# මෙතේ බුදුගුණ ලකර

හෙවත්

# මෛත්‍රෙය බුද්ධ ගුණාලඞ්කාරය

## මනෝරමා ව්‍යාඛ්‍යා

සහිතයි.

---

කොළඹ ශ්‍රෙෂ්ඨාධිකරණශාලාවේ ලිපිකාරධුරන්ධර

**ජ්. ඩී. ලෝරන්ස් මහතා විසින්**

විරචිතයි.

---

**පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති**

රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන

කොළඹ හලාවත දෙදිගාවේ

**ප්‍රධාන සඞ්ඝනායක මාහිමියන්වහන්සේ විසින්**

අවශාන සිඩිපත්‍රාවලොකනයෙන්

**මැනවයි පිළිගන්නාලදි.**

**කොළඹ විද්‍යාප්‍රකාශ යන්ත්‍රාලයෙහි**

මුද්‍රාපිතයි.

—o—

බු. ව. 2466

ක්‍රි. ව. 1923

# Metē Buduguṇalakara

OR

# Maitreya Buddhaguṇālaṅkāraya

A POEM

WITH A FULL PARAPHRASE AND COMMENTARY

ENTITLED "MANORAMA"

BY


**Mr. A. D. Lawrence,**

(*of the Clerical Staff, Supreme Court, Colombo.*)


---

COMMENDED

(AFTER PERUSAL OF PROOF SHEETS)

BY

**Venerable Dharmakirti Sri Dharmananda**

*Chief High Priest*

OF COLOMBO AND CHILAW DISTRICTS

AND

PRINCIPAL OF VIDYALANKARA ORIENTAL COLLEGE,

PELIYAGODA, COLOMBO.


PRINTED AT THE VIDDYARTHAPPRAKASA PRESS.

COLOMBO.

1923

## සත්කීර්තිමත් ඩී. බී. ජයතිලක ඇම්. ඒ. අධිනීතිඥ මැතිතුමන්ගේ පිළිගැනීම.

*Telephone*
**No. 2069.**

**14. Regent Street,**
**COLOMBO.**
**17-11-22.**

"මෙතේ බුදුගුණාලංකාර" නම් කවිපොතින් පිටු කීපයක් කියවා බැලිමි. එහි කර්තෘවූ ඒ. ඩී. ලෝරන්ස් මහතා විසින් ස්වකීය ශ්‍රද්ධා භක්තිය ප්‍රකාශ කිරීම පිණිස නිපදවනලද මේ ප්‍රබන්ධයෙහි බෞද්ධයන් විසින් දතමනා බොහෝ කරුණු අන්තර්ගත බැව් සතුටින් කියමි.

*(Sd:)* **D. B. Jayatilaka.**

## Letter of Commendation
by
**D. B. Jayatilaka Esq. M.A.(Oxon.) Barrister-at-Law**
(Translation)

I have perused a few pages of the Poetical work entitled "Mete Budugunalakara."

It gives me pleasure to say that this book which has been written with the object of giving expression to the religious ardour and faith of its author, Mr. A. D. Lawrence, embodies much that should be known by all Buddhists.

*(Sd:)* **D. B. Jayatilaka.**

# ශුද්ධිපත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 3 | 10 | දීනිදු | දිනිදු |
| ,, | 13 | සෘජුවූ | සෘජුවූ |
| 4 | 28 | උතසහය | උතසාහය |
| 8 | 5 | සමස්කාරකොට | නමස්කාරකොට |
| ,, | 24 | මහාසමද්‍රස්ථවූ | මහාසමුද්‍රස්ථවූ |
| 14 | 13 | අත්නැති | අත්හැති |
| 15 | 23 | ඵරුෂ | පරුෂ |
| 16 | | 1 සගීය | 2 සගීය |
| ,, | 24 | සමග | සමහ |
| 24 | 4 | යුකතතව | යුකතව |
| 25 | 13 | ලැබ | ලබ |
| 27 | 7 | චිත්තයෙහි | චිත්තයෙන් |
| 31 | 34 | වෛකල | වෛකල්‍ය |
| 45 | 20 | ගජනනායක | ජගනනායක |
| 47 | 1 | පෘපිවීශවර | පෘථිවීශවර |
| 49 | 13 | පිඤ්ඡාකලාපයක් | පිච්ඡකලාපයක් |
| 54 | 17 | වන්දනයකොට | වන්දනයකොට |
| 61 | 25 | බොධියත්ව | බොධිසත්ව |
| 62 | 28 | කල්පලක්ෂ්‍යයක් | කල්පලක්ෂයක් |
| 64 | 22 | රජිතකොට | රජීතකොට |
| 65 | 8 | ගදෙව් | ගඳෙව් |
| 66 | 7 | අවලොකය | අවලොකනය |
| 67 | 8 | විදි | විදී |
| 68 | 7 | නිරනතයෙන් | නිරනතරයෙන් |
| 69 | 31 | සෛඝ්‍රයෙන් | ශෛඝ්‍රයෙන් |
| 71 | 7 | විපුල, මහත්වූ | (අධිකයි) |
| 75 | 16 | චිද්‍රයකුත් | ඡිද්‍රයකුත් |
| 78 | 23 | දීපතියක්ආති | දීපතියක්ඇති |
| 81 | 30 | එනිමුව | එණිමුව |
| 82 | 31 | අතිවන්නාවූ | ඇතිවන්නාවූ |
| 85 | 23 | තේජසින් | තෙජසින් |
| 86 | 34 | චිත්‍රාකර්ෂණ | චිත්තාකර්ෂණ |
| 87 | 27 | සමපුණණි | සම්පූර්ණ |
| 89 | 25 | සම්දනා | සම්දනා |

| පිට | පෙළ | අශුඬ | ශුඬ |
|---|---|---|---|
| 90 | 14 | ජිද්‍රනොවූ | ඡිද්‍රනොවූ |
| 90 | 17 | අවිවරදනත | අවිවරදනතු |
| ,, | 26 | දතනයෝතුමූ | දනතයෝතුමූ |
| 91 | 25 | දඣමින් | දක්වමින් |
| 93 | 8 | බඣුවූ | බන්ධුවූ |
| 93 | 15 | බුඩ | බුඩ |
| 98 | 32 | සැරසිසිටි | සැරසිදිති |
| 100 | 32 | වර, ප්‍රාර්ථිනියවූ | (අධිකයි) |
| 102 | 26 | වන්‍දනවයෙහි | වන්‍දනවයෙහි |
| 103 | 3 | රතනයක් | රතනයක් |
| 103 | 33 | සකලෛලශෛවය‍ර්‍යය | සකලෛලශවය‍ර්‍යය |
| 116 | 2 | බමුණු, ඒ බ්‍රාහමණයෝ (අධිකයි) | |
| 123 | 7 | ශසත්‍රුව | ශත්‍රැව |
| 127 | 12 | පිංඡාකලපයන් | පිච්ඡකලාපයන් |
| 128 | 8 | අවලොවකනය | අවලොකනය |
| 135 | 24 | පරමිතාවන් | පාරමිතාවන් |
| 135 | 30 | යයවිසර | යසවිසර |
| 138 | 26 | මූව කාට | මූවාකොට |
| 141 | 4 | සමසත | සමසත |
| 147 | 4 | කාරණු | කාරුණු |
| 147 | 22 | ශ්‍රාඩාදි | ශ්‍රඩාදි |
| 149 | 18 | සංකෙලසදි | සංකිසෙලාදි |
| 151 | 8 | විතතාශයද | විතතායාශයද |
| 153 | 13 | අශවාස | ආශවාස |
| 156 | 28 | දෙශනාය | දෙසනාය |
| 160 | 18 | නොබිදූ | නොබිඳැ |
| 163 | 34 | අකාසසාසිණ | ආකාසසාසිණ |
| 171 | 3 | ප්‍රතිවෙධඥණයෙන් | ප්‍රතිවෙධඥනයෙන් |
| ,, | 9 | —එම— | —එම |
| ,, | 5 | යොදන | යෙදූන |
| 177 | 21 | සත්පුෂී | සත්පුරුෂ |
| 180 | 5 | සමපගතියක් | සමපතතියන් |

මෙහි සුවිසේදනහැකි හුශවදීඝී සංයොගාදීන්ගෙන්
ජනිතවූ ප්‍රමාදස්ථානයන් සඳහන්නොකෙළෙමු.

# සංඥාපනය.

—— ෦ ——

## මෙතේබුදුගුණලකර
### හෙවත්
## මෛත්‍රෙයබුද්ධගුණාලඞ්කාරය.

---

**ශ්‍රී සුගතතථාගත සද්ධර්මවරචක්‍රවර්ත්ති ගෞතමසම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන්වහන්සේ** විසින් "එකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවො දුල්ලභො ලොකස්මිං කතමස්ස එක පුග්ගලස්ස ? තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස" යි-වහණෙති එක්පුද්ගලකෙනකුන්ගේ පහළවීම ලොකයෙහි දුර්ලභය-කවර නම් එක්පුද්ගලකෙනකුන්ගේදයත් ? තථාගතඅර්හත්සම්‍යක්සම් බුදුරජාණන්වහන්සේගේයයි, අඞ්ගුත්තරනිකායෙහි බුදුකෙන කුන්ගේ ලොව පහළවීමේ දුර්ලභත්වය වදාරනලද්දේය.

මෙබඳු දුර්ලභවූ තථාගත ප්‍රාදුර්භාවය වනාහි සමස්තසත්ත්වයාහට හිතසුඛදායකවේ. අනන්තදුඃඛපුඤ්ජයක්වූ මේ සංසාරයෙහි චුතිඋත්පත්තිවසයෙන් පරිභ්‍රමණය කරන සත්ත්වසමූහයාට ස්වර්ගාපවර්ගසම්පත් ලැබීමට අසහාය හෙතුවන්නේ බුද්ධොත්පාද කාලයමය.

**මෙතේබුදුගුණලකාර හෙවත් මෛත්‍රෙයබුද්ධගුණාලඞ්කාරය** නම් මේ අභිනව කාව්‍යග්‍රන්ථය වනාහි අපතථාගතයන් වහන්සේ විසින් අනුබුද්ධධර්මසෙනාපති ශාරීපුත්‍ර මහ රහතන් වහන්සේගේ අයැදුමෙන් තමන්වහන්සේට අනතුරුව ඇති වන්නාවූ හිතාවහවූ බුද්ධොත්පාදකාලයක් දක්වමින් දෙශනාකර වදාළාවූ අනාගතවංශදෙශනාව ඇසුරුකොට රචනාකරනලද්දකි. මෙයින් ප්‍රකාශවන්නේ මතුබුදුවන මෛත්‍රෙයසර්වඥරාජොත්තමයාණන්වහන්සේගේ බුද්ධරාජ්‍ය ශ්‍රීවිශෙෂයයි.

මෛත්‍රෙයතථාගතයන්වහන්සේ මේ මහාභද්‍රකල්පයට සොළසාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් ඔබ්බෙහි ලොවපහළවූ මූහුනී නම් භාග්‍යවතුන්වහන්සේගේ කාලයෙහි දඹදිව මධ්‍යමණ්ඩල යෙහි ප්‍රභාවත්ත නම් චක්‍රවර්ත්තිරාජත්ව අතටපත් තිවත් හැර ලොකානුකම්පාවෙන් සකල චක්‍රවර්ත්තිරාජ්‍යසම්පත්තිය යථොක්ත

මුනීන්ද්‍රයාණන්වහන්සේට පුද බුදුසසුන් වැද පැවිදිව රතන ස්ථවිරයන නමින් ප්‍රසිද්ධව පංචාභිඥා අෂ්ටසමාපත්තීන් උපදවා එම බුදුන්හමුවෙන් ප්‍රථමාභිනීහාරලදින් සොළසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම්පුරා එද තුරෙහි බුදුවූ සහස්‍රසඞ්ඛ්‍යාත බුද්ධ දිවාකරයන්වහන්සේලාගෙන්ද විවරණ ලැබ තුසිදෙව්පුර ඉපද එසින් සැව පස්බුදුකෙනකුන්වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ මේ මහාභද්‍රකල්පයෙහි පස්වෙනිවරට ලොවුතුරාබුදුව අසූදහසක් අවුරුදු අනන්තාපරියන්ත බුද්ධශ්‍රීන්බබළමින් වැඩහිඳ ලෝවාසීන්ට තිවන් සිරි ලබාදෙන බවත්, "මෙත්තෙය්‍යො උත්තමො රාමො" යනාදින් දක්වනලද මහාබොධිසත්වවරයන් අතුරෙන් පළමුවන බෝසත් බවත්, දැන් තුසීපුර වැඩවසන බවත් ප්‍රකාශවතිබේ.

තවද මෛත්‍රෙයබෝසතාණන්වහන්සේ අප ගෞතම බුද්ධොත්පාදකාලයෙහිද දෙව්ලොවින් චුතව අවුත් සැවත්නුවර තිස්යොදුන් පමණවූ සංකස්ස නම් නුවර මහත්භොග සම්පත් ඇති සිරිවඩ්ඪනගෘහපති මහාසාරයන්ගේ අගමෙහෙසුන් කුස ඉපද වැඩිවිය පැමිණ බුදුසසුන් වැද පැවිදිව උපසම්පදා ඇතිව ත්‍රිපිටකබුද්ධවචනය ඉගෙන අපශාක්‍යසිංහගෞතමජිනේන්ද්‍රයාණන්වහන්සේගෙන්ද විවරණ ලැබූ බව—සෙංකඩගලනුවර උපොසථාරාමාධි වාසීවූ වැලිවිට පිණ්ඩපාතිකසරණඞ්කරසඞ්ඝරාජමහාස්ථවිරස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍යවූ සිද්ධාර්ථබුද්ධරක්ෂිත මහානායකස්වාමිපාදයන් විසින් විරචිත "ශ්‍රීසද්ධර්මාවවාද සඞ්ග්‍රහයෙහි ප්‍රකාශිතයි. තවද එහි මතුදක්වන කථාප්‍රවෘත්තියද දක්නාලැබේ:—

> "මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණුරට කාම්බෝජ නම් දනව්වෙහි මලියදෙවස්ථවිරනම් රහත්කෙනකුන්වහන්සේ නමක් වාසය කරනසේක. උන්වහන්සේ එක්දවසක් පෙරවරු හැඳ පෙරව පාත්‍රය අතින් ගෙන එම කාම්බෝජ නම්ගම පිඬුපිණිස වඩනාකල්හි එක්තරා පුරුෂයෙක් දැක පහන්සිතින් වැඳ මහනෙල්මල්අටක් දින, තෙරුන්වහන්සේ ඒගෙන සිතනසේක් මෙබඳු වර්ණගන්ධසම්පන්නවූ මල් ගෙනගොස් පිණ්ඩපාත කාලය සම්ප්‍රාප්තවනතුරු තව්තිසා භවනයෙහිවූ චූළාමණිචෛත්‍යයෙහි පුද වැඳ එමියි සිතා එකෙණෙහි අහසට නැගී ඇසිල්ලකින් ගොස් වෛජයන්ත ප්‍රාසාදයාගේ අභිමුඛයෙහි අපබුදුන්ගේ කෙශධාතු හා දන්තධාතුන්වහන්සේ වඩා ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් කරන ලද සතරගවුවක් උසඇති මාණික්‍යමයවූ සිළුමිණිසෑ නම් දා

ගැබට ඒ මහනෙල්මල් අට පුදා, වැඳ ප්‍රදක්ෂිණාකොට
එක්පාශ්වයෙක වැඩසිටිසේක. එකල්හි සක්දෙව්රජ එසේ
වැඩසිටි මලියදෙව මහතෙරුන්වහන්සේ දැක සපිරිවරින්
ගොස් වැඳ සිටියේය. එවිට තෙරුන්වහන්සේ ශක්‍රදෙවෙ
න්ද්‍රය මෛත්‍රෙයබෝසතාණෝ මෙහි එනසේක්දැයි විචාළ
සේක, ඒ ඇසූ ශක්‍රදෙවෙන්ද්‍ර එසේය ස්වාමින්වහන්ස අද
අටවක්දිනයෙහි එනසේක. හෙතෙමෙ පඤ්චමී චාතුද්දසී
පණ්ණරසී තුන්පොහොයෙහිදු මේ චෛත්‍යය වඳනට එන
සේකැයි දැන්වීය, එසේදැන් එනසේකැයි කියමින් සිටියදී
මහපිරිවරින් යුත් එක්දිව්‍යපුත්‍රයෙක් ආයේය, ඒදැක මේ
මෛත්‍රෙයබෝසතාණෝදැයි විචාරාවදාළ කල්හි සක්දෙව්
රජ නැත ස්වාමින්වහන්ස මෙතෙමේ පෙර අනුරාධපුර
නුවර සුවිසාමියෙන් ජීවත්වීමෙන් බොහෝ පින්කම් කළ
නැනැත්තහුයයි දැන්වීය. නැවත අනික් දිව්‍යපුත්‍රයෙක්ද
මහපිරිවරින් ආයේය. ඒදැක මහතෙරුන්වහන්සේ ශක්‍ර
දෙවේන්ද්‍රය මේතෙමෙ මෛත්‍රෙයබොධිසත්වදැයි විචාළ
සේක, එවිට සක්දෙව්රජ නැත ස්වාමිනි මෙතෙමෙ පෙර
දුටුගැමුණුරජ මලණුවූ *සද්ධාතිස්සනම් රජයයි දැන්විය.
නැවත එක්දිව්‍යපුත්‍රයෙක් මහපිරිවරින් එනුයේය, ඒදැකද
තෙරුන්වහන්සේ මහරජ මේ මෛත්‍රෙයබොධිසත්වයෝ
දැයි විචාළසේක. එවිට සක්දෙව්රජ නැත ස්වාමිනි මෙ
තෙමෙ පෙර රත්නමාලීනම් අසදෘශ චෛත්‍යය කරවාලූ
*දුටුගැමුණුරජයයි කිය. මෙසේ නොයෙක්දිව්‍යපුත්‍රයෝ ඔවු
නොවුන්ගේ ශරීරශොභායෙන් දසදිග්බබුළුවා මහපිරිස්
පිරිවරා අවුත් සිළුමිණිසෑ වැඳ ප්‍රදක්ෂිණාකොට සිටිකල්හි
ඔවුන් හැමදෙනාට පසුව මහත් උදාරතර දිව්‍යශ්‍රීශොභා
යෙන් පූර්වදිශාභාගය හොබවමින් එන දිව්‍යරාජයා දැක
මලියදෙවමහතෙරුන්වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රය මේ කවරේ
දැයි විචාරාවදාළකල්හි ස්වාමීන්වහන්ස මේ මෛත්‍රෙය
බෝසතාණන්වහන්සේයයි දන්වා ඔවුන් පිරිවරා එන
දිව්‍යප්සරාවන්ගේද ප්‍රවෘත්ති විචාළනැත ඔවුනුදු කලකුසල්
මේ මේ යයි දැන්විය, එකල්හි මෛත්‍රෙයබෝසතාණෝ
දශදිසා බබුළුවමින් අවුත් සිළුමිණිසෑය වැඳ ප්‍රදක්ෂිණා

---

*දුටුගැමුණුරජ සහ සද්ධාතිස්සරජතෙමෙත් මෛත්‍රෙයබුදුරජාණන්ට අශොකය, බ්‍රහ්මදෙවය යන නමින් දාගබ්වන් වන බව මෙයි මතු දක්නාලැබේ (189 සහ 430 කවිදෙක බලනු.)

කොට මලියදෙවමහතෙරුන් සාරා පැමිණ වැඳ එකත්පස්ව සිට ස්වාමීන්වහන්ස කොයින් මෙහට වැඩිසේක්දැයි විචාළහ, ඒ අසා තෙරුන්වහන්සේ මහරජ දඹදිවින් ආම්හයි වදාළසේක, එකල්හිබෝසතාණෝ **ස්වාමීනි කිංමෙක්ද? දඹදිව මිනිස්සු මා ප්‍රාර්ථනාකෙරෙද්දැයි** විචාළහ, එවිට තෙරුන්වහන්සේ එසේය මහරජ හැමකල්හිම කුසල්කොටමෛත්‍රෙය බුදුන්ගේදැක්ම ම ප්‍රාර්ථනාකරන්නාහුයයි වදාළසේක, එබස් ඇසූ මෛත්‍රෙයබෝසතාණෝ කියන්නාහු **එසේ සම්කුශලයක්කොට සසර හයින් ශීඝ්‍රව මා ප්‍රාප්තනාහුද ඔවුන් සියලු හයින් මමද මුදලිගංහම්වයි** කියා මේ ආදිනොයෙක් කාරණා මලියදෙව මහතෙරුන්වහන්සේට දන්වා අවසරගෙන සපිරිවරින් මෛත්‍රෙයබෝසතාණෝ තුසිපුරදෙව්ලොවටම ගියහ, තෙරුන්වහන්සේද මිනිස්ලොවට වැඩ එම කාම්බෝජ නම් ගමට පිඬු පිණිස වැඩවදාළසේක. එතැන් පටන් මෛත්‍රෙයබෝසතාණෝ තුසීපුරදෙව්ලොව දිව්‍ය සම්පත් විඳිමින් වසන බව විශෙෂයෙන් මිනිස්ලොවට ප්‍රකාශවිය"-යනාදියි.....

මෙම්කථාප්‍රවෘත්තිය සකලබෞද්ධයන්ගේ චිත්තප්‍රසාදයට වැදගත් කාරණයෙකි.

තවද තොටගමුවේ ශ්‍රීසඞ්ඝබොධිශ්‍රීවිජයබාහුපරිවෙණාධිපති ෂඩ්භාෂාපරමේශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය ශ්‍රීරාහුලස්ථවිර සඞ්ඝරාජොත්තමයාණන්වහන්සේ විසින් විරචිත චිරප්‍රසිද්ධ ‘කාව්‍යශෙඛර” යෙහි—

"සිරි පැ හිරු තරි ඳු
තෙද යස දිගත පසි ඳු
මතුවන බුදුර ඳු
සැරදෙතොටගමුවෙහෙරතිඳු"

සූර්‍ය්‍ය චන්ද්‍ර දෙදෙනාගේ ශොභාව ප්‍රකාශකොට තෙජ සින්හා යසසින් ජගත්හි ප්‍රසිද්ධවූ අනාගතයෙහි බුද්ධ රාජවන්නාවූ තිවු ග්‍රාමවිහාරාධිෂ්ඨිතවූ නාථසුරෙන්ද්‍රය ! (සුෂවත්තෙමෙ) චිරකාලයක් ජීවත්වෙහිවා යනුද—

වීදාගම ශ්‍රීඝනානන්දපරිවෙණාධිපති මෛත්‍රෙයමහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් විරචිත බුදුගුණාලඞ්කාරය යෙහි–

"මෙලෙසින් හැම දව ස
හැම පින් පුරා තිසිලෙ ස
බුදුවන එන දව ස
මෙතේමුනිරජතුමන් දැක තො ස
පුදකරමින් නොම ද
බණසා උන්සසුන් වැ ද
හැම කෙලෙසුන් පසි ද
වසව සැනසී නිවන්පුර වැ ද"

යනාදියද පෙනේ-

මෙසේ මතු බුද්ධත්වයට පැමිණෙන මෙත්බෝසතුන් කෙරෙහි දැඩිභක්ති ඇත්තාවූ සියලු බෞද්ධ රටවල බෞද්ධවූ සියලු උතුමන් විසින් සම්භාවනා කළ බැව් නොයෙක් ග්‍රන්ථාන්තරයන්හි දක්නා ලැබේ—එසේම වර්තමාන බෞද්ධයන් විසිනුදු සම්භාවිතය.

යම්කිසි පුණ්‍යකර්මයක් කොට මෛත්‍රෙයබුදුන් දැක නිවන්දකිම්වා ! දකිත්වා ! යනාදින් ප්‍රාර්ථනා කිරිම සියලුම බුද්ධභක්තිකයන්ගේ නිත්‍යචාරිත්‍රයකි. අපේ කුලදෙවතාවූ මහා සඞ්ඝයාවහන්සේලාගේද පිණ්ඩපාතදාන, බුද්ධප්‍රමුඛදාන, ධර්මදෙශනාදියෙහි පුණ්‍යානුමෝදනා කරවන අවස්ථාවන්හි මෛත්‍රෙයබුදුරජාණන්වහන්සේ සිහිපත් කොට පුණ්‍යානුමෝදනා කරවීමේචාරිත්‍රය පරම්පරාගතව අදදක්වා ප්‍රවෘත්තවේ.

ලක්දිව අතීත වර්තමාන විහාරස්ථානයන්හි මෛත්‍රෙය බුද්ධාංකුරනාථසුරෙන්ද්‍ර ප්‍රතිමාරූප ප්‍රතිෂ්ඨාපනයෙන් ගරුබුහුමන් පුදසිරිත් පැවැත්වීම ඉතා ප්‍රසිද්ධකරුණකි.

බොධිසත්වවරයෝ වනාහි බුද්ධාංකුරත්වයෙන් වන්දනමානන පූජනය කරන්නවුන්ට පුණ්‍යක්ෂෙත්‍රයෝයි. සෙසුලොකයා තබා බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ක්ෂීණාශ්‍රවයන් විසිනුදු සර්වඥගුණානුස්මෘතියෙන් බොධිසත්ව පූජනය කරන බව දීපංකරසර්වඥයන්වහන්සේ හා සාරලක්ෂයක් මහරහතන් විසින් සුමෙධ නම් අප බෝසතාණන්වහන්සේට සමන්මලින් පිදූ කථාප්‍රවෘත්තියෙන් මනාව හැඟෙයි.

අනාගත බුද්ධොත්පාදකාලයෙහි සර්වඥපදප්‍රාප්තව නිර්වාණය ලබාදෙන සමත්‍රිංශත්පාරමිධර්මයන් පූරණය කොට මහාකාරුණ්‍යයෙන් වැඩසිටින මෛත්‍රෙයබෝසතුන්වහන්සේ නිතර සිහිපත්කරන ප්‍රාඥයන්ට බුද්ධගුණානුස්මෘති පූර්වක උදාර පුණ්‍යරාශියක් අත්පත්ව උන්වහන්සේ සම්‍යක්සම්බුද්ධවූකල්හි සියැසින් දැක නිවන් ලැබීමට හේ උපනිශ්‍රයවන්නේය.

කාරුණ්‍ය මෙසේ හෙයින් මෛත්‍රෙයසම්‍යක්සම්බුද්ධයන් වහන්සේගේ බුද්ධරාජ්‍යශ්‍රීවිශෙෂය විස්තරකොට සියබසින් රචනාකරනලද කාව්‍යයක් දුර්ලභ. බවද, එසේ ඇතහොත් සියබස දත් බෞද්ධපිරිසට පඨන පාඨනාදි වසයෙන් උභයලොකාර්ථ සිද්ධිය කරගැන්මෙහි අතිශය හෙතුභූත කාරණක් වන බවද මෛත්‍රී සිත් පෙරදැරිව තරයේ සිතූ මා විසින් අපතිලෝගුරු ගෞතමතථාගතයන්වහන්සේ විසින් දෙශනාකළ මෛත්‍රෙය මුනීන්ද්‍රයන්සම්බන්ධ අනාගතවංශදෙශනාව ඇසුරුකොට මාගේ ඥානශක්ති තරමින් පංචශත ප්‍රමාණ කාව්‍යයන්ගෙන් යුත් **මෛත්‍රීබුදුගුණලකර හෙවත් මෛත්‍රෙය** බුද්ධගුණාලඞ්කාරය නම් මේ ග්‍රන්ථය රචනාකරනලදුව කාව්‍ය සුබොධය පිණිස **මනොරමාව්‍යාඛ්‍යා** නම් සන්නයක්ද යුක්තකොට මුද්‍රාඞ්කණය කරවන ලදී.

මේ කාව්‍යයට ඇතුලත්කරනලද ධර්මකොට්ඨාසාදි කාරණා මේ මේ යයි මොනවට පිළිවෙළකොට මෙහි මූලට යොදා තිබෙන පටුනෙන් සුඛාවබොධ හෙයින් ග්‍රන්ථවර්ණනාව ගැන ප්‍රපංච නොවෙමු.

මේ **පොත්රුවන** සකල ශ්‍රද්ධාවන්තයන් විසින් චිත්තප්‍රීතින් යුක්තව නිතර භාවිතාකිරීමෙන් ජනිත පුණ්‍යකර්ම හෙතුබල යෙන් අනාගතයෙහි දඹදිව කෙතුමතී නම් රාජධානියෙහි තුන් ලොවට අසහාය පුණ්‍යපිණ්ඩයක්මෙන් ප්‍රාදුර්භූතව නාගශ්‍රී බොධිද්‍රැමූලයෙහි සකල මාරපරාජයකොට ලොවුතුරාබුදුවන් නාවූ ශාශ්වත උච්ඡෙදාදි සකල මිථ්‍යාදෘෂ්ටි නමැති මත්තහස්තීන් ගේ දපි නමැති කුම්භස්ථල ප්‍රදලනයෙහි කෙසරීන්ද්‍රයමාණවූ ආකාශයසේ අනන්තගුණඇති මහාසමුද්‍රයසේ ගැඹුරුවූගුණ ඇති මහාමේරුවසේ උස්වූ ගුණඇති ජාතිරත්ගමාණික්‍යයක්සේ පිරි සුදුවූ ගුණඇති ප්‍රඥසාගරවූ නිකෙලෙශිවූ නිරවද්‍යවූ කාරුණිකනිධානවූ ත්‍රිභුවන ජනවන්ද්‍ය **ශ්‍රීමත්තථාගත** මෛත්‍රෙය **සම්‍යක්සම් බුද්ධ සර්වඥරාජොත්තමශ්‍රෙෂ්ඨයාණන්වහන්සේ** දර්ශනය කොට උන්වහන්සේ විසින් අෂ්ටාංගසමුපෙත බ්‍රහ්මස්වර විහිදුවා ලලිත විචිත්‍ර මධුර මනොහර ලෙස දෙශනාකර වදාරණලද **චතුස්සත්‍යාදි ශ්‍රීසද්ධර්මයන්** ශ්‍රවණය කොට ප්‍රාර්ථිතාපරිද්දෙන් එක්තරා බොධියකට පැමිණ අජරාමරසඞ්ඛ්‍යාත ශාන්ත සුන්දර **අමාමහ නිවන්** ලබාගන්නා ලෙස මෙත් සිත් පෙරටුව මතක්කරමු.

A. D. Lawrence

# උපකාරස්මෘතිය.

මේ පොත මුද්‍රාඞ්කණයකිරීමෙහිදී අප අයැදුම කාරුණාවෙන් පිළිගත් පෑලියගොඩ විද්‍යාලඞ්කාරපරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය රත්මලානේ ධර්‍මකීර්ත්‍ති ශ්‍රීධර්‍මාරාමාභිධාන සඞ්ඝනායකමාහිමියන්වහන්සේ මෙහි අවසාන සිද්ධපත්‍රබලා පිළිගැනීමෙන් මේ සඳහා අපට මහත් ධෛර්‍ය්‍යොපකාරකරවදළ බැවින් යථොක්තමාහිමියන්වහන්සේවෙත අපගේ මහත් ගෞරව ස්තුතිය පුදකරමූ.

තවද මේපොත සුද්ධකරගැනීමෙහිදී යථොක්ත පිරිවෙනෙහි උපාචාර්‍ය්‍ය දෙනමක්වූ මාද්‍යේවිට ඤාණානන්දස්වාමිපාදයන්වහන්සේද, මාතර ඕවිටිගල්ලේ ධම්මක්ඛන්ධස්වාමින්වහන්සේද, නොබෝද කාලයාත්‍රා කළ මාතරබටුවිට ඩී. ජී. අභයගුණරත්නපණ්ඩිත මහතාද සංශයස්ථානයන් සුද්ධකරදීමෙන් ආධාරකළබැවින් එම ස්වාමින්වහන්සේලා දෙනමටසහ පණ්ඩිතමහතාණන්ටද ගෞරව ස්තුතිකරමූ.

මේ පොත නැවතමුද්‍රණයකිරීම් ආදී සියලු අයිතිවාසිකම් මෙහි කර්තෘවූ මාවෙතම තබාගත්බවද දන්වමු.

A. D. L.

1923 සැප්තැම්බ්‍රමස 21 වෙනිදින
කොළඹදීය.

# පටුන.


| සංඛ්‍යා. | ධර්මකොට්ඨාස | කවිය | පිට |
|---|---|---|---|
| | **(1) ප්‍රාරම්භය.** | | |
| 1 | නමස්කාරය. | 1— 3 | 1- 3 |
| 2 | දෙවතානුස්මෘතිය. | 4 | 4 |
| 3 | කාව්‍ය මාතෘකාව. | 5—10 | 4- 5 |
| 4 | සුදෙවුන්මහරජතුමන්ගේ ආරාධනාවෙන් ගෞතමබුදුරජාණන්වහන්සේ කිඹුල්වත්පුරට වැඩ න්‍යග්‍රොධාරාමයෙහිදී ඥාතීන් දමනයපිණිස ධර්මදේශනා කිරීම. | 11—16 | 6- 7 |
| 5 | මෛත්‍රෙයබුද්ධවිස්තර අනාගතවංශදෙශනාවපිණිස ශාරීපුත්‍රස්ථවිරයන්වහන්සේගේ ආරාධනාව. | 17—18 | 7- 8 |
| | **(2) සර්වඥයන්වහන්සේගේ අනාගතවංශදෙශනාව.** | | |
| 6 | ගෞතමබුද්ධශාසනය පවතිනකාලය. | 19—20 | 8 |
| 7 | අබුද්ධොත්පාද කාලය සහ අධර්මයෙන් ලොවපිරිහීම. | 21—27 | 9-10 |
| 8 | ශස්ත්‍රාන්තඃ කල්ප නම් ලොකවිනාශයට සතියක් ප්‍රථම ආකාශචාරී දෙවතාවෙකුගේ අවවාදයක්. | 28—32 | 11-12 |
| 9 | එකීදෙවවාක්‍ය පිළිගත් නොපිළිගත් සත්වයාගේ පැවැත්ම. | 33—35 | 12-13 |
| 10 | මෘගසංවර්තාව සහ සත්වවිනාශය. | 36 – 39 | 13-14 |
| 11 | එයින්විපත් සිදුනොවූ මනුෂ්‍යයන්ගේ පැවැත්ම. | 40—12 | 14 |

| සංඛ්‍යා | ධර්මස්කන්ධය | ගාථා | පිට. |
|---|---|---|---|
| | **(3) ඒකාදශ පාපකර්ම විභාගය.** | | |
| 12 | කායකර්ම චතුෂ්කය. | 43 | 15 |
| 13 | වාක්කර්ම චතුෂ්කය. | 44 | 15 |
| 14 | මනෝකර්ම ත්‍රිකය. | 45 | 15 |
| 15 | තමන් විසින් කරන ප්‍රාණඝාතයෙහි අඞ්ග | 46 | 16 |
| 16 | අනුන්ලවා කරවන —එම— | 47 | 16 |
| 17 | තමන් විසින් කරන අදත්තාදානයෙහි අඞ්ග. | 48 | 16 |
| 18 | අනුන්ලවා කරවන —එම— | 49 | 17 |
| 19 | කාමමිථ්‍යාචාරයෙහි අඞ්ග. | 50 | 17 |
| 20 | මුසාවාදයෙහි අඞ්ග. | 51 | 17 |
| 21 | සුරාපානයෙහි අඞ්ග. | 52 | 17 |
| 22 | පෛශුන්‍යයෙහි හෙවත් කේලාම්කීමෙහි අඞ්ග. | 53 | 18 |
| 23 | පරුෂවචනයෙහි අඞ්ග | 54 | 18 |
| 24 | සම්ඵප්‍රලාපයෙහි අඞ්ග, | 55 | 18 |
| 25 | අභිධ්‍යාවෙහි හෙවත් විෂමලෝභයෙහි අඞ්ග. | 56 | 19 |
| 26 | ව්‍යාපාදයෙහි හෙවත් ක්‍රෝධයෙහි අඞ්ග. | 57 | 19 |
| 27 | මිථ්‍යාදෘෂ්ටියෙහි අඞ්ග. | 58 | 19 |
| 28 | යථෝක්තපාපකර්ම කළවුන් ලබන අනිෂ්ටවිපාක. | 59–62 | 20 |
| | **(4) පංචශීලය රක්ෂාකිරීමෙන් ලබන ආනිසංස.** | | |
| 29 | ප්‍රාණඝාතයෙන්වැළැක්මෙහිආනිසංස | 63–64 | 21 |
| 30 | අදත්තාදානයෙන් —එම— | 65–66 | 21–22 |
| 31 | කාමමිථ්‍යාචාරයෙන් —එම— | 67–68 | 22 |
| 32 | මුසාවාදයෙන් —එම— | 69–70 | 22–23 |
| 33 | සුරාපානයෙන් —එම— | 71–72 | 23 |
| | **(5) චාදශ පුණ්‍යකර්ම විභාගය.** | | |
| 34 | චාදශපුණ්‍යකර්ම. | 73–74 | 24 |
| 35 | දානවස්තු දශකය. | 75 | 24 |
| 36 | දානමයකුශලය. | 76 | 24 |

| සංඛ්‍යා | ධර්මකොට්ඨාස | කවිය | පිට |
|---|---|---|---|
| 37 | ශීලමයකුශලය. | 77 | 24 |
| 38 | භාවනාමයකුශලය. | 78 | 24 |
| 39 | අනෘශංසපුණ්‍යප්‍රාප්තිය නොහොත් ප්‍රාප්ති දානමයකුශලය. | 79 | 24 |
| 40 | ප්‍රාප්ත්‍යනුමොදනාකුශලය. | 80 | 25 |
| 41 | දෙශනාමයකුශලය. | 81 | 25 |
| 42 | ධර්මශ්‍රවණමයකුශලය | 82 | 25 |
| 43 | අපචායනකුසලය. | 83 | 25 |
| 44 | වෛයාවච්චකුසලය. | 84 | 26 |
| 45 | ප්‍රශංසනකුශලය. | 85 | 26 |
| 46 | සරණමයකුශලය | 86 | 26 |
| 47 | අනුස්සතිනම්කුසලය. | 87 | 27 |
| 48 | යථොක්ත ද්වාදශපුණ්‍යකර්ම කළවුන් ලබනසම්පත්තිය. | 88 | 27 |
| | **(6) ගුණ ධර්මවෘද්ධිමෙන් ලොකය වර්ධනවීම.** | | |
| 49. | ශස්ත්‍රාන්තඃකල්පවිනාශයෙන් ගැලවුනු මනුෂ්‍යයන්ගේ ගුණධර්මවැඩීමෙන් ලොකයෙහිමනුෂ්‍යයන්ට ක්‍රමයෙන්වැඩී අවුරුදුඅසංඛ්‍යයක් ආයුලැබ ලොකය වර්ධනයවීම. | 89-101 | 27-31 |
| | **(7) මෛත්‍රෙයබුද්ධොත්පාදකාලදෙශනාදි විස්තර.** | | |
| 50 | ඉන්පසු ක්‍රමක්‍රමයෙන් ගුණධර්ම අඩුවීම හෙතු කොටගෙන මනුෂ්‍යයන්ගේ ආයුපිරිහී අසූදහසක් අවුරුදු ආයුෂ ඇතිවන කාලය. | 102-104 | 31-32 |
| 51 | මෛත්‍රෙය බොධිසත්වයන්වහන්සේ උපදින කෙතුමතී රාජධානියෙහි අලඞ්කාරය. | 105-131 | 32-40 |
| 52 | කෙතුමතියෙහි උපදින සංඛනම් සක්විතිරජතුමාගේ විස්තරය | 132-151 | 41-48 |
| 53 | එම අග්‍රමහිෂියගේ රූපශ්‍රීවර්ණනාව | 152-161 | 48-51 |
| 54 | ලොව පහළවන මහාපුරුෂයෝ දෙදෙන. | 162 | 52 |

| සංඛ්‍යා | ධර්මකොට්ඨාස | ගාථා | පිට |
|---|---|---|---|
| 55 | එසින් බුදුවන මහාපුරුෂොත්තමයාගේත් සක්විතිරජවන මහාපුරුෂොත්තමයාගේත් වෙනස. | 163–166 | 52–53 |
| 56 | මෙම මහාපුරුෂොත්තම දෙදෙනා එකමකාලයෙහි ලොවපහළ නොවනබවත් යම්කිසි ආශ්චර්යයක්කරන කොටගෙන එසේඑකවිට පහළවුණි නම් සිදුවන ප්‍රවෘත්තිය. | 167–169 | 53–54 |
| 57 | මෛත්‍රෙයබෝසතුන්ගේ නියතවිවරණලැබීමද, පාරමිපිරිමද; යනාදි ප්‍රවෘත්තිය. | 170–174 | 54–56 |
| 58 | බුදුවනපිණිස දෙවතාආරාධනාව. | 175–176 | 57 |
| 59 | එමආරාධනාව පිළිගෙන මෛත්‍රෙයබෝසතාණන්වහන්සේ පංචමහාවිලොකනයකිරීම. | 177–183 | 58–60 |
| 60 | ලඞ්කාවෙ රජකළ කාවන්තිස්ස දුටුගැමුණු තිස්ස යන මහරජදරුවන් සහ විහාරමහදෙවී අනුලාදෙවි ශාලියරාජකුමාරාදින් ඇතුළු මෛත්‍රෙයබෝසතුන්ගේ බුදු පිරිසත් උන්වහන්සේගේ වර්තමාන උත්පත්තියත්. | 184–191 | 60–62 |
| 61 | මෛත්‍රෙයබෝසතුන් මව්කුස පිළිසිඳ ගැනීම. | 192-193 | 63 |
| 62 | එදින පහළවන දෙතිස්මහපූර්වනිමිති | 194–219 | 64–72 |
| 63 | උන්වහන්සේගේ මව්කුසින් බිහිවීම සහ පුණ්‍යානුභාවය පැතිරීම. | 220–225 | 72–74 |
| 64 | උන්වහන්සේගේ ද්වාත්‍රිංශත්මහාපුරුෂලක්ෂණයෝ. | 226–282 | 74-95 |
| 65 | උන්වහන්සේගේ කුමාරනාමය | 283 | 96 |
| | පණිත් ගුම් ඇත් අස් රථ වාහනාදිය | 284– 99 | 96-100 |
| 66 | උන්වහන්සේගේ අග්‍රමහිෂිය. | 300–308 | 100–103 |
| 67 | ගිහිගෙහි වසනකාලය සහ ඒ කාලයෙහි ඇතිවනශ්‍රෙෂ්ඨතාවය. | 309-311 | 103–104 |
| 68 | දෙවියන් විසින් චතුර්විධපූර්වනිමිති පෙන්වීම. | 312–313 | 104 |

| සංඛ්‍යා | ධර්මකොට්ඨාස | ගාථා | පිට |
|---|---|---|---|
| | (8) මහාභිනිෂ්ක්‍රමණය<br>සහ<br>බුද්ධත්ව ලැබීම. | | |
| 69 | ශ්‍රමණවේශධාරීමට කල්පනාකිරීම, සත්දිනක් දුෂ්කරක්‍රියාව දෙවියන් සහ සක්විතිරාජාදීන් උන්වහන්සේ ආරක්ෂාකිරීම, | 314-320 | 104-106 |
| 70 | මහාභිනිෂ්ක්‍රමණය, සෑටුවයත දෙවියන්ආදී පිරිස දෙවියන් විසින් පවත්වන ගරුත්වය මහදෙපසෙහි විචිත්‍රය. | 321-345 | 106-113 |
| 71 | රන්කඩුවෙන්හිස කෙස් කැපීම, මහාබ්‍රහ්මයාවිසින් අටපිරිකර පිළිගැන්වීම. | 346-350 | 114-115 |
| 72 | ශ්‍රමණවේශධාරීම. | 351 | 115 |
| 73 | උන්වහන්සේවෙත මහණවනපිරිස. | 352-358 | 115-117 |
| 74 | උන්වහන්සේගේ එදින ස්නානය කිරීම, චන්ද්‍රමුඛී බිසවුන්ගේ කිරිපිඬුදානය පිළිගැන්ම සහ උන්වහසේගේ එදින දිවාවිහරණය. | 359-365 | 117-119 |
| 75 | මෛත්‍රෙයබොධිසත්වයන් වහන්සේ එද්දෙනෙක්ම නාගශ්‍රීබොධිද්‍රැමයකරා වැඩම කිරීම. | 366 | 119 |
| 76 | නාගශ්‍රීබොධින්වහන්සේගේකීතීනය | 367-373 | 120-123 |
| 77 | මහාබොධිසත්වයන්වහන්සේ ඡිතණ අටමිටක්ලැබීම සහ දකුණුදිගින් බොධිද්‍රැමයටප්‍රවිෂ්ටවතුන්යළක් පැදකුණුකොට පෙරදිගින්පැනනැගෙන පණස්රියන් වජ්‍රාසනාරූඪව බුද්ධත්වයලැබීමපිණිස වැඩහිඳීම | 374-379 | 123-125 |
| 78 | ශක්‍රබ්‍රහ්මාදීදෙවියන්විසින් පවත්වන ප්‍රීතිඝොෂාදී උත්සව සහ වැඳුම් පිදුම් ගරුබුහුමන්. | 380-395 | 125-129 |
| 79 | වසවත්මාරදිව්‍යපුත්‍රයා යුද්ධාරම්භකිරීමෙන් චක්‍රවාලපර්යන්ත මස්තකය ට පැමිණ බොධිසත්වයන්වහන්සේගේ ශ්‍රීමුඛමණ්ඩලය දුටුපමණින් පරාජයවී හැරියාම. | 396-418 | 130-136 |

| සංඛ්‍යා | ධර්මකොට්ඨාස | ගාථය | පිට |
|---|---|---|---|
| 80 | මෛත්‍රෙය බෝධිසත්ත්වයන්වහන්සේ බුද්ධත්වයට පැමිණීම. | 419-420 | 136-137 |
| 81 | ෂඩ්වර්ණබුද්ධරශ්මිය විහිදීම්ආදිය. | 421=429 | 137-139 |
| 82 | මෛත්‍රෙයබුද්ධරාජොත්තමයාණන්වහන්සේගේ දෙඅගසව්වන්, දෙඅගසෑවි, අග්‍රඋපස්ථායකාදීන්. | 430-432 | 140 |
| 83 | උන්වහන්සේගේ ශ්‍රී ශරීරාලඞ්කාරය. | 433=138 | 140-143 |
| | **(9) මෛත්‍රෙයසර්වඥයන් වහන්සේගේ සර්වඥතාඥානය.** | | |
| 84 | සර්වඥතාඥානයවැනුම්අපොසත්බැව් | 439 | 143 |
| 85 | මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ සියලු දිව්‍යබ්‍රහ්මාදීන්ට ගුරුබැව් සහ උන්වහන්සේගේ | | |
| | 1 අනාවරණඥානය. | 140-441 | 144-145 |
| | 2 අටපිරිස්මැද්ධර්මදේශනාව. | 442 | ,, |
| | 3 ත්‍රිවිද්‍යාඥානය. | 443 | ,, |
| | 4 චතුවෛශාරද්‍යඥානය. | 443 | ,, |
| | 5 පංචගතිදත්නුවණ. | 444 | 147 |
| | 6 ෂඩ්අසාධාරණඥානය. | 444 | ,, |
| | 7 සප්තබොධ්‍යඞ්ගඥානය. | 441 | ,, |
| | 8 අෂ්ටාඞ්ගමාර්ගඥානය. | 444 | ,, |
| | 9 නවලොකොත්තරඥානය. | 444 | ,, |
| | 10 දශබලඥානය. | 445 | 148 |
| | 11 එකාදශවිධමෛත්‍රීඵලඥානය. | 445 | ,, |
| | 12 ද්වාදශප්‍රත්‍යයාකාරය (හෙවත්පටිච්චසමුප්පාදය)අවබොධකළඥානය | 415 | ,, |
| | 13 තෙලෙස්ධූතාඞ්ගදත්නුවණ. | 445 | ,, |
| | 14 චතුර්දශබුද්ධඥානය. | 446 | 152 |
| | 15 පංචදශචරණධර්මදත්නුවණ. | 446 | ,, |
| | 16 ෂොඩසවිධආනාපානාස්මෘති දත්නුවණ. | 446 | ,, |
| | 17 සප්තදශචිත්තක්ෂණයවූරූපායුෂදත්නුවණ. | 446 | ,, |
| | 18 අෂ්ටාදශබුද්ධධර්මඥානය. | 447 | 1,6 |

| සංඛ්‍යා | ධර්මකොට්ඨාස | කවිය | පිට |
|---|---|---|---|
| | 19 ඒකෝනවිංශතිප්‍රත්‍යවෙක්ෂණ ඥානය. | 447 | 156 |
| | 20 විංශතිප්‍රකාරවිෂමදෘෂ්ටිදත්නුවණ | 447 | ,, |
| | 21 සමත්‍රිංශත්පාරමීන්දත්නුවණ. | 447 | ,, |
| | 22 සප්තචත්වාරිංශත්කර්මස්ථානයන් දත්නුවණ. | 448 | 163 |
| | 23 පංචාශත්සඞ්ඛ්‍යාතවූඋදයව්‍යය ඥානය. | 448 | ,, |
| | 24 පරඃපංචාශත්විධවූ කුසල්දත් ඥානය. | 448 | ,, |
| | 25 චතුෂ්ෂෂ්ටිවිධවූ කලාශිල්ප දත් ඥාන. | 448 | ,, |
| | 26 සප්ත සප්ත තිවිධඥානය. | 449 | 169 |
| | 27 ඒකෝනනවතිචිත්තයන් දත් ඥානය. | 449 | ,, |
| | 28 ෂණ්ණවතිපාෂණ්ඩසඞ්ඛ්‍යාත පරසමය දත් නුවණ. | 449 | ,, |
| | 29 චතුර්විංශතිකොටිලක්ෂ පරිමිත සමාපත්තීන් දත් නුවණ. | 449 | ,, |
| | 30 සමන්තප්‍රස්ථානයෙහිවූ ඥානය. | 450 | 174 |
| | 31 අපර්‍යන්තවූ ආධ්‍යාශයන් දත් නුවණ. | 450 | ,, |
| | 32 දශපාරමිධර්ම | 451 | 175 |
| | 33 ත්‍රිවිධචර්‍යාය. | 451 | ,, |
| | 34 පංචමහාපරිත්‍යාගය. | 451 | ,, |
| | 35 චතුස්සංග්‍රහවස්තු. | 451 | ,, |
| | 36 චතුරධිෂ්ඨානය. | 451 | ,, |
| | **(10) මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ ජීවමානවවැඩසිටිනකාලය සහ අනාගතසර්වඥයන් නිර්වාණශ්‍රීයටපත්කිරීම.** | | |
| 86 | මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ අසූද හසක්අවුරුදුජීවමානවවැඩසිටීම, ච | | |

| සංඛ්‍යා | ධර්මකොට්ඨාස | ගාථා | පිට |
|---|---|---|---|
| | තුසසත්‍යාදිධර්මයන්පැවත්වීම සහ දිව්‍යමනුෂ්‍යාදිඅසංඛ්‍යගණන් සත්වයන් නිවන්දැකීම. | 452-461 | 176-179 |
| 87 | සංඛාභිධානචක්‍රවර්තිනරේන්ද්‍රයාණන්බුදුසසුන්වැදමහණවීම සහ සියලු පිරිසත්සමගනිවන්දැකීම. | 462-166 | 179-180 |
| 88 | මෛත්‍රෙයසර්වඥයන්වහන්සේදක්නට නොලැබෙනසත්වයෝ. | 466-475 | 180-183 |
| 89 | මෛත්‍රෙයසර්වඥයන්වහන්සේසුවසේ දක්නාසත්වයෝ. | 476-485 | 183-188 |
| | (11) ආශිර්වාදය සහ පුණ්‍යානුමෝදනාව. | | |
| 90 | මෛත්‍රෙයදිව්‍යරාජයාආදිදෙවියන්ට ආශිර්වාදය. | 486 | 189 |
| 91 | මෛත්‍රෙයබොධිසත්වනාථසුරේන්ද්‍රයාණන්වහන්සේටද, ශක්‍රබ්‍රහ්මාදිසියලු දිව්‍යසමූහයාට සහ අවශෙෂ තුන් ලෝකවාසිසත්වයන්ට මෙහිපින් අනුමෝදන්කරවීම. | 487-190 | 189-190 |
| 92 | කර්තෘනාමසංදර්ශනාදිය. | 491-500 | 190-191 |

# මෙතේ බුදුගුණ ලකර

හෙවත්

# මෛත්‍රෙය බුද්ධ ගුණාලඞ්කාරය.

නමඃ ශ්‍රීඝනාය.

—o—

| | |
|---|---|
| 1 සත් සුර සෙවි ස | වන |
| සවග කුලැදුරු පිය | වන |
| දිනුතුරු දුල් රු | වන |
| වදිම් මුනිරජසුනෙර රන | වන |

"ආශීර්නමස්ක්‍රියා වස්තුනිර්දේශො වාපි තන්මුඛම්" යනුයෙන් දක්වන ලද ත්‍රිවිධ කාව්‍යයන් අතුරෙන් නමස්ක්‍රියා පූර්වකවූ **"මෙතේ බුදුගුණ ලකර"** නම් වූ මේ මහා කාව්‍යය රචනා කරන්නාහු සෞම්‍යදෙවතාස්වරූපයෙන් සිටි අනන්ත ගුණරත්නසමුජ්ජ්වලිතවූ බුද්ධ **ධර්ම සඞ්ඝ** යන **රත්නත්‍රය** වදනාහු. **"සත් සුර සෙවි සවන"** යනාදි පද්‍යත්‍රය කීහු.-

1. "මම් **මුනිරජ** සුනෙර වදිම්" යනු මෙහි ක්‍රියාකාරක පද සම්බන්ධයි. මම්, අසමත්තෙමෙ; මුනිරජ සුනෙර, මුනිරාජ නමැති සුමෙරු පර්වතය; වදිම්, නමස්කාර කෙරෙමි. (කෙබඳු මුනිරජ සුනෙරක්ද ? යත්):-

## මුනිරාජ පක්ෂයෙහි :-

සත්, ප්‍රශස්තවූ; සුර, (බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වරාදී) දෙවියන් විසින්; සෙවි, සෙවුනා ලද්දවූ; සව්අග කුල, සියල්ලන්ට අග්‍රවූ කුල ඇති (ශාක්‍යවංශොද්භූතවූ යනු භාවයි); නොහොත්: අග, (තුන් ලොවට) අග්‍රවූ; ඇදුරු, (තුන් ලොවට) ගුරුවූ; සවන, සර්වඥවූ; — සවන, නිල පීතාදි ෂඩ් වර්ණ බුද්ධරශ්මි ඇත්තාවූ; පියවන, (දුටුවන් නෙත් සිත්) ප්‍රිය වන්නාවූ; නොහොත්: සව්කුල පිය වන, ආර්‍යශ්‍රාවක සමූහයාට පිතෘ වන්නාවූ; දුල්, (ද්වාත්‍රිංශද්වර මහාපුරුෂලක්ෂණයෙන්)

2 පිරි තත රස ස    වන
සකලත මිනග නිසි    වන
වර රුවනට හෙ    වන
වඳිම් **සදහම්** සයුර රම    වන

---

බබලන්නාවූ; උතුරු රුවන, උත්තම රත්නවූ; දිනු, (පචමාර යන්) ජයගත්තාවූ; රනවන, සවර්ණවර්ණවූ; **මුනිරජ සුනෙර, මුනිරාජ** නමැති සුමෙරු පර්වතය; වඳිමි, නමස්කාර කෙරෙමි.

පර්වත පක්ෂයෙහි :-

සර්වකුලඇදුරු, (යුගන්ධරාදි) සියලු කුල පර්වතයන්ට; අග, අග්‍රවූ; සවන, ප්‍රශංසා සහිතවූ; සත්, යහපත්වූ; සුර, (ශක්‍රාදි) දෙවියන් විසින්; සෙවි, සෙවුනා ලද්දාවූ (ශක්‍රාදි දෙවියන්ට වාසභූමිවූ යෑ යනු භාවයි); උතුර, සර්වෝත්තර දිශායෙහි; දිනු, ජනිතවූ; උදුල්, උජ්වලවූ; පියවන, චිත්තප්‍රියජනකවූ; රුවන්, රත්නයක්වූ; රනවන, හිරණ්‍ය වර්ණවූ; **මුනිරජ** සුනෙර, **මුනි රාජ** නමැති සුමෙරු පර්වතය; වඳිමි, අභිවාදනය කෙරෙමි.

**සද්ධර්ම** පක්ෂයෙහි :-

2 අනන, අනන්තරහිතවූ (ධ්‍රැවලක්ෂණයුක්තයෑ යි සේයි); රස පිරි, අමෘතරසයෙන්පරිපූර්ණවූ; සවන, (ස්වාක්ඛාතො, භගවතා ධම්මො, ඉත්‍යාදි විසින් ජෙගීයමාන) වර්ණනා සහිතවූ; සකල අත, පිළිපදනා සියල්ලන්ට වැඩ ඇත්තාවූ හෙවත් අර්ථ සිද්ධිය කරන්නාවූ; — සකල අත, සම්නානාර්ථ ඇති; අගමින්, අග්‍රවූ බුද්ධත්වයට; නිසි වන, යොග්‍යවන්නාවූ; නොහොත්: අමින් අග, මාහැයිවූ; වර රුවනට, උත්තමවූ බුද්ධ රත්නයට; හෙවන, හෙතු භූතවූ; **සදහම්** සයුර, **සද්ධර්ම** නමැති සාගරය; වඳිමි, නමස්කාර කෙරෙමි.

සමුද්‍ර පක්ෂයෙහි :-

අනන, අනන්තයා හෙවත් ශෙෂ නම් නාගරාජයා ඇත්තාවූ; —අනන, විෂ්ණු දිව්‍යරාජයා ඇත්තාවූ; නොහොත්: අනනරස, ප්‍රමාණාතික්‍රාන්ත ජලයෙන්; පිරි, පූර්ණවූ; සවන, (ඉන්ද්‍රො පෙන්ද්‍රාදි දෙවියන් විසින් කරන ලද) ප්‍රශංසා සහිතවූ; මිනග, අග්‍රවූ (තිමිඞ්ගලාදි) මත්ස්‍යයන්ට; සකල අත, හාත්පස්හි;

3 දුල් සෙවුමෙන් දි නි දු
සවි ගුණ වොරදනලෙ නි දු
මිණිමුතුවු කෙමෙ නි දු
වදිම් මහසඟ පියුම් සුසි නි දු

---

නිසි වන, ආශ්‍රයස්ථාන වන්නාවූ; වර රුවනට, උත්තම්වූ ශංඛ ශිලාප්‍රවාලාදී සප්ත රත්නයන්ට; හෙවන, හෙතුවූ හෙවත් රත්නාකරවූ; රම වන, මනොනාරම්‍යවූ; සදහම් සයුර, සද්ධර්ම නමැති සාගරය; වදිමි, ප්‍රණාම කෙරෙමි.

**මහා සඞ්ඝ පක්ෂයෙහි:–**

3. දිනිදු, ජිනෙන්ද්‍රයාණන් වහන්සේගේ; සෙවුමෙන්, සෙවනයෙන්; දුල්, ජ්වලිතවූ; සවිගුණ, (ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥාන දර්ශනාදි) සකල ගුණයෙන්; වොරදන විරාජිතවූ; ලෙන්, චිත්තයෙන්; ඉදු, ඍජුවූ; කෙමෙන්, පිළිවෙළින් (ස්‍රොත ආපත්ති ආදි මාර්ග) පරිපාටියෙන්; මිණිමුතුවූ (සංසාර) බන්ධනයෙන් මුක්තවූ; ඉදු, (ත්‍රිවිද්‍යා, ෂඩභිඥා ප්‍රතිසම්භිදා ආදි ගුණ සමායොගයෙන්) සමෘද්ධවූ; සුසිනිදු, (මාන සංරම්භාදීන්ගේ සමූලඝාතනාදියෙන් චිත්තයන් දමන කළ බැවින්) අතිස්නිග්ධවූ; **මහසඟ පියුම්, මහා සඞ්ඝ නමැති පද්ම** සමූහය; වදිමි, නමස්කාර කෙරෙමි.

තාමරස පක්ෂයෙහි:–

දිනිදු, සූර්‍ය්‍යයා; සෙවුමෙන්, සෙවනයෙන් හෙවත් රශ්මියෙන්; දුල්, උජ්ජ්වලිතවූ (ප්‍රබුඬ යනුයි); සවිගුණ, සකල මෘණාල සූත්‍රයෙන්; වොරදන, භ්‍රාජිතවූ; නලෙන්, නාලයෙන්; ඉදු' ඍජුවූ; කෙමෙන්, ක්‍රමයෙන්; මිණිමුතුවූ, ප්‍රබුඬවූ; ඉදු, (වර්ණ ගන්ධ සමායොගයෙන්) සමෘද්ධවූ; සුසිනිදු, අතිස්නිග්ධවූ; **මහසඟ පියුම්, මහා සංඝනමැති පද්ම** සමූහය; වදිමි, වන්දනය කෙරෙමි.

4 සත්අත සහස් නෙ ත
වෙනු ගණිඳු කඳ දිය නෙ ත
ගුරු සඳ කිවි ති නෙ ත
මෙසුර සෙත් දෙත් යොමා දිවනෙත

4 සත්අත, මහාබ්‍රහ්මය; සහස්නෙත, ශක්‍රය; වෙනු, විෂ්ණුය; ගණිඳු, ගණේශය; කඳ, ස්කන්දය; දියනෙත, සූර්යය; ගුරු, බෘහස්පතිය; සඳ, චන්ද්‍රය; කිවි, ශුක්‍රය; තිනෙත, ඊශ්වරය යන; මෙසුර, මේ දෙවතාවෝ; දිවනෙත, දිව්‍යනේත්‍රය; යොමා, යොමු කොට; සෙත්, ශාන්තිය; දෙත්, ප්‍රදානය කෙරෙත්වා !

5 තුනුරුවන් පුද කර
වැඳ මැද සුරන් මෙත් කර
කියනෙම් අදර කර
මෙතේ බුදුගුණලකර කව් කර

5 තුනුරුවන්, රත්නත්‍රය; පුදකර, (මෙසේ) පූජනය කොට; වැඳ, වන්දනය කොට; සුරන් මැද, දෙවියන් මධ්‍යයෙහි; මෙත්කර, මෛත්‍රිය වඩා; අදර කර, ආදර කොට; මෙතේ බුදුගුණ ලකර, මෛත්‍රෙය බුද්ධගුණාලඞ්කාරය; කව්කර, (සිංහල භාෂායෙන්) කාව්‍යබන්ධනය කොට; කියනෙම්, කථනය කරන්නෙමි.

6 මෙම කප මහබ දුරු
මතු වන මෙතේ ලොවැ දුරු
ගුණ වැනුමෙහි සො දුරු
මවැර තෙර පීනනෙව් සමු දුරු

6 මෙම මහබදුරුකප, මෙම මහාභද්‍රකල්පයෙහි; මතු, අනාගතයෙහි; ලොවැදුරු වන, ලොකාචාර්ය වන්නාවූ හෙවත් බුදුවන්නාවූ; මෙතේ, මෛත්‍රෙය නාථයන්වහන්සේ සම්බන්ධවූ; සොඳුරු ගුණ, සුන්දරවූ ගුණය; වැනුමෙහි, වර්ණනා කිරීමෙහි; මවැර, මාගේ උත්සාහය (කෙබඳුද යතහොත්); සමුදුරු, මහාසමුද්‍රයාගේ; තෙර, පාරිමතීරයට; පීනනුළුව්, පීනීමක් වැන්න—

7 ඒ බුදුගුණ ල කර
ගොයුම්ගොත් මුනි ගුණ සර
දෙසූ බණින් මද කර
කියමි මානැණ පමණ වැර සර

7 ඒ බුදුගුණලකර, ඒ මෛත්‍රෙය සම්බුඬයන්වහන්සේ සම්බන්ධී ගුණාලඞ්කාරය; ගුණකර, ගුණයන්ට ආකරවූ; ගොයුම් ගොත් මුනි, ගෞතම ගොත්‍රසම්භූත අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන්වහන්සේ විසින්; දෙසූ බණින්, දෙශනා කරන ලද ධර්මයෙන්; මඳකර, ලෙශමාත්‍රකොට; මා, අසමත්හුගේ; නැණ පමණ, ඥානශක්ති ප්‍රමාණයෙන්; වැර කර, වීර්‍ය්‍ය කොට; කියම්, කථනය කෙරෙම්.

8 මහවියත් කිවි සුරු
වැනූ බණ මෙකව් කළු සුරු
දෙසැතැර නොව මි සුරු
ලබත් ඇසුවෝ නිවන් **යසි සුරු**

8 වියත්, ව්‍යක්තවූ; මහ, පූජ්‍යවූ; කිවිසුරු, කවීශ්වරයන් විසින්; වැනූ, වර්ණනා කරනලද; බණ, ධර්මය; ඇසුරු කළ, ආශ්‍රයකළාවූ; මෙකව්, මේ කාව්‍යයෙහි; දෙස ඇත, යම් කිසි දෝෂයක් විද්‍යමානවූ නමුදු; ඇර, දුරලා; මිසුරු නොව, මාත්සර්‍ය්‍ය නොව; ඇසුවෝ, (මේ ධර්මය) ශ්‍රවණ කළාහු; නිවන් යසඉසුරු, නිර්වාණ යශ-ඓශ්වර්‍ය්‍යය; ලබත්, ලබන්නාහුය.

9 සියපිතින් සා රය
මෙතේබුදු මතුවා රය
වනන ගුණබා රය
ලබව් වියතුනි පල උදා රය

9. වනන, (මෙසේ මා විසින්) වර්ණනා කරනුලබන්නාවූ;- මතුවාරය, අනාගතයෙහි පහළවන; සියපිතින් සාරය, ශත පුණ්‍යශ්‍රීන් සාරවූ; මෙතේබුදු, මෛත්‍රෙයබුදුරජාණන්වහන් සේගේ; ගුණබාරය, ගුණභාරය සම්බන්ධවූ; උදාරය, මහත්වූ; පල, ඵලය; වියතුනි, ව්‍යක්තයෙනි; ලබව්, ප්‍රතිලබ්ධ කරව්.

10 මුනි උවසුව- නි සි නි
**තෙරුවන්** කෙරෙහි වෙසෙ සි නි
පැහැදී විදිලෙ සි නි
කියන බණ මේ අසව් සතොසි නි

10 තෙරුවන් කෙරෙහි, රත්නත්‍රය විෂයෙහි, නිසිනි, නිරන්තරයෙන්; වෙසෙසිනි, විශෙෂයෙන්; පැහැදී, ප්‍රසන්නව; මුනිඋවසුව, බුඬොපාසකව; විදිලෙසිනි, විධිවූ පරිද්දෙන්; කියන, කථනය කරනු ලබන්නාවූ; මේ බණ, මේ ධර්මය; සතොසිනි, සන්තොෂයෙන්; අසව් ශ්‍රවණය කරව්.

11 සව් සතට සෙත දුන්
ගොයුම් මුනි ලෝ ඇස දුන්
බුදුවූ වදනි දුන්
පලමු වසෙහිම සුදෙවුන් ර දුන්

11 සව් සතට, සකල සත්ත්වයාහට; සෙතදුන්, ශාන්ති දානයකළාවූ; ලෝ, ජගත්‍රයවාසී සකල සත්ත්වවර්ගයාගේ; ඇස, ඥාන චක්ෂුෂයට; අඳුන්, (මහාමෝහපටල පාටනයෙහි පටුතර) රසාංජනයක් බඳුවූ; වදනිඳුන්, වාගීශ්වරවූ; ගොයුම්මුනි, අප ගෞතමගෝත්‍රවංශෝද්භූත මුනීන්ද්‍රයාණන්වහන්සේ; බුදුවූ, බුද්ධත්වයට පැමිණුනාවූ; පලමු වසෙහිම, ප්‍රථමසංවත්සරයෙහි දීම; සුදෙවුන්රදුන්, ශුද්ධෝදන රාජෝත්තමයාගේ—(මතුදෙක වහාකුලකයි.)

12 බස් ගෙන කළ න දුන්
කාළුදායිතෙරි දුන්
යැදුමෙන් සග බ දුන්
කිඹුල්වත් පුරවරට පසි දුන්

12 බස් ගෙන, වචනය ප්‍රතිග්‍රහනය කොට; නඳුන්, ප්‍රිය ජනකවූ; කාළුදායීතෙරිඳුන්, කාළුදායීනම්ලත් මහරහතන් වහන්සේ විසින්; කළ, කරන ලද්දාවූ; යැදුමෙන්, ආරාධනායෙන්; සග බඳුන්, ස්වර්ගසදෘශවූ; පසිදුන්, ප්‍රසිද්ධවූ; කිඹුල්වත් පුරවරට, කපිලවස්තු පුරප්‍රවරයට—

(සර්වඥයන්වහන්සේ බුදුවූ වෙසග පොහොදින පටන් දසමාසයක් ගත වන මැදි පොහොදින රජගහ නුවර වේළුවනාරාමයෙන් පිටත්ව හැටදිනක් මග ගෙවා වෙසග පොහොදින කිඹුල්වත්පුරට වැඩමවූසේක )

13 පිරිවරා රහ තුන්
වැඩිය අප මුනිමහ තුන්
ගඳගජෙව් නෑ තුන්
දිරි ඒ රජපිරිස විය තුන්

13 රහතුන්, ක්ෂීණාශ්‍රවයන්; පිරිවරා, පරිවාරකොට; වැඩිය, වැඩමවූ; නෑ ඇතුන්, ඥාති නමැති හස්තීන්ට; ගඳගජෙව්, සුගන්ධහස්තියකු බඳුවූ; විතතුන්, ව්‍යක්තවූ; අප මුනි මහතුන්, අසමත් මුනීන්ද්‍රෝත්තමයාණන්වහන්සේ; එරජ පිරිස, ඒ රාජපර්ෂද; දිරි, දර්ශනයකළා ~~~~

14 නුග නමැති මහ ර ද
ඉසුරෙන් සදිසි සුර ර ද
කැරවූ වෙහෙර ර ද
විසුම් අයැදී නැමද මුනි ර ද

14. ඉසුරෙන්, ඓශ්වර්‍යයෙන්; සුරරද සදිසි, ශක්‍ර සදෘශවූ; නුග නමැති, න්‍යග්‍රොධ යන නාමයක් ඇත්තාවූ; මහරද, මහාරාජෝත්තමයා විසින්; කැරවූ, නිර්මාණය කරවන ලද; වෙහෙර, විහාරයෙහි; අරද, නිරන්තරයෙන්; විසුම, වැඩවාසය කරවදරනු පිණිස; මුනිරද, සර්වඥරාජෝත්තමයාණන්ට; නැමද, අභිවාදනය කොට; අයැදී, (ඒ රාජපතිද් තෙමේ) ආයාචනා කෙළේය.

15 නුග රජුගෙ උ ය නා
කෙලෙන් නෙතු සිතු හ ය නා
නුගඅරම කි ය නා
වෙහෙර වැඩහිඳ අපගෙ දි ය නා

15. නුග රජුගෙ, නිග්‍රොධ රජහුගේ; නෙතු සිතු හයනා, නෙත්‍ර චිත්තාකර්ශනය කරන්නාවූ; උයනා, උද්‍යානයෙහි; කෙළෙන්, සජ්ජිත කළ හෙයින්; නුගඅරම කියනා, න්‍යග්‍රොධාරාමයයි කථ්‍යමානවූ; වෙහෙර, විහාරයෙහි; අපගෙ දියනා, ජගන්නායක අපගේ මුනීන්ද්‍රයාණන්වහන්සේ; වැඩහිඳ, උපවේශනය කොට—(පද්‍යත්‍රයකින් කුලකයි.)

16 පෙර බුදුන් තර මි න්
නෑසිය දමන කර මි න්
සදහම් පවස මි න්
වසන සඳ නෙක අසිරි පා මි න්

16. පෙර බුදුන්, පූර්ව සර්වඥවරයන්ගේ; තරමින්, ප්‍රමාණයෙන් හෝ ආකාරයෙන්; සදහම්, ශ්‍රීසද්ධර්මය; පවසමින්, ප්‍රකාශ කරමින්; නෙක අසිරි, අනෙකාශ්වර්‍යයන්; පාමින්, දක්වමින්; නෑසිය, ඥාති සඞ්ඛ්‍යාත ස්වජනයන්; දමන කරමින්, හික්මවමින්; වසන සඳ, වැඩවාසය කරන කල්හි.—

17 දම් සෙනෙවි නන තු රැ
දරන සැරියුත්හිමි තුරැ
නැඟීසිටැ සබ තු රැ
නමා පැවසී මුනිඳු ලොවුතුරැ

17. දම්සෙනෙවි තනතුරු, ධර්මසේනාපතිස්ථානාන්තරය, දරන, ධාරණය කරන්නාවූ; උතුරු, උතුම්වූ; සැරියුත්හිමි; ශාරිපුත්‍රමහාස්ථවිරයාණන්වහන්සේ; සබතුරු; ඒසභාභ්‍යන්තරයෙන්; නැඟිසිටැ, උත්ථිතවැ; ලොවුතුරු, ලොකොත්තරවූ; මුනිඳු, මුනීන්ද්‍රයාහට; නමා, නමස්කාර කොට; පැවසී, (මෙසේ) ප්‍රකාශ කොළේය ......

18 දුරුකළ බව බි රම්
හිමිසඳුනි ඔබ මන රම්
**ඒ මෙමෙත්** බුදු න රම්
දෙසනු උපදින කලද් කෙත රම්

18. බව බිරම්, භව භීතිය; දුරු කළ, දූරීභූත කළාවූ; මනරම්, මනොරම්‍යවූ; හිමිසඳුනි, ස්වාමීන්ද්‍රයාණනි! ඔබ, පින්වතුන්වහන්සේ; එමෙතේබුදු, (අනාගතයෙහි ලොව පහළ වන්නාවූ) ඒ මෛත්‍රෙය බුදුරජාණන්වහන්සේගේ; නරම්, (ගුණ) ප්‍රමාණය සහ; උපදින කලද, ලොව පහළවන්නාවූ කාලයත්; කෙතරම්, කතිප්‍රමාණද කියා; දෙසනු, දෙශනාකළ මැනවි......

19 එබසසා ලොවැ දු රු
තිබෙන මිණි මහසමු දු රු
පානාමෙන් සො ඳු රු
**අනාවස්** වදහළේ සුම දු රු

19. ලොවැදුරු, ලොකාචාය්‍ය (සම්‍යක්සම්බුද්ධ) යන්වහන්සේ; එබස, ඒ වචනය; අසා, ශ්‍රවණය කොට; මහසමුදුරු තිබෙන, මහාසමුද්‍රස්ථවූ; සොඳුරු, සුන්දරවූ; මිණි, මාණික්‍යයන්; පානාමෙන්; ගෙනහැර දක්වන්නාක්මෙන්; සුමදුරු, අති මධුරවූ; අනාවස්, අනාගතවංශ ධර්මය; වදහළේ, දේශනා කළසේක......

20 දනු සැරියුත් ස ව් ග
මගෙ මේ සසුන තිලො ව ග
නොනැසී දෙන සු ව ග
පවත්නේ පන්දහස් වස් ව ග

21. අග සව් සැරියුත්, අග්‍රශ්‍රාවකවූ ශාරිපුත්‍රය! අගසුව, අග්‍රශ්‍රීසම්පත්තිය හෙවත් නිර්වාණසෞඛ්‍යය; දෙන, දානයකරන්නාවූ; තිලොවග ත්‍රෛලොකාග්‍රවූ; මගෙ, අසමත්හුගේ; මේ සසුන, මේ ශාසනය තෙමේ; වස්වග, වර්ෂ සඞ්ඛ්‍යාවෙන්; පන්දහස්, පඤ්චසහස්‍රයක්; නොනැසී, අවිනෂ්ටව; පවත්නේ, ප්‍රවර්තනය වන්නේයයි; දනු, ජානනයකරනු......

21 ඉන් පසුව ස　සි රි
බුදුවරු නොවෙති අ　සි රි
කලක් ඉන් දු　සි රි
කරන සත ඇතිවේය නි　සි රි

21. ඉන් පසුව, තදනන්තරව; අසිරි, ආශ්චර්‍ය්‍යමත්වූ; සසිරි, සශ්‍රීකවූ; බුදුවරු, සර්‍වඥවරයෝ; නොවෙති, අවිද්‍යමාන වන්නාහ; ඉන්, එසේහෙයින්; දුසිරි කරන, දුශ්චරිත කරන්නාවූ; සත, සත්වයන් ඇති; නිසිරි, නිඃශ්‍රීකවූ; කලක්, කාලයක්; ඇතිවේය, විද්‍යමාන වන්නේය.

22 එම පව්කම් බෙ　ලෙ න්
පින්නැති සතගෙ දුබ　ලෙ න්
රා දෙස් මොහ ම　ලෙ න්
මදින් මඳ ආ පිරිහි අක　ලෙ න්

22 පින්නැති, කරන ලද පුණ්‍යකර්‍මයන් නැත්තාවූද; රා දෙස් මොහ, රාගද්වෙෂ මොහ නමැති; මලෙන්, කිලිෂ්ටයෙන් යුක්තවීම කාරණ කොටගෙනද; දුබලෙන්, දුර්‍බලත්වයෙන් යුත්; සතගෙ, (එකල ලෝවැසි) සත්වයාගේ; එම, උක්තප්‍රකාරවූ; පව්කම් බෙලෙන්, පාපකර්‍මයාගේ බලය කාරණකොටගෙන; මදින් මඳ, ස්වල්පයෙන් ස්වල්පය; අකලෙන්, අකාලයෙහි; ආ, ආයුෂය; පිරිහි, පරිහීනව — (මතුකව හා කුලකයි.)

23 දස වස් වෙයි　ව ය ස
එකල සත් නැති සු　ව ය ස
ලිය පස්වා　ව ය ස
සරණගති කුමරුවෙක් එ　ව ය ස

23 එකල, තත්කාලයෙහි; යස සුව, යස සහ සුඛය; නැති, නැත්තාවූ; සත්, ඒ සත්වයන්ට; වයස, ආයුෂය තෙම; දසවස් වෙයි, දශවර්‍ෂසංඛ්‍යාත වන්නේය; පස්වා, පඤ්චවර්‍ෂයකින් යුත්; වයස, වයස් ඇති; ලිය, ස්ත්‍රිය; එවයස, යථොක්ත වර්‍ෂසංඛ්‍යාවෙන්යුත්; කුමරුවෙක්, කුමාරයෙක් තෙමෙ; සරණගති, සරණපාවාගන්නේය.

24 මවුය බුහුතන්　පි ය
සොහොවුරු දුදරු නැ　පි ය
නොහැර සාර රා　පි ය
සරත් සාමිසසරය පා　පි ය

24 මවුය, මෑණියෝය; පිය, පියාය; සොහොවුරෑ, සහෝදරයෝය; බුහුනන්, සහෝදරියෝය; දුදරු, පුත්‍ර දුහිතෲය; පිය නෑ, ප්‍රියවූඥාතීන්ය යන මොවුන්පවා; නොහැර, වර්‍ජිත නොකොට (විචාර රහිතවූ); රූ පියකර, රූගාලයකොට; පාපිය, පාපිෂ්ඨවූ; කාමමිස සරය, කාමමිථ්‍යාචාරය; කරත්, කරන්නාහුය.

25 සුවඳැල් මෙනේ රි ය
වී මූං නොවඩි වැපි රි ය
ඉන් නොවෙ රස පි රි ය
බොදුන් රද වරසහල් අපි රි ය

25 වැපිරිය, වපනය කරන ලද්දවූ; සුවඳැල්, සුගන්ධ ශාලිය; මෙනේරිය, කොද්‍රව හෙවත් මෙනේරිය; වී, ව්‍රිහිය; මූං, මුද්ගය යන (ධාන්‍ය සමූහය); නොවඩී, වර්ධනය නොවන්නේය; ඉන්, එහෙයින්; පිරිය, රුචිවූ; රස, රසයෙක්; නොවෙ, නොමැති වන්නේය; අපිරිය, අරුචිවූ; වරසහල්, වරුසාලේ බත්; රද බොදුන්, රාජභොජන වන්නේය.

26 එවර නර වි සි නී
කරන තිදෙරින් දෙ සි නී
කම්විවා වි සි නී
පවම උලැඟිව කෙමෙන් ගො සි නී

26 එවර, තත්කාලයෙහි; නර විසිනී, මනුෂ්‍යයන් විසින්; තිදෙරින්, (කාය, වාග්, මනඃ යන) ද්වාරත්‍රයෙන්; කරන, කරනු ලබන්නාවූ; දෙසිනී, දෙෂය හෙතු කොට ගෙන; කෙමෙන්, ක්‍රමයෙන්; පවම, පාපකර්මයම; උලැඟිවගොසිනී, උත්සන්නව ගොස්; කම්විවා විසිනී, (අවසර ලද) කර්මවිපාකවශයෙන්— (මතුකාව හා කුලකයි.)

27 අනිසදම්විල සි න්
ලොවැ තිවිදකප්වන සි න්
සැත්ඇත්කප්වි සි න්
නසී කප සහ දනන් වෙසෙසි න්

27 අනිස දම් විලසින්, අන්‍යාය ධර්මයවූ පරිද්දෙන්; ලොවැ, ලොකයෙහි; තිවිද කප් වනසින්, (රොගාන්තඃකල්පය, ශස්ත්‍රාන්තඃකල්පය, දුර්භික්ෂාන්තඃකල්පය යන) ත්‍රිවිධ කල්ප විනාශයන් අතුරෙන්; සැත්ඇත්කප් විසින්, ශස්ත්‍රාන්තඃකල්ප වශයෙන්; දනන් සහ කප, ලෝවැස්සන් හා සමඟ කල්පය; වෙසෙසින්, විශෙෂයෙන්; නසී, විනාශවන්නේය.

28 සැතැත් කප් බිය දර
සත්දිනක් පෙරදි අ දර
දෙවියෙක් කමව දර
දරා වෙස් අවමඟුල් කර දර

28 බියදර, භයංකරවූ; සැත්ඇත්කප්, (යථොක්‍ත) ශස්ත්‍රාන්තඃකල්ප විනාශය (පටන්ගැන්මට); සත්දිනක් පෙරදි, සප්තාහයක් ප්‍රථමයෙන්; අදර, ආදර ඇති; කමවදර දෙවියෙක්, කාමාවචර දෙවතයෙක්; කරදර, බෙද ජනකවූ; අවමඟුල් වෙස්, අවමංගලවෙෂයක්; දරා, ධාරණය කොට ගෙන –(මතුකව හා කුලකයි.)

29 සරමින් කුස අ හස්
සක්වළෙහි කෙළසුව හස්
ගොසකර සසෙනෙ හස්
කියයි මෙම බස් මහත් අනු හස්

29 කෙළසුවහස්, කොටිලක්‍ෂ පරිමිතවූ; සක්වළෙහි, චක්‍රවාලාභ්‍යන්තරයෙහි; අහස් කුස, ආකාශකුක්‍ෂියෙහි; සරමින්, සංචාරය කරමින්; සසෙනෙහස්, සෙනහාධ්‍යාශ සහිත; ගොසකර, ඝොෂය කොට; මහත් අනුහස්, මහානුශංසවූ (මහත් වැඩදායකවූයැ යූ සේයි); මෙම බස්, මේ වචනයන්; කියයි, කථනයකරයි.

30 ලෝවැසියෙනි අ සනු
අදපටන් සතියව සනු
වැස්සෙක් මියුල් සනු
වසී එනොහැකි තොපට ඉවස නු

30 ලෝවැසියෙනි, ලොකවාසියෙනි; අසනු, ශ්‍රවණය කරව්; අද පටන්, මෙදවස් සිට; සතිය, සප්තාහයක්හුගේ; අවසනු, අවසානයෙහි; මියුල්සනු, මෘගසංඥ ඇත්තාවූ; වැස්සෙක්, වර්‍ෂණයක්; වසී, වස්නේය; තොපට, තොප විසින්; එ, ඒ වර්‍ෂණය තෙමේ; ඉවසනු නොහැකි, අධිවාසනය කළ නොහැක්කේය.

31 තෙමියෝ එවැ ස්සෙන්
පෙනෙති මිගසෙන් ලෙ ස්සෙන්
හද තද සරො ස්සෙන්
ඇත මරති උන් උන් මිගස් සෙන්

31 එවැස්සෙන්, ඒ වෘෂ්ටියෙන්; තෙමියෝ, තෙමුණාහු; මිගසෙන් ලෙස්සෙන්, මෘග සමූහයන් පරිද්දෙන්; පෙනෙති, දෘශ්‍යමාන වෙත්; හද, සිත්හි; තද, දැඩිවූ; සරොස්සෙන්, රොෂ සහිතව; ඇන, (අවි) පහරදී; උන් උන්, ඔවුනොවුන්; විගස් සෙන්, එක්ෂණයෙක්හි; මරති, දිවිවිනාශකරත්.

32 මෙබස් සිත ද ර ණ
කර ගෙන හැම උවා ර ණ
එසත් දින මා ර ණ
සිටිව් නොතෙමී මෙතිනි පූ ර ණ

32. මෙබස්, මේ වචනයන්; සිත, සිත්හි; දරණ කර, ධාරණය කොට; හැම උවාරණ, සකල උපකරණයන් (කන බොනදෑ); ගෙන, ග්‍රහණයකොට; මාරණ, මරණාසපදවූ; එසත් දින, යථොක්ත සඪග්‍රාහයෙහි; නොතෙමී, ඍතිමිතනොවැ; පූරණ, පරිපූර්ණවූ; මෙතිනි, මෛත්‍රීන් (යුක්තවැ); සිටිව්, (යෙහෙන්) ස්ථිතිකරව් !

33 එදෙව් බස් ගත ර ක්
නොකර සමහරැ අද ර ක්
නොදැන එහි අස ර ක්
කරත් තම තම සිතු අයු ර ක්

33 අරක්ගත්, ආරක්ෂාග්‍රහණය කළ; එ දෙව්, ඒ දෙවි යන්ගේ; බස්, ඒ උක්තප්‍රකාර අවවාදයට; සමහරැ, ඇතම් කෙනෙක්; අදරක්, ආදරයක්; නොකර, නොකොටම; එහි, ඒ වැඩදැයක අවවාදයෙහි; අසරක්, අභ්‍යන්තර විචාරයක්; නොදැන, නිශ්චයප්‍රාප්තනොවැ; තම තම, තම තමන් විසින්; සිතු, චින්තනය කරන ලද; අයුරක්, ආකාරයක්මැ (යමක් කැමැතිද එයම); කරත්, කරන්නාහුය.

34 පින් ඇති ඇතම් ස ත්
ඉවසා මෙදෙව් බස ස ත්
ලද තරම් පොහො ස ත්
උවාරණ උපයමින් තිදෙ ස ත්

34 පින්ඇති, පින් ඇත්තාවූ; ඇතම් සත්, සමහර සත්ව කෙනෙක්; සත්, සත්‍යවූ; මෙදෙව් බස, මේ දෙව වාක්‍යය; ඉවසා, ප්‍රතිග්‍රහණය කොට; ලද, ලබ්ධවූ; පොහොසත් තරම්, ශක්ති ප්‍රමාණයෙන්; තිදෙසත්, නිද්දොෂයෙන් නොහොත් දොෂ රහිතව; උවාරණ, උපකරණයන්; උපයමින්, සම්පාදනය කරමින්—(මතුකාව හා කූලකයි.)

35 තනිවම බිය කා   ර ත
ගල්ගුහා ගිරිදූදු   ර ත
පිවිසී කල ස   ර ත
වසී කී වැසි දෙරණ උතු   ර ත

35 බිය කරත, භයංකරවූ; ගල්ගුහා, පර්වත ගුහාවන්හා; ගිරිදූදුරත, පර්වත ජර්ජරයන්හි; පිවිසී, ප්‍රවෙශව; තනිවම, හුදකලාවම (එක් එක් අයකුබැගින්); සරත කල, වාසය කරන්නාවූ කාලයෙහි; දෙරණ, ධරණී තලය; උතුරත, ඉතිරී යන්නාවූ; කී, කියනලද; වැසි, වෘෂ්ටිය; වසී, වස්නේය.

36 එ වැසි සත ස   ත ර ය
සත් දිනක්තුර නි   ත ර ය
දහරෙන් අර   ත ර ය
වසී මුළුසක්වළෙහි ප   ත ර ය

36 සත, සත්ත්වයාහට; සතරය, ශත්‍රුවූ; එවැසි, ඒ මෘග සත්වර්ෂාව; සත් දිනක්තුර, සප්තාහයක් අතරෙහි; නිතරය, නිරන්තරයෙන්; අරතරය, මහත්වූ; දහරෙන්, ධාරානිපාතයෙන්; මුළු සක්වළෙහි, සකල චක්‍රවාලයෙහි; පතරය, පැතිරී; වසී, වස්නේය

37 තෙමුණ උන් අති   සි ව
පෙනී තිරිසන් සදි   සි ව
දෙඅත අවි දිලි   සි ව
මරා ගතිති උනුන් සැහැ   සි ව

37 අතිසිව, අයොග්‍යාකාරව; තෙමුණ උන්, ශෝනමයවූ සත්වයෝ; තිරිසන් සදිසිව, තිරශ්චීනයන් පරිද්දෙන්; පෙනී, දෘශ්‍යමානව; අවි, ආයුධයන්ගෙන්; දෙඅත, හස්තමය; දිලිසිව, දිලිසෙමින්; උනුන්, ඔවුනොවුන්; සැහැසිව, සාහසිකව; මරා ගතිති, ඝාතනය කරගන්නාහුය

38 තණ පරණලා   ප ත්
ආදිය මෙදිය වී   ප ත්
ආවුද බවට   ප ත්
වෙමින් පවතිත් දිදී නෙවි   ප ත්

38 තණ, තෘණපත්‍ර හා; පරණ ලාපත් ආදිය, ශුෂ්කපත්‍රාදිය; මෙදිය, මේ උක්තප්‍රකාර වෘක්ෂජලයට; පත්වී, ප්‍රාප්තවැ; ආවුද බවට, ආයුධස්වරූපයට; පත් වෙමින්, පැමිණී; නෙවි පත් දිදී, නොයෙක් විපත්ති දානය කොට කොට; පවතිත්, පවත්නාහ.

39 විස වැසි බයං කර
නර ලෝසතුන් බුන් කර
එක ලේ මුහුද කර
නවති සත් කළ කමුන් හෙළිකර

39 බයංකර, භීතිකරවූ; විස, විෂමයවූ; වැසි, ඒ වෘෂ්ටි තොමෝ; නර ලෝසතුන්, මනුෂ්‍ය ලොකසත්වයා; බුන්කර, භින්න කොට; එක ලේ මුහුදකර, අසහායරුධිරසාගරයක් කොට; සත්, සත්වයා විසින්; කළ කමුන්, කෘත පාපකර්මයන්; හෙළිකර, ප්‍රකාශ කොට; නවති, නිවෘත්ත වන්නීය.

40 රකුණු නෑ අත් නැති
එලිබැස එපා අත් නැති
මළවුන්ගෙ අත් නැති
කදන් පස් යටකරත් අත් නැති

40 නෑ අත්නැති, ඥාතීන්ගේ ආතම්වලින් තුරන්ව හෙවත් ඥාතීන් රහිතව; රකුණු, රක්ෂිතව සිටියාවූ සත්වයෝ; එලි බැස, බහිර්ගතව; එඅත් පා නැති, ඒ හස්ත පාදයන්ගෙන් වියුක්තවූ; අත් නැති, අර්ථාවහනොවන්නාවූ (නිෂ්ඵලවූ); අත් නැති, කෙළවරක් නැති; මළවුන්ගෙකඳන්, මෘතශරීරයන්; පස් යට කරත්, පාංශුයෙන් ප්‍රතිච්ඡන්න කරන්නාහුය.

41 ලෝ පත් වූ සසරෙහි බය
ඒ සත් දූනගත් දුල බය
දෙ‍ෝ සත් සිත් මැඩ අසු බය
බෝසෙත් මෙත් වඩා ලො බය

41 ලෝපත්වූ, ලොකයට පැමිණියාවූ; සසරෙහි බය, සංසාර භීතිය; දූනගත්, ජානනය කළාවූ; ඒ සත්, ඒ සත්වයෝ; අසුබය, අශොභනවූ; දෙ‍ෝසත්, දොෂයන්ගෙන් යුත්; සිත්, චිත්ත සන්තානයන්; මැඩ, මර්දනය කොට; බෝ සෙත්, අධික ශාන්තියෙන් යුත්; දුලබය, (එකල්හි) දුර්ලභවූ; මෙත්, මෛත්‍රියෙහි; ලොබය, ආලය; වඩා, වර්ධනය කරමින්.—(මතුකාව හා කුලකයි)

42 වෙසෙසින් මින් මතුදක් වන
විලසින් උන් උන් තොස් වන
දෑහැමින් සිල් රැකතුම් වන
වඩවන් නෝ මෙලෝ දෙ වන

42 මින් මතු, මෙයින් මත්තෙහි; වෙසෙසින්, විශෙෂ යෙන්; දක්වන, ප්‍රකාශ කරන්නාවූ; උන් උන්, ඔවුනොවුන්; තොස්වන විලසින්, ප්‍රියවන ආකාරයෙන්; දැහැමින්, ධාර්මිකව; උතුම්වන, උත්තමවූ; සිල්, ශීලය; රැක, රක්‍ෂණය කොට; මෙලෝ, මේ ලොකය; දෙවන, ද්විතීය වාරයෙහි; වඩවන්නෝ, වර්ධනය කරවන්නෝය.

**ප්‍රථමසඟිගය සමාප්තයි.**

———०ः०———

43 සත දිවි වනස නුදු
පර දන සොරා හර නුදු
පරදර රා බො නුදු
මෙසිවු පව් සිදුවේය කායි නුදු

43 සත, සත්වයාගේ; දිවි වනසනුදු, ජීවිත විනාශය කිරීමද; පරදන, අන්‍යසන්තකවූ වස්තුව; සොරා හරනුදු, සොර සිතින් ගැනීමද; පරදර, පරදාරාභිගමනයද; රා බොනුදු, සුරා පානයකිරීමද යන; මෙසිවු පව්, මේ පාප චතුෂ්කය; කායිනුදු, (මෙහි 'දු' යනු පදපූරණාර්ථයෙහි නිපාතයි.) කායවාරයෙන්; සිදුවේය, සිඩ වන්නේය.

44 මුසා පැවසී මත්
පරුස පෙහෙසුන් කී මත්
අවැඩ බස් දෙඩූ මත්
මෙසිවු පව් වේ බසින් විස මත්

44 මුසා පැවසීමත්, මෘෂා (බොරු) කථනයද; පරුස, පරුෂ වචනයද; පෙහෙසුන් කීමත්, පිශුන වචනකථනයද; අවැඩ බස්, අනර්ථාවහ නොවන්නාවූ වචන (ප්‍රලාප); දෙඩුමත්, කථනයද යන; මෙසිවු පව්, මේ පාප චතුෂ්කය; විසමත්, විෂමවූ; බසින් වේ, වාග්වාරයෙන් වන්නේය

45 අන් සැපත රි ස්සය
සතවෙත මෙනෙහි රෝ ස්සය
මිසදිටු විල ස්සය
මෙතුන් පව් සිදුවේ මන ස්සය

45 අන් සැපත, මෙරමා සැපතෙහි; රිස්සය, (අභිධ්‍යා සඞ්ඛ්‍යාත) ආශාවද; සතවෙත, සත්වයා කෙරෙහි; මෙනෙහි, චින්තායෙහි; රොස්සය, ව්‍යාපාදයද; මිසදිටු විලස්සය, මිථ්‍යා දෘෂ්ටික විලාශයද හෙවත් පැවත්මද යන; මෙතුන් පව්, මේ පාපත්‍රය; මනස්සය, මනොවාරයෙන්; සිදුවේ, සිද්ධවන්නේය.

46 සතකු බව හැඟු මය
නසනුව මනුපකම මය
සියතබද මැරු මය
පළමු සිකපද පසඟ වේ මය

46 සතකුබව, සත්වයකු බවද; හැඟුමය, (සත්වයෙකැයි) ජානනය කිරීමද; නසනුව මන, මාරණය කරන පරිද්දෙන් ගන්නා චිත්තයද; සියතබද, ස්වකීය හස්තප්‍රතිබද්ධවූ; උපකම මය, මරණප්‍රයොගයද; මැරුමය, ජීවිතයාගේ තොරවීමදැයි (මෙසේ); පළමු සිකපද, ප්‍රථම ශික්ෂාපදය හෙවත් එහි ව්‍යතික්‍රමය; පසඟ වේමය, පඤ්චාඞ්ගයකින් යුක්ත වන්නේය.

47 අණ බාරගැන් මය
කරනු පෙරගින් නිය මය
හැර තමබදක මය
සතර අඟ සඟ අණත් සත මය

47 අණ, සත්වඝාතනය පිණිස අන් කිසිවක්හට) ආඥා කිරීමද; බාරගැන්මය, (ඒ ආඥප්තයා විසින් එය) ප්‍රතිග්‍රහණය කිරීමද; කරනු නියමය, (ඒ) නියොගය කිරීමද; පෙරගින්, පූර්වොක්තවූ අඞ්ගයන්ගෙන්; හැර තමබදකමය, තමන්ගේ ප්‍රතිබද්ධකම හැර; සතර අඟ සඟ, අඞ්ගචතුෂ්කය හා සමග; අණත්, (ප්‍රථම ශික්ෂායෙන් සිද්ධවන) නියොගයද; සතමය, සප්තාඞ්ගයක්ම ඇත්තේය.

48 අන් අයසතු ද නය
හැඟුමද ඒ සොරම නය
ගැනුමත් පියෝ නය
දෙවැනි සිකපද පසඟ ගණ නය

48 අන් අයසතු, අන්‍යායත්ත; දනය, වස්තුවද; හැඟුමද ඒ, (අන්‍යසන්තක භාවය) දැනීමද; සොරමනය, චෞර චිත්තයද; පියෝනය, ප්‍රයොගක්‍රමයද; ගැනුමත්, (ඒ ප්‍රයොගයෙන්) ගැන්මදැයි; දෙවැනි සිකපද, විතීය ශික්ෂාපදය හෙවත් එහි ව්‍යතික්‍රමය; පසඟ ගණනය, පඤ්චාඞ්ගයකින් පරිමිත වේ.

49 අණ පිළිගැනී ම ත්
එලෙසේ ඔහු කිරි ම ත්
හැර අත්උවකු ම ත්
සමඟ සිවුඅඟ සතගි තිය ම ත්

49 අණ, ආඥප්තියද; පිළිගැනීමත්, එය ප්‍රතිග්‍රහණය කිරීමද; ඔහු, ඒ ආඥවනලද්දහු විසින්; එලෙසේ කිරිමත්, ඒ ඇණවූ පරිදි කිරීමද; අත් උවකුමත්, (පූජෝපකතාවූ) සවාහස්තික උපක්‍රමයද; හැර, වර්ජිත කොට; සමඟ සිව්අඟ, ඒ (අවශෙෂ) අඞ්ගචතුෂ්ටය හා සමඟ; තියමත්, (විනීය ශික්‍ෂා යෙන් සිදුවන) ආඥප්තියදූසි; සතගි, සප්තාඞ්ගයක් ඇත්තේය.

50 අන්සතු තැනැ ත් තී
රිසිවසුම සෙවුමැ ත් තී
මඟතිමිඟ ග ත් ති
සතර අඟ පරදර යු ත් තී

50 අන්සතු තැනැත්තී, (මාතෘරක්ෂිතාදි විංශතිප්‍රකාර) අන්‍යායත්ත ස්ත්‍රියද; ඉවසුම, මෛථුනය ඉවසීමද; ඇත්තී, ඒ ස්ත්‍රිය පිළිබඳව; රිසිසෙවුම, සෙවනෙච්ඡාවද; මඟතිමඟ ගත්තී, මාර්ගයෙන් මාර්ගය ග්‍රහණය කිරීමදූසි යන; පරදර, පරස්ත්‍රී සෙවන කාමීය; සතර අඟ යුත්තී, චතුරඞ්ගයකින් යුක්ත වන්නේය.

51 බොරුව සිතු සඟ ව න
එලෙසේම බස් පළ ව න
ඇසුවො දැනුමැති ව න
මුසා වෙයි සතරගින් දෙස ව න

51 බොරුව, මෘෂාභූතයද; සඟවන සිතු, විසංවාදන චිත්ත යද; එලෙසේම, ඒ සිතු ආකාර; බස් පළවන, වචන ප්‍රකාශ කිරීමද; ඇසුවො, එය ශ්‍රවණය කළාහුගේ; දැනුම් ඇතිවන, තදර්ථවිජානනයෙන් යුක්තවීමදූසි යන; දෙසවන, දෝෂ සහිත; මුසා, මෘෂාවාදය; සතරඅඟින් වෙයි, චතුරඞ්ගයෙන් සිඬවන් නේය.

52 රා බව රිසියු ම ද
බොනු ඊට තැත් කිරු ම ද
යළි එයින් බී ම ද
මෙසිවු අඟ පානයට වේ ම ද

ප

52 රාබව, සුරාවක් බවද හෙවත් මස් කරන සුරා මෙරය යන දෙවර්ගයට අයිති ද්‍රව්‍යයක්වූ බවද; බොනුරිසියුමද, පානයට රුචිකිරීමද; ඊට නැත් කිරුම ද, පානයට සුදුසු ව්‍යායාමය කිරීමද; යළි, නැවත; එයින්, ඒ උත්සාහයෙන්; බීමද, පානය කිරීමද යන; මෙසිවු අඟ, මේ අඞ්ගචතුෂ්කය; මද පානයට වේ, මද්‍ය පානයට ඇතිවන්නේය.

53 සිත සමගි වැන සුම්
නොහොත් තම පියසැල සුම්
දැනුම ඔහු පැව සුම්
සතැත පෙහෙසුන් සිවඟි සාරු සුම්

53 සමගි වැනසුම්, සාමග්‍රිය විනාශ කරවන හෙවත් හෙද කරවනු (කැමැති); සිත, චිත්තයෙන් හෝ; නොහොත්, එසේ නොවීනම්; තම පියසැලසුම්, තමහට ප්‍රිය භාවය සැලැස් වීමද; (අන්‍යයන් හෙද කරවන අදහසින් හෝ-තමන්ට ප්‍රිය භාවය සැලැස්වීමට හෝ, මේ දෙකින්ම යුක්තවීමෙන් හෝ-එකක්න් පමණක් යුක්තවීමෙන් හෝ) දැනුම, (අසන්නාහුගේ) විජානනයද; ඔහු, ඒ ශ්‍රවණය කරන තැනැත්තේද; පැවසුම් සතැත, වාග්ව්‍යාපාරය හා සමග්‍රව; පෙහෙසුන්, පෛශුන්‍යය හෙවත් කේලාම් කීම; සිවඟි, චතුරඞ්ගයකින් යුක්තවන බැවි; ඇසුම්කර, ශ්‍රවණය කරව.

54 සතෙකි බස ව දිනා
ඔහුට කිපි සිත් න දිනා
එලෙස බැණ සෙ දිනා
තුනඟි රළු බස් දනිව් සො දිනා

54 බස වදිනා, වචනය සිතට ප්‍රවිෂ්ටවන්නාවූ; සතෙකි, සත්වයෙක්ද; ඔහුට, ඒ පුද්ගලයාහට; නදිනා, රළු කොට; කිපි සිත්, කුපිත චිත්තයෙන් යුක්තවීමද; එලෙස, එපරිද්දෙන්; සෙදිනා, සුහුවම; බැණ, අක්‍රොශ කිරීමදැයි; රළු බස්, පරුෂ වචනය තෙමෙ; තුනඟි, අඞ්ගත්‍රයක් ඇත්තේයයි; සොදිනා, සුන්දරාකාරයෙන්; දනිව්, ජානනය කරව්

55 රමයණ බරනැ යන
මුල්වූ දෙඩුමැතැයි යන
එම හිස් බස් කි යන
නිරත තෙපුලට දෙඅඟකැයි යන

55 රමයණ බරතැ යන, රාමායණ භාරත (කථා)යනාදිය අනාගතවූ; මුල්වූදෙඩුම් ඇතැයි යන, කථාවක් පෙරදූරිකොට ඇත්තේයයි යන බවද; එව හිස් බස්. ඒ අඞ්ගානිත නොවූ කථාවන්; කියන, කථනයදූයි; යන, යනාදි; නිරත තෙපුලව, සම්ප්‍රලාප වචනයට; දෙඅඟකැයි, අඞගවයක් ඇත්තේයි.

56 අන්සතු දෙය ඇ දින
උන්ට නොලැබී කිසි දින
මට වේ වයි වි දින
ලෝබ සිත දෙඅහක්ය වර දින

56 අන් සතුදෙය, අන්‍යායත්ත භාණ්ඩයකැයි; ඇදින ජානනයද; කිසි දින, කවර දිනකවත්; උන්ට නොලැබී, ඔවුන්හට ප්‍රතිලාභ නොවී; මට වේ වයි විදින, තමහට ලැබේ වයි කියා විඥනය කිරීමද හෙවත් රුචිකිරීමදූයි; වරදින, වරදවා ගන්නාවූ ලෝබ සිත, ලොභ චිත්ත ය හෙවත් අභිධ්‍යාව; දෙඅහක්ය, අඞගවයකින් යුක්තවේ.

57 සතුකු බව දන් මින්
යම් කිසි වෙරක් පා මින්
නැසෙව ඔහු සිත මින්
ගත් වනස් මත දෙඅගි නිය මින්

57 සතකුබව, සත්වයකු බවද; දන්මින්, (සත්වයේකැයි) ජානනය කරමින්; යම් කිසි, අනියතවූ; වෙරක් පාමින්, වෛරයක් දක්වමින්; ඔහු, ඒ සත්වයා; නැසෙව සිතමින්, ජීසාංසාවදූයි; ගත් වනස් මත, ග්‍රහණය කළ විනාශ චින්තාව (ව්‍යාපාදය); නියමින්, නියමයෙන්; දෙඅගි, අඞගවයක්වේ.

58 නොතතු නොවු සම් දිටු
සිතු නැතහේඅකිරි දිටු
එලෙසින් දත් කු දිටු
මෙසේ දෙඅගින් වේය මිස දිටු

58 නොතතු, අතථ්‍යයවූ; නොවු සම්දිටු, සම්‍යක් දෘෂ්ටි සහගත නොවූ; සිතු. චින්තනය කළාවූ; නැහහේඅකිරිදිටු, නාස්තික අහෙතුක අක්‍රිය යන වාදත්‍රයෙන් යුක්තවූ දෘෂ්ටියද; එලෙසින්, ඒ චින්තනය කළ පරිද්දෙන්ම; දත් කුදිටු, කුදෘෂ්ටි භාවය හැඟීමදූයි; මෙසේ, මෙපරිද්දෙන්; දෙඅගින්, අඞගවයකින්; මිසදිටු, මිථ්‍යාදෘෂ්ටි නොමෝ; වේය, සිඩවන්නීය.

59 කි මෙ පවෙකොළො සය
කළෝ ලැබ වද නෙවි සය
විඳකල මර දෙ සය
වැටෙත් නිරයේ දුකින් විව සය

59 මෙකි, පූර්වොක්තවූ; එකොළොසය, එකාදශවිධවූ; පව්, පාප කර්මයන්; කළෝ, ආචීර්ණ කළාවූ සත්වයෝ; නෙවි සය, අනෙක විෂයවූ; වද, වධබන්ධනයන්; ලැබ, අනුභව කර; අකල මර, අකාල මර; දෙසය, දෙෂයන්; විඳ, වින්දනය කෙරෙමින්; නිරයෙහි, නරකයෙහි; දුකින්, දුඃඛයෙන්; විවසය, ආශ්වාද රහිතවැ; වැටෙත්, පතිතවෙත් ......

60 හෙ ල් ල මුගුරුද ගෙ න
අ ල් ල අල්ලා පැන ගෙ න
බෙ ල් ල පාගා ගෙ න
ගොල් ල යම මුව දමති ගිනි ගෙ න

60 හෙල්ල මුගුරුද, හෙල්ල සහ මුද්ගරයන්ද; ගෙන, ග්‍රහණය කොට; පැන ගෙන, ප්‍රවනය කරමින්; අල්ල අල්ලා, ප්‍රග්‍රහණය කොට කොට; බෙල්ල, කණ්ඨය; පාගා ගෙන, පාද යෙන් ආක්‍රමණය කොටගෙන, යමගොල්ල, යමපාල සමූහයෝ; ගිනිගෙන, වහනිය රැගෙන; මුව, (ඒ සත්ත්වයන්ගේ) මුඛයෙහි; දමති, ප්‍රක්ෂෙප කෙරෙත් ......

61 මෙමිලස් අනෙක ව ද
විඳ මිදී ඉන් ආ ව ද
තිරිසන් පේත ව ද
බොහෝ කල් දුක් ලබත් පසු ව ද

61 මෙවිලස්, මේ උක්තප්‍රකාර වූ; අනෙක වද, නානා වධබන්ධනයන්; විඳ, විඳිනය කරමින්; ඉන්මිදී, එයින් මුක්තව; ආවද, ප්‍රත්‍යාගමනය කළේවී නමුදු; තිරිසන්පේතවද, තිර්යක් ප්‍රෙත ව; පසුව ද, පශ්චාත්කාලයෙහිදු; බොහෝ කල්, අධික කාලයක්; දුක් ලබත්, දුඃඛයන් ලබන්නාහුය ......

62 මිනිසත් බවක් ල ත්
සැලත් ඒසත් දුබ ල ත්
නිරතුරු වැ කබ ල ත්
සිඟා ගෙන් ගෙට ඇවිදී නෙප ල ත්

62 මිනිසත් බවක්, මනුෂ්‍යාත්මභාවයක්; ලත් කලත්, ප්‍රතිලබ්ධවූ කල්හිත්; දුබල අත්, දුර්වල ආත්ම ඇති; ඒ සත්, ඒ පූර්වෝක්ත සත්වයෝ; නිරතුරු, නිරන්තරයෙන්; කබලත්වැ, කපාලහස්තවූ; ගෙන්ගෙට, ගෘහයක් පාසා; සිහා, භික්ෂණය කෙරෙමින්; ඇවිදි, ආහිණ්ඩනය කරතැයි; තෙපලත්, ප්‍රකාශ කෙරෙත්.

63 දිවි තොර නොව ක ර මි
පළමු සික පසසිල් ර මි
රැකි සත ඇති ත ර මි
දිගා ලැබ සුව විඳම මන ර මි

63 දිවි, (සත්වයන්ගේ) ජීවිත; තොර නොව කරම්, තුරන් නොකෙරෙමැයි හෙවත් විනාශ නොකෙරෙමැයි යන; රම්, රම්‍යවූ; පසසිල්, පච ශීලයෙහි; පළමු සික, ප්‍රථම ශික්ෂාව; රැකි සත, රක්ෂාකළ සත්වයෝ; ඇති තරම්, ඇති තාක්; දිගා, දීර්ඝායුෂය; ලැබ, ලබ්ධ ව; මනරම්, මනොරම්‍යවූ; සුව විඳම, සෞඛ්‍ය සම්පත්තිය විඳනය කරමින්ම—(මතුකව් හා කුලකයි.)

64 සදෙව් සිරි වි ඳ වා
මිනිස් බැව් සිතු න ඳ වා
නෙක් සැපත් යො ද වා
උපනුපන් තැන් ඉඳිත් සො ඳ වා

64 සදෙව් සිරි, ෂඩ්විධ දිව්‍ය සම්පත්තිය; විඳවා, විඳනය කරවා; මිනිස් බැව්, (නැවත) මනුෂ්‍යාත්ම භාවයෙහි; සිතු නඳවා, චිත්ත නන්දනය කරවා; නෙක් සැපත්, නොයෙක් සම්පත්තියෙහි; යොදවා, යොජිත කොට; උපනුපන් තැන්, උත්පන්නොත්පන්න ස්ථානයන්හි; සොඳවා, සුන්දරාකාරයෙන්; ඉඳිත්, වාසය කරන්නාහුය.

65 දෙවැනි සික අ න් ද න
නොගැන්මැයි යන න න් ද න
රැක්ක හැම පි න් ද න
නිසග සග රිසි සැපත වි න් ද න

65 අන්දන, මෙරමා අයත් වස්තුව; නොගැන්මැයි යන, නොපැහැර ගැනීමැයි යන; නන්දන, මනඃකල්‍යවූ; දෙවැනි සික, ද්විතීය ශික්ෂාව හෙවත් අදත්තාදානයෙන් වෙන්වීම; රැක්ක, රක්ෂණය කළ; හැම පින්දන, සකල පුණ්‍යවන්ත ජනයෝ; නිසග, ස්වභාවයෙන්; සග, ස්වර්ගයෙහි; රිසි සැපත, අභිමත (සෞඛ්‍ය) සම්පත්තිය; වින්දන, විඳනය කරමින්—(මතුකව හා කුලකයි.)

66 උපන් කල මෙදි යත
නොවෙත් දුක්පත් අනි යත
තමලද දන නි යත
නොගනී අන් කිසි අයෙක් එයි යත

66 මෙදියත, මේ මනුෂ්‍යලොකයෙහි; උපන් කල, උත්පන්නවූ කල්හි; අනියත, අස්ථිරාකාරයෙන්; දුක්, දුඃඛයකට; පත් නොවෙත්, ප්‍රාප්ත නොවන්නාහුය; නියත, නිශ්චිතවූ; තමලද, තමාවිසින් ලබ්ධවූ; දන, ධනය; එයියත, ඒ ස්වකීය හස්තයෙන්; අන්කිසි අයෙක්, අන්‍යවූත් යම් සත්වකෙනෙක් තෙමේ; නොගනී, ග්‍රහණය නොකරන්නේය.

67 තෙවැනි පර දුරය
නැති සික සතා දුරය
සුරලිය උ දුරය
කරත් සුරලොව නෙකා දුරය

67 පරදුරය නැති, පරදාරාභිගමනයෙන් වියුක්තවූ; තෙවැනි සික, තෘතීය ශික්ෂායෙහි; සත ආදරය, ආධාර ඇති සත්වයාහට; සුරලොව, දිව්‍යලොකයෙහි; සුරලිය, දිව්‍ය පසරාවෝ; උදුරය, මහත්වූ; නෙකාදුරය, අනෙකාධාරයන්; කරත්, කරන්නාහුය.

68 නරලොව උපන් සඳ
ලැබ පියන් සරි සිරි සඳ
තම දරුවන් ය සඳ
විඳිත් සිරි උන් විලස හිර සඳ

68 උන්, ඒ සත්වයෝ; නරලොව, මනුෂ්‍ය ලොකයෙහි; උපන් සඳ, උත්පන්නවූ කල්හි; සිරි සඳ සරි, ලක්ෂ්මිය සදෘශවූ; පියන්, ප්‍රිය භාර්‍ය්‍යාවන්; ලැබ, ලබ්ධව; යසද, යහපත්වූ; තම දරුවන්, ස්වකීය පුත්‍ර දුහිතෘන් සමඟ; හිර සඳ විලස, චන්ද්‍ර සූර්‍ය්‍ය ලීලායෙන්; සිරි, ශ්‍රී සෞභාග්‍යය; විඳිත්, විඳනය කරන් නාහුය.

69 සිවුවැනි සික ස මත්
මුසා නොදෙඩන මිස මත්
රැකි සත අසිරි මත්
විඳම සුරලොව සුවත් සිරි මත්

69 විසමත්, විෂමවූ; මුසා නොදෙඩන, මෘෂා කථනය නොකෙරෙත්මැයි යන; සමත්, සමර්ථවූ; සිවුවැනි සික, චතුර්ථ ශික්ෂාපදය; රැකි, සංරක්ෂණය කළ; අසිරිමත්, ආශ්චර්‍ය්‍යමත්; සත, සත්වයෝ; සුරලොව, දෙව්ලොව; සිරිමත්, ශ්‍රීමත්වූ; සුවත්, ඓශ්වර්‍ය්‍යයද; විඳම, විඳනය කොට-(මතු කව හා කුලකයි.)

70 මිනිසත් බැව් ක ල ය<br>
ගතිත් බස් ලෝ ස ක ල ය<br>
ගොළු බිහිරි වි ක ල ය<br>
නොවී වැජඹෙත් සිරින් ළ ක ල ය

70 මිනිසත් බැව් කලය, මනුෂ්‍යාත්ම භාවය ලැබූකල්හි; සකලය ලෝ, සමස්ත ලොකවාසීහු; බස් ගතිත්, (ඔවුන්ගේ) වචනය ප්‍රතිග්‍රහණය කෙරෙත්; විකලය, වෛකල්‍යවූ; ගොළු බිහිරි නොවී, මූක බධිර භාවයකට නොපැමිණ; ළකලය, මනොඥවූ; සිරින්, ශ්‍රියෙන්; වැජඹෙත්, විජෘම්භමාණ වන් නාහුය.

71 හළ සුරා පා න ය<br>
පස් වැනි සික නිද න ය<br>
රැක්ක සත් මා න ය<br>
විඳම දෙව් සිරි නොඅනුමා න ය

71 සුරාපානය හළ, මද්‍යපානයෙන් නොරවූ; පස්වැනි, පචමවූ; සික නිදනය, ශික්ෂා නාමැති නිධානය; රැක්ක, රක්ෂණය කළාවූ; මානය, පූජ්‍යවූ; සත්, සත්වයෝ; නොඅනුමානය, ශඞ්කා රහිතව ම; දෙව් සිරි, දිව්‍ය සම්පත්තිය; විඳම, විඳනය කරමින්ම—(මතු කව හා සම්බන්ධයි.)

72 නරලොව වන් ක ල ය<br>
නොවී සිතුබැව් වික ල ය<br>
නැණින් තෙද උදු ල ය<br>
පසිදු වෙති සතවෙතෙහි විපු ල ය

72 නරලොව, මනුෂ්‍යලොකයට; වන් කලය, ප්‍රවිෂ්ටවූ කල්හි; සිතු, චිත්තයෙහි; විකලය බැව්, වෛකල්‍ය භාවයක්; නොවී, නොමැතිව; විපුලය, මහත්වූ; තෙද, තෙජසින් හා; නැණින්, ඥානයෙන්; උදුලය, ජ්වලමානව; සත වෙතෙහි, සත්වයා අතුරෙහි; පසිදු වෙති, (ඒ සත්වයෝ) ප්‍රසිද්ධ භාවයට පැමිණෙන්නාහ.

73 බාවනා සිල් දන්
පින් දෙනු එ අනුමෝ දන්
දෙසුම්ඇසුමුදු ව දන්
මුනිඳු පිදුනී පුදනු සුන දන්

73 දන්, දානය; සිල්, ශීලය; බාවනා, භාවනාය; පින් දෙනු, ප්‍රාප්තිදානය; එ අනුමෝදන්, ඒ ප්‍රාප්ත්‍යනුමොදනාය; සුනදන්, සුෂ්ඨුනන්‍දනවූ; මුනිඳු වදන් දෙසුම්, ධර්මදෙශනා කිරීමය; ඇසුමුදු, සද්ධර්මශ්‍රවණය කිරීමය; පිදුනී, පූජනීයයන්; පුදනු, පූජනයද—(මතුකාව හා කුලකයි.)

74 වතාවත් කර මය
පින්කරු ගුණ වැනී මය
සරණද සිතී මය
කාර දෙලොස් පින්කම් මෙ රම් මය

74 වතාවත්, කුඩා මහත් වෘත්තායන් හෙවත් වත්පිළිවෙත්; කරමය, කිරීමද; පින්කරු, පින්කරන්නවුන්ගේ; ගුණ වැනීමය, ගුණවර්ණනා කිරීමද; සරණද, සරණගතවීමද; සිතීමය, (බුඩාදිගුණ) අනුස්මෘතියද යන; රම්මය, මනොරම්‍යවූ; මෙ දෙලොස් පින්කම්, මේ ද්වාදශපුණ්‍යක්‍රියා; කාර, සම්පාදනය කරව

75 පැනහර වත් ය හන
සුවඳ විලෙවුන් වා හන
මල් ගේ තෙල් ප හන
දන් මෙදන්වත් දසය සුප හන

75 පැන්, පානයකටයුතු දෑය; අහර, බුදියයුතුදෑය; වත්, වස්ත්‍රය; සහන, ශයනය; සුවඳ, සුගන්ධද්‍රව්‍යය; විලෙවුන්, විලෙපනය; වාහන, යානාවත්ය; ගේ, ගෘහය; මල්, මාල්‍යය; පහන තෙල්, ප්‍රදීපය පිණිස තෛලය යන; මෙ දසය, මේ උක්ත ප්‍රකාර වස්තු දශකය; සුපහන, අතිශයින් ප්‍රසන්නවූ; දන්වත්, දානවස්තු බව; දන්, ජානනය කරව

76 දන් දුන් දේ අ තිව්
පලදෙසි නැණින් සිතැ තිව
දුන් දන් ලොබ නැ තිව
ජවන් සිතමෙව් මේලෙස පැව තිව

76 ඇතිව, තමාසන්තකව; දන්දුන්, දාන වශයෙන් පරිත්‍යාග කළාවූ; දේ, දෙයධර්මය; පල දෙයි, (විපාක)ඵලය දෙන්නේයයි; නැණින්, (කර්මස්වකතා) ඥානයෙන්; සිත ඇති ව, චිත්ත යෙන් යුක්තතව; ලොබ නැතිව, (දාන වස්තුයෙහි) ලොභයෙන් තොරවූ; මෙලෙස, මේ උක්තප්‍රකාරයෙන්; පැවතිව, ප්‍රවෘත්තවූ; ජවන් සිත, ජවන චිත්තයෙන්; දුන්, දානයකරනලද්ද; දන් වේ, දානමය කුසලය වේ.

77 කයින් සග බ සි නා
වන පව් සත ද දෙ සි නා
වෙළෙඳහම් ප සි නා
තකා වළකිනු සිලැයි නි සි නා

77 කයින් සහ, කායද්වාරයෙන් හා; බයිනා, වාග්ද්වාර යෙනුත්; වන, සිඬ වන්නාවූ; පව් සත ද, සප්තවිධ පාපයෙන් ද; දෙසිනා, දෝෂයෙන් යුක්තවූ හෙවත් අධාර්මිකවූ; වෙළෙඳහම් පසිනා, පඤ්චවිධ වාණිජ්‍යයෙන්ද; නිසිනා, යොග්‍යවූපරිද්දෙන්; තකා, ආදීනව සලකා; වළකිනු, විරමණය; සිලැයි, ශීලමය කුසල (නම්වේ).

78 මෝ රා දෙස් ව නා
දෙස් මැඩ මනස නි ව නා
අදහස් බා ව නා
සමත විවසුන් දෙකැයි ස ව නා

78 මෝ රා දෙස්, මොහරාගද්වේෂයෙන්; වනා, සිඬ වන්නාවූ; දෙස්, දෝෂයන්; මැඩ, මර්දනය කරමින්; මනස, චිත්ත සන්තානය; නිවනා, නිර්වාපණය කරන්නාවූ; අදහස්, චිත්තාධ්‍යාශයන්; බාවනා, 'භාවනාමය'( කුශලය වේ ). (ඕතොමෝ)- විවසුන් සමත, 'විදර්ශනාය' 'ශමථය' (යන දෙදෙනාගේ) වශයෙන්; දෙකැ, ද්විකයෙකැයි; සවනා, සර්වඥයන්වහන්සේ; යි, දෙශනා කළසේක.

79 මිය ගිය මෙලොව ස ත්
නිසා එවැනිවු පේ ස ත්
වතහර දෙනු ප ස ත්
දනෙහි පින්පෙතනුසස් වේ ස ත්

79 මෙලොව, මේ ලොකයෙහි; සත්, සත්වයා අතුරෙන්; මිය ගිය, පරලොකප්‍රාප්තවූ; එවැනිවූ, එබඳුවූ හෙවත් පින් අනුමෝදන් වන්නාවූ; පේසත්, ප්‍රෙත සත්වයකු; නිසා, උදෙසා කොට; පසත්, ප්‍රශස්තවූ; අහරවත්, ආහාර වස්ත්‍රයන්; දෙනු, දානය කිරීම්; දනෙහි, දානයෙහි; සත්, යථාපත්වූ; අනුසස් පින්පෙත් වේ, 'අනුශංසපුණ්‍යප්‍රාප්තිය' වෙයි හෙවත් 'ප්‍රාප්තිදාන' නම් වන්නේය.

80 නොසතුටු මසුරු සිත්
පහ කොට වෙමින් තුටු සිත්
දුනන් කර මෙත් සිත්
ගැනුම් පින් අනුමෝදනා සිත්

80 නොසතුටු, මනාපත්වය සහ; මසුරු, මාත්සර්‍ය්‍යයෙන් යුත්; සිත්, චිත්තයන්; පහ කොට, දුරිභූත කොට; මෙත්සිත් කර, මෛත්‍රී චිත්තය ඇති කොට; තුටුසිත් වෙමින්, චිත්ත සන්තුෂ්ටියෙන් යුක්ත ව; අන්, අන්‍යයන් විසින්; සිත්, සිත්වූ පරිද්දෙන්; දුන්, දානය කරනලද; පින්, පුණ්‍යය; ගැනුම්, ග්‍රහණයකිරීම; අනුමෝදනා, 'ප්‍රාප්ත්‍යනුමොදන කුශලය' (වේ)......

81 පරනට මොක් නි සා
පුද ලැබයසස් නො නි සා
දම් දෙසුව වි නි සා
දේසනා අනුසසය එ නි සා

81 පුද ලබ, පූජා ලාභ හා; යසස්, කීර්ත්‍යක්; නොනිසා, උද්දේශ නොකොට; පරනට, අන්‍යයාහට; මොක් නිසා, නිර්‍වාණ ප්‍රතිලාභය සඳහා; විනිසා, විනිශ්වය ඇති ව; දම්, බුඩවචනය; දෙසුව, (ශ්‍රොතෘජනයාහට) දෙශනා කළේ වී නම්; එනිසා; ඒ හෙතු කොට ගෙන; අනුසසය, අනෘශංස ඇති; දේසනා, 'දෙශනාමය කුශලය' (වේ)......

82 ඇසුව බණ සතො සි ත්
සිතා ඇත පල තොල සි ත්
පැහැදී විදි ලෙ සි ත්
අසනු බණසන කුසලි වෙසෙ සි ත්

82 බණ ඇසුව, ධර්‍මශ්‍රවණය කෙළේ වී නම්; පල ඇත, ඉෂ්ට විපාක ඇත්තේයයි; සිතා, චින්තනය කොට; සතොසිත්, සන්තොෂයෙන් යුක්ත ව; තොලසිත්, අනලස වූ; වෙසෙසින් පැහැදී, විශෙෂයෙන් ප්‍රසන්න වූ; විදිලෙසින්, විධිවූපරිද්දෙන්; අසනු, ශ්‍රවණය කිරීම; බණසන කුසලි, 'ධර්‍මශ්‍රවණමය' කුශලය වේ......

83 නොඅඩු වන ගුණ ය ත්
කුලදෙටුන් මුනිවර ය ත්
වැඳුම් ආදර ය ත්
කරනු පුද මේ පින් සුලබ ය ත්

83 ගුණයන්, (ශීලාදි) ගුණයන්ගෙන්; නොඅඩු වත, අනූනවූ; මුනිවරයන්, යතිවරයන්ට හා; කුලදෙටුන්, කුල ජ්‍යෙෂ්ඨයන්ට; වැඳුම් ආදරයන්, වන්‍දනාදර; කරනු, කිරීම; පින් සුලබයන්, සුලභ්‍ය පුණ්‍යවූ; පුද වේ, 'අපචායන කුශලය' වේ.

84 පින්කරුවන්හ ටත්
ගුණවත් ශීලත් අය ටත්
' කරනු මෙහෙ පින ටත්
වතාවත් කුසලයයි සත ටත්

84 පින්කරුවන්හටත්, පින්කරන්නවුන්හට ද; ශීලත් ගුණවත් අයටත්, රෝගීන් හා ගුණවතුන්ට ද; පිනටත්, පින් සලකා ගෙන; මෙහෙ කරනු, පරිචර්‍ය්‍යාකරණය කළාවූ; සත ටත්, සත්‍වයාහටත්; වතාවත්කුසලයයි, 'වෙය්‍යාවච්චකුශලය' වේ යයි (කීහු).

85 පින් කරනා ස හ ට
වැර සතුට දෙන එ සි හ ට
ඔවුන් ගුණ පව ත ට
කුසල් පැසසුම් වේය නිය ත ට

85 පින් කරනා, පුණ්‍යකර්ම කරන්නාවූ; සතට, සත්‍වයාහට; එ සිතට, ඒ (ඔවුන්ගේ) චිත්තයට; සතුට, සන්තුෂ්ටිය හා; වැර, වීරිය; දෙන, ගෙනදෙන්නාවූ; ඔවුන් ගුණ, ඔවුන්ගේ ගුණ යන්; පවතට, ප්‍රවර්තනයට; නියතට, නිශ්චිතවූ; පැසසුම් කුසල් වේය, 'ප්‍රශංසන කුශලය' වේ.

86 කෙලෙස්රණ මා ර ණ
කළ ලොවිඳු ගුණ පූ ර ණ
එ තකා කැරැ ස ර ණ
හැඟුම් මෙසරණකුසලි එව ර ණ

86 කෙලෙස්රණ, ක්ලේශයුද්ධ හෝ ක්ලේශගණනා පාපයන්, මාරණ කළ, මාරණය කළාවූ හෙවත් විනාශ කළාවූ; ලොවිඳු, ලොකාචාර්‍ය්‍ය (වූ සම්‍යක්සම්බුද්ධ) යන්ගේ; පූරණ, පරිපූර්ණවූ; ගුණ, (ඥානකරුණා) ගුණයන්; තකා, සංලක්ෂණය කොට; එ සරණ කැරැ, ඒ සරණයයි කොට; හැඟුම්, අවබොධය කර ගැන්මය යන; මෙ, මේ තෙමේ; එ, ප්‍රසිද්ධවූ; වරණ, උත්කෘෂ්ටවූ; සරණකුසලි, 'සරණවයකුශල' නම් (වේ).

87 දන් සිල් ඈ උ සස්
කුසල් විලසින් අනු සස්
සිතුමෙන් යුත් ප සස්
සිතින් සිති නම් කුසලි එය සස්

87 දන්සිල් ඈ කුසල්, (සවකියවූ) දානශීලාදි කුශලයන්; උසස් අනුසස් විලසින්, උත්කෘෂ්ට අනෘශංස වශයෙන්; සිතින්, චිත්තයෙහි; සිතුමෙන්, අනුස්මරණය කිරීමෙන්; පසස්, ප්‍රත්‍යක්‍ෂවූ; එ යසස් යුත්, ඒ යශෝරාශියෙන් යුක්තවූ; සිහි නම් කුසලි, 'අනුස්සති' නම් කුශලය වේ.

88 තොස ල ම් බා ළු කාලෝ දෙලොස්පින් බ ල ය
ස ද බි ම් බා යුරු සුගතින් සිරි දූ ල ය
ලෙ ස ර ම් බා හිමි සුව විඳ හැම සා ල ය
සි ත ර ම් බා මොක්පුර වදිති නිම ල ය

88 ළු තොස ලම්බා, සවචිත්ත සංතෝෂාභ තො කොට හෙවත් ප්‍රසන්න සිතින් යුක්ත ව; බලය, බලවත්වූ; දෙලොස් පින්, මේ චාදශවිධවූ පුණ්‍යකර්මයන්; කාලෝ, කලාවූ සත්වයෝ; සඳබිම්බා යුරු, චන්ද්‍රබිම්බයට බඳු; සු, ශෝභනවූ; ගතින්, දෙහයෙන්; සිරි දූලය, උජ්වලිතශ්‍රීයෙන්; සිතරම්බා, චිත්තාභිරාමවූ භාග්‍ය ඇති ව; හැම සාලය, සියලු කල්හි; රම්බාහිමි ලෙස, ශක්‍ර සදෘශවැ; සුව විඳ, සෞඛ්‍ය විඳිනය කරමින්; නිමලය, නිර්මලවූ; මොක්පුර, නිර්වාණපුරප්‍රවරයට; වදිනි, ප්‍රවිෂ්ට වන්නාහුය.

**විනියසඞ්ගය සමාප්තයි.**

—— ०:० ——

89 වහරයෙන් මිග සන්
බියපත් එ සත් නොප සන්
පරපණ නොව න සන්
කරමු පෙරසික රකිත් වැ ප සන්

89 වහරයෙන් මිගසන්, මෘගසංඥ ඇති ව්‍යවහාරයෙන් හෙවත් මෘගසංවර්ණනයෙන්; බියපත්, භයප්‍රාප්තවූ; නොප සන්, (එහෙයින්) අප්‍රසන්නවූ; එසත්, ඒ මනුෂ්‍යයෝ; පර, පරා පිළිබඳවූ; පණ, ප්‍රාණයන්; නොවනසන් කරමූ, අවසන් නො මැ කරමූයයි හෙවත් පරපණ නොනසම්හයි කියා; පසන් වැ, ප්‍රසන්න වැ; පෙරසික, ප්‍රථමශික්‍ෂාව; රකිත්, රක්‍ෂා කරන් නාහුය.

90 පළමු ව මෙ සෙත    කා ර
වැදූ දරුවන්ට දා    කා ර
විසිවසර නිම    කා ර
ආයු ඇති වෙයි එවර හිර    කා ර

90 පළමු වැ, ප්‍රථම වැ; මෙ සෙත කර, මේ ශාන්තිය කොට ගෙන හෙවත් ප්‍රාණඝාතයෙන් වෙන්වූ ශීලයෙහි පිහිටාගෙන; දා කර, ජාතකකොට; වැදූ, ප්‍රසව කළාවූ; දරුවන්ට, අපත්‍යයන්ට; එවර, හගකාලයෙහි; හිරකර, ස්ථිර කොට; නිමකර, නිශ්චයෙන්; විසිවසර, විංශති වර්ෂයකින් යුක්ත; ආයු, ආයුෂය; ඇති වෙයි, ඇති වන්නේය.

91 දෙවනුව නුදුන්    ද න
නො ගෙන රැක සිල් එ සු    ද න
දූපුතුන් තන්    ද න
ලබත් ආනිස්වසක් වළ    ද න

91 දෙවනුව, විතීය වාරයෙහි; නුදුන් දන, ධනහිමියා විසින් නොදෙන ලද ධනය හෙවත් අන්‍යායත්ත වස්තුව; නො ගෙන, ආදානය නො කොට; එ සුදන, ඒ උකතප්‍රකාර සජ්ජනයෝ; සිල් රැක, (අදත්තාදානයෙන් වෙන්වූ) ශීලය රක්ෂා කොට; ආ, ආයුෂය; තිස්වසක්, ත්‍රිංශවර්ෂයක්; වළදන, වළජනය කරන්නාවූ; දූපුතුන්; දුහිතෘන් හා පුත්‍රයන්; ලබත්, ලැබගන්නාහුය.

93 තුන්වනුව පර    ද ර
නොකළො ලබනා සුත    ද ර
නො වී කිසි අන    ද ර
ඉදිත් සතලිස් වසක් සුත්    ද ර

92 තුන්වනුව, තෘතීය වාරයෙහි; පරදර, පරදාරාභිගමනය; නොකළො, නොකළාවූ (ඒ) සත්වයන් විසින්; ලබනා, ලැබගන්නාවූ; අදර, ආදරවන්තවූ; සුත, දරුවන්; කිසි, ස්වල්පයක් නමුදු; අනදර අනාදරයක්; නොවී, අවිද්‍යමානව; සුත්දර, යහපත්වූ; සතලිස්වසක්, සමචත්වාරිංශත්වර්ෂයක්; ඉදිත්, ජීවමානවන්නාහුය.

93 වෙන්ව මුසවා    ද ය
රැකි සත සිල් නොබේ    ද ය
දරුවන් පසා    ද ය
පකස්වස් වෙයි නොව පමා    ද ය

93 මුසවාදය, අභූතවචනයෙන්; වෙන් ව, විරමණ ව; සිල්, ශිලය; නොබේදය, හෙද නො කොට; රැකි, සංරක්ෂණය කළ; සත, ඒ සත්වයන්ගේ; පසාදය, ප්‍රසන්නවූ; දරුවන්, දාරකයන් හට; නොවපමාදය, ප්‍රමාදරහිත වැ; පනස් වස් වෙයි, පචාශත් වර්ෂ ආයු ඇතිවන්නේය.

94 පස්වනුව පෙහෙ සු න්
නො මැති සිල් රැකි සුද සු න්
සතගෙ දරු දුකු සු න්
වසත් සැටවසරක් ම මර සු න්

94 පස්වනුව, පචම්වාරයෙහි; පෙහෙසුන්, පෛශුන්‍යය හෙවත් කේලාම් කීම; නො මැති, නැත්තාවූ; සිල් රැකි, ශීල රක්ෂණය කළ; සුදසුන්, සුදර්ශනීයවූ; දුකුසුන්, දුක් රහිත වූ; සතගෙ, ඒ සත්වයාගේ; දරු, පුත්‍රදුහිතෘන්; මරසුන්, මාරණය රහිත; සැටවසරක් ම, ෂෂ්ටිවර්ෂයක් ම; වසත්, ජීවත්වන්නාහුය.

95 මෙසේ දසපින් බ ල
සපුරා එ සත නැණ බ ල
මදින් මඳ වැඩි බ ල
වී දෙසියවස් ආයු වේ බ ල

95 මෙසේ, උක්තප්‍රකාර; දසපින් බල, දශවිධවූ පුණ්‍ය බලය; නැණ බල, ඥාන ශක්තියෙන් යුත්; එසත, ඒ සත්වයෝ; සපුරා, පරිපූර්ණ කොට; මදින් මඳ, ස්වල්පයෙන් ස්වල්පය; බලවැඩිවී, බලය වර්ධනවී; දෙසියවස්, විශතවර්ෂයක්; බල ආයු, බලවූ ආයුෂය; වේ, (ඒ සත්වයාට) ඇතිවන්නේය.

96 අතුරෙන් සදෙව් ලෙ ව්
උතුමෙව් තුසි සුර ලෙ ව්
දඹදිව් අග මෙ ලෙ ව්
එකල බරණැස්පුර වෙ සිතැ ලෙ ව්

96 සදෙව් ලෙව්, ෂඩ්විධ දිව්‍යලොකයන්; අතුරෙන්, අතුරෙහි; තුසි, තුසිතභවන නම් යුත්; සුරලෙව්, දිව්‍යලොකය; උතුම් එව්, උත්තම වන්නාක් මෙන්; මෙලෙව්, මනුෂ්‍යලොක යෙහි; අග, (විපඅතුරෙන්) ශ්‍රෙෂ්ඨවන්නාවූ; දඹදිව්, ජම්බුද්වීප යෙහි; එකල, තත්කාලයෙහි; බරණැස්, බාරාණසීනාමයෙන්; (ප්‍රසිද්ධවූ); සිතැලෙව්, සිත් ආලය කරන්නාවූ; පුර, නගරයක්; වේ, ඇතිවන්නේය.

97 එ බරණැස හැ සි රි
වසන සත් දම් සු සි රි
වඩ වඩා ස සි රි
කිරීමෙන්ආ වැඩී අ සි රි

07 එබරණැස, ඒ බාරාණසී නම්වූ නුවරෙහි; හැසිරි වසන, සඤ්චාරොපවෙශනය කරන්නාවූ; සත්, සත්වයෝ; සුසිරිදම්, සුචරිතධර්මය;, වඩ වඩා, අධික වශයෙන්; සසිරි කිරීමෙන්, සශ්‍රීක කිරීම හෙතු කොට ගෙන; අසිරී, ආශ්චය්‍ය්‍යීමත්; ආ, ආයුෂය; වැඩී, වර්ධිත වෙමින්—(මතුකාව හා කුලකයි.)

98 අනූදහසක් ව ස්
ලබතායු සත එද ව ස්
එම බරණැස් නි ව ස්
වේය උත්පල නමක් සුපු ව ස්

98 එදවස්, තද්දිනයෙහි; අනූදහසක්වස්, නවති සහස්‍රවර්ෂ පරිමිතවූ; ආයු, ආයුෂය; සත, (එකලලෝවැසි) සත්වයෝ; ලබත්, ප්‍රතිලබ්ධ කරන්නාහුය; බරණැස්, බාරාණසී නම්වූ; එම නිවස්, ඒ නිවාසස්ථානයට; උත්පල, උත්පල නුවරය යන; සුපුවස්, සුප්‍රකාශවූ; නමක් වේය, නාමයක් ඇතිවන්නේය.

99 දිග පුලුලින් ස පු ර
යොදුනක් පමණ ඒ පු ර
වසන සත් ආ පු ර
මින් ම වේ සියදහස් නොන පු ර

99 දිගපුලුලින්, දීර්ඝත්වයෙන් හා පෘථුලත්වයෙන්; සපුර, පරිපූර්ණවූ; යොදුනක් පමණ, යොජන ප්‍රමාණවූ; ඒ පුර, ඒ නගරයෙහි; වසන සත්, වාසය කරන්නාවූ සත්වයන්ට; ආ පුරමින් ම, ආයුෂයාගේ පරිපූර්ණත්වය හෙතු කොට ගෙන; නොනපුර, අප්‍රතිෂ්ඨාවක් නොවූ; සියදහස් වේ, ශතසහස්‍රයක් ගෙවත් ලක්‍ෂයක් වශී (ආයුෂ) ඇතිවන්නේය.

100 යළි උත්පල පු ර ව
නම් වන පදුම දෙව ර ව
පුලුලත් දිග එ ර ව
යොදුන් සත් පමණ ඇත අත ර ව

100 යළි, නැවත; උත්පල පුරට, උත්පල නම්වූ නගර යට; දෙවරට, විතිය වාරයෙහි; පදුම්, පදුම නුවර යත; නම් වන, නාමය ඇති වන්නේය. එරට, ඒ ජනපදය; පුලුලත් දිග, පෘථුලත්වය හා දීර්ඝත්වය; අතරට, අතර තුරෙහි; සත් යොදුන්, සප්තයොජනයක්හුගේ; පමණ ඇත, ප්‍රමාණත්වය ඇත්වන්නේය.......

101 එසේ වැඩි කුස ලය<br>
බෙලෙන් ආයුස එකා ලය<br>
අසෙකි වස් නිම ලය<br>
විඳිත් සත් ඒ පුරෙහි විපු ලය

101 එකලය, ඒ කාලයෙහි; නිමලය, නිර්මලවූ; විපුලය, මහත්වූ; ඒ පුරෙහි, ඒ නගරයෙහි; සත්, සත්වයෝ; එසේ, උක්තප්‍රකාරයෙන්; වැඩි, වඩිනවූ; කුසලය බෙලෙන්, පුණ්‍ය මහිමයෙන්; ආයුස, ආයුෂය; අසෙකි වස්, අසංඛ්‍ය වර්ෂයක් විඳිත්, විඳිනය කරන්නාහුය.......

102 ඒ නුවරට ප දුම<br>
බැවින් කිසිදුක් නොයෙ දුම<br>
මන්දරය පු දුම<br>
එසත් අත්සේ කියත් සුසැ දුම

102 පදුම්, පදුමය යන; ඒ නුවරට, ඒ නගරයට; කිසි දුක්, සවල්පවූ දුකක් නමුදු; නොයෙදුම බැවින්, අයොජිත වනභාවයෙන්; අත් සේ, අර්ථාන්විත ව; සුසැදුම, සුසජ්ජිත කළාවූ; පුදුම, ආශ්චර්‍යවූ; මන්දරය, මන්දරයන නාමයක්; එසත්, ඒ සත්වයෝ; කියත්, ප්‍රකාශ කරන්නාහුය.......

103 එපුර දිග පුලු ලය<br>
දෙලොස් යොදුනෙන් ළකා ලය<br>
උදයවැය කිසා ලය<br>
නොපෙනී සුව් සත වෙසෙත්විකාල ය

103 එපුර, ඒ නගරයෙහි; දිග පුලුලය, දීර්ඝත්වය හා පෘථු ලත්වය; දෙලොස් යොදුනෙන්, ද්වාදශයොජනයකින්; ළකා ලය, සිත්කලුවන්නේය; උදයවැය, උදයව්‍යය ධර්මතාසඞ්ඛ්‍යාත ස්වභාවය; කිකලය, කවර කාලයෙක්හිද යන බව; නොපෙනී, (දීර්ඝායුෂයෙන් යුත් සම්පත් නිසා) අදෘශ්‍යමානව; සත, ඒ නගරවාසි සත්වයෝ; සුවවිකලය, සෞඛ්‍යවෛකල්‍යයෙන්යුක්ත ව; වෙසෙත්, වාසය කරන්නාහුය.......

104 ම නා  ආයු අඩුවී එහෙයි  නේ යා
ද නා  අසූදහසවු වසරි  නේ යා
එ නා  මය මඳුරා  වෙනසි  නේ යා
නනා  ගුණ කේතුමතිවේ දි  නේ යා

104 එහෙයිනේයා, යථොක්තාකාරයෙන්; මනා, මනොඥවූ; ආයු, ආයුෂය; අඩුවී, ඌනව; දනා, ඒ සත්වයන්ට; වසරිනේයා, වර්‍ෂ සඞ්ඛ්‍යාවෙන්; අසූදහසවූ, අශීතිසහස්‍රයක්වූ; එදිනේයා, ඒ කාලයෙහි; මඳුරා, මන්දුරපුරයයන; එනාමය, ඒ නාමය; වෙනසිනේයා, වෙනස්විමෙන්; නනා ගුණ, නොයෙක් ගුණ සමූහයෙන් යුක්තවූ; කේතුමතිවේ, කෙතුමතී රාජධානිය යන නමින් ප්‍රසිද්ධ වන්නේය.——

## තෘතියසර්ගය සමාප්තයි.

—— ०:० ——

105 සව්සිරි පිරි ප  ත ර
කේතුමති පුර බල  ත ර
තෙදියට එක වි  ත ර
එදිය දද බැඳ දිලෙයි නුබ  ත ර

105 සව්සිරිපිරි, සකලශ්‍රීන්පූර්ණවූ; පතර, ප්‍රසිද්ධවූ; බල තර, අතිශයින් බලවත්වූ; කේතුමති පුර, කෙතුමතී නම් රාජ ධානිය; තෙදියට, (ස්වර්ග මර්ත්‍ය පාතාලසඞ්ඛ්‍යාත) භුවනත්‍රයට; එක විතර, අසහාය (නගරයක්) මෙන්; නුබ අතර, ආකාශ අභ්‍යන්තරයෙහි; එදිය දද, ඒ විජයශ්‍රීධ්වජය; බැඳ, බන්ධනය කොට; දිලෙයි, භ්‍රාජමාන වන්නේය.——

106 අමර නර පි  න නා
එපුර සුරලෝ දි  න නා
දිග ගණනදු  න නා
දෙලොස් යොදුනකි පඬින් වන නා

106 අමර, දෙවියෝද; නර, මනුෂ්‍යයෝද; පිනනා, ප්‍රීණනය කරන්නාවූ; සුරලෝ, දෙව්ලොව; දිනනා, ජයග්‍රහණය කරන්නාවූ; එපුර, ඒ කෙතුමතී නම් රාජධානියෙහි; පඬින්, පණ්ඩිතයන් විසින්; අදුනනා, සජානනය කොට; වනනා, වර්ණනාකරන්නාවූ; දිග ගණන, දීර්ඝසඞ්ඛ්‍යා ප්‍රමාණය; දෙළොස් යොදුනකි; ද්වාදශයොජනයක්ද—(මතුකාව යා කුලකයි)

107 පුලුල සත් යො ද නා
වටින් වෙති තිස්යො ද නා
සත සිත නෙත ද නා
එපුර කවරෙක් වනති නෙ ද නා

107 පුලුල, පෘථුලබවය; සත් යොදනා, සප්තයොජනයක්ද; වටින්, හාත්පස්හි; තිස්යොදනා, ත්‍රිංශත් යොජනයක්ද; වෙති, ඇති වන්නාහ; සත, සත්වයාගේ; නෙත සිත අදනා, නෙත්‍රචිත්තාකර්ෂණය කරවන්නාවූ; එපුර, ඒ නගරය; නෙදනා, අනෙකජනයන් අතුරෙන්; කවරෙක්, කතර පුද්ගලයෙක්හු; වනති; වර්ණනාකරත්ද.

108 ඉවුරු අසමි යු රු
රඟන රුචි දී මි යු රු
මින් රදූ සිත යු රු
රඳන කෙළැවිද විලස ස යු රු

108 ඉවුරු අස, කූලසමීපයෙහි; මියුරු, මධුරවූ; රුචි දී, රුචය කොට; රඟන, නෘත්‍ය කරන්නාවූ; මියුරු, මොනොරුන් ඇත්තාවූ; සිතයුරු, චිත්තානුකූලව; විලස සයුරු, සාගරයෙහි මෙන්; කෙළැවිද, ක්‍රීඩායෙන් ආඝර්ෂණය කරමින්; රඳන, රජමානවූ; මින්රදූ, මත්ස්‍යරාජයන් ඇත්තාවූ — (මතුකව හා කූලකයි.)

109 පස් පියුමෙන් ළ කා ල
සුනිල්වන් දල හැම කා ල
සරන බිඟු මන කා ල
එපුර දියගළ සදිසි සිරි කා ල

109 පස් පියුමෙන්, පඤ්ච පද්මයෙන්; ළකල, මනොඥවූ; හැම කල, සියලු කල්හි; සුනිල් වන්, අති නීලවර්ණවූ; දල, ජල යෙන් යුක්තවූ; මනකල, මනඃකල්‍යවූ; බිඟු, භෘඞ්ගයන්; සරන, සඤ්චාරය කරන්නාවූ; එපුර, ඒ නගරයෙහි; දිය අගළ, ජලපූර්ණ පරිඛා තොමෝ; සිරිකල, ශ්‍රීකාන්තාවට; සදිසි, සදෘශවන්නීය.

110 රු ව න් සත් පවුර වට මන කා ලා ව න්
කු ව න් පිනා පැන නැඟි මිහි කා ලා ව න්
සු ව න් රසින් පුරහුළ සිරි කා ලා ව න්
නොව න් නෙ රු දවතුර සුළ කා ලා ව න්

110 මනකලාවන්, මනඃකල්‍යවූ; මිහි කලාවන්, මහී කාන්තාවගේ; නුවන් පිනා, නෙත්‍ර පීණනය කෙරෙමින්; වට, (ඒ නගරයෙහි) හාත්පස්හි; පැන නැඟි, පැනනැංගාවූ; සිරිකලා වන්, ශ්‍රී කාන්තාවගේ ප්‍රවේශය ඇති; සුළකලාවන්, ඉතා මනොඥවූ; රුවන් සත්පවුර, සවර්ණමය සප්තප්‍රාකාරයන්ගේ; සුවන් රසින්, සවර්ණරශ්මිය හෙතු කොට ගෙන; රුදවතුර, රාත්‍රිදිවයාගේ අන්තරයක් හෙවත් රෑදවහල් දෙක්හි වෙනසක්; පුරතුළ, ඒ නගරාභ්‍යන්තරයෙහි; නොවන්නෙ, නොමැති වන්නේය.

111 රි දී කඳින් ලෙළෙනා පත් මි ණින් නි ල
සැ දී එතල් සත්වටරන් ග ණින් ප ල
දි දී යස රුවන් වාසල් මි ණින් දු ල
යෙ දී තිබෙත් සතරක් සිවු කො ණින් ලොල

111 රිදී කඳින්, රජතමයවූ ස්කන්ධය ඇති; ලෙළෙනා, ලීලොපෙත වන්නාවූ; නිල්මිණින් පත්, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ පත්‍ර ඇති; රන්පල ගණින්, සවර්ණමය ඵල සමූහයෙන් යුක්තවූ; එතල්, ඒ තාලවෘක්ෂයන්; සත්වට, සප්තවෘත්තයක්; සැදී, සජ්ජිතවූ; ලොල, ලෞල්‍යයෙන් යුත්; වාසල් සතරක්, සිවු දොරටු වක්හු; මිණින්, මාණික්‍යයෙන්; දුල, ජ්වලමානව; රුවන්, යහපත් සවර්ණයන්; දිදී, දානය කෙරෙමින්; සිවු කොණින්, සතර සීමාවෙහි; යෙදී, යුක්තව; තිබෙත්, (ඒ නුවර) ඇති වන්නාහ

112 ස ත ර එවාසල්දොර සිරි ර භා යා
ස ත ර මෙතේ පුදයට සොඳ ර භා යා
ස ත ර වතහු සෙද නිමවූ ර භා යා
ස ත ර කප්රුකක් ඇත මත ර භා යා

112 සිරි රභායා, ශ්‍රී ශොභාව ඇති; සතර එවාසල්දොර, ඒ සිවුවාසල්දොරටුවෙහි; මෙතේසතර පුදයට, මෛත්‍රෙය ශාස්තෘන්වහන්සේට පූජාපිණිස; සතරවතහු, මහාබ්‍රහ්මයා විසින්; සෙද, ශීඝ්‍රව; සොඳරභායා, සුන්දරාකාරයෙන්; නිමවූ රභායා, නිර්මිත සභාක් වැනිවූ; මතරභායා, මනඃකල්‍යවූ; සතර කප්රුකක්, කල්පවෘක්ෂ චතුෂ්කයක්; ඇත, ඇතිවන්නේය.

113 ප ත ර දඹදිව්හි සත එසා ලෙ සේ යා
අ ත ර අසුදහසක් තුළ ව සේ යා
නි ත ර ගතදු එදනින් නොව ල සේ යා
වි ත ර එකරුකක් නිමවනු කො සේ යා

113 පතර, පතළාවූ; දඹදිවහි, ජම්බුද්වීපයෙහි; සත, සත්ත්වයෝ; එකලෙසේයා, එකාකාරයෙන්; අසූදහසක්, අශීතිසහස්‍ර පරිමිත; වසේයා, වසියක්හුගේ; අතරතුළ, අන්තරයෙහි හෙවත් කාලයෙහි; නිතර, නිරන්තරයෙන්ම; එදතින්, ඒ ධනයෙන්; නොවලසේයා, ප්‍රපංච නොව; ගතදූ, ගත්තාහුද; විතර එක රුකක්; එක වෘක්ෂයක වස්තුව පමණක්; කෙසේයා, කවර ආකාරයකින්; නිමවනු, නිෂ්ඨාවීම වේද? (නොවේමැයි)

114 සො දි න් එපුර මැද නැඟ තව රුවන් ගෙ ය ක්
දි ගි න් සතර සිවුකප්තුරු සොඳව ග ය ක්
තෙ දි න් දසත විහිදෙත් යස කර අ ග ය ක්
සි රි න් පසුබසි පිරි සුරසර ස ග ය ක්

114 එපුර මැද, ඒ නගරමධ්‍යයෙහි; තව, අන්‍යවූ; සොඳින්, සුන්දරාකාරයෙන්; රුවන් ගෙයක්, ස්වර්ණමය ගෘහයක්; නැඟ, උද්ගතවැ; සතර දිගින්, චතුර්දිශාවෙහි; සොඳ වගයක්, සුන්දරවූ වර්ගයක; සිවු කප්තුරු, කල්පද්‍රැම චතුෂ්කයක්; යසකර අගයක්, අග්‍රවූ කීර්තිශ්‍රිය ඇති කොට; තෙදින්, තෙජො රශ්මිකදම්බයෙන්; දසත, දශදිගන්‍යන්තරයෙහි; විහිදෙත්. විස්තීර්ණවෙත්. පිරි, පූර්ණවූ; සිරින්, (ඒ නගරයෙහි) ඓශ්වර්‍ය්‍යයෙන්; සුරසර, දෙවියන් විසින් ගැවැසීගත්තාවූ; සගයක්, දෙව්ලොවද; පසුබසී, පශ්චාද්භූත වන්නේය.

115 ස ත ක් රුවනින්ම සැදූ සිරි අම බැ න් දූ
මි ස ක් වෙන ගෙවල් නැත ලිගල් රැ න් දූ
උ ද ක් දිව උයන් පොකුණෙන් සුවවි න් දූ
නොඑ ක් සත සරත් එනුවර දුක්බි න් දූ

115 අමසිරි, අමෘතශ්‍රිය; බැන්දූ, බන්ධනය කළ; සතක් රුවනින්ම, (රන්, රිදී, මුතු, මැණික්, වෙරළුමිණි, විදුරු, පබළු යන) සප්තවිධ රත්නයෙන් ම; සැදූ, සජ්ජිත කළාවූ; ගෙවල් මිසක්, ගෘහයන් විනා; ලිගල්, කාෂ්ඨ හා පාෂාණයෙන්; රැන්දූ, රජිතවූ හෙවත් කළාවූ; වෙන, අන්‍යවූ (ගෘහ); නැත, නැත්තාහ; උදක්, අතිශයින්ම; දිව උයන් පොකුණෙන්, දිව්‍යමය උද්‍යාන සහ පුෂ්කරිණියෙන්; සුව වින්දූ, සුඛ විඳිනය කරනු ලබන්නාවූ; දුක් බින්දූ, දුඃඛය භග්නකළ; නොඑක් සත, අනෙකප්‍රකාර සත්වයෝ; එනුවර ඒ නගරයෙහි; සරත්, සංචාරය කරන්නාහුය.

116 ගෝවි තැන් වෙණෙඳගම් ආදී වැඩ ස කල
කි සි අ න් දෙයක් වෙ හෙසව නොකොටමඑ කල
දෙ වි ය න් විසින් ගෙනදෙන නොනැසෙනඅ කල
ගෙ සි තැන් පත් විදිත් හැම සිරි දන ළ කල

116 ගොවිතැන් වෙළෙඳහම් ආදී, කෘෂිකර්ම වණිග්කර්මයනාදිවූ; වැඩසකල, සර්වකර්මාන්තයන් හා; කිසිඅන්දෙයක්, කතරුකාරඅන්‍ය කර්මාන්තයක් නමුදු; එකල, තත්කාලයෙහි; වෙහෙසව, විහිංසාප්‍රාප්තව; නොකොටම, නොකරමින්ම; දෙවියන් විසින්, දෙවතාවන් විසින්; ගෙනදෙන, පමුණුවනු ලබන්නාවූ; අකල, අකාලයෙහි; නොනැසෙන, විනාශ නොවන්නාවූ; ගෙසි, ගෘහයෙහිම; තැන්පත්, ස්ථානප්‍රාප්තවූ; හැමසිරි, සමෛශ්වර්‍ය්‍යය; ළකල, මනොඥවූ; දන, ජනයෝ; විඳිත්, විඳනය කරන්නාහුය.

117 එ ක ස යං ජාත වී බීජයකි න් ම
නෙක රැ සින් සැදෙන පඳුරක පමණි න් ම
දැ ක ඇසින් නෙලන එකරල් ගණනි න් ම
සැ කනොවන් පිරෙන ගැල් දැන මෙලෙසි න් ම

117 සයංජාත, ස්වයංජාත (ඉබේහටගත්) යන නාමයෙන් යුත්; එක වී බීජයකින්ම, එකම ව්‍රීහිබීජයකින්; නෙක, අනෙකප්‍රකාර; රුසින්, කාණ්ඩියෙන්; සැදෙන, අටගන්නාවූ; පඳුරක පමණින්ම, පඳුරක ප්‍රමාණයෙන්ම; ඇසින් දැක, (ඒ උක්තප්‍රකාර සත්වයෝ නෙත්‍රයෙන් දර්ශනය කොට; නෙලන, නෙලාගන්නාවූ; එකරල්, ඒ ශස්‍යමඤ්ජරින්ගෙන්; පිරෙන, පූර්ණවන්නාවූ; ගැල් ගණනින්ම, ශකට සඞ්ඛ්‍යාප්‍රමාණය; මෙලෙසින්ම, මෙපරිද්දෙන්ම; දනු, ජානනයකරනු; සැක නොවන්, එහි නිඃශඞ්කාවවි.

118 දෙ ද හස්දෙසියදෙසැත්තෑගැල් ගැණ ස පු රා
ර ද ත් සොළොසමුණු අටලහසිතිරි පු රා
යො ද මේ වී උදුන මිණි තව නොව ව පු රා
ස ද මිනබුදින් රන්බදුනෙහි සත එ පු රා

118 දෙදහස් දෙසිය දෙසැත්තෑ, විසහස්‍ර විශත විසප්තති පරිමිතවූ; ගැල්, ශකටයන්; සපුරා, සම්පූර්ණකොට; ගැණ, සඞ්ඛ්‍යාප්‍රමාණකළවිට; සොළොසමුණු, ෂොඩශඅමුණකුත්; අටලහස්, අෂ්ටාආඪකයක්; පුරා, පුරිතවූ; ඉතිරි, අතිරිකතය;

රදන්, රජතවන්නේය හෙවත් ඉතුරු වන්නේය; තව නොව වපුරා, අන්‍යවපනය කිරීමක් නොකොට; මිණි උදුන, මාණි කොෂාඩනයෙහි; මේ ඊ, මේ ව්‍රීහි; යොදා, යුක්තකොට; සදමින, සජ්ජිතකොට; රන්බඳුනෙහි, සුවර්ණමයවූ භාජනයෙහි (බහා); එපුරා, ඒ නගරයෙහි; සත, සත්වයෝ; බුදිත්; අනුභව කරන්නාහුය.

119 අ ත ර මෙපුරතු ලා ය මනකා ලා ය
නි ත ර සුනිල්ද ලා ය ගලග ලා ය
ප ත ර නදීකැ ලා ය සිරිදු ලා ය
වැ නි ර නටත්ලො ලා ය මින්කැ ලා ය

119 අතුලාය, අතුල්‍යවූ (අන්‍ය නගරයන්ට සමානත්වයක් නැත්තාවූ); මනකලාය, මනඃකල්‍යවූ; මෙපුර අතර, මේ (නගරාභ්‍යන්තර) භූමිප්‍රදෙශයෙහි; නිතර නිරතුරුව; ගලගලාය, ගල ගල යන අනුකරණ ඇත්තාවූ; සුනිල් දලාය, සුශුද්ධනීල ජලඇති; සිරි දුලාය, උජ්ඣලිතශ්‍රියෙන්; පතර, ප්‍රසාරිතවූ; නදී කැලාය, ගංගාසමූහයෙහි; මින් කැලාය, මත්ස්‍ය සමූහයෝ; ලොලාය, ලෞල්‍යයෙන්; වැනිර, ව්‍යාප්තව; නටත්, නෘත්‍ය කරන්නාහුය.

120 සොබ න එගංනෙ රා ය නිරතු රා ය
නි බෙ න සුසල්තු රා ය මල්පු රා ය
ර ඟ න මොනරගි රා ය නෙමියු රා ය
හ ඬ න වනත් ස රා ය මෙනිසු රා ය

120 සොබන, සොභනවූ; එගංනෙරාය, ඒ ගංගා තීරභූමියෙහි; නිරතුරාය, නිරන්තරයෙන්; මල් පුරාය, පුෂ්පයන්ගෙන් පූර්ණව; නිබෙන, විද්‍යමානවූ; සුසල් තුරාය, මහා ශාලවෘක්ෂයන්ගේ; නෙමියුරාය, අනෙක මධුරස්වරයෙන් යුක්තව; රඟන, නෘත්‍ය කරන්නාවූ; මොනර ගිරාය, මයූර කීර පක්ෂීන්ගේ; හඬන, නාදයෙන්; මෙනිසුරාය, මෛත්‍රෙය නාථයන්වහන් සේගේ; සරාය, සාරශ්‍රිය; වනත්, වර්ණනා කරන්නාහුය.

121 වි දු රු එපඩිව රා ය සුරගු රා ය
වි දු රු නුවණද රා ය එකායු රා ය
ඇ දු රු නෙකිවිව රා ය නිරස රා ය
සොදු රු මෙපුරව රා ය ඇතපු රා ය

121 එ, ප්‍රසිඬවූ; විදුරුපඬිවරාය, විධුරපණ්ඩිතොත්තාම යාය; සුරගුරාය, වෘහස්පතිය (යන මොවුන් හා); එක පුරාය, එකාකාරවූ; විදුරු, වජ්‍රයට බඳුවූ; නුවණ, ඤාණය; දරාය, ධාරණයකරන්නාවූ (සියුම් නුවණ ඇත්තාවූ යනු භාවයි); තිර සරාය, ස්ථිරසාරවූ; ඇදුරු නෙකිවිවරාය, අනෙක පණ්ඩිතා චාර්‍ය්‍යොත්තාමයෝ; සොඳුරු, සුන්‍දරවූ; මෙපුරවරාය, මේ උතුම් නගරය; පුරාය, පූරිතව; ඇත, ඇති වන්නාහ.

122 ස ඳ ලූවල නිති රැ න් දූ
ම ද රද දද වැනි බැ න් දූ
සොඳ රුසිරැති පුර ළ න් දූ
වි ඳ සුව කෙළිතී ප න් දූ

122 නිති, නිරන්තරයෙන්; සඳලූවල, චන්‍ද්‍රශාලාවන්හි; රැන්දූ, රජිතවූ; මදරද, අනඞ්ගයාගේ; බැන්දූ දද වැනි, බන්ධනය කරනලද ධවජයවැනි; සොඳ, සුන්‍දරවූ; රුසිරැති, රූපාන්විත; පුරළන්දූ, පුරස්ත්‍රීහු; සුවවිඳ, සෞඛ්‍යය විඳනය කරමින්; පන්දූ කෙළිති, කන්‍දුක ක්‍රීඩා කරන්නාහුය.

123 ඉ දු ව ර හෙල්මැලි සපු ම ල්
බැ ඳ ව ර ලස සරා නි ම ල්
පොබකර තනහස සුවි ම ල්
එ පු ර ර ඟන ලියෙව් ක ම ල්

123 ඉඳුවර, ඉන්දීවරය; හෙල්මැලි, සෞගන්ධිකය; සපු, චම්පකය යන; මල්, පුෂ්පයන්; නිමල්, නිර්මලවූ; වරලස, කෙශකලාපයෙහි; බැඳ, බන්ධනය කොට; සුවිමල්, සුපිරිසුදු; තනහස, තිසර පයොධරයන්; පොබකර, පුබුදුකොට; එපුර, ඒ නගරයෙහි; රඟන, නෘත්‍ය කරන්නාවූ; ලිය, ස්ත්‍රීහු; කමල් එව්, ශ්‍රී දෙවිය වැනිවෙ.

124 සු ර ඹා රුසිරෙන් ජය ගෙ න
ස ළ ඹා මිණි පයලා ගෙ න
න ර ඹා හැමදන මන ගෙ න
ස ර ඹා කර නටති ර ගෙ න

124 රුසිරෙන්, රූපශ්‍රීයෙන්; සුරඹා, දිව්‍යාප්සරාවන්; ජයගෙන, පරාජය කොට; මිණිසළඹා, මණිමඤ්ජීරයන්; පය ලාගෙන, පාදයෙහි වින්‍යාස කොට ගෙන; නරඹා, නිරීක්ෂණය කෙරෙමින්; හැමදන, සකල ජනයන්ගේ; මන ගෙන, චිත්ත ග්‍රහණය කෙරෙමින්; රගෙන, අනුරාගයෙන් යුක්තව; සරඹා කර, ලාස්‍ය දක්වා; නටති, නෘත්‍ය කරන්නාහුය.

125 කැ ලු මෙන් වත දිසි ඉ න් ද්‍ර
රූ සි රෙන් සරි සිරි ල න් ද්‍ර
මෙ ළ දු න් ගේ ගී සි න් ද්‍ර
අ ස මි න් එයි එසුරි න් ද්‍ර

125 කැලුමෙන්, කාන්තියෙන්; ඉන්ද්‍ර, චන්ද්‍රයා සදෘශවූ; වත, වක්ත්‍රයෙන්; දිසි, භ්‍රාජිතවූ (මේ සත්‍රිගු තුමූ); රූසිරෙන්, රූප ශ්‍රිලාවන්‍ය හෙතු කොට ගෙන; සිරි ලන්ද්‍ර, ශ්‍රිකාන්තාවට; සරි, සදෘශ වන්නාහ. මෙළදුන්, මේ කාන්තාවන්ගේ; ගී සින්ද්‍ර, සින්ද්‍ර ගීතයන්; එසුරින්ද්‍ර, ඒ ශක්‍රදෙවේන්ද්‍ර තෙමෙ; අසමින්, ශ්‍රවණය කරමින්; එයි, (මේ පුරප්‍රවරයට) ආගමනය කරයි.

126 මෙ ත් මහස්ත් ගුණ තු ං ගා
යු ත් ගීයට් පද න ං ගා
සි ත් සෙ නටන කොම ළ ං ගා
ම ත් වෙයි දුට එන ර ං ගා

126 මෙත් මහසත්, මෛත්‍රෙය මහාබොධිසත්වයාණන්ගේ; තුංගාගුණයුත්, උත්තුංගගුණ ප්‍රතිසංයුක්ත; ගීයට්, ගීත වෘත්තයට; පදනංගා, පාදයන් ඔසවමින්; සිත්සේ, හෘදයඞගමව; නටන, නෘත්‍ය කරන්නාවූ; කොමළංගා, (එපුර) කොමලාඞගනාවන්; දුට, දර්ශනය කළහොත්; එනරංගා, ඒ අනඞග තෙමෙ; මත්වෙයි, මත්තභාවයට පැමිණේ.

127 ක න් තක අස් රජ විල සි න්
ස න් කර යන එන අහ සි න්
පෙන් කෙළනා තුරඟ රැ සි න්
ම න් පිනවයි එපුර ය සි න්

127 සන් කර, සංඥ කොට; අහසින් යන එන, ආකාශයෙන් ගමනා ගමනය කරන්නාවූ; පෙන් කෙළනා, ප්‍රණය ක්‍රිඩ්‍යමාණවූ; විලසින්, විලාසයෙන්; කන්තක අස්රජ, කන්ථක නම් අශ්වරාජයා සදෘශවූ; තුරඟ රැසින් අශ්වසමූහයෙන්; එපුර, ඒ නගරය තෙමෙ; යසින්, කීර්තිඝාදම්බයෙන්; මන්පිනවයි, (ජනයන්ගේ) මනඃ ප්‍රිණනය කෙරෙයි.

128 ග ජ මුතු කුඹුතොලෙහි රැ ඳු
ර ජ රජ මැණිපිට වො රැ ඳු
ඔ ජ බිඳ එරවණ පැ රැ ඳු
ග ජ රළ සිට් තොමැ මැ රැ ඳු

128 ගජමුතු, ගජේන්ද්‍රයන්සම්බන්ධි මෞක්තිකයන්; කුඹු තෙලෙහි, කුම්භස්ථලයෙහි; රුඳු, රජිතවූ; රජ රජමැති, රාජ රාජමන්ත්‍රීන්; පිට, පෘෂ්ඨයෙහි; වොරුඳු, විරාජිතවූ; එරවණ, ඓරාවණ නම් හස්තිරාජයාගේ; ඔජ, ඔජෝගුණය; බිඳ, භග්න කොට; පැරුඳු, පරාජය කළ; නොම වැරදූ, බාධාවක් නැති; ගජරළ, හස්ති සමූහය තෙමෙ; සිටි, (ඒනුවරෙහි) සපිත වේ.

129 ළ ත ර ළඳුන් හදය ය සි ත
ප ත ර දෙපියොවුරු විල සි ත
නි ස ර රදුහු විල් ගැව සි ත
නිතො ර ව දිය කෙළිති තො සි න

129 ළතර, ඉතා යෞවනවූ; ළඳුන්, කාන්තාවන්ගේ; යසිත, මනාවූපරිද්දෙන්; හදය, හෘදයෙහි පිහිටියාවූ; පතර, මහත්වූ; දෙපියොවුරු, පයොධර වන්‍දයන්ගේ; විලසිත, විලාස යෙන් යුත්; විල්ගැවසිත, (ඒ නගරයෙහි) තඩාගයන්හි සංචාරය කරන්නාවූ; නිසර රදුහු, හංසරාජයෝ; තොසිත, සන්තුෂ්ටව; නිතොරව, අනවරතයෙන්; දිය කෙළිති, ජලක්‍රීඩනය කරන් නාහුය.

130 සු සැ ට කලා දත් පඬි ව රු
යු ද ට නිපුණ රජමැති ව රු
ද න ට පසිඳු ගරු සිටු ව රු
පි න ට දිලෙත් විලස දි ව රු

130 සුසැට, චතුඃෂෂ්ටි විධවූ; කලා, කලා ශිල්පයන්; දත්, අවබොධ කළ; පඬිවරු, ප්‍රාඥයෝද; යුදට, යුඩයෙහි; නිපුණ, දක්‍ෂවූ; රජමැතිවරු, රාජාමාත්‍යයෝද; දනට, වස්තුසම්පත්ති යෙන්; පසිඳු, ප්‍රසිඬවූ; ගරු, ගෞරවාන්විතවූ; සිටුවරු, ශ්‍රෙෂ්ඩි හුද; පිනට, පුණ්‍යමහිමය හෙතු කොටගෙන; දිවරුවිලස, දිව්‍ය ස්වරූප විලාසයෙන්; දිලෙත්, (මෙපුර) භ්‍රාජමාන වන්නාහුය.

131 දි ව ඉ සි ව ර අහස ස ර න
හා න ව ස ර වෙද මතු ර න
රු දි මනහ ර ගිරිඳුදු ර න
උ ප වනපු ර ඇත සොඳු ර න

131 අහස සරන, ආකාශයෙහි සංචාරය කරන්නාවූ; දිව ඉසිවර හා, දිව්‍යඎෂින් හා; වෙද, වෙද (මන්ත්‍රයන්); මතුරන, ජප කරන්නාවූ; නවසර, තාපසයින් ද; රුදි, රජිතවූ; මනහ

මනොඥවූ; ගිරිදුර්ග, පර්වත ජර්ජරයන් ඇත්තාවූ; සොඳුරත, සුන්දරවූ; උපවන, වනොද්‍යාන (පංක්තියක්ද); පුර, මේ නගරයෙහි; ඇත, ඇතිවන්නේය—

## චතුර්ථ සර්ගය සමාප්තයි.

—o:o—

132 ඉඳුරු පුර දිනු තු රු
කේතුමතියෙහි විසි තු රු
සක්රුවනණ පැ තු රු
අසව් සක්විති රජුගෙ තොර තු රු

132 ඉඳුරුපුර, ශක්‍රපුරය; දිනු, ජයග්‍රහණය කළාවූ; උතුරු, ශ්‍රෙෂ්ඨවූ; විසිතුරු, විචිත්‍රවූ; කේතුමතියෙහි, කෙතුමතී නම් රාජධානියෙහි (වසන); සක්රුවන, චක්‍රරත්නයක් ඇත්තාවූ; අණ පැතුරු, (චාතුර්මහාද්වීපයෙහි) ආඥාව පැතිරවූ; සක්විතිරජුගෙ, චක්‍රවර්ති නරේන්ද්‍රයාගේ; තොරතුරු, විශෙෂ විභාගය; අසව්, ශ්‍රවණය කරව්—

133 සසර පෙර දව ස ක
දෙදෙන පිය පුත් විල ස ක
තමන් ලත් පෙදෙ ස ක
දිඹුල්දණ්ඩෙන් තැනූනිව ස ක

133 සසර, සංසාරයෙහි; පෙරදවසක, පූර්වකාලයෙක්හි; පිය පුත්, පිතෘපුත්‍රත්වයෙන් යුත් (හෙවත් පියා සහ පුත්‍රයා වූ); දෙදෙන, ද්විපුද්ගලයක්හු; තමන් ලත්, තමන්ට අයිති; පෙදෙසක, භූමිප්‍රදෙශයෙක්හි; දිඹුල්දණ්ඩෙන්, උදුම්බරකාෂ්ඨයෙන්; තැනූ, නිර්මාණය කරන ලද; නිවසක, වාසස්ථානයෙක්හි; (මතු තුන් කවක් හා කුලකයි.)

134 සත් පසේ මුනි ව ර
වස්වසවා ම සත් ව ර
කළ ගරු පින් ප ව ර
බෙලෙන් දිවසුව විඳ අනෙක ව ර

134 වර, උතුම්වූ; සත්පසේමුනි, ප්‍රත්‍යෙකමුනීන්ද්‍රයන් වහන්සේලා සත්නමක්; සත් වරම, සප්තවාරයෙක්හිම; වස් වසවා, වස්එළඹවමින්; කළ, කරන ලද්දාවූ; පවර, ප්‍රවරවූ; ගරු පින් බෙලෙන්, ගරුවූ කුශලක්‍රියා හෙතුබලයෙන්; අනෙකවර, අනන්තවාරයෙක්හි; දිවසුව, දිව්‍ය-ඓශ්වර්‍ය්‍යය; විඳ, විඳිනාය කොරේෂින්—

135 ගොයුම්ගොත් මුනි කාල
දෙදෙනතුර පුත් එම් කාල
බද්දිය නම් ස කාල
ලබා සිටුතනතුරද මන කාල

135 ගොයුම්ගොත්මුනි, අප ගෞතමගොත්‍රමුනීන්‍ද්‍රයන්ගේ, කාල, කාලයෙහි; දෙදෙනතුර, ඒ පිතෘපුත්‍රද්විජනයන් අතුරෙන්; පුත්, පුත්‍රතෙමෙ; බද්දියනම්, භද්දිය යන නාමයෙන් (ප්‍රසිඬවූ); සකාල, කල්‍යාණලක්‍ෂණොපෙතවූ; එම්කාල, ඒ කාලයට (අසිනි); මනකාල, මනොඥවූ; සිටු තනතුරද, ශ්‍රෙෂ්ඨිස්ථානාන්තරයද; ලබා, ලබ්ධව—

(මේ භද්දිය නම් සිටාණෝ මෙහි මහාපණාද නම්නුද මතු දක්වනු ලැබෙත්.)

136 ගෙනැ මුනිඳුගෙ ස රණ
නම කාර බැතින් දෙස රණ
කාර බවදුකු හ රණ
වැඩිය මොක්පුර සිරින් සපු රණ

136 මුනිඳුගෙ, ඒ ගෞතම මුනීන්‍ද්‍රයන්ගේ; සරණ ගෙනැ, ප්‍රතිෂ්ඨාධාරය ලැබ; බැතින්, භක්තියෙන්; දෙසරණ, ශ්‍රීපාදචන්‍ද්‍රය; නම කාර, අභිවාදනය කොට; බවදුකු, සංසාර දුඃඛය; හරණ කාර, වර්ජිත කොට; සිරින්, සෞන්‍දර්‍ය්‍යයෙන්; සපුරණ, පරිපූණ්වූ; මොක්පුර, නිර්‍වාණපුරප්‍රවරයට හෙවත් මොක්‍ෂයට; වැඩිය, වැඩම කොළේය.

137 පිය කළ එපින් පල
වැඩි වූයෙන් ලෙස'ම පල
අප මුනි කාල ස පල
තුරා සොළවර පිඳ සදෙව් පල

137 පිය, පියා විසින්; කළ, සිඬ කරන ලද්දාවූ; එපින් පල, ඒ පූණ්‍යෝකතවූ පුණ්‍ය ඵලය; අමපල ලෙස, අමෘත ඵලයක් මෙන්; වැඩිවූයෙන්, වර්‍ද්ධනයවූ හෙයින්; සපල, ඵලසහිතවූ; අපමුනි කාල, අප ගෞතමමුනීන්‍ද්‍රයන්ගේ කාලය; සොළවරතුරා, ප්‍රානතය තොක්; සදෙව් පල, ෂඩ්විධ දිව්‍යසම්පත්තිය; පිඳ, පින්‍දනයකොට-(මතුකාව හා කුලකයි.)

138 ගුණයෙන් අ සංකය
කේතුමති සග සංකය
එතිරිඳු නි සංකය
දිනයි සක්විතිරජව සංකය

138 ගුණියෙන්, (ඓශ්වර්‍ය්‍යාදි) ගුණයන් කාරණ කොට ගෙන; අසංඛය, සඞ්ඛ්‍යාවක් නැත්තාවූ; සග සංඛය, ස්වර්ගීයයි ශංඛා කටයුතුවූ; කේතුමති, කෙතුමතීනම් රාජධානියෙහි; තිසංඛය, සැකනැතිව; එතිරිඳු, ඒ නරේන්‍ද්‍රතෙමෙ; සංඛය, සංඛ යන නාමයෙන් ප්‍රසිද්ධවූ; සක්විතිරජ ව, චක්‍රවර්ත්තිරාජන් ව; දිනයි, ජනිත වන්නේය.

139 සොඳුරු එ පුර අසෙකි ආයු වළඳන කල අ තරා
ම හරු ප ව ර මහපණාද රදු තෙද අණ ප තරා
ස පිරු ල කර මාලිගයක විසූ සිරින් නි තරා
මි තුරු අ ම ර සංඛරදුට අත්වෙසි එය ස තරා

139 සොඳුරු, සුන්දරවූ; එපුර, ඒ (කෙතුමතීනම්) නගර යෙහි; අසෙකි ආයු, අසඞ්ඛ්‍යයක් ආයුෂය; වළඳන, වළඳනය කරන්නාවූ; කල අතරා, අනන්තර කාලයෙහිදී; මහරු, මාහැඟිවූ; පවර, ප්‍රවරවූ; තෙද අණ, ආඥා තෙජසින්; පතරා, පතළාවූ; මහපණාද රදු, මහාපණාද යන නාමයෙන් (ප්‍රසිද්ධවූ) රජතෙමෙ; ලකර, ස්වලඞ්කෘතවූ; සපිරු සිරින්, පරිපූර්ණශ්‍රියෙන් යුක්තවූ; මාලිගයක, රාජමන්දිර යෙක්හි; නිතරා, නිරතුරුව; විසූ, වාසය කොළේය; අමර, දෙවියන්ට; මිතුරු, මිත්‍රවූ; සංඛරදුට, සංඛාභිධාන චක්‍රවර්ත්ති නරනායකයන් හට; සතරා, මහත්වූ; එය, ඒ මාලිගය; අත් වෙසි, ලැබෙන්නේය.

140 පු ර ඳ ර බවනය සිරිගත් මාලිග යස ඉසු රේන්
නොමිහැ ර පස්විසියොදනක් උස්වෙයි සොඳ රුසි රේන්
නි ම ක ර තැනු සියක් මහල් දිලියෙන් එහි අතු රේන්
එ ස ත ර සූදහසක් රන්ගබඩා ඇතවිත රේන්

140 යස ඉසුරෙන්, යශඓශ්වර්‍ය්‍යයෙන්; පුරඳර, පුරන්දර යාගේ හෙවත් ශක්‍රයාගේ; බවනය, විමානයෙහි; සිරි, ශොභාව; ගත්, ග්‍රහණය කළාවූ; සොඳ, සුන්දරවූ; රුසිරෙන්, අලඞ්කාරයෙන් යුක්තවූ; මාලිග, ඒ මාලිගාව; නොමහැර, අනූනව; පස්විසි යොදනක්, පඤ්චවිංශති යොජනයක්; උස් වෙයි, උන්නතභාව වන් නේය; එහි අතුරෙන්, එය අතර තුරෙහි; නිම කර, නිෂ්ඨා කර; තැනු, සජ්ජිත කළාවූ; සියක් මහල්, ශත මාලකයක්හු; දිලියෙන්, දීප්‍යමානවන්නාහුය; විතරෙන්, සුදුසුපමණින් යුක්තවූනොහොත් විස්තාරයෙන් යුක්තවූ; එරන් ගබඩා, ඒ ස්වර්ණමය භාණ්ඩාගාර යන්; අසූසතරදහසක්, චතුරශීතිසහස්‍රයක්; ඇත, ඇති වන්නා හුය.

141 රු ස ගන ර න් කළ බිතුවැඹ එවිමන සිරිනි න්ද්‍ර
ය ස රිදියෙ න් සුසැදූ කොත් දූව පේසාඩ රු න්ද්‍ර
ඝොස සුව නි න් සෙවෙනිසොයා පොළොවද තිලිනි න්ද්‍ර
හ සකෙසරුන් වගරු පබළු දුටුදන මන බැ න්ද්‍ර

141 සිරින්, ශ්‍රීයෙන්; ඉන්ද්‍ර, චන්ද්‍රයාට් බඳුවූ; එ විමන, ඒ මන්දිරයෙහි; ගනරන් රුස, ඝනකනක සමූහයකින්ම; කළ, නිර්මාණය කරන ලද; බිතු, බිත්තිහා; වැඹ, ස්තම්භද; යස, සුන්දරවූ; රිදියෙන්, රජතයෙන්; සුසැදූ, සුසජ්ජිත කළාවූ; කොත්, ශෘඞ්ගද; දූව (තුලාසංඝාටාදි) ද්‍රව්‍ය හා; පේසාඩ, පියවසාකඩින්ද යුක්ත කොට; ඝොස, සන්තුෂ්ටිකාරවූ; සුවනින්, සවර්ණයෙන්; සෙවෙනි, ඡදනය; සොයා, සෙවිලි කර; පොළොව ද, භූමිය ද; තිලිනින්ද්‍ර, ඉන්ද්‍රනීලයෙන්ද යුක්ත කොට; රුන්ද්‍ර, රජනය කළ; හස, තිස රුන්ගේද; කෙසරුන්, සිංහයන්ගේද; වග, ව්‍යාඝ්‍රයන්ගේද; රූ, රූපයන්; පබළු, ප්‍රවාලමයවූ; දුටුදන, තිරීක්ෂණයකළ ජනයන් ගේ; මන බැන්ද්‍ර, මනොබන්ධනයකළාවූ-(මිතුකාව හා කුලකයි)

142 ස ව න සු ර න් පුරෙන් අඩක් දෙරණට-බට වි ලසා
නෙව න රු වි න් සොඳ එවිමන බබුළුවමින් නො ලසා
ප ව න වෙයි න් අහසට පැන ඇඹරී නොව අ ලසා
දෙ ව න සු පු න් සඳසේ පුර පිහිටයි සෙත ස ලසා

142 සවන සුරන් පුරෙන්, ෂෂ්ඨවූ දෙව්ලොවින්; අඩක්, අර්ධයක් හෙවත් කොටසක්; දෙරණට, පෘථිවියට; බට විලසා, අවතීර්ණවූවාක් මෙන්; නෙවන රුවින්, අනෙක රූපශ්‍රීයෙන් යුක්තවූ; සොඳ, සුන්දරවූ; එවිමන, ඒ විමානය; නොලසා, අන ලස වැ; බබුළුවමින්, භ්‍රාජිතව; පවන වෙයින්, වාතවෙගයෙන්; අහසට පැන, ගගනොල්ලංඝනය කොට; නොව අලසා, ශීඝ්‍රව; ඇඹරී, ආවෘත්ත වැ; දෙවන සුපුන් සඳසේ, ද්විතීය පූර්ණ චන්ද්‍රයකු මෙන්; සෙත සලසා, ශාන්තිශ්‍රිය ප්‍රදානය කොරෙමින්; පුර, ඒ නගරාභ්‍යන්තරයෙහි; පිහිටයි, ප්‍රතිෂ්ඨිත වන්නේය.

143 තු මු ල බ ලැනි ස ක් රු ව න ද ජ ය සිතුමිණි රු ව නා
ද ව ල පැහැනි ඇත් රු ව න ද හ ය සිරිසර රු ව නා
වි පු ල තෙදැනි පු ත් රු ව න ද හි ය සරමැනි රු ව නා
ක ම ල රුවැ නි කා ත් රු ව න ද දි ය මෙමසත්රු ව නා

143 තුමුල, මහත්වූ; බලැනි, පරාක්‍රමාන්විතවූ; සක්රුවනද, චක්‍රරත්නයද; ජය, විජයශ්‍රීයෙන් යුත්; සිතුමිණි රුවනා, චින්තාමාණික්‍ය රත්නයද; දවල, ශුභ්‍රවර්ණවූ; පැහැනි, ප්‍රභාසම්පන්නවූ;

ඇත්රුවනද, හස්තිරත්නයද; සිරිසර, ශ්‍රීසාරවූ; හය රුවනා, අශ්වරත්නයද; විපුල, මහත්වූ; තෙදැති, තේජසින් යුත්; පුත් රුවනද, පුත්‍ර (පරිණායක) රත්නයද; හියසර, හිතකාරීවූ; මැති රුවනා, අමාත්‍ය (ගෘහපති) රත්නයද; සාමල, ශ්‍රීකාන්තාවැති; රුවැති, රූපශ්‍රීන් යුක්තවූ; කත් රුවනද, කාන්තාරත්නයද යන; දිය, විජයශ්‍රී; මෙම සත් රුවනා, මේ උක්තප්‍රකාර සප්තරත්න යද යන—(මනුෂ්‍යව හා කුලකයි.)

144 ප සි දු රු ව න් සතක් අනැගි දූරු සක්විති දි ය නා
ය ළි දු පු තු න් දහස් ලබයි තම සම සිතු හ ය නා
නො ම දු ස දු න් සුවඳ වැහෙයි සිරුරෙන් පිනු න ය නා
පි ති දු මු වෙ න් පියුම් සුවඳ නික්මෙයි කි දි ය නා

144 පසිදු, ප්‍රසිඞවූ; අනැගි, අනඝවූ; රුවන් සතක්, සප්ත රත්නයක්; දූරු, ධාරිතවූ; සක්විති දියනා, ඒ චක්‍රවර්ති ජගන්නාථ යන තෙමේ; යළිදු, නැවතත්; සිතු හයනා, චිත්තාකර්ෂණය කරන්නාවූ; තම සම, තමන් සමානවූ; දහස් පුතුන්, සහස්‍ර පුත්‍රයන්; ලබයි, ලබන්නේය; නොමඳු, අමඳවූ; නයනා පිනු, නෙත්‍රය ප්‍රීණනය කළාවූ; සිරුරෙන්, (ඒ නරාධිපතිහුගේ) ශරීර යෙන්; සඳුන් සුවඳ, චන්දන සුගන්ධය; වැහෙයි, වහනය වේ; පිතිඳු මුවෙන්, පූර්ණචන්ද්‍රායමාන මුඛයෙන්; පියුම් සුවඳ, පද්ම සුගන්ධ යද; නික්මෙයි, නිෂ්ක්‍රාන්ත වේ යයි; දියනා, ගජනායකවූ ගෞතම සම්බුදුවහන්සේ; කී, දෙශනා කළසේක.

145 ස හ ස් නෙති දු පිරිවැරු ගරු එසිවු වරම් සු ර නා
වි ල ස් සු රි දු සතර දෙනෙක් නිරතුරු කග ද ර නා
අ හ ස් හි රු දු සිවුදිග රදු රකිත් සුසිරි ස ර නා
ද හ ස් මැ නි දු තිහි හැසිරෙයි ඉදුහබෙලෙන් න ර නා

145 සහස් නෙතිඳු, සහස්‍ර නයනයා හෙවත් සක්දෙවිරද; පිරිවැරු, පරිවෘතවූ; ගරු, ගරුවූ; එසිවුවරම් සුරනා, ඒ සතර වරම් දෙවරජුන්ගේ; විලස්, විලාසයෙන් යුක්තවූ; අහස්හි, ආකාශයෙහි; සිවුදිග, චතුර්දිග්භාගයෙහි; රුදු, රජිතවූ; නිරතුරු, නිරන්තරයෙන්, කග දරනා, ඛඩ්ගගත්අත් ඇත්තාවූ; සුරිඳු සතරදෙනෙක්, චතුස්සුරේන්ද්‍රයෝනෙක්; සුසිරිසරනා, සුචරිත යෙහි හැසිරෙන්නාවූ; රදු, මේ චක්‍රවර්තිනරෝත්තමයා; රකිත්, ආරක්ෂාග්‍රහණය කරන්නාහුය; නරනා, මේ නරේන්ද්‍රතෙමේ; දහස් මැනිඳුන් ඉහි, සහස්‍රමන්ත්‍රීන් හා එක් ව; ඉදුහ බෙලෙන්, ඍද්ධි බලයෙන්; හැසිරෙයි, (ආකාශයෙහි) සංචාරය කරයි.

146 ස ත ර සුමේ න හට නෙත හිත අත මත පුදව දි නා
ප ත ර ස මි ත මෙරද උදය අහසට නැඟ තෙ දි නා
ස ත ර දි ග තැ විද පසසිල් රකිනට කියත දි නා
අ ත ර නැ ව ත මැඳුරත එයි දිවාහරට එ දි නා

146 සුමෙත සතරහට, සුන්දරවූ මෛත්‍රෙය මුනීන්ද්‍රයන් හට; නෙත හිත අත මත, නෙත්‍ර චිත්ත හස්ත මස්තකයෙන්; පුද, පූජනය කොට; වඳිනා, නමස්කාර කරන්නාවූ; පතර, ප්‍රසිද්ධවූ; සමත, සමර්ථවූ; මෙරද, ඒ සක්විති ක්ෂිතිපතිහු; තෙදිනා, තෙජොකාන්තිශ්‍රියෙන්; උදය, ප්‍රත්‍යූෂයෙහි; අහසට, ආකාශයට; නැඟ, උල්ලඞ්ඝනය කොට; සතර දිගත, චතුර්දිගන්තයෙහි; ඇවිද, ආහිණ්ඩනය කරමින්; පසසිල්, පචශීලය; රකිනට, රක්ෂා කිරීම පිණිස; නදිනා, නරයේ; කියා, (සකල සත්ත්වයාහට) අණ කර; නැවත, යළිත්; අතර, ඒ අතරෙහි ම; එදිනා, ඒ දිනයන්හි; දිවාහරට, දහවල් අහරකෘත්‍යය පිණිස; මැඳුරත, (ස්වකීය) මන්දිරයට; එයි, ආගමනය කරන්නේය.

147 එ දින දිඹුල්දණ්ඩෙන් කළ එපන්සලෙහි පි තෙ නා
මෙ දින සංඛ සක්විතිරද ලබයි පාය ර තෙ නා
ඇ දින පිදූ අනුහස් එකයහනෙහි පින්පැ තෙ නා
සොඳින සුවාසූ දහසක් රුවන් යහන් තැ තෙ නා

147 එදින, ඒ අතීත කාලයෙහිදී; දිඹුල්දණ්ඩෙන්, උදුම්බරා කාෂ්ඨයෙන්; කළ, නිර්මාණය කරන ලද; පන්සලෙහි, පර්ණශාලායෙහි; පිතෙනා, ඒ පුණ්‍යතෙජස හෙතු කොට ගෙන; මෙදින, මේ මෛත්‍රෙය (බුද්ධොත්පාද) කාලයෙහි; සංඛසක්විතිරද, සක්සක්විති නරෙශ්වරතෙමෙ; රතෙනා, සවර්ණමයවූ; පාය, ප්‍රාසාදය; ලබයි; ලැබගන්නේය; අනුහස්, පුණ්‍යානුශංසය; ඇඳින, සජානනය කොට; පිදූ, පුදන ලද; එක යහනෙහි, එකම ශයනයෙහි; පැන එනා, උල්ලඞ්ඝිතව එන්නාවූ; පින්, පුණ්‍යශ්‍රියෙන්; සොඳිනා, සුන්දරාකාරයෙන්; සුවාසූ දහසක්, චතුරශීතිසහස්‍ර පරිමිතවූ; රුවන්යහන්; සවර්ණමයවූ ශයනයෝ; තැනෙනා, ප්‍රාදුර්භූත වන්නාහුය.

148 එ දූ පිදූඑක ඇතිරිලි බෙලෙන් තිරිඳු වි සි නා
මෙදූ සුවාසූ දහසක් බරණ ලබයි ය සි නා
ස දූ දීපු බොදුනෙන් බැලමෙහෙවරකොට තො සි නා
නා දූ නෙදිවබෝජන රජ ලැබගනි නොවල සි නා

148 නිරිඳු විසිනා, මේ පෘථිවීශ්වරයාණන් විසින්; එදා, පාඳිනයෙහි; පිදූ, පුදනලද; එක ඇතිරිලි, එකම ආස්තරණයෙහි; බෙලෙන්, හෙතු බලයෙන්; මෙදා, මේ (මෛත්‍රෙය බුද්ධොත්පාද) කාලයෙහි; සුවාසූදහසක්, චතුරශීතිසහස්‍රපරිමිතවූ; බරණ, ආභරණයන්; යසිනා, යසසේ; ලබසි, ලබන්නේය; තොසිනා, සන්තොෂයෙන්; බැලමෙහෙවර කොට, දශකර්මාන්ත කොට; සදදීපු, සජ්ජිතකොට දෙනලද; බොදුනෙන්, භොජනයාගේ අනෘශංසයෙන්; නඳ, සන්තුෂ්ටිකරවූ; නෙදිවබෝජන, අනෙක දිව්‍ය භොජනයන්; නොවලසිනා, අනලස වූ; රජ, ඒ ධරණීශ්වර තෙමේ; ලැබගනී, ලබාගන්නේය.

149 එ ක පුටුවක් පිදූ පිතින් එරජ සැදැහැ සි තිනා
සැ ක නොවු සිව්අසූදහස් සිහසුන් වෙත් නි තිනා
එ ක තුව දන්පිසූ ලියත් සමගින් සම මෙ තිනා
නෙක සිරි සිව්අසූදහස් ළඳුන් ලබසි රු තිනා

149 එරජ, ඒ නරපුඞ්ගවයා විසින්; සැදැහැ සිතිනා, ශ්‍රද්ධා චිත්තයෙන්; එකපුටුවක්, එකම පීඨයක්; පිදූ පිතින්, පූජනය කළ පුණ්‍යබලයෙන්; සිව්අසූදහස්, චතුරශීතිසහස්‍ර පරිමිතවූ; සිහසුන්, සිංහාසනයෝ; සැකනොවු, ශංකාරහිතව; නිතිනා, නිරන්තරයෙන්; වෙත්, ඇතිවන්නාහ; සමමේතිනා, විනෙතසාග්‍ර මෛත්‍රියෙහි සෙදී; එකතුව, සම්බන්ධව; දන්පිසූ, දානය පචනය කළ; ලියත් සමගින්, කාන්තාවන් සමග්‍රව; නෙකසිරි, අනෙකශ්‍රියෙන් යුත්; සිව්අසූදහස්, චතුරශීතිසහස්‍ර පරිමිතවූ; ළඳුන්, මහිෂිකාන්තාවන්; රුනිනා, රුචිවූපරිද්දෙන්; ලබසි, (ඒ සක්විතිරජතෙම) ලබන්නේය.

150 බැ ඳූ වැ ට ට වටකරු පන්සල රැක කොට එ ව රා
රැ ඳූ අ ව ට රුවන් පවුරු සතක් තිබෙත් නු ව රා
යෙදූ පෙළ ට වෙහෙරට තල්වටින් මෙනර ප ව රා
පි ද්‍ද එ ර ට රන්තල් ඇත පෙළින් සතක් හා ව රා

150 එවරා, ඒකාලයෙහිදී; පන්සල, පර්ණශාලාව; රැක කොට; ආරක්ෂා කොට; වටකරු, පරික්ෂිප්ත කොට; බැඳී, බන්ධනයකරන ලද; වැටට, වෘතිබන්ධනයෙහි (පුණ්‍ය බලය හෙතුවෙන්); නුවරා, ඒ නගරයෙහි; අවට, හාත්පස්හි; රැඳී, රජිතවූ; රුවන් පවුරුසතක්, ස්වර්ණමය සප්ත ප්‍රාකාරයක්; තිබෙත්, ඇතිවෙත්; මෙනර පවරා, මේ මහීපාලයන් විසින්; වෙහෙරට වටින්, විහාරයාගේ හාත්පස්හි; යෙදූ, යොජිත

කරන ලද්දවූ නොහොත් රෝපණය කරන ලද්දවූ; තල්පෙළට, තාලවෘක්ෂ පඞ්ක්තියෙහි අනුභසින්; තවරු, ස්ථාවර කොට; පිදූ, (දෙවියන් විසින්) පරිත්‍යාග කළ; රන්තල්, ස්වර්ණමයවූ තාලවෘක්ෂයෝ; පෙළින් සතක්, සප්ත පඞ්ක්තියක්; එරට, එනුවර; ඇත, ඇතිවන්නීය.

151 වැස් සෙව් වර සතක් එවස් ලැබෙනනුසස් නිදනක්
උස් තිරසර දනමනතොස් සුසැදෙයි සත් රුවනක්
වස් අත් වර පිදූ වඑ වස් වාසික සිවුරු ද නක්
රුස් වෙත්පුර තුළට සහස් සුරතුරු තව ගණනක්

151 වර සතක්, සප්තවාරයෙක්හි ම; එවස්වැස්සෙව්, ඒ වස්එළඹවීමෙහි; අනුසස්, අනෘශංසය හෙතුකොට ගෙන; ලැබෙන, ලැබෙන්නාවූ; නිදනක්, නිධානයක් මෙන්; තොස්, සන්තොෂය; දනවන, උපදවන්නාවූ; නොහොත් දනවන තොස්: දන, ජනයා; තොස්වන, සන්තොෂ වන්නාවූ; උස්, උස්වූ; තිරසර, ස්ථිරසාරවූ; සත්රුවනක්, සප්තවිධ රත්නයක්; සුසැදෙයි, ප්‍රාදුර්භූත වෙයි. දනක්, ඒ දානමය පුණ්‍යකර්මයක් කොට; වස්අත්වර, වස්අවසානවූ දිනයෙහි; පිදූව, පූජනය කළ; එවස්වාසික සිවුරු, ඒ වර්ෂාවාසික චීවර වස්ත්‍රයෙහි පුණ්‍ය මහිමයෙන්; පුරතුළට, ඒ [illegible] යෙහි; තව, අන්‍යවූත්; සහස් ගණනක්, සහශ්‍ර සංඛ්‍යාත; සුරතුරු, කල්ප වෘක්ෂයෝ; රුස්වෙත්, රාශීනුත් වන්නාහුය.

152 එම්හිසුරු වරගේ
අගබිසවගෙ මනරගේ
සඳ සිරි වෙනු උරගේ
දිනයි සුරගඟ සරඟ තරගේ

152 එම්හිසුරුවරගේ, ඒ චක්‍රවර්ති පෘථිවීශ්වරයාගේ; අගබිසවගේ, අග්‍ර මහිෂියගේ; මනරගේ, මනෝඥාකාරය (ශෝභමානවූද යනහොත්); වෙනු, විෂ්ණුහුගේ; උරගේ, වක්ෂස්ථලය නම්වූ ගෘහයෙහි (වාසයකරන්නාවූ); සිරිසුරි, ශ්‍රී දෙවියගේ මෙන්; සුරගඟ, ආකාශ නදියගේ; තරගේ, ඒ රළපඞ්ක්තියෙහි ඇත්තාවූ; සරඟ, මනොඥකාරය; දිනයි, ජයග්‍රහණය කරන්නේය.

153 සදිසි රතිස එවන්
සිරි සඳු නිබඳ සෙ ව්වන්
සන සිත ඇලෙ එවන්
නළල තුලඅඟන තිලකො ව්වන්

153 සව්වන්, සකල රූපශ්‍රී වර්ණයෙන්; රති, රතී නම් දිව්‍යාප්සරාව; සදිසි, සදෘශවූ; සිරිසඳු, ශ්‍රී දෙවිය විසින්; නිබඳ, නිරතුරුවම; සෙව්වන්, සෙව්නාලද්දාවූ; සත, සමස්තසත්ත්වයාගේ; සිත ඇලෙව්වන්, චිත්තාසක්තකරන ලද්දාවූ (මේ දෙවී තොමෝ); කුලඅඟන, කුලාඞ්ගනාවන්ගේ හෙවත් උත්තම වංශවත් ස්ත්‍රීන්ගේ; නළල, ලලාටයෙහි (සැදූ); එ තිලකොව්වන්, ඒ (කුඞ්කුම) තිලකයක් වැනිවේ.

154 ව ර ල උ දුළ දිගු පිල් රනමොනරි න් දු
න ළ ල ල සාළ අඩසඳ තන හසප න් දු
සු නි ල යු වළ නෙත් ඉඳුවර පෙතිබ න් දු
නි ම ල කොමළ එඅඟන වනු වෙනුළ න් දු

154 රනමොනරින්දු, සවර්ණමයූර රාජයකුගේ; පිල්, පිඤ්ඡකලාපයක් මෙන්; දිගු, දීඝීවූ; උදුළ, උජ්ජ්වලිතවූ; වරල, කෙශකලාපයක් ද; අඩසඳ, අර්ධචන්ද්‍රාකාරවූ; ලකළ, සවලඞ්කෘතවූ; නළල, ලලාටයක්ද; පන්දු, කන්දුකාකාරවූ; තනහස, තිසර පයොධරයන්ද; සු, මනොඥවූ; නිල්වන්, ඉන්ද්‍රනීලමාණික්‍යාකාරය හා; ඉඳුවරපෙති බන්දු, ඉන්දීවරපත්‍රාකාරවූද; නෙත්යුවල, නෙත්‍රයුගලයක්ද (ඇත්තාවූ); නිමල, නිර්මලවූ; කොමළ, කොමලාඞ්ගිවූ; එ අඟන, ඒ කාන්තාතොමෝ; වෙනු ළන්දු වනු, ශ්‍රී කාන්තාසදෘශ වන්නීය.

155 හැම ව ර රූ සි රූ බැමයුග වැනි පත නි ම් බ
මු ව ස ර මි යු රූ බස දෙඅදර පල බි ම් බ
දි ව ස ර අ යු රූ ඇගෙ වුවනත සඳ බි ම් බ
තුනු ව ර සො ඳු රූ එබිසව සරි රන බි ම් බ

155 දිවසර අයුරු. දිව්‍යාප්සරාවක් සදෘශවූ; හැමවර රූසිරු, සර්වකාලයෙහි රුචිරවූ; ඇගෙ, ඒ කාන්තාවගේ; බැමයුග, භ්‍රෑයුගමය තෙමේ; පතනිම්බ වැනි, කොසඹපත්‍ර වැන්න; මියුරු බස, මධුරවචනොපෙතවූ; මුව, මුඛය තෙමේ; සර, පදමයක් වැන්න; දෙඅදර, අධරයුගමය තෙමේ; පලබිම්බ, බිම්බිඵල වැන්න; වුවනත, වක්ත්‍රය තෙමේ; සඳබිම්බ, චන්ද්‍රබිම්බය වැන්න; සොඳුරු, සුන්දරවූ; තුනුවර, උත්තමවූ දෙහයතෙමේ; රනබිම්බ, සවර්ණබිම්බයකාව; සරි, සදෘශවන්නීය; එබිසව, ඒ මහිෂිකාකාන්තාවගේ—(මධ්‍යකව ගා කුලකයි)

156 ග හ න ර න කුසෙව් දත් මුතු සුපස න් න
ස ච න ර න ඔව්ලි ඉහනඟ මිට දු න් න
සො බ න ර න වනින් ගෙලෙ ජය සක පු න් න
දි ලෙ න ර න විලස අත් සපුදම වැ න් න

156 ගහන ශ්‍රෝණිය තෙමේ; රනකුසළුව්, ස්වර්ණාඞ්කුශයක් වැන්න; සුපසන්න, සුප්‍රසන්නවූ; දත්, දන්තයෝ තුමූ; මුතු, මුක්තා වැන්න; සවන, කර්ණ (යුගමය) තෙමේ; රනඔවිලි, රන් උන්සිල්ලාවක් වැන්න; ඉහ, කටිප්‍රදේශයතෙමේ; අනඟ, අනඞ්ගයාගේ; දුන්නම්ට, ධනුර්මුෂ්ටිය වැන්න; සොබන, ශෝභනවූ; රනවනින්, සෞවර්ණයෙන් යුත්; ගෙලෙ, ග්‍රීවය තෙමේ; පුන්න, පූර්ණවූ; ජයසක, ජයශංඛයක් වැන්න; රන විලස, ස්වර්ණාකාරයෙන්; දිලෙන, දීප්‍යමානවූ; අත්, හස්තවය තෙමේ; සපුදම වැන්න, චම්පකපුෂ්ප මාලාවක් වැන්න.

157 මදමත් සලළ ගජ බැඳ රඳනා වි කල
ගජනත් දිනසි එළදගෙ දෙවටොර ළ කල
සිරිමත් සිලුටුදහ සත පිනවන ස කල
පැහැපත් මලෙව් එතැඹිලි නුපුබුදු අ කල

157 මදමත්, මදයෙන් මත්තවූ; විකල, වෛකල්‍යයෙන් යුක්තවූ; සලළ, කාමුකයන් නමැති; ගජ, හස්තීන්; බැඳ, බන්ධනය කොට; රඳනා, රජිත කරන්නාවූ; එළදගෙ, ඒ කාන්තාවගේ; ළකල, මනොඥවූ; දෙවටොර, වෘත්තාකාරූ යුගමය; ගජනත්, හස්ති ශුණ්ඩාව; දිනසි, ජයග්‍රහණය කෙරෙයි; සිරිමත්, ලක්ෂ්මීමත්වූ; සිලුටු, ශ්ලිෂ්ටවූ; සකලසත, සමස්ත සත්වයා; පිනවන, ප්‍රීණනය කරවන්නාවූ; දහ, ජඞ්ඝා (යුගමය); අකල, අකාලයෙහිදී; නුපුබුදු, ප්‍රබුද්ධ නොවූ; පැහැපත්, ප්‍රභා සම්පන්නවූ; එතැඹිලි මලෙව්, ඒසතනිර පුෂ්පාකාර වැන්න.

158 බිඟුන් කැල නිසා රොන් ලොබ ම ලේයා
සිරින් තෙවුණ මෙන් රතුපුල් වි ලේයා
රුවින් දුලන ඇගෙනැබ සුනිම ලේයා
රැසින් වසාරොද දිලෙ ඉඳුනි ලේයා

158 මලේයා, පුෂ්පයන්ගේ; රොන් ලොබ, රේණුලොභිව් (වසන්නාවූ); බිඟුන් කැල නිසා, භෘඞ්ගසමූහයා කාරණ කොට ගෙන; රතුපුල් විලේයා, රක්තෝත්පල තඩාගය; සිරින්, ශ්‍රීයෙන්; තෙවුණ මෙන්, ජ්වලිතවූවාක් මෙන්; රුවින්, රූප ශ්‍රී සෞන්දර්යයෙන්; දුලන, බබළන්නාවූ; ඇගෙ, ඒ කාන්තාවගේ; සුනිමලේයා, අතිනිර්මලවූ; නැබ, නාභියෙහි (රජිතවූ); වසාරොද, රොමරාජි තොමෝ; ඉඳුනිලේයා, ඉන්ද්‍රනීල මාණික්‍යාකාරවූ; රැසින්, රශ්මියෙන්; දිලෙ, ජ්වලමානවේ.

159 ල කු ළු පි . යු ම් පදැගිලි දල ලෙ සේ යා
උ කු ළු යො වුන් මිණිගඟවැලි ප සේ යා
කැකු ළු කොදෙව් දත් දිලිසුවිල සේ යා
රැ කු ළු ර ති න් රුවකෙව් නිති දි සේ යා

159 දල ලෙසේයා, පත්‍රාකාරවූ; ඇඟිලි, අඞ්ගුලීන් යුක්තවූ; ලකුළු, සවලඞ්කෘතවූ; පදපියුම්, පද්මවැනි පාදම්ඤයක්ඇත්තාවූ; යොවුන්, යෞවන නමැති; මිණිගඟ, මාණික්‍යගඞ්ගායෙහි; වැලිපසේයා, වාලුකාපාලිවය හෙවත් වාලුකාතලය වැනි; උකුළු, (පෘථුලවූ) ජඝනය ඇත්තාවූ; කැකුළු කොදෙව්, කුන්දකුඞ්මලාකාරවූ; සුවිලසේයා, ශොභන විලාසයෙන්; දිලි, භ්‍රාජිතවූ; දත්, දන්ත ඇත්තාවූ; රතින්, සවර්ණයෙන්; රුකුළු, කරන ලද්දවූ; රුවකෙව්, රූපයක් බඳුව; නිති, නිරන්තරයෙන්; දිසේයා, දීප්‍යමානවූ (මේ කාන්තාවගේ);— (මතුකව හා කුලකයි.)

160 ළැම ප ත් දෙතන දුටු සරි සිරි අමා ප ල
ම ද ම ත් සෙද වැටෙත් බඹසරවත් නෙ ප ල
ප බ ව ත් බිසව මවමින් දුක රුසිරු ප ල
සි වු ව ත් මෙළඳ මැවුවැනි තුනුඅඟ ස ප ල

160 සිරි ශ්‍රියෙන්; අමාපල, අමෘත ඵලයන්; සරි, සදෘශවූ; ළැමපත්, හෘදයප්‍රාප්තවූ; දෙතන, පයොධර යුගමය; දුටු, දර්ශනය කළාවූ; නෙපල, අනෙකප්‍රකාර ඵලාන්විතවූ; බඹසරවත්, බ්‍රහ්මචාරිහු නමුදු; මදමත්, අනුරාගයෙන් මත්ව; සෙද, ශීඝ්‍රව ; වැටෙත්, (භූමියට) පතිත වන්නෝය; සිවුවත්, මහා බ්‍රහ්ම තෙමෙ; පබවත් බිසව, ප්‍රභාවතී (නම්වූ) මහිෂිය; මවමින්, නිර්මිත කරමින්; රුසිරු පල, රූපශ්‍රීලාවන්‍යයෙහි ඵලය; දුක, අවලොකනය කොට; තුනුඅඟසපල, දෙහාඞ්ග ලක්ෂණයෙන් සඵලවූ හෙවත් සමෘධවූ; මෙළඳ, මේ කාන්තාව; මැවුවැනි, නිර්මිතකළාක් වැනිවේ.

161 සු ර ඹා අනඟ කත දිනු යස ම නා ලි ය
පොල ඹා නුවන් ගමනින් සදිසි නා ලි ය
න ර ඹා සුරිඳු යම් තම් රුව් ව නා ලි ය
ක ර බා ඉඳි එවන ගත නොහි එ නා ලි ය

161 පොලඹා නුවන්, (දුටුවන්ගේ) නයනප්‍රලොභය කොට; ගමනින්, ගමන ලීලායෙන්; නාලිය, හංසිනියක් හා; සදිසි, සදෘශවූ; අනඟකත, අනඞ්ග කාන්තාව හෙවත් රතිනම් දිව්‍යාඞ්ගනාව (ඇතුළු); සුරඹා, දිව්‍යඅප්සරාවන්; දිනු, ජයග්‍රහණය කළාවූ;

යස, කීර්තිශ්‍රියෙන් යුත්; මනාලිය, (ඒ) මනොඥ කාන්තාවගේ; රුව, රූපශ්‍රිය; නරඹා, නිරීක්ෂණය කරමින්; යම්තම්, ලෙශ මාත්‍රයක්; සුරිඳු, ශක්‍රදෙවෙන්‍ද්‍ර තෙමෙ; මනාලිය, වර්ණනා කොට ලිමෙහි සමර්ථ වන්නේය; එනාලිය, ඒ නාගකන්‍යා තොමෝ; එවන ගතනොගි, යථොක්ත ලෙශමාත්‍ර වර්ණනාව වත් කරන්ට අපොහොසත්ව; නරබාඉඳී; (ලජ්ජාවෙන්) පතිතස්කන්ධ ඇතිව සිටින්නීය.

## පස්වම සඟිහය සමාප්තයි.

---

162 ලොව මහපුරිස් සි හ
දෙදෙනෙක් පහළවෙත් සි හ
කෙනෙක් වෙති බුදු සි හ
කෙනෙක් සක්විති වෙති එරජ සි හ

162 ලොව, ලොකයෙහි; සිහ, ශ්‍රෙෂ්ඨවූ; මහපුරිස් සිහ, මහාපුරුෂොත්තමවූ; දෙදෙනෙක්, ව්‍යුද්ගල කෙනෙක්; පහළ වෙත්, ප්‍රාදුර්භූත වන්නාහුය; කෙනෙක්, (ඒ දෙදෙනා අතුරෙන්) එක් පුද්ගල කෙනෙක්, බුදුසිහ වෙති, බුද්ධශ්‍රෙෂ්ඨයාණන් වහන්සේය; කෙනෙක්, අනික් පුද්ගලහු; එසක්විති රජසිහ වෙති, ඒ චක්‍රවර්තිරාජෙන්‍ද්‍ර වනසේක.

163 මෙතුමන් දෙදෙන තු ර
රන්වන් කය සුපිවි තු ර
දෙතිසක් තෙද උ තු ර
දිලෙත් මහ පුම ලකුණු විසි තු ර

163 මෙතුමන් දෙදෙන, මේ උක්තප්‍රකාර විජන ශ්‍රෙෂ්ඨයන්ගේ; සුපිවිතුර, මොනවට පවිත්‍රවූ; රන්වන්, සුවර්ණ වර්ණවූ; කය අතුර, ශරීරයෙහි; උතුර, උත්තරවූ (අධිකවූ); තෙද, තෙජසින් යුත්; විසිතුර, වෛචිත්‍ර්‍යාවහවූ; දෙතිසක්, ද්වාත්‍රිංශද්; මහපුම ලකුණු, මහාපුරුෂ ලක්ෂණයෝ; දිලෙත්, භ්‍රාජමාන වෙත්.

164 මෙම ලකුණු දෙති ස ක්
එකෙක ඇතිවෙයි වෙසෙ ස ක්
දුරු බුදු දිය ස ක්
පෙනේ උණුලොම්දැයි මෙලෙ ස ක්

164 මෙම, මේ උක්තප්‍රකාරවූ; ලකුණු දෙතිසක්, වාත්‍රිංශත්වර මහාපුරුෂ ලක්ෂණයන් අතුරෙන්; එකක, එක්ලක්ෂණයක්හුගේ; වෙසෙසක්, විශෙෂයක් හෙවත් ප්‍රමොදජනක විලාසයක්; ඇතිවෙයි, විද්‍යමාන වන්නේය; (එනම්) දියසක්, ජගනෙනත්‍රවූ; බුද්ධ, සර්වඥයන්වහන්සේ; දූරු, ධාරිතවූ; උණු ලොම්දහි, ඌර්ණාරෙම ධාතුයෙහි; මෙලෙසක්, මේ ආකාර (විශෙෂභාව) යක්; පෙනේ, දෘශ්‍යමාන වේ.—

165 මෙ ද ගහනත — අ ග
පිහිටා නළල ලෝ — අ ග
දවලවු වතින් — අ ග
සාරකෑවෙයි දකුණතට කර — අ ග

165 ලෝ අග, (ත්‍රෛ) ලොකාග්‍රයාණන්වහන්සේගේ; මෙ ද, මේ ඌර්ණාරෙමධාතුව; නළල, ලලාටයෙහි; ගහනත අග, නාසිකාග්‍රයෙහි; අග. අග්‍රවූ; දවලවු වතින්, සුභ්‍රවර්ණයෙන්; පිහිටා, ප්‍රතිෂ්ඨිතව; අගකර, අලඞ්කාර කොට; දකුණතට කර කැවෙයි, දක්ෂිණාවෘත්ත වන්නේය.—

166 සක්විති රජ තු — ම ට
මෙද සැදි කී මහි — ම ට
නළලත මැද ව — ම ට
කරකැවෙන බව දනිව් නිය — ම ට

166 සක්විතිරජතුමට, චක්‍රවර්ති රාජොත්තමයාහට; මෙද, මේ ඌර්ණාරොමධාතුව: කී. කථිතවූ; මහිමට, ආකාරයටම; සැදි, සජ්ජිතව; නළලත මැද, ලලාට මධ්‍යයෙහි; වමට කර කැවෙන බව, වාමාවෘත්තවන බව; නියමට, නිශ්චය කොට; දනිව්, ජානනය කරව්.—

167 මෙ ම උතුමෝ දෙ — දෙ න
එක කල ලොව නොඉප — දෙ න
වුව යම්සේ යෙ — දෙ න
පුවතසව් සව් අමාසිරි — දෙ න

167 මෙම, මේ උක්තප්‍රකාරවූ; උතුමෝ දෙදෙන, විජන මහාපුරුෂොත්තමයෝ; එකකල, එක ම කාලයෙක්හි; ලොව, ලොකයෙහි; නො ඉපදෙන, උත්පන්න නොවන්නාහ; යමසේ, යම්ආකාර යකින්; වුව, (එකම කාලයෙක්හි) උත්පන්නවූණිනම්; යෙදෙන, (ඒ කාරණ කොට ගෙන) යොජිතවන්නාවූ; සව් අමාසිරි, සර්ව අමෘතශ්‍රිය; දෙන, (ලොකයට) ප්‍රදානය කරන්නාවූ; පුවත, ප්‍රවෘත්තිය; අසව්, ශ්‍රවණයකරව්.—

168 සක්විතිරද එ   ව න්
වැඳ බුදු දෙපද රන්   ව න්
පුද කර සක්රු   ව න්
පැවිදි වෙයි එම සසුන ගරු   ව න්

168 එවන්, තාදෘශවූ; සක්විතිරද, චක්‍රවර්ත්තිනරෙන්ද්‍රතෙමෙ; රන්වන්, සෞවර්ණවූ; බුදුදෙපද, සර්වඥපාදද්වය; වැඳ, ප්‍රණාමය කොට; සක්රුවන්, චක්‍රරත්නය; පුද කර, පූජනය කොට; ගරුවන්, ගරුවූ; එම සසුන, එම (සර්වඥ) ශාසනයෙහි; පැවිදි වෙයි, ප්‍රව්‍රජිත වන්නේය.

169 මෙකිවිදි නොව   ර දු
සංක සක්විති සි   ර දු
වැඳ මෙතෙබුදු   ර දු
පැවිදි වෙයි කම්සුවෙහි නො   ර දු

169 මෙකිවිදි, මේ කථිතවූ විධානය; නොවරදු, විරොධ නොකොට; සංඛසක්විති සිරදු, සංඛාභිධාන චක්‍රවර්ත්ති රජසිංහ තෙමෙ; කම් සුවෙහි, කාම සම්පත්තියෙහි; නොරදු, නොබැඳී; මෙතේබුදුරදු, මෛත්‍රෙය මුනීන්ද්‍රයන්වහන්සේ; වැඳ, වන්දනය කොට; පැවිදි වෙයි, ප්‍රව්‍රජිත වන්නේය.

110 මුල එබෝ   දි ය නා
මරු දිනා වන   දි ය නා
අප මෙතේ   දි ය නා
පුවත මුල සව් මඳක්   කි ය නා

170 එ, ප්‍රසිද්ධවූ; නාබෝදිය මුල, නාගශ්‍රීබොධිද්‍රැමූලයෙහි; මරුදිනා, මාරපරාජය කොට; දියනා වන, බුදුවන්නාවූ; අප, අපගේ; මෙතේ දියනා, මෛත්‍රෙය ලොකනාථයන්වහන්සේගේ; මඳක් කියනා, (මෙහිදී) ලෙශමාත්‍රයකින් උච්‍යමාන වන්නාවූ; මූල පුවත, මූල ප්‍රවෘත්තිය; අසව්, ශ්‍රවණය කරව්.

171

ස කා ල කුණ වර දරු පදසර මොගොත නම් යුත් මුනි   ස ඳු
ස කා ල නෙමඩල තැඹුල ලෙස දුන බුදුව වැඩ හිඳිනා   ස ඳු
ස කා ල මරමත මතඟ සිඳිනා සිහ මෙතේ බෝසත්   ස ඳු
ස කා ල ගුණයුත් පබාවත් සක්විතිව දිනි ලොව තුඹ   ස ඳු

171 වර, උත්තමවූ; සකලකුණ, චක්‍රලක්ෂණය; දරු ධාරිතවූ; පදසර, ශ්‍රීපාදපද්මයකින් යුක්තවූ; මොගොත නම් යුත්, මුහුර්ත්තය යන නමින් යුක්තවූ; මුනිසඳු, මුනීන්ද්‍රොත්තම

යන්වහන්සේ; සකල තෛමඩල, සකලඥෙය මණ්ඩලය; අතැඹුල ලෙස, හස්තාමලකයක් මෙන්; දැන, අවබොධ කොට; බුදුව, බුඬත්වයට පැමිණ; වැඩහිඳිනා සඳ, වැඩවාසය කරනකල්හි; සක අල, සවකීය ආලය හා; මරමතඟ, මාරනමැති මත්තහස්තීන්ගේ; මත, ඊ ස්තාකය; සිඳිනා, ඡීතන කරන්නාවූ; සිහ, කෙශරි ඍද්‍රාය මානවූ; මෙතේ බෝසත් සඳ, මෛත්‍රෙය බොධිසත්ව තෙමේ; ලොවනුබ, ලොකය නමැති නභස්තලයට; සඳ, චන්ද්‍රයා මෙන්; සකල ගුණයුත්, සියලු ගුණයෙන් යුක්තවූ; පබාවත්, ප්‍රභාවන්ත යන නාමයෙන් ප්‍රසිඬවූ; සක්විතිරජව, චක්‍රවර්තිරාජන්ව; දිනි, ජනිතවිය.

172

සු බා සර සරසවිය මුවසර එසක්විතිරජ සු ස රුවන්
බ බා බිම දණ බඹාලෙස වැඳ මොහොතමුනිපදතඹු රුවන්
ලොබා එසසුන පැවිදිවී ලැබ මහරු අටදම් සක් රුවන්
ල බා ගති බුදුවන්ට පළමුව නියත විවරණ සපි රුවන්

172 සුබා, ශොභනවූ; සරසවිය, සරසවති දෙවිය; මුවසර, මුඛ නමැති පද්මයෙහි; සර, හැසිරෙන්නාවූ; සුසරුවන්, මොනවට සමාඬවූ; එ, ඒ උක්තප්‍රකාරවූ; සක්විතිරජ, චක්‍රවර්ති නරොත්තම තෙමේ; බඹාලෙස, මහාබ්‍රහ්ම ලීලායෙන්; බිම, ධරණියෙහි; දණ, ජානුයුගමය; ඔබා, ප්‍රතිෂ්ඨිත කොට; මොහොත මුනි, මූහුතී මුනීන්ද්‍රයන්ගේ; පද තඹුරුවන්; දෙපාපියුම්; වැඳ, අභිවාදනයකොට; එ සසුන, ඒ සම්බුඬශාසනය කෙරෙහි; ලොබා, ආලය කොට; පැවිදිවී, ප්‍රව්‍රජිතව; මහරු, මහාර්ඝවූ; අටදම්, අෂ්ටාඬගධර්ම නමැති; සක්රුවන්, චක්‍රරත්නය; ලැබ, ප්‍රතිලබ්ධව; බුදුවන්ට, සම්‍යක් සම්බුඬ වන පිණිස; සපිරුවන්, පරිපූර්ණවූ; නියත විවරණ, නියත ව්‍යාකරණශ්‍රිය; පළමුව, ප්‍රථමයෙන්; ලබාගති, (ඒ මූහුතී මුනීන්ද්‍රයන්ගෙන්) හස්තප්‍රාප්ත කෙළේය.

173

වි දු රු පැනසර දිරද මූව දිනු මෙතේ බුදුකුරු සුරිඳු නා රණ
සොදුරු සොළසාඅසෙකිකප්ලක්එතැන්සිටදසපෙරුම් සපුරණ
ඇ දු රු ලොවැදුරුදහස්මොකැදුරුඑවරතුළඳකනැමඳසුසරණ
බු දු රු වන වන පිණිස මරදෙව් ඔදුර සිඳ බිඳලදී විව රණ

173 විදුරු, වජ්‍රයට බඳු; සර, සාරවූ; පැන, ප්‍රඥයෙන්; දිරද මූව, ගණෙශයා; දිනූ, ජයග්‍රහණය කළාවූ; බුදුකුරු, ඒ

බුඩාංකුරවූ; මෙතෝ සුරිඳු නාරණ, මෛත්‍රෙය සුරේන්‍ද්‍රනාරායණ තෙමෙ හෙවත් උපෙන්‍ද්‍රායමාන මෛත්‍රෙය සුරේන්‍ද්‍රතෙමෙ; එතැන් සිට, එදවස් පටන්; සොදුරු, සුන්‍දරවූ; සොළසා අසෙකි කප්ලක්, ෂොඩශඅසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයක්; දස පෙරුම්, දශ පාරමිධර්මයන් සම්බන්‍ධවූ; සපුරණ, පාරිපූරි කරණය ඇත්තාවූ; එවරතුළ, ඒ කාලාභ්‍යන්තරයෙහි; ලොවැදුරු, මහාබ්‍රහ්මයාහට; ඇදුරු, ගුරුවූ; දහස්, සහස්‍රසඞ්ඛ්‍යාත; මොකැදුරු, මොක්‍ෂාචාරීන් හෙවත් සර්‍වඥවරයන්වහන්සේලා; දුක, නෙත්‍ර දර්ශනලාභීව; සුසරණ, (උන්වහන්සේලාගේ) සිරි පාපියුම්; නැමඳ, නමස්කාර කොට; මරදෙව්, වසවර්තිමාරදිව්‍යපුත්‍රයාගේ; ඔද, එඩිය; සිඳ; ඡින්‍න කොට; බිඳ, භින්‍න කොට; හැර, වර්‍ජිත කොට; බුදුරුවන වන පිණිස, සම්‍යක්සම්බුඩරත්‍නයවන පිණිස; විවරණ, ව්‍යාකරණශ්‍රිය; ලදී, ප්‍රතිලබ්ධ කෙළේය.

174

සි සිර කර හ ර පඬෙරහරගිරයසහරුර දිගු ලිය පැලැ න්ද්‍ර
සුනෙර යු ර තිර සඳෙව්සොමිගුණමෙතෝබෝසත්තෙදදිති න්ද්‍ර
ඉ වර කර පු ර මින් පෙරුම් දම් පෙරඑවරගෝතම දිති න්ද්‍ර
ප වර සුර පු ර තුසිත ඉපදුණිලබනතෙක් කල්වන ලොවි න්ද්‍ර

174 සිසිරකර, චන්‍ද්‍රයාය; හර, මහෙශ්වරයාය; පඬෙර, ශ්වෙතපද්මය; හරගිර, කෛලාශපර්‍වතය (යන මේ මඞ්ගල වස්තූන් හා සදෘශවූ); යසහර, කීර්තිකදම්බ නමැති මුක්තාහාරය; දිගුලිය, දිශා නමැති කාන්තාවන්ගේ; උර, වක්‍ෂඃස්ථල යෙහි: පැලැන්ද්‍ර, පිලන්‍ධනය කළාවූ; තිර, ස්ථිරසාරගුණය කරණ කොට ගෙන; සුනෙරයුර, සුමේරු පර්‍වතරාජයා සදෘශවූ; සොමිගුණ, සෞම්‍යගුණය කරණ කොට ගෙන; සඳෙව්, චන්‍ද්‍රයා සදෘශවූ; තෙද, තෙජස් ගුණය කරණ කොට ගෙන; දිතින්ද්‍ර, සූර්‍ය්‍ය සදෘශවූ; මෙතෝ බෝසත්, මෛත්‍රෙය බොධිසත්‍වතෙමෙ; පෙරුම්දම්, සමත්‍රිංශත්පාරමීධර්මයන්; පුරමින්, පූරණය කර මින්; ඉවරකර, නිමා කොට; ලොවින්ද්‍රවන (තමන්වහන්සේ) ලොවුතුරාබුදුවින්නාවූ; කල්,(බුඬොත්පාද) කාලය; ලබනතෙක්, සම්ප්‍රාප්තවනතුරු; එ ගෝතමදිතින්ද්‍ර, ඒ අප ගෞතම මුනීන්‍ද්‍ර යන්ගේ; වර, (බුඬොත්පාද) කාලයට; පෙර, පූර්‍වයෙහිදීම; පවර, ශ්‍රෙෂ්ඨවූ; තුසිතසුරපුර, තුෂිත නම් දෙව්ලොවෙහි; ඉප දුණි, (ඒ මෛත්‍රෙය බොධිසත්‍වතෙමෙ) උත්පන්‍නවූ සේක.

175

ස ත ර වර සැසිසතර මර බුන් එතර චරතර විතර බඹ සු ර
ස ත ර දිව් දසදහස් සක් වළ පිවිස සිරිසර තුසිත පුර සු ර
ස ත ර තම තම හසළ තියුකර පසඟ බිමොබා නැමඳ නත සු ර
ස ත ර දසබුදු සබිනැ වෙසරද ගෙවන සව්නේ තතුවියත් සු ර

175 සතර, ශත්‍රැවූ; මර, පඤ්චමාරයන්; බුන්, භග්නකළාවූ; වර, උතුම්වූ; සැසිසතර, අප ශාක්‍යසිංහජිනේන්ද්‍රයන්ගේ; තර, මහරු; වර, බුද්ධකාලයෙහි; එතරවිතර, ප්‍රාන්තප්‍රමාණයෙහිදී; සතරදිව්, සතරමහාද්වීප සහිත; දසදහස් සක්වළ, දශසහස්‍ර පරිමිත චක්‍රවාලයන්හි; බඹසුර, (සකල) බ්‍රහ්මාමර සමූහතෙමේ; සිරිසර, ශ්‍රීසාරවූ; තුසිතසුරපුර, තුෂිතදිව්‍ය පුරයට; පිවිස, ප්‍රවිෂ්ටව; තම තම, ස්වකීය ස්වකීයවූ; සතර, ශාස්ත්‍රාකාර; හසළ, පරිචිතවූ; තියුකර, ස්තුති කොට; පසඟ, (හස්ත පාද ශීර්ෂ යන) පඤ්චාවයවයන්; බිම, ධරණීතලයෙහි; ඔබා, අවස්ථාපිත කොට; නතසුර, නාථසුරේන්ද්‍ර මෛත්‍රෙය බෝසතාණන්වහන්සේ; නැමඳ, නමස්කාර කොට; සතරදසබුදුසබිනැ, චතුර්දශ බුද්ධඥානය හා ෂඩභිඥාවද; වෙසරද, සතරවෛශාරද්‍යඥානයද සහිත; සව්නේ, සකලඥෙය මණ්ඩලය; ගෙවන, කෙළවර කරන්නාවූ (නොහොත් කෙළවර කොට අවබොධ කරන්නාවූ) සුර, ශූරවූ; තතු, තත්ත්වාකාරය; වියත්, (යථොක්ත බ්‍රහ්මාමර ජනයෝ මෙසේ) ආරොචනය කරන්නාහුය.——

176

මෙ සු ර ස ර පොබයනට මොහගනඳුරට දිවයුරුසේ ළ කල්
අ ම ර ත ර ගඟ තරඟ රඟ තුඟු විකුම් යස සුරිඳුනි ස කල්
බි දැර ම ර බුදුවන්ට සව්නේ මඹුලුදූන පිළිබඳ තෙ කල්
ප ව ර ව ර දූන් පැමිණිබැව් අපි කියමු වැඳ සිරිපද මෙ කල්

176 මෙසුරසර, මේ දිව්‍යසමූහ නමැති පද්මයන්; පොබයනට, ප්‍රබොධ කිරීමටද; මොහගනඳුරට, මොහ නමැති ඝනාන්ධකාරය (දුරුකිරීම)ටද; ළකල්, මනොඥවූ; දිවයුරුසේ, සූර්‍ය්‍යයා වැනිවූ; තර, මහත්වූ; අමරගඟ, ආකාශගඞ්ගාවගේ; තුඟු, උන්නතවූ; තරගරඟ, තරඟාකාර හෙවත් රළපඞ්ක්තිය මෙන්; යස, යශොරාශියක්ඇති; විකුම්, වික්‍රමාන්විතවූ; සකල්, කල්‍යාණලක්ෂණ සහිතවූ; සුරිඳුනි, දෙවරාජොත්තමයාණෙනි! මර, පඤ්චමාරයන්; බිඳැර, බිඳපියා; තෙකල් පිළිබඳ, කාලත්‍රයවර්තිවූ; සව්නේ

මඬුලු, සකලඥෙය මණ්ඩලය; දැන, අවබොධ කොට; බුදුවන්ට, සර්‍වඥපදප්‍රාප්තවන්ට (යොග්‍යවූ); පවර, ප්‍රවරවූ; වර, කාලය; දැන්, වර්‍තමානයෙහි; පැමිණි බැව්, සම්ප්‍රාප්තවූභාවය; මෙකල්, මේ අවස්ථාවෙහි; සිරිපද (භවතුන්ගේ) ශ්‍රීපාදපද්මය; වැඳ, අභිවාදනය කොට; අපි, අසමත්හු; කියමු, ප්‍රකාශකරම්හ—

| | |
|---|---|
| 177 තිලෝ අප ආ | රි ය |
| විමසා මෙසෙට කා | රි ය |
| පෙර මුනිඳු සූ | රි ය |
| විලස පස් බැලුමෙන්ම සපු | රි ය |

177 අප, අසමත්හුගේ; තිලෝආරිය, ජගන්නාථ තෙමේ හෙවත් මෛත්‍රෙය බොධිසත්ව තෙමේ; මෙ, මේ කපිතවූ; සෙට කාරිය, ශ්‍රෙෂ්ඨ කර්‍තව්‍යය; විමසා, විමංසනය කොට; පෙර, පූර්‍වයෙහිවූ; මුනිඳුසූරිය, බුඬදිවාකරයන්ගේ; විලස, ශොභායෙන්; සපුරිය, පරිපූර්‍ණකොට; පස්බැලුමෙන්, පචමහා විලොකනයෙන්-(මතු කව හා කුලකයි.)

| | |
|---|---|
| 178 දිව්දෙස කල ල | කා ළ |
| කුල මව් පෙර පැතුම් | කා ළ |
| දිවනෙතින් සුල | කා ළ |
| මෙපස දනි තුන්ලෝවි සී | කා ළ |

178 ලකළ, අලඞ්කෘතවූ හෙවත් යොග්‍යවූ; කල, (බුඬොත්පාද) කාලයද; දිව්, (උත්පන්නවීමට) ද්වීපයද; දෙස, දෙශයද; කුල, පිතෘවංශයද; පෙර, පූර්‍වයෙහිදී; පැතුම්කළ, (සර්‍වඥ කෙනෙකුන්ට මවුවන පිණිස කල්පලක්‍ෂයක් මුලුල්ලෙහි) ප්‍රාර්‍ථනාකළාවූ; මව්, මාතෘව (මාතෘවගේ ආයුෂය) ද යන; තුන්ලෝ විසීකළ, භුවනත්‍රය වාසීන් වශග කළාවූ; මෙපස, මේ පචවිධ විලොකනය; සුලකළ, සවලඞ්කෘතවූ; දිවනෙතින්, දිව්‍යචක්‍ෂුෂයෙන්; දනී, විජානනය කරන්නේය—

| | |
|---|---|
| 179 තෙදිය දිය ගොස | දි ව් |
| කේතුමති පුර දඹ | දි ව් |
| කිත් කුල ගහෙව් | දි ව් |
| බමුණු වේ වර මහසකසෙ | දි ව් |

179 තෙදිය, ජගත්ත්‍රයෙහි; දිව්, ධාවනය කරන ලද; දිය ගොස, ජයඝොෂණයෙන් යුක්තවූ; දඹදිව්, ජම්බුද්වීපයෙහි; කේතුමතිපුර, කෙතුමතීනමින් ප්‍රසිඬවූ රාජධානියෙහි; එවර,

ඒ කාලයෙහිදී; දිවිසෙ, (ලොකයට) ප්‍රදීපයක්වැනිවූ; දිවිගහළුවි, ආකාශතාදිය මෙන්; කිත්, කීර්තිමත්; මහසක කුල, මහා ශාක්‍යවංශය; බමුණු වෙ, බ්‍රාහමණවංශය වේ.

180 කේතුමති පුර    ව ර
එසක් සක්විති නර    ව ර
පෙරවි මිහිසුර    ව ර
සුබඹ නම් යුත් වේය එම    ව ර

180 එම්වර, තත්කාලයෙහිදී; කේතුමති, කෙතුමතී නම්වූ; පුරවර, පුරප්‍රවරයෙහි; එසක්, ඒ සංඛයන නාමයෙන් යුත්; සක්විති නරවර, චක්‍රවර්තිනරොත්තමයාණන්ගේ; සුබඹනම් යුත්, සුබ්‍රහම යන නාමධෙයයෙන් ප්‍රසිඬවූ; පෙරවිමිහිසුරවර, පුරොහිතබ්‍රාහමණොත්තමයෙක්; වේය, ඇතිවන්නේය.

181 පිය වන තිලොවැ    දු රු
මෙ සුබඹ නැණින් බඹැ    දු රු
සිරින් සරි පුර    දු රු
එසඳ කවරෙක් ඔහුට වෙද    දු රු

181 තිලොව ඇදුරු, මෛත්‍රෙයත්‍රෛලොකාචායඹීන්වහන්සේට; පිය වන, පිතෘ වන්නාවූ; මෙසුබඹ, මේ සුබ්‍රහම නම් බ්‍රාහමණොත්තම තෙමෙ; නැණින්, ප්‍රඥවකාරණ කොට ගෙන; බඹ ඇදුරු, බ්‍රහමාචායඹීකු වැන්න; සිරින්, ඓශ්වයඹීය කාරණ කොට ගෙන; පුරඳුරු, පුරන්‍දරයා හෙවත් ශක්‍රයා; සරි, සදෘශය; (එහෙයින්) එසඳ, තත්කාලයෙහිදී; ඔහුට, ඒ උත්තමයාහට; කාවරෙක්, කතර ජනයෙක්; ඇදුරුවෙද, ආචායඹීවන්නේද; (ඔහු සියල්ලන්ට ආචායඹී යන අඹීයි.)

182 එතුමට නර සො    ස ර
රුසිරෙන් දිනූ දිව    ස ර
නමින් බඹවති    ස ර
සොඳුරු බිසවක් වෙයි සුසිරි    ස ර

182 නරසොසර, නරශ්‍රෙෂ්ඨවූ; එතුමට, ඒ බ්‍රාහමණොත්තමයාහට; රුසිරෙන්, රූපශ්‍රියෙන්; දිවසර, දිව්‍යප්සරාවන්; දිනූ, ජයග්‍රහණය කළාවූ; බඹවති, බ්‍රහමවතීය යන; නමින්, නාමයෙන්; (ප්‍රසිඬවූ); සුසිරි, පුණ්‍යශ්‍රියෙන් හෙවත් මූර්තිමත් කුශලයෙන්; සර, සාරවූ; සොඳුරු, සුන්‍දරවූ; බිසවක් සර, මහිෂිකා කාන්තාවක්; වෙයි, ඇතිවන්නීය.

183 කුලුණෙන් අ මා යා
සතවෙත වැනි අ මා යා
යසිනිඳු ස මා යා
ලොවට පෑ වැනි මහා මා යා

183 අමායා, මායා රහිතවූ; සතවෙත කුලුණෙන්, සත්‍වයා කෙරෙහි (පතළාවූ) කරුණායෙන්; අමායා වැනි, අමෘතයක් බඳුවූ; යසින්, කීර්තිය කරණ කොට ගෙන; ඉඳු, චන්‍ද්‍රයා බඳුවූ; (මේ දෙවීතොමෝ); ලොවට, ලොකයාඃහට; මහාමායා, මහාමායා දෙවිය; පෑ වැනි, ප්‍රකාශකළාක් වැන්නීය.

184 මෙඋතුම් දෙමව් පි ය
සමගව බුදු පිරිස් පි ය
කවරහුද ලෝ පි ය
දනිව් සොඳසඳබැතින් කර පි ය

184 මේ, මේ උක්තප්‍රකාරවූ; උතුම්, උත්තමවූ; දෙමව්පිය, මාතෘ පිතෘ දෙදෙනා; සමගව, සමග්‍රව; ලෝ පිය, ජගත්පිතෘවූ; බුදු, මෛත්‍රෙය බුදුරජාණන්වහන්සේගේ; පිය, ප්‍රියංකරවූ; පිරිස්, පෂිත්; කවරහුද; කතර පුද්ගලයක්හුද යන බව; සොඳ, සුන්‍දරවූ; සඳ බැතින්, චිත්තයෙහි භක්තියෙන්; පියකර, ප්‍රෙමය කොට; දනිව්, ජානනය කරව්.

185 ලක විසු ගැමුණු ර ද
කාවන්තිස්ස පිය ර ද
මෙතේ බෝසත් ර ද
සිහ සුබඹ පිය වේය නිව ර ද

185 ලක, මේ ශ්‍රීලඞ්කාවීපයෙහි; විසූ, වාසය කළාවූ; ගැමුණුරද, දුටුගැමුණු නාමයෙන් යුත් නරාධිපතිහුගේ; පිය, පිතෘවූ; කාවන්තිස්සරද, කාවන්තිස්ස නම්යුත් නරෙන්‍ද්‍ර තෙමෙ; නිවරද, නිරවද්‍යවූ; මෙතේ බෝසත්රදසිහ, කෙශරීන්‍ද්‍රායමාන් මෛත්‍රෙය බොධිසත්‍වරාජොත්තමයන්ට; පිය, පිතෘවන්නාවූ; සුබඹ වේය, සුබ්‍රහ්මයන නම් ඇති බ්‍රාහ්මණොත්තමයා වේ.

186 ගැමුණු රජ මව් ව න්
වෙහෙරමහ දේවී ව න්
මහසතුට මව් ව න්
බිසව් බඹවති වේ පසිදු ව් න්

186 ගැමුණුරජ, දුටුගැමුණු මහිපාලයාණන්ගේ; මව්වන්, මාතෘවවූ; වත්, වණීවත්වූ; වෙහෙරමහදේවී, විහාරමහාදේවී තොමෝ; මහසතුට, මෛත්‍රෙය මහාබොධිසත්ත්වයාණන්ගේ; මව්වන්, මාතෘවන්නාවූ; පසිදුවන්, ප්‍රසිද්ධ බවට පැමිණියාවූ; බඹවනි, බ්‍රහ්මවතී යන නාමයෙන් යුක්තවූ; බිසව වේ, බ්‍රාහ්මණ දෙවිය වන්නීය.

187 එ සාවත්ති ස් ස ය
නැහැණි අනුලාති ස් ස ය
මහසත් තිදෙ ස් ස ය
මෙහෙසි සඳමුව වේ සතො ස් ස ය

187 එ, ඒ පූර්ණොක්තවූ; සාවත්තිස්සය, සාවත්තිස්ස නම් යුත් මනුජේශ්වරයාණන්ගේ; නැගණි, බුහුනැණියන්වූ; තිස්සය, (සමස්ත ගුණයෙන්) යොග්‍යවූ; තිදෙස්සය, දෝෂ රහිතවූ; සතොස්සය, (එහෙයින්) සන්තුෂ්ටිකරවූ; අනුලා, අනුලානම් දෙවී තොමෝ; මහසත්, මහාබොධිසත්ත්වයාණන්ට; සඳමුව, චන්ද්‍රමුඛී නම් ඇති; මෙහෙසි වේ, මහිෂි රත්නය වන්නීය.

188 ලෙව් සසුන ත න් ද න
සල ගැමුණු මැඩ න න් ද න
සාලි නම් න න් ද න
එහිමි පුත් බඹවඩන න න් ද න

188 නන්දන, (මිථ්‍යාදෘෂ්ටිගත්) නොයෙක් ජනයන්; මැඩ, මර්දනය කොට; ලෙව් සසුන, ලොකශාසනවය; නන්දන සල, සතුටු කළාවූ; ගැමුණු, දුටුගැමුණු පෘථිවීශ්වරයන්ගේ; නන්දන, පුත්‍රවූ; සාලිනම්, ශාලිරාජකුමාර යන නමින් ප්‍රසිද්ධවූ කුමාර තෙමේ; එහිමි, ඒ මෛත්‍රෙය බොධිසත්ත්වයාණන්වහන්සේගේ; පුත්, පුත්‍රවූ; නන්දන, අනෙකශ්‍රීසමෘද්ධවූ; බඹවඩන, බ්‍රහ්මවර්ධන නම්වූ කුමාරොත්තම තෙමේ වේ.

189 ම න් මෙන දිග්බුවනුරතල යසස් සඳුන ගැ ල් වූ
ම න් පි න වන ගැමුණු රදත් සැඳූ තිස්ස ම ල් වූ
ව න් ද න සල පමණින් පද මොක් දෙන සුවිම ල් වූ
නන් ද න් සුවළගසව් වෙත් මුනිඳුට සිරිදු ල් වූ

189 දිගඹුවන්, දිශා නමැති කාන්තාවන්ගේ; උරතල, වක්‍ෂඃස්ථලයෙහි; යසස්සඳුන, කීර්ති නමැති චන්දන කල්කය; මන්මෙන, සිත්සේ; ගැල්වූ, විලෙපනය කළාවූ; මන්පිනවන,

මනොරජනය කරවන්නාවූ; ගැමුණු රදත්, දුටුගැමුණු නරෙන්‍ද්‍රයන්හා; මල්වූ, (උන්වහන්සේගේ) බාලසහොදරවූ; සැදූතිස්ස, ශ්‍රද්ධාතිශ්‍ය කුමාරයාණොත්; පදවන්දන කළ පමණින්, (තමන් වහන්සේලාගේ) පාදපද්ම ප්‍රණාමය කළ ප්‍රමාණයෙන්ම; සුවිමල්වූ, අතිනිර්මලවූ; මොක්දෙන, නිවන් සැප සාධාදෙන්නාවූ; නන්දන, යහපත්වූ; සිරිදුල්වූ, (ශතපූර්ණ) ශ්‍රියෙන් බබළන්නාවූ; මුනිඳුට, ඒ මෛත්‍රෙය මුනීන්‍ද්‍රයාණන්ට; යුවළගසව්වෙත්, අග්‍රශ්‍රාවක යුගලය වන්නාහුය.

190 ස ඟ නම් යුත් මැතිඳු ගැමුණු රදහුගෙ නැණ වි දූ රූ
ස ග සුව විඳ තම දුව සහ අවුත් එවර සො දූ රූ
අ ග සුව දෙන මෙතේමුනිඳුහට තුන්ලෝ ඇ දූ රූ
අ ග ගිහිඋවටුවද උවැටි වෙත් සිත්කර ඇ දූ රූ

190 විදුරුනැණ, වජ්‍රයට බඳු ඤාණයෙන් යුක්තවූ; ගැමුණු රදහුගෙ, ඒ දුටුගැමුණු නරාධිපතිහුගේ; සඟ නම්යුත් මැතිඳු, සඞ්ඝයන නාමයෙන් යුත් අමාත්‍යයෙක්; සොඳුරු, සුන්‍දරවූ; තම දුව සහ, ස්වකීය දුහිතෘවත් සමග්‍රව; සග සුව, දිව්‍යසම්පත්; විඳ, අනුභව කොට; එවර, ඒ කාලයෙහිදී; අවුත්, (නරලොව ඉපද) අවුදින්; අගසුවදෙන, නිර්වාණශ්‍රිය දෙන්නාවූ; තුන්ලෝ ඇදුරු, තුන්ලොවට ගුරුවූ; එමෙතේ මුනිඳුට, ඒ මෛත්‍රෙය මුනීන්‍ද්‍රයාණන්හට; ඇදුරු කර, ආදර කොට; ගිහි, ගෘහස්ථයන් අතුරෙන්; අග, අග්‍රවූ; උවටුවද, උපස්ථායකද; උවැටි, අග්‍ර උපස්ථායිකාද; වෙත්, වන්නාහ.

## ෂෂ්ඨසර්ගය සමාප්තයි.

——०ः०——

191 තුසීපුර ගරු ම න්
දූන් විඳිත සිරි මෙන් ම න්
පිරූ හැම පෙරු ම න්
නතිඳු එමෙතේ බුදුයැ සොබ ම න්

191 පිරූ හැම පෙරුමන්, (ෂොඩශාසඞ්ඛ්‍ය කල්පලක්ෂ්‍යයක් ලොවුතුරාබුදුවනු පිණිස පරිපූර්ණ කරනලද්දවූ) සකල පාරමිතාවන් ඇත්තාවූ; ගරුමන්, මහත්වූ මාන්‍ය ඇති; තුසීපුර, තුෂිතාභිධානවූ දෙව්ලොවෙහි; දූන්, වර්තමාන කාලයෙහි; මන්මෙන්, සිත්වූ පරිද්දෙන්; සිරිවිඳිත, දිව්‍ය ඓශ්වර්‍ය්‍යවින්‍දනය කරන්

නාවූ; සොබමන්, ශොභමානවූ; නතිඳු, නාථසුරෙන්ද්‍රයන නාමයෙන් (ප්‍රසිඬවූ) මහාබොධිසත්ව තෙමෙ; එමෙතේ බුදුයැ, ඒ මෛත්‍රෙය සම්‍යක්සම්බුඬ සර්ඥරාජොත්තමයාණන් වහන්සේ වන සේක—

---

192 පස් බැල්මෙන් එලෙස
දුන මෙතතු අතැඹුලෙස
සත ගිනි දුක් කෙලෙස
නිවා මොක්සිරි දෙන්ට එකලෙස

192 එලෙස, තත්වූ පරිද්දෙන්; පස් බැල්මෙන්, පඤ්චමහා විලොකනයෙන්; මෙතතු, මේ පූර්වොක්ත තත්ත්වාකාරය; අතැඹුල ලෙස, හස්තාමලකයක් මෙන්; දුන, විජානනය කොට; සත, සත්වයන්ගේ; කෙළෙස, ක්ලෙශ නමැති; දුක්ගිනි; දුඃඛාග්නිය; නිවා, නිර්වාපණය කිරීමෙන්; එකලෙස, එකාකාරයෙන්; මොක් සිරි, මොක්ෂ සම්පත්තිය හෙවත් නිර්වාණශ්‍රිය; දෙන්ට, දානය කිරීම පිණිස—(මතුකව හා කුලකයි.)

193 තිරගුණ ගිරිරඳු
මෙතේ බෝසත් සිරඳු
දෙව් සැපත් නොරඳා
දිනයි බඹවතී කුසෙහි සුරඳා

193 තිරගුණ, ස්ථිරගුණය කාරණ කොට ගෙන; ගිරිරඳු, මේරුපර්වත රාජයාබඳුවූ; මෙතේ බෝසත් සිරඳු, මෛත්‍රෙය බොධිසත්වොත්තම තෙමෙ; දෙව් සැපත්, දිව්‍යසම්පත්තියෙහි; නොරඳා, නොඇලී; බඹවතී, බ්‍රහ්මවතී දෙවියගේ; කුසෙහි, කුක්ෂියෙහි; සුරඳා, යෙහෙන් වැස; දිනයි, ප්‍රතිසන්ධිග්‍රහණය කරයි—

194 ගැබ සොඳ යහන් වෙයි
කුමර සඳ සිරි වැඩි වෙයි
මව් සඳ පහන් වෙයි
එදා තුන්ලොව මඟුල් ගෙය වෙයි

194 සොඳ, සුන්දරවූ; ගැබ, මාතෘගර්භය; යහන්වෙයි, ශයනයක් වන්නේය; සිරි, ශ්‍රීමත්වූ; කුමර සඳ, කුමාරොත්තමයා; වැඩිවෙයි, වැඩෙන්නේය; මව්සඳ, මාතෘවගේ චිත්තය; පහන්වෙයි, ප්‍රසන්නවෙයි; එදා, තද්දිනයෙහි; තුන්ලොව, ජගත්ත්‍රය; මඟුල්ගෙය වෙයි, මඞ්ගල ගෘහයක් වැනි වේ—

195 දෙ ව් බඹනම්දින දෙසරණ තා යා
ම ව් කුසවන්කල එබෝස තා යා
ලෙ ව් තුළ දෙතිසක් පෙරනිමි තා යා
ලෙ ව් නරඹව් සිදුවන මග තා යා

195 දෙව්බඹ, දිව්‍යබ්‍රහ්මයන් විසින්; නම්දින, වන්‍දනය කරනුලබන්නාවූ; දෙසරණතායා, පාදවන්‍දයක් ඇත්තාවූ; එ බෝසතායා, ඒ මෛත්‍රෙය බොධිසත්‍වයන්වහන්සේ; මව්කුස, මාතෘකුක්ෂියට; වන්කල, (ප්‍රතිසන්ධිග්‍රහණයෙන්) ප්‍රවිෂ්ටවූ කාල යෙහි; ලෙව්තුළ, ජගදභ්‍යන්තරයෙහි; සිදුවන, සිඬ වන්නාවූ; දෙතිසක්, ද්වාත්‍රිංශත් පරිමිතවූ; මගතායා, මහත්වූ; පෙරනිමි තායා, පූර්වනිමිත්තයන්; ලෙව්, ලොකවාසීහු; නරඹව්, නිරීක්ෂණය කරව්.

196 ස ක් වළ දසදහසෙහි මිහිළ න් ද
1 දු ක් නැති කුමරිඳු නරලොවුප න් ද
පූර්ව ඉ ක් මන් යස ගුම් දෙරණත ර න් ද
නිමිත්ත. වි ක් මන් හහවත් එදරු බිලි න් ද

196 දුක්නැති, දුඃඛයන් රහිත; කුමරිඳු, මෛත්‍රෙය බොධිසත්ව කුමාරෙන්‍ද්‍ර තෙමේ; නරලොව, මනුෂ්‍යලොකයෙහි; උපන්ද, උත්පන්නවූ දිනයෙහි; දසදහසෙහි, දශසහස්‍ර පරිමිතවූ; සක්වළ, චක්‍රවාළයෙහි; මිහිළන්ද, මහීකාන්තාවෝ; ඉක්මන්, ශීඝ්‍රවූ; යසගුම්, කීර්තිඝොෂයන්; දෙරණත, ධරණිතලයෙහි; රන්ද, රජත කොට; එදරුබිලිත්ද, ඒ බොධිසත්ව කුමාරයා ණන්ගේ; වික්මන්, වික්‍රමය; හහවත්, ඥාපනය කරවත්.

197 ලෙ ව් දසදහසෙහි බඹසුර අ සු රා
2 ග ව් ගණනක් විහිදෙන රැස් අ සු රා
පූර්ව ම ව් කුස මහබා කුමරලොවි සු රා
නිමිත්ත. සි ව් දිග පැතිරෙයි තෙදකැන් ඉ සු රා

197 ලෙව් දසදහසෙහි, දශසහස්‍ර චක්‍රවාට යෙහි; බඹසුර අසුරා, බ්‍රහ්මාමර අසුරයන්ගේ; ගව් ගණනක්, ගව්‍යූති සඞ්ඛ්‍යා වක්; විහිදෙන, විසතිණී වන්නාවූ; රැස්, රශ්මිය; අසුරා, ආවර ණය කොට; මව්කුස, මාතෘකුක්ෂියෙහි වැඩයිටින; ලොව්සුරා, ලොකශ්වරවූ; මහබා, මහාපින් ඇත්තාවූ; කුමර, බොධිසත්ව කුමාරයන්ගේ; ඉසුරා, ඓශ්වර්‍ය්‍යයෙහි; තෙදකැන්, තෙජස්කාන්තිය; සිව්දිග, සතරදිශායෙහි; පැතිරෙයි, ප්‍රසාරිත වන්නේය.

198 ස ඳ කල්ම නෙත නොතිබු දූකි මි ය<br>
3 එ ඳ අන්ද සත ලබා පෙනි ම ය<br>
පූර්ව තු ඳ ගදෙව් දූ රැඟුම් බැලි ම ය<br>
නිමිත්ත. ර ඳ සිටිත රඟ කිමට පුදු ම ය

198 සඳකල්ම, සර්වකාලයෙහිම; නෙත, නෙත්‍රයෙහි; දූකී මය, දෘෂ්ටිය; නොතිබු, අවිද්‍යමානවූ; අන්ද සත, අන්ධවූ සත්‍වයන්; එඳ, තද්දිනයෙහි; පෙනිමය, නෙත්‍රදෘෂ්ටිය; ලබා, ලබ්ධව; තුඳ, තුෂ්ටිකරවූ; ගදෙව්, ගන්ධර්ව (සඞ්ගීතය); දූ, ද්‍යූතය; රැඟුම්, නෘත්‍යයන්ද; බැලිමය, දර්ශනයෙහි; රඳ සිටිත රඟ, රජිතවත ආකාරය; කිමට, කථනය කිරීමට; පුදුමය, ආශ්චර්‍ය්‍ය වන්නේය.

199 කි කා ල කතා නැති පෙර පරසි ද්දේ<br>
4 ස කා ල දෙයම ඉඟි බිඟි කර ල ද්දේ<br>
පූර්ව වි කා ල ගොළුවො දීලා මහ ස ද්දේ<br>
නිමිත්ත. එ කා ල නුරාගී කියනු සුසි ද්දේ

199 පෙර, පූර්වයෙහිදී; කිකාල, කතර කාලයකදීවත්; කතා නැති, බස් නොපැවසුවායයි; පරසිද්දේ, ප්‍රසිද්ධවූ; සකල දෙයම, සියලුමද්‍ද; ඉඟි බිඟි කර, කුඩා මහත් ඉඞ්ගිතයන් කොට; ලද්දේ, ලබාගන්නාවූ; විකාල, ජිහ්වා වෛකල්‍යයෙන් යුත්; ගොළුවො, මූකයෝ; මහ සද්දේ දීලා, මහත් ඝොෂපවත්වමින්; එකල, තද්දිනයෙහි; සුසිද්දේ, සුසිද්ධවූ; අනුරාගී, අනුරාගාන්විත ගීත; කියති, කථනය කරන්නාහුය.

200 උ ප න් දිනෙහි සිට බිහිරිව දෙ ස ව න<br>
5 දු කි න් සිටිය සත නැති හඬ එ ස ව න<br>
පූර්ව ප හ න් ව බෙර වීණා නද ර ස ව න<br>
නිමිත්ත. අ ස න් ට යන එති කන්දී නො ස ව න

200 උපන්දිනෙහි සිට, උත්පන්නවූ දිනයෙහි පටන්; දෙසවන, ශ්‍රවණ යුගමය; බිහිරිව, බධිරව; එසවන, ඒ ශ්‍රවණය කිරිමට හැකිතරම්; නැතිහඬ, ශබ්දයන් නොමැතිව; දුකින් සිටිය, දුඃඛිත භාවයෙන් ස්ථිතවූ; සත, සත්‍වයෝ; රසවන, මධුරවූ; නොසවන, සන්තුෂ්ටිකරවූ; බෙර, භෙරිනාදය; වීණා, වෛණ නාදය යන; නද, ශබ්දයන්, අසන්ට, ශ්‍රවණය කිරීම පිණිස; පහන්ව, ප්‍රසන්නවැ; කන්දී, ශ්‍රවණවය යොමුකොට; යති එති, ගමනාගමනය කරන්නාහුය.

201 නොගිය ගෙසින් පිටතට රුස පි ළු ව න්
6–7 යා ය තැනින් තැන දූක කෙළින ළු ව න්
**පූවී** කු ද ය ගැසුණු සත කම්බැම් වෙ ළු ව න්
**නිමිති.** ඇ ද ය හැරී සෙද සිත දුකු හ ළු ව න්

201 ගෙසින් පිට, ගෘහයෙන් බාහ්‍යස්ථානයකට; නොගිය, ප්‍රයාණය නොකළාවූ; පිළුවන් රුස, කොරුන් සමූහය; නළුවන්, නැට්වුවන්; දූක, අවලොකය කොට; තැන තැන, තන්හි තන්හි; යාය, ප්‍රයාණය කරන්නොය; කම්බැම්, කම් බන්ධනයෙන්; වෙළුවන්, (තමා රිසිය නොපැවත්විය හැකිසේ) වෙෂ්ටනය කරනුලැබුවන් වැනි; කුදය ගැසුණු සත, කුබ්ජත්වයෙන් යුත් සත්ත්වයන් විසින්; ඇදය හැරී, වඞ්කරහිතවීම හෙතු කොට ගෙන; සිතදුකු, චිත්ත දුඃඛය; සෙද, වහා; හළුවන්, හරන බවය.

202 නු බේ දෙරණතල සිටි වී මිග ස ත්
8 ලොබේ සිතින් බැඳ වදකරනා ස ත්
**පූවී** කා ඹේ කුඩු සැඩිලා ඒ දින ස ත්
**නිමතන.** ඉ බේ මිදෙත් අනුහසයෙන් මහ ස ත්

202 නුබේ, ආකාශයෙහිද; දෙරණතල, ධරණීතලයෙහිද; සිටි, ස්ථිතවූද; අසත්, අසාධුජනයන් විසින්; ලොබේ සිතින්, ලොභ චිත්තයෙන් ප්‍රග්‍රහණය කොට; බැඳ, බන්ධනය කොට; වද කරනා, පීඩා කරන්නාවූ; වී මිගසත්, පක්ෂීන් හා මෘගයෝ; සත්, සහපත්වූ; ඒ දින, තද්දිනයෙහි; කාඹේ කුඩු සැඩිලා, රජ්ජුපඤ්ජරභාණ්ඩවී; මහසත්, මහාබොධිසත්ත්වයන්වහන්සේගේ; අනුහසයෙන්, ආනුභාවය හෙතු කොට ගෙන; ඉබේ, උපක්‍රම රහිතව; මිදෙත්, මුක්තවන්නාහුය.

203 රු දු රු ලෙසින් වද ඇති නිරතු ර යේ
9 කු රි රු බයානක සැම ගොර නි ර යේ
**පූවී** ගැ ඹු රු මහත් ගිනිකඳ අරන ර යේ
**නිමිතන.** අ තු රු ව සිහිලස වෙයි එම ව ර යේ

203 නිරතුරයේ, අනවරතයෙන්; රුදුරු ලෙසින්, රෞද්‍රාකාරයෙන්; වද ඇති, වධ ඇත්තාවූ; කුරිරු, ක්‍රෑරවූ; බයානක, භයඞ්කරවූ; ගොර, ඝොරවූ; සැම, සකලුම; නිරයේ, නරක වල; ගැඹුරු, ගම්භීරවූ; මහත්, විසාලවූ; අරනරයේ, දුස්තරවූ; ගිනිකඳ, වහ්නිස්කන්ධය; එම වරයේ, තද්දිනයෙහි; අතුරුව, වේනස්ව: සිහිලස වෙයි, ශීතලභාවයට පැමිණෙන්නේය.

204 දි ව නොතෙමෙන දිය සමුදුර බී වත්
10 ප ව රුදු පේතව විදි දුක් බල වත්
**පූර්** ගෙව මින් එමදින කා බී හිත වත්
**නිම්නානා.** ත ව ලොබනොකෙරෙතිකොපමණලදු වත්

204 සමුදුරදිය, සමුද්‍රයෙහි ජලය; බීවත්, පානය කෙළේවී නමුදු; දිව, ජිහවාව; නොතෙමෙන, සෙතමනය නොවන් නාවූ; පේතව, ප්‍රෙතාත්මයෙහි ඉපිද; බලවත්, මහත්වූ; දුක්, දුඃඛය; විදි, විඳිනය කරන්නාවූ (සත්වයෝ,; රුදුපව, රෞද්‍රවූ පාපය; එමදින, තද්දිනයෙහි; ගෙවමින්, ඉක්මවා; හිතවත්, පථ්‍යවූ දෑ; කා, ඛාදනය කෙරෙමින්ද; බී, පානය කෙරෙමින්ද; තව, අත්‍යවුත්; කොපමණ ලදුවත්, කතර ප්‍රමාණ ලද්දේවී නමුත්; ලොබ නොකෙරෙති, ආලය නොකරන්නාහුය.

205 බි ය මර හදගිනි තද දුක සැ ල සී
11 ගි ය ගිය තැන සැඟ වෙන වල නො ල සී
**පූර්** හ ය ගජගෝණ මියුල් වග ව ල සී
**නිම්නානා.** දි ය කෙළිති විල් වල සිතු වි ල සී

205 මරබිය, මාරණ භීතිය කාරණ කොටගෙන; තද, සනබඩවූ; හද ගිනිදුක, හෘදයාග්නි දුඃඛය; සැලසී, වැළඳී; ගිය ගිය තැන, ගමනාගමනය කළ කළ තන්හි; වල, වනයෙහි; නොලසී, අනලසව; සැඟවෙන, ප්‍රතිච්ඡන්න වන්නාවූ; හය, තුරංගයෝද; ගජ, හස්තිහුද; වග, ව්‍යාඝ්‍රයෝද; ගෝණ මියුල් වලසී, ගොණ මෘගාච්ඡයෝද; සිතු විලසි, චිත්තානුකූලව; විල් වල, ෑඩාගයන්හි; දිය කෙළිති, (එදින) ජලක්‍රීඩනය කරන් නාහුය.

206 දෙ සි නි ස හිත ගොර සිවු වා මේ හ ය
12 කෑ සි මූ ස ඇ මේ විදුවෝ අස හ ය
**පූර්** කි සි දෙ ස නැති සුව ලබමින් එස හ ය
**නිම්නානා.** නි සි ය ස ඇදුමෙන් නැඟ යෙත් ගජ හ ය

206 ගොර දෙසිනි සහිත, ඝොරවූ දෙෂයෙන් යුක්තවූ (නොහොත් අසාධ්‍යවූ); සිව් වා මේහය, චතුර්විධ වාතප්‍රමෙහ යද; කෑසිමූස ඇ, කාශස්වාසාදිවූ; අසහය, අසහ්‍යවූ; මේ, මෙම ව්‍යාධීන්; විදුවෝ, විඳිනය කළාහු; කිසිදෙස නැති, කිසිදෙෂ යක් නොමැති, එසගය, ඒ පිහිට ඇති; සුව ලබමින්, සුඛිතව: නිසි, යොග්‍යවූ; යස, යහපත්වූ; ඇදුමෙන්, ආභරණයෙන් යුක්තව; ගජහය නැඟ, හස්ත්‍යශ්ව වාහනාරූඪව; යෙත්, ගමනා ගමනය කරන්නාහුය.

207 ඇතු න් එදසකුල එදා තො සේ යා
13–14 තිති න් කුංච නද කරති ය සේ යා
සූළු පු තු න් මවුන් ලෙස නැතිව රො සේ යා
නිමිති. ස තු න් සියලු බස් දෙඩති තො සේ යා

207 එදා, තද්දිනයෙහි; එදසකුල, ඒ දශවිධ කුලයෙහිවූ; ඇතුන්, හස්තින්; තොසේයා, සන්තුෂ්ටවූ; යසේයා, මනා කොට; තිතින්, නිරන්තයෙන්; කුංචනද, කුංචනාදය; කරති, කරන්නාහුය. සියලු සතුන්, සකල සත්වයෝම; මවුන් පුතුන් ලෙස, මාතෘ පුත්‍ර ලීලායෙන්; රොසේයා, කොපයක්; නැතිව, අවිද්‍යමානව; බස් දෙඩති, වාග් ව්‍යවහාර කරන්නාහුය.

208 තු ර ඟ කෙ ස ර මිගසත් තොල සේ යා
15–16 ත ර ඟ නොකර මින් කිසි විල සේ යා
සූළු තෙර ඟ මි යු ර තමහඬින් ගො සේ යා
නිමිති. ත ර ඟ අ යු ර නද දෙත් සතො සේ යා

208 තුරඟ කෙසර, අශ්ව සිංහාදි; මිගසත්; මෘගසත්වයෝ; කිසි විලසේයා, කතරාකාරයෙන් නුමුදු; තොලසේයා, අනල සවැ: තරඟ නොකරමින්, විවාද නොකොට; තෙරඟ, අනෙකාකාර; තම, සවකීයවූ; මියුර හඬින්, මධුර ශබ්දයෙන් යුත්; ගොසේයා, ඝොෂයෙන්; සතොසේයා, සන්තුෂ්ටිකරවූ; තරඟ අයුර, තරඞ්ගවේගාකාර; නදදෙත්, නාද පවත්වන්නාහුය.

209 මී වු න් ග ව රුන් සෙමරුන් ස ත් තු
17 මේ ව න් දිනු ප න් අප මහස ත් තු
සූළු රූ ව න් අ ස මි න් සතොසින් ම ත් තු
නිමිත්ත. බෝව න් නදයෙන් තුති දෙන් යු ත් තු

209 මීවුන්, මහිෂයන්ද; ගවරුන්, ගවරයන්ද; සෙමරුන්, චමරමෘගයන්ද යනාදී; සත්තු, තිරශ්චීන සත්වයෝ; මේවන් දින, මෙසේවූ දිනයෙහි; උපන්, උත්පන්නාවූ; අපමහ සත්තු, අපමහා මෛත්‍රෙයබොධිසත්වයන්ගේ; රුවන්, රූපශ්‍රීවර්ණය; අස මින්, ශ්‍රවණය කරමින්; සතොසින්, සන්තොෂයෙන්; මත්තු, මත්වූවාහු; බෝවන්, අමන්දවූ; නදයෙන්, නාදයෙන්; යුත්තු. යොග්‍යවූ; තුතිදෙත්, ස්තුති පවත්වන්නාහුය.

210 රන් රිදී මුතු මිණි සුරනර පල දිත
18-19 නන් අබරණ වන් බබළයි එම දිත
පූව පින් කල එකුමර යසරුස දිත
ගමකි. තුන් ලොවයයි බුදුරුස් මෙන් වොරැ දිත

210 සුර නර, දෙව් මිනිසුන්; පලදිත, ප්‍රසාධිතවූ; රන් රිදී මුතු මිණි, සුවර්ණ රජත මුක්තා මාණික්‍යමයවූ; නන් අබරණ, නානාභරණයන්ගේ; වන්, වර්ණය; එමදිත, තද්දිනයෙහි; බබළයි, භ්‍රාජමාන වන්නේය; පින්කළ (සමත්‍රිංශත් පාරමී සඞ්ඛ්‍යාත) කෘතපුණ්‍යාන්විත; එකුමර, ඒ බොධිසත්වකුමාරයාණන්ගේ; වොරැදිත, විරාජමානවූ; යසරුස, යශොරශ්මිය; දිතදිත, ජය ග්‍රහණය කොරෙමින්; බුදුරුස් මෙන්, බුඩරශ්මියසේ; තුන්ලොව, ත්‍රිවිධලෝකයෙහි; යයි, ධාවනය කරන්නේය......

211 වස්ස වලාහක දෙවියෝ තො ස්වී
20-21 වැස්ස අකල් වස්වති නෙවිල ස්වී
පූව රොස්ව හමන සැඬ මේ ගය අ ස්වී
නිමිති. ලස්ස නො වා වදි කුසුමෙන් රැ ස්වී

211 වස්ස වලාහක දෙවියෝ, වස්සවලාහක නාමයෙන් යුත් දෙවතාවෝ; තොස්වී, සන්තුෂ්ටවී; නෙවිලස්වී, අන්‍යකාකාරව; අකල්, අකාලයෙහි නොහොත් බලාපොරොත්තු නොවූ; වැස්ස, වර්ෂාව; වස්වති, වර්ෂණය කරවත්; රොස්ව, රෞද්‍රාකාරයෙන්; හමන, වහනය වන්නාවූ; සැඬ, චණ්ඩවූ; මේගය, ප්‍රද්‍යුම්නය; අස්වී, ඉවත්ව; නොලස්ස, ප්‍රපංච නොවූ; කුසුමෙන්, පුෂ්පයන්ගෙන්; රැස්වී, රාශිභූත වන්නාවූ; වා, (මල්සුවඳින්යුත්) වාතය තෙමේ; වදී, වහනය වේ......

212 රිදී කඳන් මෙන් දියකඳු සො දිනා
22 විදී දියෙන් දෙරණින් පැන සෙ දිනා
පූව දිදී සාදුනද කුමරුට න දිනා
නිමිතක. යෙදී දුවත් දසදිගතුර එ දිනා

212 සොදිනා, සුන්දරාකාරයෙන්; දියකඳු, ජලස්කන්ධයෝ; රිදී කඳන් මෙන්, රජතස්කන්ධයන් මෙන්; විදී දියෙන්, විකීර්ණවූ ජලධාරාවෙන්; සෙදිනා, ශෛඝ්‍රයෙන්; දෙරණින්, ධරණීතලයෙන්; පැන, උල්ලඞ්ඝනය කොට; නදිනා, සන්තොෂයෙන් යුක්තවූ; කුමරුට, මෛත්‍රෙයබොධිසත් කුමාරයාණන්ට; සාදු නද, සාධුනාදයන්; දිදී, දානය කොට කොටමෙන්; එදිනා, තද්දිනයෙහි; දසදිගතුර, දිගාදශකයෙහි; යෙදී, යුක්තව; දුවත්, ධාවනය කෙරෙත්......

213 ඉ ඳ නොම තුරු නුබ කිර මි යු රා යා
23 වැද දෙරණත මෙකුමර අ යු රා යා
පූර්‍ව නද කරලිය ගී නටන යු රා යා
නිමිත්ත. අ ද කෙලෙසක වනමුද මි යු රා යා

213 කිරමියුරායා, කිරයන් හා මයුරන් ආදි පක්‍ෂීන්; තුරු, වෘක්‍ෂයන්හිද; නුබ, ආකාශයෙහිද; නොමඉඳ, උපවේශනය නොකොට; දෙරණත, පෘථිවියට; වැද, ප්‍රවිෂ්ටවැ; මෙකුමර අයුරායා, මේ කුමාරයාණන්ගේ පුණ්‍යශ්‍රිසාරය; ලියගි, ලයාන්විත ගීතයට; නදකර, ශබ්ද පවත්වමින්; නටනයුරායා, නෘත්‍යකරන්නාවූ ලීලාවෙහි; මියුරායා, මධුරාකාරය; අද, මේ අධුනා කාලයෙහි; කෙලෙසක, කතරාකාරයකින්; වනමුද, වර්ණනා කරමෝද ?

214 ලොලා වඩන මුනි ඉපදුන රං ගා
24 බ ලා සිටින ලෙස පියවි සු රං ගා
පූර්‍ව ග ලා එයටිගං නොගොසින් ග ං ගා
නිමිත්ත. දු ලා සිටිත් නිසලව මන රං ගා

214 ලොලා, ලොලය; වඩන, වර්‍ධනය කරන්නාවූ; මුනි, මුනීන්‍ද්‍රබෝධිසත්වතෙමේ; ඉපදුන රංගා, උත්පන්නවූ ආකාරය; බලා, අවලොකනය කොට; සුරංගා, සුරඞ්ගනාවන්; පියවි, සන්තුෂ්ටවැ; සිටින ලෙස, ස්ථිතවන්නාක් මෙන්; ගංගා, නදීතුමූ; ගලා, පැතිර; එයටිගං, ඒ නදින්ගේ අධඃභාගයෙහි; නොගොසින්, ප්‍රයාණය නොකොට; නිසලව, නිශ්චලව; මනරංගා, මනොඥාකාරයෙන්; දුලා, ජ්වලමානව; සිටිත්, ස්ථිතවන්නාහුය.

215 ලොව දසදහසෙහි සමුදුර ත ර ඟා
25 නැ ව තෙයි නිසලව කර රුස්ස ර ඟා
පූර්‍ව ල ව ණ රුසින් පිරි සමුදුර එ ර ඟා
නිමිත්ත. පැ ව නි මිහිරිදිය වෙයි රසනෙ ර ඟා

215 ලොව දසදහසෙහි, දශසහස්‍ර චක්‍රවාලයෙහි; සමුදුර, සමුද්‍රයාගේ; තරඟා, තරඞ්ගය නොහොත් රළගම්න; නිසලව, නිශ්චලව; සරඟා, යහපත්වූ ශොභාවන්; රුස්කර, රාශිභූත කොට; නැවතෙයි, නිවෘත්තවන්නේය; ලවණ රසින්, ලුණුරස යෙන්; පිරි, පූර්ණවූ; සමුදුර, සමුද්‍රයාගේ; පැවැති, ප්‍රවෘත්තවූ; එරඟා, ඒ ආකාරය; නෙරඟා රස, අනෙකාකාර රසයෙන් යුක්තව; මිහිරිදිය වෙයි, මධුර ජලය වන්නේය.

216 ස ත ලි ස් දහසක් ලෝ අතුරෙහි සි දු
26–27 නත ප ස් පියුමෙන් ගැවසෙනි පර සි දු
**පූර්ව** සි ත ලෙස් ගොඩදිය හැම තැන පිරි සි දු
**නිමිති.** ස තතොස් සුවඳ මලින් සාරවත් සි දු

**216** ලෝ අතුරෙහි, ලෝකාභ්‍යන්තරයෙහි ඇත්තාවූ; සත ලිස්දහසක්, චත්වාරිංශත්සහස්‍ර පරිමිත; සිදු, සමුද්‍රයෝ තුමූ; විපුල, මහත්වූ; නත, අනන්තවූ; පරසිදු, ප්‍රසිද්ධවූ; පස්පියුමෙන්, පංචපද්මයෙන්; ගැවසෙනි, සඞ්කීර්ණ වෙති; ගොඩ, ස්ථලභූමියෙහිද; දිය, ජලයෙහිද යන; හැමතැන, සකලස්ථානයෝ; පිරිසිදු, පරිශුද්ධවූ; සුවඳ මලින්, සුගන්ධ පුෂ්පයන්ගෙන්; සත, සත්වයන්ගේ; සිතලෙස්, හෘදයඞ්ගමව; තොස්සිදු, තුෂ්ටාත්ම සිද්ධිය; සාරවත්, සාරවති.........

217 තු රු ලෙස ගල් මුල් අගතෙක් පි පු ණු
28-29-30 දු රු දෙස සරඇත දනමන දු පු ණු
**පූර්ව** පි රු රැ ස බුමුමල් එකටෙක හැ පු ණු
**නිමිති.** ග රුතොස නුබ දිලෙ කුසුම් සුපි පු ණු

**217** ගල්, ශෛලයන්හිද; මුල්, වෘක්ෂයන්හිද; අගතෙක්, මුලපටන් අග දක්වා; පිපුණු, පුෂ්පිතවූ; දනමන, ජනයන්ගේ චිත්තය; දුපුණු, දුෂ්ටවූ; තුරුලෙස, තාරකාවන් බඳු; දෙසදුරු, දෙෂරහිතවූ: සර, පුෂ්පයන්; ඇත, ඇතිවන්නාහුය; එකට එක, එකකට අනිකක්; හැපුණු, සම්බන්ධයවූ; මල්රැස, පුෂ්ප සමූහයෝ; බුමු, භූමියෙහි; පිරූ, පූර්ණවන්නාහුය; ගරුතොස, මානැඟිවූ සන්තුෂ්ටිය ගෙනදෙන්නාක් මෙන්; සුපිපුණු, සුපුෂ්පිතවූ; කුසුමෙන්, පුෂ්පයන්ගෙන්; නුබ, ආකාශයද; දිළෙ, භ්‍රාජිත වේ.........

218 ලෝ කු ස මුළු සක්වළෙහි දු ලා යා
31 බෝතොස මල් වැසි වැස නිම ලා යා
**පූර්ව** පැ නි ස සුරු මෙනඹර සුනි ලා යා
**නිමිත්ත.** ලෝ ය ස සැරහෙයි මලින් ලො ලා යා

**218** ලෝකුස, ලෝක කුක්ෂියෙහි තුළ; මුළුසක්වළෙහි, දස සහස්‍ර පරිමිත චක්‍රවාලාභ්‍යන්තරයෙහි; දුලායා, ජ්වලමානවූ; බෝතොස, අතිශයින් තුෂ්ටිකරවූ; නිමලායා, නිර්මලවූ; මල්වැසි, පුෂ්පවර්ෂය; වැස, වර්ෂණය කොරෙමින්; සුනිලායා, මහානීලවර්ණවූ; අඹර, ආකාශය; පැනිසසුරුමෙන්, චන්ද්‍රාලෝක කළාක්මෙන් වේ; ලොලායා, ලෞල්‍යය වන්නාවූ; යසසිරි, යසශ්‍රියෙන් යුත්; මලිනි, මාල්‍යයෙන්; ලෝ, ලෝකධාතුව; සැරහෙයි, සජ්ජිත වන්නේය.

219

### 32 සූව් නිමිතත.

සු  ර ණ ව ර ණ රණ අසුර න් හ ර ණ විලස තෙද පා  මින
පො ර ණ නර ණ මදර ගිරෙ න් කිර ණ අලළ කළසෙනොමින
ද  ර ණ තර ණ පැණගුණපින් තරුණ තරණී කුමර ද  මින
දෙ ර ණ පු ර ණ අනත රුසි න් කිර ණ බඹලොවසයිනො මින

219 සුර වරණ, සුරේන්ද්‍රයා; අණ, ආඥාවද; තෙද, තේජසද; පාමින, ප්‍රකාශකොට; අසුරන්, අසුරේන්ද්‍රයන්ගේ; රණ හරණ විලස, යුඩවජිනය මෙන්ද; පොරණ, පූර්වකාලයෙහි; නරණ, නාරායණ යාවිසින් හෙවත් විෂ්ණුසුරේන්ද්‍ර යාවිසින්; මදරගිරෙන්, මන්දුරපර්වතරාජයා ගෙන; නොමින, අමන්දව; කිරණ, ක්ෂීරාර්ණ වය හෙවත් කිරිමුහුද; අලළ කළසෙ, ආලොඩනය කළාක් හෙවත් කැලඹුවාක් මෙන්ද; තරණ, මහත්වූ; පින් පැණ ගුණ දරණ, පුණ්‍යප්‍රඥගුණ ධාරණවූ (ගුණාධාරවූ); තරුණ තරණී, බාලාර්කයා සමානවූ හෙවත් තරුණ සූර්‍ය්‍යාසමානවූ; කුමර, (අප මහමෛත්‍රෙය බොධිසත්ව) කුමාරොත්තම තෙමේ; දමින, ධර්ම යෙන්; දෙරණ, ධරණීතලය; පුරණ, පූරණය කරන්නාවූ; අනත රුසින්, අනන්තරශ්මිමාලාවෙන්; බඹලෝ, බ්‍රහ්මලොක යෙහි; කිරණ, රශ්මිය; කොමින, ක්‍රමයෙන්; වසයි, ඡාදනය කරන සේක හෙවත් මූවාකරන සේක.

**සප්තමසර්ගය සමාප්තයි.**

—— ०:० ——

| | |
|---|---|
| 220 බෝසත් කුමර | ස ඳ |
| වැඩෙන එකලෙස පුර | ස ඳ |
| දසමස් ඉකුත් | ස ඳ |
| වඩවමින් තොස් දෙමව් පිය | ස ඳ |

220 පුරසඳ එකලෙස, පූර්වපක්ෂ චන්ද්‍රයමානව්; වැඩෙන, වර්ධනය වන්නාවූ; බෝසත් කුමරසඳ, බොධිසත්ව කුමාරොත්තම තෙමේ; දසමස්, දශමාසය; ඉකුත්සඳ, අතික්‍රාන්තවූ කල්හි; දෙමව්පිය, මාතෘ පිතෘන් දෙදෙනාගේ; සඳ, චිත්තයෙහි; තොස්, සන්තුෂ්ටිය; වඩවමින්, වර්ධනය කරවමින්— (පද්‍ය පඤ්චකයකින් කුලකයි.)

| | |
|---|---|
| 221 තුරු කුසුම් මුදු | තෙ හි |
| රඟන සිකිකැන් එදි | තෙ ගි |
| මහකොවුල් තොසි | තෙ හි |
| හඬන ඉසිපතන නා උය | තෙ ගි |

221 කුසුම්තුරු, පුෂ්පවෘක්ෂයන්ගේ; මුදුනෙහි, මස්තක යෙහි; රඟන, නෘත්‍යකරන්නාවූ; සිකිකැන්, මයූර සමූහ ඇත්තාවූ; නොසින්, සන්තුෂ්ටියෙන්; හඬන, නාදපවත්වන් නාවූ; මතකොවුල්,මත්තකෝකිලයන් ඇත්තාවූ; එහි ඉසිපතන නං උයනෙහි, ඒ ඉසිපතන නම් නාග වනෝද්‍යානයෙහි; එදි නෙහි, ඒ දවස්හි—

222 සහම්පති බඹ ර ද
අතරත් දූලට සිරි ර ද
මච් කුසයෙන් වො ර ද
වලා මිදිදිලි විලස් තරු ර ද

222 සහම්පති බඹරද, සහම්පත්‍යභිධාන මහාබ්‍රහ්මරාජ යාගේ; අත, හස්තයෙහි; සිරිරඳ, ශ්‍රියෙන් රජිතවූ; රන් දූලට, සුවර්ණජාලයට; වොරද, විරාජිතවූ; මච්කුසයෙන්, මාතෘ ගර්භයෙන්; වලා, වලාහකයෙන්; මිදි, මුක්තවූ; දිලි, ජ්වලමාන වන්නාවූ; තරුරද විලස්, චන්ද්‍රරාජලීලායෙන්—

223 බිහිවි මෙනර ලො ව
වැඩහිඳ දෙහොතැදුරු ලො ව
කම්පා කර ති ලො ව
කරන මතු වැඩහගවමින් ලො ව

223 මෙතර ලොව, මේ මනුෂ්‍යලෝකයෙහි; බිහිවී, උපපන් නවූ; ලොව ඇදුරු, මහාබ්‍රහ්මයාගේ; දෙහොත, හස්තවයෙහි; වැඩහිඳ, උපවිෂ්ටවූ; තිලොව, ජගත්‍රය; කම්පාකර, කම්පිත කොට; ලොව, ලොකයාහට; මතු, අනාගතයෙහි; කරන වැඩ, (තමන්වහන්සේ විසින්) සිඩකරනු ලබන්නාවූ අර්ථය; හඟව මින්, සූපනය කරවමින්—

224 උළුගෙන දෙරණ න ය
පියුම් පිට සිට නැව න ය
ඇසෙන ලොව අන න ය
කරයි ඒ සිහනද අබී න ය

224 දෙරණනය, ධරණී තලයෙන්; උළුගෙන, උද්ගත වන්නාවූ; පියුම්පිට, පද්ම මස්තකයෙහි; නැවනය සිට, නිවෘත්තව වැඩසිට; ලොව අනනය, අනන්ත ලෝකධාතුවට; ඇසෙන, ශ්‍රූයමානවූ; ඒසිහනද අබීනය, (අගෙගාහමස්මි ලොකස්ස යනාදි වශයෙන් තමන්වහන්සේගේ අසහාය ශ්‍රෙෂ්ඨබැව් දක්වන්නාවූ) ඒ අභීත සිංහනාදය; කරයි, කරනසේක—

225 පෙරනිමිති දෙති     ස ක්
පළ කොට උපන් විග     ස ක්
එකුමර තෙදිය     ස ක්
බෙජේ සිදුහත් කුමර විල     ස ක්

225 උපන්, උපපන්නවූ; විගසක්, ක්ෂණයෙහිම: පෙර නිමිති දෙතිසක්, ද්වාත්‍රිංශත්පූර්ව නිමිත්තයන්; පළකොට, දක්වා: තෙදියසක්, ත්‍රෛලොක්‍ය නෙත්‍රායමානවූ; එකුමර, ඒ කුමාරොත්තමයා; සිදුහත්කුමර විලසක්, (අප සම්‍යක්සම්බුද්ධවූ) සිද්ධාර්ථ කුමාරයාණන්වහන්සේ මෙන්; බෙජේ, භ්‍රාජමාන වන්නේය.

226 තුන්ලෝ ලකළ     ක ර
සමතිස් පෙරුම් නිම     ක ර
සුර නරන් තුටු     ක ර
දිලෙයි උතුමා අසිරි පළ     ක ර

226 සමතිස් පෙරුම්, සමත්‍රිංශත්පාරමි ධර්මයන්; නිමකර, නිෂ්ඨාකොට; තුන්ලෝ, ජගත්‍රය; ලකළකර, සාලංකෘත කෙරෙමින්; සුරනරන්, දිව්‍ය මනුෂ්‍යයන්; තුටුකර, සන්තුෂ්ට කෙරෙමින්; අසිරි, ප්‍රාතිහාර්‍ය්‍ය; පළකර, ප්‍රකාශ කොට; උතුමා, ඒ උත්තමයාණන්වහන්සේ; දිලෙයි, භ්‍රාජිත වන්නේය.

227 දිය බිඳක් තිය     තු ර
ගෙනැර පානෙව් සිඳු     තු ර
එකුමරුගෙ ගත     තු ර
කියමි මහපුම ලකුණු විසි     තු ර

227 සිඳුතුර, සමුද්‍රාභ්‍යන්තරයෙහි; දියබිඳක්, ජලබින්දුවක්; තියතුර, තබාභ්‍යන්තරයට; ගෙනැර, ග්‍රහණය කොට; පානෙව්, දක්වන්නාක් මෙන්; එ කුමරුගෙ, ඒ කුමාරොත්තමයාගේ; ගතතුර, රූපකායයෙහි; මහ පුම්ලකුණු, මහාපුරුෂ ලක්ෂණයන්ගේ; විසිතුර, වෛචිත්‍ර්‍යය හෙවත් ආශ්චර්‍ය්‍යය: කියමි, කථනය කරන්නෙමි.

228 සුදනෙනි එ අස     මි න්
සොඳ සඳ බදන බග     මි න්
පින් රුස්කරු නො     මි න්
දකිව් බුදුවූ කලට එහි     මි න්

228 සුදනෙනි, සත්පුරුෂයිනි: එ, ඒ භාෂිතය; අසමින්, ශ්‍රවණය කරමින්; සොඳ, සුන්දරවූ; සඳ බදන, විතාන නමැති

භාජනයෙහි; බහමින්, ස්ථාපනය කොට; නොමින්, අමඳව; පින් රුස්කර, පුණ්‍යසචය කොට; එහිමින් ඒ මෛත්‍රෙය බොධිසත්ව ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ; බුදුවූ කලට, සම්ඥපද ප්‍රාප්තවූ කල්හි; දකිව්, දශීනය කරව්.

229 අ න් නර සැම හෙළන තබනා කල දෙ ප ද
1 · ඉ න් පළමුව විළුඹ හෝ වෙන පසක් ප ද
මහාපුරුෂ ල ං වම වදී එරඟ නගි දෙරණත එ ප ද
ලක්ෂණය. පෙන් වයි සිදුරකුත් මිහි අතර මැද ප ද

229 අන් නර සැම, අන්‍ය සියලු මනුෂ්‍යයෝ; දෙපද, විපාදතල; හෙළන තබනා කල, උත්ක්ෂෙපණාවක්ෂෙපණ කරනනාවූ කල්හි; ඉන් පළමුව, ප්‍රථමයෙන්; පද, පාදතලයෙහි; විළුඹ හෝ, පාෂ්ණිය හෝ; වෙනපසක්, අන්‍යපාර්ශ්වයක් හෝ; දෙරණත, පෘථිවිතලයට; ලංවම, සමීපස්ථවම; වදී, ස්පර්ශ වන්නේය; එරඟ, එමෙන්ම; එපද, ඒ පාදතලය; නගි, උද්ගත වන්නේය; මැදපද, පාදමධ්‍යය සහ; මිහි අතර, භූමියට අන්තර යෙහිත්; සිදුරකුත්, ඡිද්‍රයකුත්; පෙන්වයි, දක්වන්නේය.

230 ස න් හු න් මෙකුමරුගෙ පා නොවැ එම වි ල සා
ර න් ව න් යුවළ මිරිවැඩි සිරි සර ස ල සා
ම න් මෙන් එක විටම බිම වැද නගි එ ලෙ සා
ඉ න් පි න් ලකුණ 'සුපිහිටි පදය' සුවි ල සා

230 සන්හුන්, ශාන්ත භාවයෙන් යුක්තවූ; මෙකුමරුගෙ, මේ කුමාරොත්තම යාණන්ගේ; පා, පාදය තෙමෙ; එමවිලසා නොවැ, තාදෘශාකාර නොව; රන්වන් යුවළ මිරිවැඩි, සුවර්ණ පාදුකා යුගලයක්හුගේ; සිරිසර, ශොභාව; සලසා, යුක්ත කොට; මන්මෙන්, චින්තානුවර්ත්තිවැ; එකවිටම, එක්වරම; බිම වැද, භූමියට ස්පර්ශව; එලෙසා, එපරිද්දෙන්ම; නගී, උද්ගම්නය කෙරේ; ඉන්, ඒ හෙතුකොට ගෙන; සුවිලසා, අතිසයින් බබළන්නාවූ; 'සුපිහිටිපදය', '**සුප්‍රතිෂ්ඨිතපාද**' නම්; පින් ලකුණ, පුණ්‍යලක්ෂණය; (ඒ කුමාරොත්තමයාහට) වේ.

231 ද ග ස ක් දූවිද නිමි නැබ යුවළ සක් සි රි
2 දි ය ස ක් මෙතුම ඇත මැද එපතුල් ස සි රි
(චක්‍ර) රි ය ස ක් මැද නැබද පළවිනු වෙයි අ සි රි
ලක්ෂණය. ව ට ය ක් එවට වට රේඛා රුස් වි සි රි

231 දියසක්, ජගන්නෙත්‍රවූ; මෙතුම, මේ උත්තම බොධිසත්ව යන්ගේ; සසිරි, ඉතා ශොභාමත්වූ; එපතුල් මැද, ඒ පාදතල

මධ්‍යයෙහි; දහසක් දැවිද, අරසහස්‍රයකින්ද; නිම්, නෙමියෙන් හා; නැබ, නාභියෙන්ද යුක්තාවූ; යුවළ සක්සිරි, චක්‍රයුගලශ්‍රියක්; ඇත, විද්‍යමාන වන්නීය; අයිරි, ආශ්චර්‍ය්‍යවූ; රියසක් මැද, එම රථචක්‍ර මධ්‍යයෙහි; නැබද, නාභියද; පළවනු වෙයි, ප්‍රකට වන්නේය; එවට, ඒ නාභිවර්‍තිතයෙහි; වට, වෘත්තවූ; රුස්, රශ්මි යෙන්; විසිරී, ව්‍යාප්තවූ; රේකා වටයක්, හාත්පස රේඛාද (මතු කාවහා කුලකයි.)

232 නැ බ මු ව වි ට ද ඉ රි ව ට විහිදී සු දි ලි
සු බ දැ වි එමැ ද දකි නට ලැබේ පැහැදි ලි
බ බ ළ න ව ට ද අ ර ව ට රේකා බැ දි ලි
හොබ නි මි පි ට ද එ හි ව ට මේ ලකුණු දි ලි

232 නැබ මුව විටද, නාභිමුඛවර්ත්තියෙහිද; වට, වෘත්තාවූ; ඉරි, රේඛා; විහිද, ව්‍යාප්තාව; සුදිලි, මනා කොට දිලිහි; එමැද, ඒ මධ්‍යයෙහිද; පැහැදිලී, ප්‍රභොජ්වලිත; සුබදැවි, යහපත් අරද; දකිනට ලැබේ, දෘශ්‍යමානව ඇතිවන්නේය; බබළන, භ්‍රාජමාන වන්නාවූ; අරවටද, දැවි අවටින්ද; වට, වෘත්තාවූ; රේකා බැඳිලී, රෙඛා බන්ධනය ඇති; පිටද, ඒ වටාපිටිනුදු; හොබ, සොභනවූ; නිම්, නෙමියෙහු; එහිවට, ඒ නෙමියගේ හාත්පසින්; දිලී, භ්‍රාජමානවූ; මේ ලකුණු, මේ වක්ෂ්‍යමාණ ලක්‍ෂණයෝ වෙත්.

233

සෝ වැ ති සිරිවස නදවට සෝවැතිකය තලල් ප ට ද
සේ ස ත මිණිරුවන මුදුන් මල්කඩ සහ බදුරු පි ට ද
ලෝනෙත හිත කඩුව සමග්මල්දම සහ එතල් වැ ට ද
සේ සි ත දිසි මගුල් තොරණ වඩමනපායත් යස ව ද

233 1 සෝවැති, ස්වස්තිකය; 2 සිරිවස, ශ්‍රීවත්සය; 3 නදවට, නන්ද්‍යාවර්තය; 4 සෝවැතිකය, සෞවස්තිකය; 5 තලල්පටද, උෂ්ණීෂපට්ටය; 6 සේසත, ශ්වෙතච්ඡත්‍රය; 7 මිණිරුවන, මාණික්‍ය රත්නය; 8 මුදුන්මල්කඩ, අවතංශකය; (සහ, සමග්‍රව;) 9 බදුරු පිටද, භද්‍රපීඨකය; 10 කඩුව, ඛඞ්ගය; (ලෝනෙතහිත, ලොකයාගේ නෙත් පිනවන;) 11 සමන්මල්දම සහ, සුමනමාලාදමය හා; (එ, ඒ;) 12 තල්වැටද, තාලවෘන්තය; (සේසිත දිසි, සිත්වූ පරිද්දෙන් දෘශ්‍යමානවූ;) 13 මගුල්තොරණ, මඞ්ගල තොරණය; 14 වඩමන, වර්ධමානකය; (යසවද, මැනවින්;) 15 පායත්, ප්‍රාසාද යත්; (මතු කාව්‍යත්‍රය යා සම්බන්ධයි.)

234

වල් විදු නාවද මොනොරත රතුපුල් රත් හෙල පියු මද
පුල් ඉදු වර පබළු සයුර පුනුපාරන් සයුර නො මද
දුල් ඉදු මෙර හිම සක්වළ කුලන් හිරුගෙ මඩල අ මද
දුල් ඉදු මඩලද පිරිවරයුත් සිවු මහදීප එ මැද

234 16 වල්විදුනාවද, වාලවීජනියද; 17 මොනොරත, මයුර හස්තය; 18 රතුපුල්, රක්තොත්පලය; 19 රත්පියුමය; රක්ත පද්මය; 20 හෙලපියුමද, සෙවතපද්මය; 21 පුල්ඉඳුවර, පුල්ලනීලොත්පලය; 22 පබළුසයුර, ප්‍රවාල සාගරය; 23 පුනුපා, පූර්ණපාත්‍රය; 24 රන්සයුර, සුවර්ණසාගරය, (නොමඳ, අමන්‍දව; ඉදු, සෘජුවූ; දුල්, උජ්වලිතවූ;) 25 මෙර, සුවර්ණමෙරුපර්වතය; 26 හිමකුළ, හිමාලයපර්වතය; 27 සක්වළකුළ, චක්‍රවාලපර්වතය; 28 හිරුගෙ මඩල, සූර්‍ය්‍ය මණ්ඩලය සහ; (අමඅද, අමෘතාර්ද්‍රවූ;) 29 දුල්ඉදු මඩල, පූර්ණචන්ද්‍රමඩලයද; (එමැද, තන්මධ්‍යයෙහි;) 30 පිරිවරයුත් සිවුමහදීප, සපිරිවරින් සිටිනා සතරමහාවීපය—

235

ස ක් වි ති ර ජ එරවණ ර ජ සිහ ර ජ රනමොනොර ර ජ ද
පොහොඇත් ර ජ වලහස් ර ජ නා ර ජ රනමුවර ර ජ ද
කෝ කි ල ර ජ රනහස් ර ජ ගව ර ජ සක්ලිහිණි ර ජ ද
ජී ව ක ර ජ සිසුමර ර ජ වග ර ජ කොස්ලිහිණි ර ජ ද

235 31 සක්විතිරජ, (සපිරිවරින් සිටිනා) චක්‍රවර්තිරාජය; 32 එරවණරජ, ඓරාවණ හස්තිරාජය; 33 සිහරජ, කෙසර සිංහරාජය; 34 රනමොනොරරජද, සුවර්ණමයුරරාජය; 35 පොහොඇත්රජ, උපොසථ හස්තිරාජය; 36 වලහස්රජ, වලාහක අශ්වරාජය; 37 නාරජ, (වාසුකී නම්) නාගරාජය; 38 රනමුවර රජද, සුවර්ණමකරරාජය; 39 කෝකිලරජ, කුරවීකරාජය; 40 රනහස්රජ, සුවර්ණහංසරාජය; 41 ගවරජ, වෘෂභරාජය; 42 සක්(වා)ලිහිණිරජද, චක්‍රවාකරාජය; 43 ජීවකරජ, ජීවංජීවකරාජය; 44 සිසුමරරජ, සුංසුමාරරාජය; 45 වගරජ, ව්‍යාඝ්‍රරාජය; 46 කොස්වාලිහිණිරජද, ක්‍රෞඤ්චරාජය—

236

පුන් කලසද යුවළ එරන්මසු සහ සත්මහ තියෙ න් ද
රන් සිවිගෙය සක්අවියද සුදුසක දෙව්ලෝ සයෙ න් ද
කින් පුම දද පතාක සත්කුළපව් එකෙලෙස් ගලි න් ද
වුන් මේ සකලකුණෙහි ඇත සමඟ සොළොස් බඹලොවි න් ද

236 47 පුන්කලසද, පූර්ණඝටය; (එ, ඒ;) 48 රන්මසු යුවල, සවර්ණමත්‍ස්‍ය යුගලය; (සහ, සමග්‍රව) 49 සත්මහනියෙන්ද, සප්ත මහාගංගායෙන්ද; 50 රන්සිව්ගෙය, සවර්ණසිවිකාය; 51 සක් අවියද, චක්‍රායුධය; 52 සුදුසක, (දක්ෂිණාවෘත්ත) ශ්වෙත ශංඛය; 53 දෙව්ලෝසයෙන්ද, ෂඩ්විධ දිව්‍යලොකය; 54 කින්පුම, කිං පුරුෂය; 55 දද, ධවජය; 56 පතාක, පතාකය; 57 සත්කුළද, සප්තකුටපර්වතය; 58 කෙලෙස්ගලින්ද; කෛලාසකූට පර්වත යෙන්ද; 59 සොළොස්බඹලොවින්ද, ෂොඩශවිධ බ්‍රහ්මලොක යෙන්ද යන; මෙවන්, මෙකී ලක්ෂණයන් හා එක්වූ; සකලකුණ, චක්‍රලක්ෂණය; එහි, උන්වහන්සේගේ (ශ්‍රීචරණයෙහි); ඇත, විද්‍යමානවේ.....

237 සෙසු ස ත පදග දික්වම විළුඹ විහැ කු එම්
3 මු දු න ත එහි සියුම් බවැතිව නැත සුදි එම්
ලක්ෂණය. වි ල සැ ත සැසතුබූමෙන් පැතලිව එවි එම්
දි යනෙත මොහුට ඇතපදමොනවට බැබඑම්

237 සෙසු සත, අවශෙෂ සත්‍වයන්ගේ; පදඅග, පාදග්‍රය; දික්වම, දීඝීවම; විළුඹ, පාර්ෂ්ණියද; හැකුළුම්වී, සංකුචිතව; සුදිළුම්, මනාදීප්තියක්; නැත, නොමැතිය; එහි මුදුනත, ඒ පාර්ෂ්ණි මස්තකයෙහි; සියුම්බවැතිව, සතිගධභාවයෙන්යුක්තව; සැසතුබූමෙන්, තච්ජනය කළාක්මෙන්; පැතලිව, ප්‍රස්තාරිතව; එවිළුම් විලසැත, ඒ පාර්ෂ්ණියගේ සවභාව ඇතිවන්නේය; දිය නෙත, ජගන්නෙත්‍රවූ; මොහුට, මූන්වහන්සේට; මොනවට බැබ එම්, මනාදීප්තියක් ආති; පද, පාදපද්මයක්; ඇත, ඇතිවන් නේය.....

238 ර න් ව න් පා සිවුකොටසින් අඩ අ ග ය
ඉ න් තු න් බා ගෙහි පිහිටා ඇත ද ඟ ය
ව න් ප න් දුව එල්ලූ රත්පල ස ග ය
අ න් තෙන් වට විළුමැත සිවුපස අ ග ය

238 රන්වන්, සවර්ණවර්ණවූ; පා, (ඒ කුමාරයාගේ) පාදතලය පිළිබඳවූ; සිවුකොටසින්, චතුර්භාගයෙන්; අඩ, අඩක් හෙවත් පාදතලයෙන් දෙකෙන් කොටසක්; අගය, පාදග්‍රය වන්නේය; ඉන්, ඒ පාදතලයෙන්; තුන්බාගෙහි, තුන්වෙනි භාගයෙහි; දඟය, ජංඝාතොමෝ; පිහිටාඇත, ප්‍රතිෂ්ඨිතවන්නීය; සිවුපස, ඒ පාදතලයෙහි සිවුවෙනි පාර්ශ්වයෙහි හෙවත් සතරවෙනි කොට

සෙහි; රත්පලස් අගය, රක්තකම්බලාග්‍රයෙක්හි; එල්ලූ, එල්වන ලද්දාවූ; පන්දුවවන්, කන්දුකයක් බඳු; අත්පොත්වට, කොළවරින් වටවූ (හවත් චූතාග්‍ර ඇති; අගය, උතුම්වූ; විළුම්, පාෂ්ණිය; ඇත, (ඒ කුමාරයාහට, ඇතිවන්නේය.....

239 සේ ස ත් සමතිසක් පෙරුමන් පිරූ ග රු ව න්
ඒ ස ත් බුමු පියුම් ඉඳ බිඳලන ම රු ව න්
බෝස ත් එකි සුවිළුම් ඇති කුමර රු ව න්
ලෝස ත් දනිව් 'දික් සුවිළුම්' මෙ අයු රු ව න්

239 ගරුවන්, ගරිෂ්ටවූ; සමතිසක් පෙරුමන්, සමවත්‍රිංශත් පාරමිතාවන්; සත් සේ, ප්‍රශස්ත ලෙස; පිරූ, පරිපූර්ණකළාවූ; ඒ සත්බුමුපියුම්, බොහෝවූ සත්ත්වභූමකපද්ම මස්තකයෙහි; ඉඳ, අවස්ථිතව; මරුවන්, (පච) මාරයන්; බිඳලන, භේදනය කරන්නාවූ; එකි, යථොක්ත; සුවිළුම් ඇති, ශෝභන පාෂ්ණියක් ඇත්තාවූ; බෝසත් කුමර රුවන්, මහා බොධිසත්ව කුමාරොත්තමයාණන්ගේ; 'දික්සුවිළුම්', '**ආයතපාෂ්ණි**' නම් ලක්ෂණය; මෙ අයුරුවන්, මෙ ආකාර බව; ලෝසත්, ලොකසත්වයෙනි; දනිව්, ජානනය කරව්.....

240 ක ර සා පා ඇඟිලි අන්මිනි සුන් ග තය
4 ස තොසා නොවුදිග ලුහුඬුව සම නැ තය
ලක්ෂණය. සොළ සා අසෙකි කප්ලක් පුන්පැරුමැ තය
එ ලෙ සා ඟුල්නොවෙතිමොහුවන්එසුග තය

240 අන්මිනිසුන්, අන්‍යමනුෂ්‍යයන්ගේ; ගත, ශරීරයෙහි; කරසා, හස්තාඞ්ගුලිහුද; පා ඇඟිලි. පාදාඞ්ගුලිහුද; සතොසා නොවූ, අප්‍රියකරවූ; දිග, දීර්ඝත්වයෙන් හා; ලුහුඬුවී, හ්‍රස්වවීමෙනුත්; සමනැතය, සමානනොවන්නාහ; සොළසා අසෙකිකප්ලක්, ෂොඩශ අසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි; පුන්, පරිපූර්ණවූ; පැරුම් ඇතය, පාරමිතාවන් ඇත්තාවූ; එසුගතය වන, ඒ සම්‍යක්සම්බුද්ධ සුගතයන්වහන්සේට; එලෙසා අඟුල්, යථොක්තාකාර අඞ්ගුලිහු; නොවෙති, විද්‍යමාන නොවන්නාහුය.....

241 මූ ලි න් දළව මඳ මඳ අග සිහි න් වී
තොමි න් ඉඟුල් පලුසේ පබසරි න් වී
සි රි න් එසිරියල් වැටිමෙන් පහ න් වී
එ ව න් ලකුණඇත 'දිගැඟිලි' නම් න් වී

241 මුලින්, (ඒ අඞ්ගුලිහුගේ) මූලයෙන්; දළව, මහත්ව; මඳ මඳ, ක්‍රමක්‍රමයෙන්; අග සිහින්වී, සූක්ෂ්මාග්‍රව; ඉඟුල් පලුසේ, හිංගුලපල්ලවයන් (සාදිලිංගම්කරල්) මෙන්; නොමින්, අප්‍රමාණ; පබසර, ප්‍රභාසාරය; ඉන්වී, එසින් සැලසී; සිරින්, ශොභායෙන්; එසිරියල් වැටිමෙන්, ඒ හරිතාලවර්ත්තිකාවන්සේ; පහන්වී, ප්‍රසන්නාවූ; එවන් ලකුණ, ඒ ආකාර ලක්ෂණය; 'දිග ඇඟිලි' නමින්වී, 'දීඝාඞ්ගුලි' නාමයෙන් යුක්තව; ඇත, (ඒ කුමාරයාහට) ඇතිවන්නේය.

242 ගි තෙ ල් කපු පුළුන් ගැලු පෙළ සිය ක් ව ර
5 ප තු ල් අත්විලස මුදු මෙදිය ස ක් ව ර
ලක්ෂණය. ඇ සි ල් ලුපන බිළිඳකුමෙන් ගත ක් ව ර
අ තු ල් පතුල් තරුණැතවසතෙතෙ ක් ව ර

242 සියක් වර, ශත වාරයෙක්හි; පෙළ, මර්දිතය කළ ගිතෙල්, ඝෘතයෙහි; ගැලු, නිමග්න කළ: කපුපුළුන් විලස, කාර්පාසතුලයක් බඳු; වර, පූජ්‍යවූ; මෙදිය සක්, මේ ජගත් චක්ෂුහුගේ; පතුල් අත්, පාදතල හා හස්ත තලයෝ; මුදු, මෘදු වන්නාහුය; ඇසිල්ල, තත්ක්ෂණයෙක්හි; උපන, උපපන්නවූ; බිළිඳකු, ළදරුවකුගේ; ගතක්මෙන්, ශරීරාකාරයෙන්; වසන, (උන්වහන්සේ) ජීවමානව වාසයකරන; එනෙක් වර, ඒ තාවත් කාලයක් මුලුල්ලෙහි; වර, උතුම්වූ; අතුල් පතුල්, (ඒ) හස්ත තලයන්ගේ හා පාදතලයන්ගේත්; තරුණ, තලුන භාවය; ඇත, ඇතිවන්නේය.

243 බු දු වම ස ත පා සත පොවන දම් ර ස
රුදු සිය ප ත පා බඹසුර ඇ සි ර ස
ඉ දු මහ ස ත පා ණ දූරඟ මිණෙව් ර ස
මු දු 'තුරුණතපා' නම් මෙයනුවන් ර ස

243 බුදුවම, සම්බුද්ධප්‍රාප්තවම; සත, සත්වයන්; සතපා, සන්තර්පණයකොට; දම්රස, ධර්මාමෘතරසය; පොවන, පොවන්නාවූ; බඹසුරඇ, බ්‍රහ්මාමරාදීන්ගේ, සිරස, මස්තකයෙහි; පා, සියපත, ශ්‍රීපාදපද්මය; රුදු, රංජනයකළාවූ; ඉදු, සන්ධ්‍යාතාම්‍රවූ; මහසතපාණ, මහසත්වයන් වහන්සේගේ; දූරඟමිණෙව්, ජාතිරඞ්ගමානික්‍යයක්බඳු; රස, රශ්මිමත්වූ; නුවන්රස, නෙත්‍ර රසායනවූ; මෙය, මේලක්ෂණය; 'මුදුතුරුණතපා' නම්, 'මෘදුතරුණහස්තපාද' නම්වන්නේය.

244 ස ල සා දැල් කවුළු සිප්ඇදුරකු රැ න් දූ
6 වි ල සා විතිවිදමැ පෙනෙනා සිරි රැ න් දූ
ලක්ෂණය. කා ර සා පා සමතුරැ ඒ කුමරි න් දූ
එ ති සා 'දැලත්පද' මෙලකුණ මනබැ න් දූ

244 සිප්ඇදුරකු, ශිල්පාචාය්‍ර්‍යකු විසින්; සලසා, සත්කෘත කොට; රැන්දූ, රජත කළාවූ; දැල්කවුළු, ජාලකවාටයක් මෙන්; විතිවිදමැ, විතිර්වෙධනය කොටම හෙවත් සිදුරු කරගනමැ; පෙනෙනා, දෘශ්‍යමානවූ; සිරිවිලසා, රූපශ්‍රීවිලාස යෙන්; රැන්දූ, රජිතවූ; ඒ කුමරින්දූ, ඒ කුමාරොත්තමයාගේ; කරපා සා, හස්තපාදඞ්ගුලිහු; සමඅතුරැ, සමානන්තර ඇතිවන් නාහුය; එතිසා, තාදෘශාකාරය හෙතුකොටගෙන; මනබැන්දූ, (නෙත්) සිත්පිනවූ; මෙලකුණ, මේ ලක්ෂණය; 'දැලත් පද', 'ජාලහස්තපාද' නම් වේ.

245 සෙස් සත් පදත ගොප්ඇට පිටිපස අ සි ත
7 වි ස් සමු දිනත කුමරුට එම නැතිසෙ සි ත
ලක්ෂණය. උ ස් වී ඉදිරිපිට එය පිහිටයි ප සි ත
'උ ස් සක්පද' නම් වේ මෙලකුණ එ සි ත

245 සෙස්සත්, අවශෙෂ සත්‍වයන්ගේ; ගොප්ඇට, බොල' ටය; පදපිටිපස, පාදයාගේ පශ්චාත්භාගයෙහි; අසිත ඇත, කෙළවරෙහි ඇතිවන්නේය; විස්සමු, අන්‍යූනඅනඞ්ගයා; දිනු, පැරදවූ; කුමරුට, මේ බොධිසත්‍ව කුමාරයාහට; එම, එපරිදි; නැති සෙසිත, නොමැති බැවින්; පසිත, පාදතලයාගේ; ඉදිරි පිට, අභිමුඛපාර්ශ්වයෙහි; උස්වී, උද්ගතව; එය, ඒ ගුල්එය; පිහිටයි, ප්‍රතිෂ්ඨිත වන්නේය. එසිත, ඒ ශොභාව නිමිත්තකොට ගෙන; මෙළකුණ, (උන්වහන්සේගේ) මේ ලක්ෂණය; 'උස්සක් පද' නම් වේ, 'උස්සඞ්ඛපාද' නම් වේ.

246 දි ති ඳු ව අ ග දෙන එතිවන් ලොවි න් දා
8 දි ති දි ව ගඟ තර තිර යස බිලි න් දා
ලක්ෂණය. වැ ති රුව ද ඟ එණිමුව වෙයි පබ න් දා
'එ ති මූ ව දඟ' නම් මෙලකුණ එබ න් දා

246 අග, අග්‍රවූ; ලොවින්දා දිතිදුව, ලොකෙශ්වරවූ ජිනෙන්ද්‍රව; එතිවන්, ඒ තිඹිාණශ්‍රිය; දෙන, සකල සත්‍වයාහට ප්‍රදානය කරන්නාවූ; තර, මහත්වූ; තිර, ස්ථිරවූ; යස, යශො රාශියෙන්; දිවගඟ, අමරගඞ්ගාව; දිනි, ජයග්‍රහණය කළාවූ;

බිලින්ද, ඒ ළදරුකුමාරබෝධිසත්ත්වයන්ට; එණිමුව වැනි, එණි මෘගයන්ට මෙන්; රුව, මනාසංස්ථාන රූපයෙන් යුත්; දහ, ජඞ්ඝා (යුගමය); වෙයි, ඇතිවන්නේය. එබන්ද, තාදෘශවූ; පබන්ද, ප්‍රසිද්ධවූ (මුන්වහන්සේගේ); මෙලකුණ, මේ ලක්‍ෂණයට 'එණිමුවදහ' නම්, '**එණේජඞ්ඝ**' ලක්‍ෂණ නම් වේ.

247 ග ත පෙර පි රි බැවින් අතගෙනදණහි සය
9 සි ත යු රු පි රි මදී නොනැමී නිසි ලෙ සය
**ලක්‍ෂණය.** ස ත සෙසු බැරි දෙකයනොපිරුණුඑසදි සය
අ ත ද ණ පි රි මදිනු හැකිඉන්මෙවිල සය

247 (මුන්වහන්සේගේ) පෙරගත, ඌර්ධ්වකාය; පිරිබැවින්, පරිපූර්ණවීම හෙතුකොටගෙන; දණහිසය, ජානුමණ්ඩලයට; අතගෙන, හස්තග්‍රහණයකොට; නොනැමී, නම්‍රනොව; නිසිලෙසය, යොග්‍යවූ පරිද්දෙන්; සිතයුරු, සිත්සේ; පිරිමදී, පරිමාර්ජනය කෙරෙයි; දෙකය, ඌර්ධ්වකාය අධඃකායවය; නොපිරුණු, පූරිතනොවූ; සෙසුසත, අන්‍යසත්ත්වයන්ට; එසදිසය, තාදෘශාකාරයෙන්; බැරි, භාරයැ (නොහැකියි); ඉන්, එහෙයින්; දණ පිරිමදිනු හැකි, ජානුපරාමර්ශණයට පොහොසත්වූ; අත විලසය, උන්වහන්සේගේ හස්ත (ලක්‍ෂණ) ශොභාව; මෙ, මෙ උක්තප්‍රකාරය.

248 සු ල කා ළ පත්ඇතුළවැදදිලෙනානෙලෙ සින්
10 සි රි දු ළ රන් පියුම්කොමියකරහවෙසෙ සින්
**ලක්‍ෂණය.** කා ය තු ළ පිවිසි පුමලකුණැත මොහුටනි සින්
'කොපු තු ළ සැඟවිඅහඳු' මෙලකුණ එවි සින්

248 සුලකළ, ස්වලඞ්කෘතවූ; පත් ඇතුළ, පත්‍රාභ්‍යන්තරයට; වැද, ප්‍රවෙශව; නෙලෙසින්, අනෙකාකාර; දිලෙනා, බබළන්නාවූ; වෙසෙසින්, විශෙෂයෙන්; සිරිදුළ; ශ්‍රියොජ්ජ්වලිතවූ; රන්පියුම්කොමියක රහ, ස්වර්ණපද්මකර්ණිකාවක් බඳු; නිසින්, යොග්‍යාකාර; කායතුළ පිවිසි, ශරීරාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවූ; පුමලකුණ, පුරුෂව්‍යඤ්ජනය; මොහුට, මේ උත්තමයාහට; ඇත, විද්‍යමානවේ; එවිසින්, ඒ කාරණකොට ගෙන; මෙලකුණ, (මුන්වහන්සේට අතිවන්නාවූ) මේ ලක්‍ෂණය; 'කොපුතුළ සැඟවි අහඳු', '**කොශාවහිතවස්ත්‍රගුහ්‍ය**', ලක්‍ෂණය නම් වේ.

249 සි යු ම් දැහිඟුලෙන් මැද අළ හොකල් මිබා
11 දි ලු ම් දිවිදැළින් සාළ ලෙද මනර මිබා
**ලක්‍ෂණය.** නොහි ම් නිවාකම් යුතු යුරු රනබි මිබා
උ තු ම් සිරුර රන් වන් මුන් ගුණබි මිබා

249 සියුම්, සූක්ෂමවූ; දූහිඟුලෙන්, ජාතිහිංගුලයෙන්; නොකලම්බා, ක්ෂෝභ නොකොට; මැද අළ, මැදහැරියාවූ; දිවිදළින්, විපිදංෂ්ට්‍රාවෙන්; දිලුම් කළ ලෙද, දීප්තිමත් කළාක් මෙන්; නොහිම්, අපරිමිත; නිවාකම් යුතු, නිෂ්කාමියෙන් යුක්තවූ; මනරම්, මනොරම්‍යවූ; බා, පින්ඇති: රතබිම්බා යුරු, සුවර්ණප්‍රතිරූපයක් බඳුවූ; උතුම් ගුණ, උදාර ගුණසම්බන්ධවූ; බිම්බා, ප්‍රතිමූර්තියක් බඳුවූ; මුන්, මූන්වහන්සේගේ; සිරුර, ශරීරය; රන්වන්, සුවර්ණවර්ණ වන්නේය.

250 උ ව ම් සිරිගනින් පති එබිසෝබි ම් බා
12 සි යු ම් සම මොවුන් උර රුඳු පියුම ම් බා
ලක්ෂණය. ඇලු ම් නැත කිලිටි අළපත ලෙස අ ම් බා
'සි යු ම් සිවි' කුමරුටැත හිමි හිමි ර ම් බා

250 එබිසෝ බිම්බා, ඒ බිම්බාදෙවියගේ හෙවත් යශොධරා දෙවියගේ; පති, ස්වාමිපුරුෂයාණන් වහන්සේට හෙවත් සිද්ධාර්ථ කුමාරොත්තමයා හට; උවම්, සමානවූ; සිරි, ශ්‍රීමත්වූ; ගනින්, දෙහයෙන් යුක්තවූ; පියුමම්බා, ශ්‍රීදෙවිය; රුදු, රජිතවූ; උර, වක්ෂඃස්ථල ඇති; මොවුන්, මේ කුමාරොත්තමයාගේ; සියුම්, සූක්ෂමවූ; සම, සිවියෙහි; අළපත, නෙළුම්පත්‍රයෙහි; අම්බා ලෙස, ජලය මෙන්; කිලිටි ඇලුම්, ක්ලිෂ්ටසම්බන්ධියෙක්; නැත, නැත්තේය; (එහෙයින්) රම්බාහිමි, නලකූබරයාහට; හිමි, ස්වාමි වන්නාවූ; කුමරුට, මේ කුමාරොත්තමයාහට; 'සියුම් සිවි' 'සූක්ෂමච්ඡවි' (ලක්ෂණය); ඇත, ඇතිවන්නේය.

251 සේ න ක පඬි සදිසි සුබඹුන් බිසොකු ස ය
13 ලෝ ස ක වන ඉපිද මහබා දරු නො ස ය
ලක්ෂණය. රෝමෙක තැන එකොකලොම්ගණනැතය ස ය
නා මෙක 'එකොකලොම්' මෙලකුණමෙවිල ස ය

251 සේනකපඬි සදිසි, සෙනකාභිධානපණ්ඩිතොත්තමයා සදෘශවූ; සුබඹුන්; සුබ්‍රහ්ම යන බ්‍රාහ්මණොත්තමයාණන්ගේ; බිසොකුසය, දෙවියගේ ගර්භයෙහි; ඉපිද, ජනිතව; ලෝසක වන, ජගනෙත්‍ර වන්නාවූ; මහබා, මහපින් ඇත්තාවූ; යසය, කීර්තිමත්වූ; නොසය, සන්තුෂ්ටිකරවූ; දරු, මෛත්‍රෙයබෝධිසත්ත්වකුමාරයාගේ (ශ්‍රීශරීරයෙහි); රෝමෙකතැන, එකරෝම කූපයක; එකඑකලොම් ගණන, එක්එක්රෝමසඞ්ඛ්‍යාවෙක්; ඇත, ඇත්තේය; 'එකොකලොම්', 'එකෛකරොම' යන; නා මෙක, නාමයෙන් යුත්; මෙලකුණ, 'උන්වහන්සේට ඇතිවන්නාවූ) මේ ලක්ෂණය තෙමෙ; මෙවිලසය, මේපරිදිවේ.

252 ම හ ස ත් මූව බලන විලසට කර ලො ල් ල
14 පැහැප ත් නිල් අඳුන්වන් ලොම් එසිය ල් ල
**ලක්‍ෂණය.** දකු ණ ත් කුමරු ඇති උඩුඅග ඇඹරි ල් ල
ලකු ණ ත් මෙලෙස 'උඩුඅගලොම්' වේදු ල් ල

252 මහසත්, මහාබොධිසත්‍වයන්ගේ; මූව, ශ්‍රීමුඛය; ලොල් ලකර, ලොභය කොට; බලන විලසට, නිරීක්‍ෂණය කරන පරිද්දෙන්; පැහැපත්, ප්‍රභාප්‍රාප්තාවූ; නිල්අඳුන්වන්, නීලඅජනවර්ණයෙන් යුත්; එලොම්සියල්ල, (උන්වහන්සේගේ ශරීරයෙහි) ඒ සකලරෝමයෝ; උඩුඅග, ඌර්ධ්වාග්‍රව; දකුණත්ඇඹරිල්ල, දක්‍ෂිණාවෘත්ත වන්නාහුය; කුමරු ඇති, මේකුමාරයාට ඇතිවන්නාවූ; දුල්ල, උජ්ජ්වලිතවූ; 'උඩුඅගලොම්' ලකුණත්, '**ඌර්ධ්වාග්‍රරෝම**' ලක්‍ෂණයත්; මෙලෙස වේ, මේ ආකාරවේ.

253 ස තු න් අන් සියලු ගත නැත එකළු ල් ල
15 නිති න් ඇතැම් සත් සිටිකලනැමිබෙ ල් ල
**ලක්‍ෂණය.** වෙතින් උකුළු දණ මඬලැත එනැවි ල් ල
ගු ව න් තරුගණිනලෙසයෙතිවෙනගොල් ල

253 සියලු අන්සතුන්, අවශෙෂ සියලුසත්‍වයන්ගේ; ගත, ශරීරය; එකළුල්ල නැත, එකාකාර සෘජුභාවයක නැත්තේය; ඇතැම්සත්, සමහර සත්‍වකෙනෙකුන්; සිටිකල, උත්‍ථිතවූ කල්හි; නිතින්, නිත්‍යයෙන්; නැමි බෙල්ල, අවනතවූ ග්‍රීවාඇත්තේය; වෙතින්, ඇතැම් සත්‍වකෙනෙකුගේ; එනැවිල්ල, ඒ අවනතභාවය; උකුළුදණමඬලැත, කටියෙහි හා ජානුමඬලයෙහි; ඇත, විද්‍යමානවේ. වෙනගොල්ල, අන්‍යසමූහයෝ; ගුවන්, ආකාශයෙහි; තරුගණිනලෙස, තාරකා සංඛ්‍යානය කරන්නාක් මෙන්; යෙති, (ඌර්ධ්වාවලොකනය කෙරෙමින්) ගමනය කෙරෙත්.

254 එ කෙ ක් ලේ මසින් අඩුවී ඇවිදි ල් ල
හු ල ක් ලෙස කරති සහිතවවෙවිලි ල් ල
කෙ නෙ ක් දික්ගතැති වක්වෙනිසිරුරැ ල් ල
අ යෙ ක් කොදමෙබඳුඉදුවෙනබැබළි ල් ල

254 එකෙක්, එක්පුද්ගලයෙක්; ලේ මසින්, රුධිර හා මාංශයෙන්; අඩුවී, ඌනවී; වෙවිලිල්ල සහිතව, කම්පාග්‍රහණසහිතව; හුලක්ලෙස, ශූලයක් මෙන්; ඇවිදිල්ල කරති, ගමනාගමනය කරත්; දික්ගතැති, දීර්ඝගාත්‍රඇති; කෙනෙක්, ඇතැම් පුද්ගලයෝ; සිරුරැල්ල, ශරීරපාර්ශ්වයෙන්; වක්වෙති, වංකවන්

නාහුය; ඉඳු, සෑජුවූ; බැබළිල්ල, භ්‍රාජමානවූ; මෙබඳු, මේ උත්තම යාණන් සදෘශවූ; වෙන අයෙක්, අන්‍ය පුද්ගලයක්හු; කොද, කව රේද? (නොමැතිවන්නේය)

255 තොර ණ රන් සරන එක බඳු පුර දෙ ර ණ
දෙ ර ණ පැමිණී ඉඳු බඹරුව වන් ස ර ණ
ස ර ණ වන ලොවට බවදුක් සාර ව ර ණ
ව ර ණ බඹඉරිදුගත කුමරුන ද ර ණ

255 දෙරණ පුර, ධරණී පුරයෙහි; සරන, සවරත්වූ; එක රන් තොරණ බඳු, අසහාය සුවර්ණමය තොරණයක් වැනිවූ; සරණ, ශ්‍රීචරණයෙන්; දෙරණ, ධරණීතලයට; පැමිණී, ප්‍රවිෂ්ට වූ; ඉඳු, සෑඩි ඇත්තාවූ නොහොත් සෑජුවූ; බඹරුව වන්, බ්‍රහ්ම රූපයක් වැනිවූ; බවදුක්, සංසාර දුඃඛය; වරණ සාර, පහකර මින්; ලොවට, ලොකසත්වයාහට; සරණ වන, පිහිට වන්නාවූ; වර අණ, උතුම් ආඥ ඇති; කුමර, මේ කුමාරොත්තමයා; දරණ, ධාරිතවූ; 'බඹඉරිදුගත', 'බ්‍රහ්මාර්ජුගාත්‍ර' ලක්ෂණය; ඇත, ඇති වන්නේය

256 තරුණ ගෙලුර අත් පා පිට පති කි ර ණ
16 කිර ණ මසින් උස් වෙති සත්තැන ව ර ණ
ලක්ෂණය. ව ර ණ සුර තබන මත යුත් සිරි ස ර ණ
ස ර ණ වෙමොහු 'සත්තැනඋස්'රුව ද ර ණ

256 සුරවරණ, සක්දෙවිඳුගේ; මත, මස්තකයෙහි; තබන, පිහිටුවන්නාවූ; සිරිසරණයුත්, ශ්‍රීපාදවන්දයකින් යුක්තවන් නාවූ; වරණ, උතුම්වූ; කිරණපති, (තේජසින්) හිරුහුවැනි; (මුන් වහන්සේගේ)තරුණ, යෞවනවූ; ගෙල,ග්‍රීවයද; උර අත් පා පිට, (උභය)අංශකූටය හස්තවය සහ පාදවයමත්තෙහිද යන; සත් තැන, සප්තස්ථාන; කිරණ, රශ්මිමත්; මසින්, මාංසයෙන්; උස්වෙති, උත්සන්න වන්නාහුය; (ශරීරලාවන්‍යශ්‍රීන් යුක්තවූයෑ යුසේයි) (එහෙයින්) සරණ, (ජගත්ත්‍රයට) පිහිටඇති; මොහු, මුන්වහන්සේ; දරණ, ධාරිතවූ; 'සත්තැන උස්'රුව, '**සප්තොාන් සද**' ලක්ෂණය; වේ, ඇතිවන්නේය

257 සි හ ර ද පෙරඞකය වේසි විදිසේ පු න්න
17 එ ම ලෙ ද පසඞකය තැන කිසිවිලසි න්න
ලක්ෂණය. හැ ම බ ඳ මොහු සපිරි සිහපරපසවැ න්න
මෙද සොඳ මෙකුමරුගෙලකුණකිදූනගන්න

257 සිගරද, කෙශර සිංහරාජයක්හුගේ; පෙර අඬකය, පූර්‍වාර්ධකායය; විදිසේ, විධිවූපරිද්දෙන්; පුන්න වෙයි, පරිපූර්‍ණ වන්නේය; පසඬකය, පශ්චිමාර්ධකායය; කිසිවිලසින්න, කතරාකාරයකින් වත්; එමලෙදනැත, එපරිදි නොවන්නේය. මොහු, මුන්වහන්සේගේ; හැමබඳ, සකලශරීරය තෙමෙ (නොහොත් පූර්‍වාර්ධපශ්චිමාර්ධ යනකායවය); සිහ, කෙශරසිංහරාජයක්හුගේ; පෙරපස වැන්න, පූර්‍වාර්ධකායමෙන්; සපිරි, පරිපූර්‍ණ වන්නේය. මෙකුමරුගෙ, මේ කුමාරයාණන්වහන්සේගේ; මෙද, මෙයද; සොඳ ලකුණකි, ශොභන ලක්‍ෂණයකැයි; දැනගන්න, ජානනය කරව.

258 ග ත සිහ ලෙසට අඩු වැඩි බැව් නොවමි න් න
යු ත දිග කොට වෙ වැඩි අඩුතැන් එලෙසි න් න
තැත කිසිසුරෙක් කළ හැකි රුව මෙරගි න් න
ඇ ත 'සිහපෙරඬකය' සලකුණ සුපස න් න

258 සිහ. කෙශරසිංහරාජයක්හුගේ; ගත ලෙසට, ශරීරය මෙන්; අඩුවැඩිබැව්, ඌනාධිකභාවයක්ද; නොවමින්න, නොවී; දිග, දීර්‍ඝද; කොට, හ්‍රස්වද; වැඩි, පරිපූර්‍ණද; අඩු, අපරිපූර්‍ණද යන; යුතතැන්, යුක්‍තවියයුතු තත්තත්ස්ථාන; එලෙසින්න, එපරිද්දෙන්ම; වේ, ඇතිවන්නේය; මෙරඟින්න, මේ ආකාර යෙන්; රුව, රූපයක්; කළහැකි, නිර්‍මාණයකරන්ට සමර්‍ථ; කිසිසුරෙක්, කිසියම් දෛවතයෙක්; නැත අවිද්‍යමාන වේ; (එහෙසින්) සුපසන්න, සුප්‍රසන්නාවූ; 'සිහපෙරඬකය' සලකුණ, **'සිංහපූර්‍වාර්ධකාය'** ලක්‍ෂණය; ඇත, (උන්වහන්සේට) ඇති වන්නේය.

259 දෙපස පිට මැදෙහි නොබෙදී වෙනවෙ නය
18 වි ළ ස රන්පුවරු ගෙලෙසිට කටිතැ නය
**ලක්‍ෂණය.** ස කස බැඳි මසින් දිලෙ මනනෙත් ගෙ නය
දියැ ස මෙ 'පිරිපිටමැද' ලකුණි සොබ නය

259 පිටමැදෙහි, පෘෂ්ඨ මධ්‍යයෙහි; දෙපස, දෙපාර්ශ්වයක්; වෙන වෙනය, වෙන්වෙන් වශයෙන්; නොබෙදී, විභාග නොව; ගෙලෙසිට, ග්‍රීවයෙහි පටන්; කටි තැනය, ශ්‍රොණිභාගය දක්වා; රන්පුවරු විලස, ස්වර්‍ණමය පුවරුවකගේ ශොභායෙන්; මසින් බැඳී, මාංශයෙන් බඩව හෙවත් පූරිතව; මන නෙත් ගෙනය, නෙත්‍රචිත්‍රාකර්‍ෂණය කරමින්; සකසා, සැලසී; දිලෙ, භ්‍රාජි

තවේ; දිගැස, මේ ජගත්චක්ෂුහුගේ; සොබන්ය, ශොභනවූ; 'පිරිපිටමැද' ලකුණි, 'චිත්‍රාන්තරාංශ' ලක්ෂණය; මෙ, මේ උක්තප්‍රකාරවේ.

260 රු ක ක් නුග පුළුල දිග එකස මා න ය
19 ලෙ ස ක් මොවුන් බඹපමණද එ මා න ය.
ලක්ෂණය. එ තෙ ක් කයද වනු ලෙද එ උප මා න ය
මෙ එ ක් ලකුණි 'නුගපිරිමඩල' මා න ය

260 නුගරුකක්, න්‍යග්‍රොධවෘක්ෂයක්; පුළුලදිග, පෘථුලත්වයෙන් හා දීර්ඝත්වයෙන්; එකසමානය, ඒකාකාරද; එලෙසක්, තාදෘශාකාරවූම; මොවුන්, මුන්වහන්සේගේ; බඹ, ව්‍යාමයෙහි; මානය, ප්‍රමාණය; පමණද, යම්ප්‍රමාණයක්ද; එතෙක්කයද, ශරීරයත් ඒ ප්‍රමාණම; වනු, වන්නේය. එ උපමානය ලෙද, ඒ උපමා පරිද්දෙන් (එනම්:-න්‍යග්‍රොධ පරිමණ්ඩල උපමා වශයෙන්); මෙ, මෙය; මානය, පූජ්‍යවූ; 'නුගපිරිමඩල', 'න්‍යග්‍රොධපරිමණ්ඩල'; නම්වූ; එක්ලකුණි, උන්වහන්සේගේ එක්ලක්ෂණයකි.

261 පැණස ර වි දු රු සරසවි මුවසර වැ සුණු
20 මෙකුම ර රු සි රු ගෙලසැමසිරිනිසැර සුණු
ලක්ෂණය. ව ට ක ර සොඳුරු රනබෙරඅයුරු ගැව සුණු
කා ළ ක ර ස පි රු 'සමවටකඳ' මෙදිලි සුණු

261 මුවසර, මුඛනමැති පද්මයෙහි; සරසවි, සරස්වතීදෙවිය විසින්; වැසුණු, ආවිෂ්ටවූ; විදුරු, වජ්‍රයට බඳු; පැනසර, ප්‍රඥාසාරවූ; රුසිරු, රූපශ්‍රියෙන්යුත්; මෙකුමර, මේ කුමාරොත්තමයාගේ; සැම සිරිනි, සකලශ්‍රියෙන්; සැරසුණු, සජ්ජිතවූ; වටකර, හාත්පසින්; ගැවසුණු, ගැවසී ගත්තාවූ; සොඳුරු, සුන්දරවූ; ගෙල, ග්‍රීවාව; රනබෙර අයුරු, ස්වර්ණභෙරියක් බඳු වේ; දිලිසුණු, භ්‍රාජිතවූ; කළකරසපිරු, සම්පූර්ණරන්කලස කරක්බඳු; 'සමවටකඳ', 'සමවෘත්තස්කන්ධ'(ලක්ෂණය); මෙ, මේඋක්තප්‍රකාරවේ.

262 ර ස ක් කිසි මෙතුම් මුව තබනා කා ළ ට
21 සි ය ක් සත්නහර රස තුඩුදෙති ගෙ ළ ට
ලක්ෂණය. ම ද ක් අහර දිවතුබු පමණින් ති ළැ ට
රු ස ක් ඔද පැතිරයයි ගතමුළුල් ළ ට

262 මෙතුම, මේ උත්තමයා විසින්; කිසිරසක්, යම්කිසි රසයක්; මුවතබනා කලට, මුඛස්ථාපනය කරන කල්හි; සත්සියක්

රස නහර, සප්තශත ප්‍රමාණ රසහරණීහු; ගෙලට, ග්‍රීවයට; තුඩුදෙති, ඌර්ධ්වාග්‍රව සිටින්නාහුය. (එහෙයින්) තිලඇට, තිල බීජයක් පමණ; මඳක් අහර, ආහර ස්වල්පයක්; දිව, ජිහ්වාග්‍ර යෙහි; තුබූ පමණින්, ස්ථාපනය කළ ප්‍රමාණයෙන්; ගතමුළුල්ලට, සකලශරීරාභ්‍යන්තරයට; ඔදරුසක්, දිව්‍යඔජස් සමූහයක්; පැතිරයයි, ව්‍යාප්ත වන්නේය.

263 එ සි න් දෙන නිරෝගී සැපසුවිපු ල් ල
බෙ ලෙ න් කය පිනයි දින දින සිරිදු ල් ල
මො වු න් රූවට කවරකු ලොව වෙදතු ල් ල
මෙ සි න් 'රසගසග' ලකුණැත මනකා ල් ල

263 එසින් දෙන, ඒ හෙතුකොට ගෙන ප්‍රතිලාභවන්නාවූ; සුවිපුල්ල, අත්‍යන්තයෙන් මහත්වූ; නිරොගි සැප බෙලෙන්, ආරොග්‍යශ්‍රී බලයෙන්; සිරිදුල්ල, උජ්වලිතශ්‍රියෙන්; දින දින, දවසක් දවසක් පාසා; කය පිනයි, ශරීරය ප්‍රීණනය කෙරේ; මොවුන්, මූන්වහන්සේගේ; රූවට, රූපයට; ලොව, ලෝකයෙහි; කවරකු, කවරක්හුගේ රූපය; තුල්ල වෙද, සමානවන්නේද? (නොවන්නේමැයි) මෙසින්, මේ හෙතුවෙන්; මනකල්ල, මනඃකල්‍යවූ; 'රසගසග' ලකුණ, **'රසග්‍රාසාග්‍ර'** ලක්ෂණය; ඇත, (මූන්වහන්සේට) ඇතිවන්නේය.

264 පි රි යටිහනුව පමණක් කෙසරුට ඇ ති ය
22 සි රි මත්කුමරු දෙහනුව වේ එමග ති ය
**ලක්ෂණය.** පි රි පූරසොම්දෙළොස්වකාමඩලෙහිරු ති ය
සි රි වරලකුණ 'සිහහනු' ඉන් මෙතුමැ ති ය

264 කෙසරුට, කෙශර සිංහරාජයක්හට; යටිහනුව පමණක්, අධස්තාද්-හනුව පමණක්; පිරි ඇතිය, පරිපූර්ණව ඇත්තේය; සිරමත්, ශ්‍රීමත්වූ; කුමරු, මේ කුමාරයාණන්ගේ; දෙහනුව, ඌර්ධ්වහනුවහා අධස්තාද්-හනුව; එමගතිය වේ, යථොක්තශොභායෙන් යුක්තවන්නේය. පූරදෙළොස්වක, පූර්ණිමාදශම තිථියෙහි (සිටි); සොම්මඩලෙහි, චන්ද්‍රමණ්ඩලයෙහි; පිරිරුතිය, පූර්ණරුචිරත්වයඇති; 'සිහහනු', **'සිංහහනු'** යන; සිරි, ශ්‍රීමත්වූ; වර, පූජ්‍යවූ; ලකුණ, ලක්ෂණය තෙමේ; ඉන්, එසේ හෙයින්; මෙතුම, මේ උත්තමයාහට; ඇතිය, විද්‍යමානවේ.

265 ස කා ල කණ දරන උතුමං මුව අ ටි ය
23 ස කා ල සතලිසක් දත් වෙති සුපිහි ටි ය
ලක්ෂණය. ස කා ල අන්සතගෙ පිරුදෙතිසය හැ ටි ය
ස කා ල එක්ලකුණි 'සකලිස්' දත්තු ටි ය

265 සකලකණ, චක්‍රලක්ෂණය; දරන, ධාරණය කරන්නාවූ; උතුමං, මේ උත්තමයාගේ; අටිය, සන්තුෂ්ටිකරවූ; මුව, ශ්‍රීමුඛයෙහි; සුපිහිටිය, සුප්‍රතිෂ්ඨිතවූ; සකල, කල්‍යාණසහිතවූ; සතලිසක් දත් වෙති, චත්වාරිංශත්දන්තයෝ ඇතිවන්නාහුය; සකල, සියලුම; අන්සතගෙ, අන්‍යජනතාවගෙ; පිරුහැටිය, (මුඛයෙහි දන්තයාගේ) පරිපූර්ණාකාරය; දෙතිසය, ද්වාත්‍රිංශත් ප්‍රමාණය; (එහෙයින්) 'සතලිස්' දත්, 'චත්වාරිංශද්දන්ත' යන; තුටිය, සන්තුෂ්ටි කරවූ; සකල, කල්‍යාණ සහිතවූ; එක්ලකුණි, (මුන් වහන්සේට ඇතිවන්නාවූ) එක්මහාපුරුෂලක්ෂණයකි.

266 අ ය ප ත කින් සිඳි සකපත සදිසි ස ම
24 ම හ ස ත දත් ඇත එකලෙසනොව අ ස ම
ලක්ෂණය. අන් ස ත වෙත් උස් මිටි දත් හා වි ස ම
න ම් යු ත මේලකුණ 'සමදත්' එවිල ස ම

266 අයපතකින්, අයඃපත්‍රයකින්; සිඳි, ඡේදනය කරන ලද; සකපත සදිසි සම, ශංඛපත්‍රයක්මෙන්සමවූ; නොව අසම, අසම නොව; එකලෙස, ඒකාකාරවූ; දත්, දන්තයෝ; මහසත, මෛත්‍රෙයමහාබොධිසත්වයන් වහන්සේට; ඇත, විද්‍යමානවෙත්; අන්සත, අන්‍යයන්හට; උස්මිටි හා, උච්චනීචහෝ; විසමදත්, විසමවූ දන්තයෝ; වෙත්, ඇති වන්නාහ; එවිලසම, තාදෘශාකාරවම; මෙලකුණ, (උන්වහන්සේගේ) මේ ලක්ෂණය, 'සම දත්', 'සමදන්ත' යන; නම්යුත, නාමයෙන් යුක්තවන්නේය.

267 රුස් කර සි දු රු සෙසුසත තුනුදත් බැ විනී
25 ම ස් හ ර ඇසිරු වෙත්කනකලටබෙහෙ විනී
ලක්ෂණය. ප ස් ම ර සතුරු අගවන සැමට තිලො විනී
උ ස් තිර කුමරු ස ැ ා දත් එලෙස සැබවිනී

267 සෙසුසත, අවශෙෂ සත්වයන්ට; තුනුදත් බැවිනී, විරල දන්තයන් ඇතිවිමකරණ කොට ගෙන; සිදුරුඃ, ඡිද්‍රයන්හි; රුස්කර, රාශිභූත කොරෙමින්; මස්අහර, මාංශාහාර යන්; කනකලට, බුදිනනාවූ කාලයෙහි; බෙහෙවිනි, බොහෝ සෙයින්; ඇසිරුවෙත්, (දන්තයන් අතර) ආශ්‍රිත වන්නාහ. පස්මර, පචමාරයන්ට; සතුරු, ශත්‍රැවූ; තිලොවිනි, භුවනත්‍ර

ශවාසීන් අතුරෙන්; සැමට, සමස්තසත්ත්වයාහට; අගවන, අග්‍රපුද්ගල වන්නාවූ; උස්, ගුණයෙන් උසස්වූ; තිර, එහෙයින්ම ස්ථිරවූ; කුමරු, මේ කුමාරොත්තමයාහට; සැබවිනි, ස්වභාවයෙන්; එලෙස, තාදෘශාකාරවූ; දත්, දන්තයෝ; නැත, අවිද්‍යමාන වින්නාහුය.

268 බ ඳි න ලද විදුරුපෙළ සේ හ රි න් යු ත
ලෙසි න තෙලිතුඩින් ඇඳිහෙබි හි රි න් යු ත
සොබන කුමර දත්රුස නොසි දු රි න් යු ත
න මි න ලකුණ 'අවිවරදත්' සි රි න් යු ත

268 සොබන, ශොභනවූ; කුමර, මේ කුමාරොත්තමිනෙමෙ; හරින්යුත, ස්වර්ණහාරයෙන් යුක්ත කොට; බඳින ලද, බන්ධනයකරනලද; විදුරුපෙළසේ, වජ්‍රපඞ්ක්තියක්මෙන්ද; හෙබි, ශොභිතවූ; තෙලිතුඩින, තුලිකාග්‍රයකින්; ඇඳි, අඳනාලද වැනි; හිරින්යුත, රෙඛායෙන් යුක්තවූ; නොසිදුරින්, ඡිද්‍රනොවූ; සිරින්, ශ්‍රියෙන්; දත්රුස යුත, දන්ත සමූහය ඇති වන්නේය; ඉන්, එහෙයින්; ලකුණ, මේ ලක්ෂණය; 'අවිවරදත්' නමිනයුත, **'අවිවරදන්ත'** නාමයෙන් යුක්ත වන්නේය.

269 ති බෝ අන්සතංගෙ පතුදත් විසම ව න
26 සු බෝ නොමැත යුත් කළුවන්ඇතෙ ව න
**ලක්ෂණය.** එ බෝ සතුගෙ සුදුපැහැදත් රුසිරු ව න
මෙ බෝ රුව 'සුසුදුදත්' යන ලකුණ ව න

269 අන්සතගෙ, අන්‍යසත්ත්වයන්ගේ; තිබෝ, බොහෝසේ; විසම්වන, විෂමවූ; පතුදත්, පූතිදන්තයෝ; කළුවන් ඈ, කෘෂ්ණ වර්ණාදී; නෙවනයුත්, අනෙකාකාර වර්ණයෙන් යුක්තවූවාහු; සුබෝනොමැත, ශොභන නොවන්නාහුය; එබෝසතුගෙ, ඒ බොධිසත්ත්වයන්ගේ; සුදුපැහැදත්, ශුභ්‍රවර්ණදන්තයෝතුමූ; රුසිරුවන, රුචිරවන්නාහුය; මෙබෝරුවට, මේ ආකාරඅධිකශ්‍රියට; 'සුසුදුදත්' යන ලකුණවන, **'සුශුක්ලදංෂ්ට්‍රා'** යන ලක්ෂණයනම් වන්නේය.

270 නොස නොවූ තුනුමහත් පටු දිවනෙසන වන
27 ප ස පල දත් මහත් මාළලෙසනොමවන
**ලක්ෂණය.** ස ස සිව් ද ම් නි කු ත් මුදු එදිගු පළ වන
අ ස පාතා රග ත් සැසායට බැව්ස වන

270 තුනු, සිහින්වූ; මහත්, සථූලවීමෙන් හා; පටු, ලුහුඬුවීමෙනුත් යුක්ත වන්නාවූ; නොස නොවූ, අසන්තුෂ්ටිකාරවූ; නෙදිව, අනෙකාකාර ජිහ්වාවෝ; සතවන, (අවශෙෂ) මනුෂ්‍යසත්‍වයාට ඇතිවේත්; පස, ප්‍රතිත්‍යසමුත්පාද ධර්මයන් හා; පල, ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයන් (හෙතුඵලයන්); දත්, ප්‍රතිවෙධකතීඃවූ; මහත්මා, ඒ මෛත්‍රෙයබොධිසත්‍වකුමාරයාහට; එලෙස, ය ථොක්තාකාරයක්; නොමවන, නොවන්නේය; සසසිව්දම් තිකුත්, චතුස්සත්‍යධර්මයන් නිෂ්ක්‍රාන්තාවන්නාවූ; එ, (උන්වහන්සේගේ) ජිහ්වානොමෝ; මුදු, මෘදුල භාවයෙන්ද; දිගු, දීර්ඝභාවයෙන් හා; පළ, පෘථුලභාවයෙන්ද; වන, යුක්තවන්නීය; සවන බැව්, (උන්වහන්සේගේ) සර්ශ්‍රපදප්‍රාප්ත භාවය; සැකඅයට, ශඞ්කා කළවුන්ට; පානා, යථොක්තජිහ්වාධාතුවෙන්) දක්වන්නාවූ; රහත්, ආකාරයත්; අස, ශ්‍රවණය කරව.........

271 මොනවට දිගු බවය පා මොහු දිවනො මි න
අ ත ර ට ලා දෙකන් සිළ මුදු බැව් ප මි න
ග හ න ට තබා මදි දෙසිදුර තුළ ල මි න
පළකොට වසා පුළුලද නළලද කො මි න

271 මොහු, මුන්වහන්සේගේ; දිව, ජිහ්වා ධාතුවෙහි; නොමින, බෙහොසේ; මොනවට, මනොඥකාර; දිගු බවය පා, දීර්ඝත්‍වය ප්‍රකාශ කොට; දෙකන්සිළ අතරට ලා, උභයකර්ණච්ඡිද්‍රාභ්‍යන්තරයට ප්‍රක්ෂෙප කොටද; මුදුබැව්, මෘදුල භාවය; පමින, දක්වමින්; ගහනට තබා, නාසිකාග්‍රයට ලා; දෙසිදුර තුළ, උභයනාසිකාච්ඡිද්‍රාභ්‍යන්තරයට; ලමින, ප්‍රක්ෂෙප කොටද; මදි, පරිමාර්ජනය කරන්නේය; පුළුලද (ඒ ජිහ්වාධාතුයෙහි) පෘථුලත්‍වයද; පළකොට, දක්වමින්; නළලද, (සකල) ලලාටස්ථලයද; කොමින, ක්‍රමයෙන්; වසා, ඡාදනය කරනසේක.........

272 න ම ක ර දෙ ව් බඹු න් දෙන පුද නොමවැ ර දු
රැ දු ම ර දෙ ව් ගජ න් පරදවන මිග ර දු
සි රි බ ර දෙ ව් රැවින් නැණ දිනු මුවදි ර දු
මෙකු මර දෙ ව් ර දු න් වෙ 'පුහුදිව්' වො ර දු

272 දෙව්බඹුන්, දිව්‍යබ්‍රහ්මයන් විසින්; නොම වැරදූ, අඛණ්ඩව; නමකර, වන්‍දනය කොට; දෙන පුද, කරනලද පූජා ඇත්තාවූ; සිරිබර, ශ්‍රීයෙන් භරිත; දෙව්රුවින්, දිව්‍යසව රූපයක් ඇත්තාවූ; දිරදුමුව, ගණෙශ්වරයා; දිනූ, ජයග්‍රහණය කළ; නැණ, ප්‍රඥසාරයක් ඇත්තාවූ; රුදු, රෞද්‍රවූ; මරදෙව්

ගජන්, සපරිවාරමාරදෙව නමැති ගජසිහු; පරදවන, පරාජය කරන්නාවූ; මිගරදු, මෘගරාජන්වූ; දෙව්රදුන්, දිව්‍යරාජන්වූ හෙවත් ශක්‍රබ්‍රහමාදී සියලු දෙවියන්ට දෙව්වූ; වෙරදු, විරාජිතවූ; මෙකුමර, මේ කුමාරොත්තමයාණන්වහන්සේට; 'පුහු දිව්' **'ප්‍රභූතජිහවා'** ලක්ෂණය; වේ, ඇතිවන්නේය.

273 ලොස ත වැත කවුඩු සිඳු බිඳු ස ර නා ද
28 මෙ ස ත මහ පිනැති නැත එම ගො ර නා ද
**ලක්ෂණය.** ව· පි ත සෙම් නිදෙස් වූ සුමදු ර නා ද
නි ය ත ගුණ මොහුට ඇත බඹස ර නා ද

273 ලොසතට, අන්‍යලොකවාසි සත්ත්වයන්ට; කවුඩු, කවුඩන්ට බඳුවූද; සිඳු, ජිතවූද; බිඳු, භින්නවූද; සරනාද, ශබ්ද ස්වරයෝ; ඇත, ඇතිවෙත්; මහපිනැති, මහාපුණ්‍යවන්තවූ; මෙසත, මේ අප මෛත්‍රෙය බොධිසත්ත්වයාණන්වහන්සේට; එම ගොරනාද, ඒ ආකාරඝොරවූහඬ; නැත, නොමැත්තේය; වපිතසෙම්, වාතපිත්තශ්ලෙෂ්මයන මෙයින්; නිදෙස්වූ, දෙෂරහිතවූ; සුමදුරනාද, අතිමධුරස්වරයෙන් සමන්විතවූ; බඹසරනාද, බ්‍රහමස්වරහඬ; නියතගුණ, නිශ්චිතගුණයෙන් යුක්තවූ; මොහුට, මුන්වහන්සේට; ඇත, ඇතිවන්නේය.

274 පිරි සුදු බැවින් හද මෙතුමන්නැබෙහිප වන්
සරි නද අටහ බඹසරවෙයි පිනනදු වන්
පිරි සුම්හිරි කොවුලන් හඬ පැරයූ තු වන්
සිරි 'බඹසර' නමැයි මෙලකුණ පෙරදිසි වන්

274 දුවන්, දශීතය කළවුන්; පිනන, ප්‍රීණනය කරවන්නාවූ; මෙතුමන්, මේ උත්තමයාගේ; හද, හෘදය; පිරිසුදු බැවින්, පරිශුඩ බැවින්; නැබෙහි පටන්, නාභිය ආදි කොට හටගන්නා; නද, ස්වරය තෙමෙ; අටහ බඹසර, අෂ්ටාහ බ්‍රහම ස්වරය; සරිවෙයි, සදෘශ වන්නේය. කොවුලන්හඬ, කෝකිලයන්ගේ නාදය; පැරයූ, පරාජය කරනලද; තුටන්, සන්තුෂ්ටවූ; පිරි සුම්හිරි, අතිමධුරත්වයෙන් පරිපූර්ණවූ; සිරි, ශ්‍රීමත්වූ; මෙලකුණ, මේ ලක්ෂණය; පෙරදි_ සිටන්, පූර්වකාලයෙහි පටන්; 'බඹසර' නමැයි, **'බ්‍රහමස්වර'** යනනාමයයි (දන්නේය.)

275 දි ය බෙරලිය් කිණිහිරි බදුවද මල් ව න්
29 දි ය රම් තරුදවහත් රුක්පෙතෙලැට ව න්
**ලක්ෂණය.** දි ය ඇති නිල් රන් රතු සුදු කළු ඇ ව න්
දි ය බඳ මෙතුමැත නැන් උවමනා නු ව න්

275 දියබෙරලිය, මෙහෙරිපුය; කිණිහිරි, කර්ණිකාරය; බඳුවද, බන්ධුජීවකය යන; මල් වන්, පුෂ්පයන්බඳුවද; දියරම්, ජගත්රම්‍යවූ; දවයත් තරු, ඖෂධිතාරකාවෙහිද; රුක්පෙනෙලැවි, රුක්පෙනෙලබීජයෙහිද (ඇත්තාවූ); වන්, වර්ණයද යන; දිය, ලෝකයෙහි; ඇති, (පිළිවෙළින්) විද්‍යමානවන්නාවූ; නිල්, නිල වර්ණයද; රන්, සුවර්ණ වර්ණයද; රතු, රක්ත වර්ණයද; සුදු, ශුභ්‍ර වර්ණයද; කළු, කෘෂ්ණ වර්ණයද; ඇ වන්, යනාදී වර්ණයෝ; දිය බඳ, ජගත් බන්ධුවූ; මෙතුම, මේ උත්තමයාගේ; නුවන්, නෙත්‍රයන්හි; උවමිනා තැන්, යෝග්‍ය තන්තත් ස්ථානයන්හි; ඇත, ඇති වන්නාහුය.

276 සවන් රුස් පවන් මහබඹලොව ය වන
නිවන් දෙන ලෙවන් උතුමන්වි ස වන
නුවන් රන් විමන් මිණිකවුළුලෙස වන
මෙවන් රඟ 'නුවන් අබිනිල්' ලකුණ වන

276 සවන වි, සම්‍යක් සම්බුද්ධව; සවන් රුස්, ෂඩ්වර්ණ බුද්ධ රශ්මිය; පවන්මඟ, මාරුත මාර්ගයෙන්; බඹලොව, බ්‍රහ්මලෝකයට; යවන, ගමනය කරවන්නාවූ; ලෙවන්, ලෝකවාසීන්ට; නිවන් දෙන, නිර්වාණය ප්‍රතිලබ්ධ කරවන්නාවූ; උතුමන්, මේ උත්තමයාහට; විමන් රන්, සුවර්ණමය විමානයක; මිණිකවුළු ලෙස, මාණික්‍ය කවාටයක් වැනිවූ; නුවන් වන, නෙත්‍රවයක් වන්නේය; මෙවන් රඟ, මේ උක්තප්‍රකාරය; 'අබිනිල් නුවන්' ලකුණවන, '**අභිනීලනෙත්‍ර**' ලක්ෂණය නම් වේ.

277 එවිගස උපන් රතුවස්සකු ඇස් ගුළිය
30 නිසිලෙස මට සිලුටුවන් කළ මිණි ගුළිය
**ලක්ෂණ.** මුදු යස සිනිඳු නිල්පියුමසෙ රුස් ගුළිය
දියකුස පතරමෙකුමර ඇතනෙත් ගුළිය

277 එවිගස, තත්ක්ෂණයෙහි; උපන්, උපපන්නවූ; රතු, රක්තවර්ණවූ; වස්සකු, වසුපැටවක්හුගේ; ඇස්ගුළිය, අක්ෂි ගොලය මෙන්ද; නිසිලෙස, මනාව; මට, මෘෂ්ටව; සිලුටු, ශ්ලිෂ්ටව; කළ, කරන ලද; මිණිගුළිය වන්, මාණික්‍ය ගොලය මෙන්ද; යස, මනාවූ; සිනිඳු, සනිග්ධවූ; නිල්පියුම, නීලොත්පල යක; රුස්ගුළියසෙ, කාන්ති ශ්‍රී රාශියක් බඳුවූද; නෙත්ගුළිය, අක්ෂිගොලය; දියකුස, ජගත් කුක්ෂියෙහි; පතර, ප්‍රසිද්ධවූ; මෙකුමර, මේ කුමාරෝත්තමයාහට; ඇත, විද්‍යමානවේ.

278 නු ව න් අ න් නොපු න් ගැ ඹු රි න් යුතු ව න් න
රු ව න් ර න් ප හ න් කු ම රු න් එළෙසි න් න
නොව න් නෙත් ව් නෙ න් පෙ ර මෙ න් නෙත්පු න් න
මෙ ව න් ද න් නු ව න් 'ගොපැකුම්' රුව වැ න් න

278 අන්, අන්‍ය සත්ත්වයන්ගේ; නුවන්; නෙත්‍රයෝ; නොපුන්, අසම්පූර්ණත්වයෙන්හා; ගැඹුරින්, ගම්භීරත්වයෙන්; යුතුවන්න, යුක්ත වන්නාහුය; රන් රුවන්, ස්වර්ණප්‍රතිබිම්බායමානවූ; පහන්, (එහෙයින්) ප්‍රසන්නවූ; කුමරුන්, මේ කුමාරයාණන් හට; එළෙසින්න, එබඳු (නෙත්‍ර) ආකාරයක්; නොවන්නෙත්, විද්‍යමාන නොවන බැවින්; පෙරවනෙන් මෙන්, පූර්වවර්ණනා (පද්‍යයෙහි) කීවාක්මෙන්; නෙත්, නෙත්‍රයෝ; පුන්න, පරිපූර්ණයහ; මෙවන්, මෙබඳු උක්තප්‍රකාරවූ; නුවන්රුව වැන්න, නෙත්‍ර ලක්ෂණය; 'ගොපැකුම්', **'ගෝපක්ෂ්ම'** නමැයි; දන්, ජානනය කරනු....

279 අ තු රු දෙබැම ගහන න අග පටන් ගෙන
31 ප තු රු වනා නළල න මැද ඉම්රැ ගෙන
**ලක්ෂණය.** ඉ තු රු දවල පැහප න දවහත් ර හෙන
උ තු රු එ 'උණ්ණලොම්'ගත ලකුණය අ ගෙන

279 දෙබැම අතුරු, භ්‍රෑයුගල මධ්‍යයෙහි; ගහනන අග, නාසිකාග්‍රයෙහි; පටන්ගෙන, ආරම්භ ග්‍රහණය කොට; නළලන මැද, ලලාටස්ථලය මධ්‍යයෙහි; ඉම් රැගෙන, සීමාකොට ගෙන; පතුරුවනා, ප්‍රස්තරිත කරන්නාවූ; දවහත් රහෙන, ඖෂධී තාරකා විලාසයෙන්; ඉතුරු දවල, සුභ්‍රවර්ණාධික; පැහැපත, ප්‍රභාප්‍රාප්තවූ; උතුරු, ශ්‍රේෂ්ඨවූ; එ 'උණ්ණලොම්' ගත ලකුණය, ඒ **'ඌර්ණාරෝම'** මහාපුරුෂ ලක්ෂණයතෙමේ; අගෙන, අනර්ඝතාවයෙන්; (මතුකාවහාසම්බන්ධයි.)

280 න ගි න සඳ මඬල පිරි තිරි සිරි රැ ස ය
දි ගි න රියන් පමණින් දිලි සුවිල ස ය
අ ගි න කරකැවී මෙන් දකුණත් දෙ ස ය
ර ගි න පෙනෙයි උන්වන බැව් සමතැ ස ය

280 නගින, වර්ධනය වන්නාවූ; හෙවත් පූර්වපක්ෂයෙහි සඳ මඬල, චන්ද්‍රමණ්ඩලාකාරයෙන්; පිරිතිරි, පූර්ණාතිරික්තවූ; සිරි රැසය, කාන්ති සමූහයෙන්ද; දිගින, ආයාමයෙන්; රියන් පමණින්, රත්නප්‍රමාණයෙන් යුක්තව; දිලි, භ්‍රාජමානවූ; සුවි

ලසය, මනඃකල්‍ය විලාසයෙන්ද; අගින, අග්‍රයෙන්; දකුණත් දෙසය, දක්ෂිණදිශාවට; කරකැවීමෙන්, ආවෘතවීමෙන්ද යන; රහිත, මේ ලක්ෂණයෙන්; උන්, උන්වහන්සේ; සමතැසය වනබැව්, සමන්තචක්ෂුහු හෙවත් බුදුවන භාවය; පෙනෙයි, දෘශ්‍යමානවේ.~

281 න ර සෙ ට බැඳි නළල් රන්පට සදිසි ව න
32 මූ ල සි ට දකුණු සවනත තෙක්වම්ස ව න
ලක්ෂණය. මොන ව ට වැසුණු මස් පටලැති නළල් ව න
මෙම සෙ ට කුමර 'උස්නිස්හිස්' එසිනි ව න

281 නරසෙට, නරශ්‍රේෂ්ඨයකු විසින්; බැඳි, බඳිනාලද; රන් නළල්පට, සුවර්ණමය උෂ්ණීෂපට්ටයක් හා; සදිසි වන, සදෘශ වන්නාවූ; දකුණු සවනත මූලසිට, දක්ෂිණ කර්ණයාගේ මූලපටන්; වම් සවනතෙක්, වාමකර්ණාන්තය දක්වා; මොන වට, මනාකොට; වැසුණු, ඡාදිතවන; මස්පටලැති, මාංස පටලයක් ඇත්තාවූ; නළල් වන, ලලාටයෙක් වන්නේය; එසිනි, එහෙයින්; මෙම සෙට කුමර, මේ ශ්‍රේෂ්ඨකුමාර තෙමේ; උස්නිස්හිස්' වන, 'උෂ්ණීෂශීර්ෂ' ලක්ෂණයෙන් යුක්ත වන්නේය.

282

සි රි ස රා වි දු ර සු න රා වනමරුහැ රා බුදු ලොවු තු රා
සි රි ස රා රු ඳි ප ද ස රා මෙකුමරව රා ගුණ පිවි තු රා
සි රි ස රා පුද දෙන සු රා අත්කෙළව රා එවරා තු රා
සි රි ස රා දෙතිසක් ව රා මෙළකුණුද රා වැඩෙ විසි තු රා

282 විදුරසුන් අරා, වජ්‍රාසනාරූඪව; මරුහැරා, පංචමාර මර්දනය කොට; සිරිසරා, ශතපුණ්‍යශ්‍රීන් සාරවූ; ලොවුතුරා බුදුවන, ලොකොත්තර සම්‍යක්සම්බුඬ වන්නාවූ; සිරිසරා රුඳි පදසරා, ශ්‍රී දෙවින් රජිතවූ පාදපද්මයක් ඇත්තාවූ; ගුණ, සකල ගුණයෙන්; පිවිතුරා, පවිත්‍රවූ; මෙකුමරවරා, මේ කුමාරොත්තම තෙමේ; අසිරි, ආශ්චර්ය්‍යයෙන්; සරා, සාරවූ; පුද දෙන සුරා, දෙවියන් විසින් පූජා පවත්වන්නාවූ; අත්කෙළ වරා, (තමන්වහන්සේගේ) පශ්චිම ආත්මභාවය වන; එවරා තුරා, ඒ කාලයෙහි; සිරිසරා, ශ්‍රීමත්වූ; මෙ, පූජෝක්තවූ; දෙතිසක් වරා ලකුණු විසිතුරා, ද්වාත්‍රිංශද්වර මහා පුරුෂලක්ෂණ වෛචිත්‍ර්‍යය; දරා, ධාරණය කොට; වැඩෙ, වර්ධනයවේ.~

**අෂ්ටමසර්ගය සමාප්තයි.**

—o:o—

283 දිනිඳුසෙ විරා ජිත
අනුනට නොවෙ පරා ජිත
ඉන් මොහු සොඳ අ ජිත
නමින් පළවේ තිලෝ පූ ජිත

283 දිනිඳුසෙ, හිරුහුමෙන්; විරාජිත, බබළන්නාවූ; තිලෝ පූජිත, තුන්ලෝ වැස්සන් විසින් පුදනලද්දවූ; (මේ කුමාරොත්තමයා) අනුන්හට පරාජිත නොවෙ, අන්‍ය කිසිවෙක් හටත් පරාජිත නොවන්නේය (කිසිවකු විසින් නොදිනිය හැක්කේ මැයිසේයි); ඉන්, එසේ හෙයින්; මොහු, මූන්වහන්සේ; සොඳ, සුන්‍දරවූ; අජිත, අජිත කුමාරය යන; නමින්, නාමයෙන්; පළවේ; ප්‍රසිඬ වන්නේය.

284 මරුමන් කර ප සුන්
බුදුවන කුමර සන් සුන්
දිලෙනා වන් ක සුන්
කෙළි කුමරුන් සමඟ සුද සුන්

284 මරුමන්, පචමාරයන්ගේ එඩිය; පසුන් කර, ප්‍රව්ජිතත කොට; බුදුවන, සම්‍යක්සම්බුඬ වන්නාවූ; සන්සුන්, ශාන්ත ගුණයෙන් යුක්තවූ; කුමර, මේ බොධිසත්ව කුමාරොත්තමයා; කසුන්වන්, කාඤ්චන වර්ණයෙන්; දිලෙනා, බබළන්නාවූ; සුද සුන්, සුදශීනියවූ; කුමරුන් සමඟ, ළදරු කුමාරයන් හා සමඟ; කෙළි, ක්‍රිඩා කරන්නේය.

285 සිදුහත්ය සඳ සා ය
සිරිවැඩුය වඩ මන සා ය
උස්ගවු දෙළස සා ය
එතුන් රන්පා සැදෙත් තිසැ සා ය

285 සිදුහත්ය, සිඬාර්ථය; සඳසාය, චන්‍ද්‍රසාය; සිරිවැඩුය වඩමනසාය, සිරිවඩඩකවූ වඩස්මානසාය යන; ගවු දෙළසසාය, ගව්‍යුතිවාදශයක් බැගින්; උස්, ප්‍රාංශුත්වය ඇති; එතුන් රන්පා, ඒ සුවර්ණමය ත්‍රිවිධ ප්‍රාසාදයෝ; තිසැසාය, තිශචයෙන්; සැදෙත්, (මේ කුමාරයාහට) ප්‍රාදූර් භූත වන්නාහුය.

286 කුමර සඳ සහො සය
ඉතු තුන සුදුසු විල සය
එපා තුළ වා සය
සිරිනි වෙයි සරි නුවන් සය සය

286 ඉතුතුන, (හෙමන්ත, ගිම්හාන, වස්සාන යන) ත්‍රිවිධ ඍතුවලට; සුදුසු විලසය, යොග්‍යවූ පරිද්දෙන්; එපාතුළ, ඒ ප්‍රාසාදාභ්‍යන්තරයන්හි; කුමරසඳ, ඒ කුමාරොත්තමයාගේ; සන්තොසය, චිත්තානුකූලව; වාසය, පරමහර්ෂොපෙත විසීම; නුවන් සහසය, සහස්‍රනයනයාට හෙවත් සක්‍රදුට; සරි, සදෘශවූ; සිරිනිවෙසි, ශොභායෙන් යුක්තවන්නේය.

287 බැගින් සත් මහ ල ය
එක එක පා විසා ල ය
එකින් එක මහ ල ය
වෙති සුවහස් එකුළු ගෙව ල ය

287 සත්මහලය බැගින්, සත් සත් මාලකයක්හුගේ සඞ්ඛ්‍යාවෙන්; එක එක පා, එක් එක් ප්‍රාසාදයෙක්; විසාලය, මහත් වේ; එකින් එක මහලය, ඒ මහල් එක එකෙහි; සුවහස්, ලක්‍ෂපරිමිතවූ; එකුළු ගෙවලය, ඒ කූටාගාරයෝ; වෙතී, ඇතිවන්නෝය.

288 පවුරු සත් රු ව න ය
වාසල් එසත් රු ව න ය
දුලනනෙක රු ව න ය
සැදෙත් ඒ තුන්පාය රු ව න ය

288 පවුරු සත්රුවනය, සප්ත රත්නප්‍රාකාරද; එසත් රුවනය, ඒ සප්ත රත්නමයවූ; වාසල්, දොරටුද; නෙක රුවනය, අනෙකරූපවර්ණයෙන්; දුලන, බබළන්නාවූ; ඒ, ඒ උක්තප්‍රකාර; තුන්පාය රුවනය, රත්නප්‍රසාදත්‍රයෙහි; සැදෙත්, සජ්ජිත වන්නාහුය.

289 පසතුරු නාද යෙ න්
රන්රසුදූල් ගිගුම යෙ න්
රන් දද ගිගිළි යෙ න්
එපුර ගුම් ගති පැතිර තිති යෙ න්

289 (ඒ ප්‍රාසාදත්‍රයෙහි ඇති) පසතුරුනාදයෙන්, (ආතතය, විතතය, ආතතවිතතය, ඝනය, ශුෂිරය යන) පඤ්චතූර්‍ය්‍ය නාදයෙන්ද; රන්රසුදූල්, ස්වර්ණකිඞ්කිණික ජාලාවන්ගේ; ගිගුමයෙන්, ඝොෂයෙන්ද; රන්දද, ස්වර්ණධ්වජයන්ගේ; ගිගිළියෙන්, ගර්ජනාවෙන්ද; එපුර, ඒ නගරය; තිතියෙන්, නිරන්තරයෙන්; පැතිර, ප්‍රස්තාරිතව; ගුම්ගති, ඝොෂග්‍රහණය කරන්නේය.

290 එතුන් පා බිති පෙ ළ
සත් රන්තල් මුවර පෙ ළ
සිඟ වගද ඇත් පෙ ළ
ඇත නිමා අස්රිය මොනර පෙ ළ

290 එතුන් පා, ඒ ප්‍රාසාදත්‍රයන්ගේ; බිතිපෙළ, භිත්ති පඞ්ක්තියෙහි; සත්රන්, සප්තරත්නමයවූ; තල්මුවර පෙළ, තාල පඞ්ක්තිය හා මකර පඞ්ක්තියද; සිඟ වගද, සිංහ පඞ්ක්තිය හා ව්‍යාඝ්‍ර පඞ්ක්තියද; ඇත්පෙළ, හස්ති පඞ්ක්තියද; අස් මොනොර රියපෙළ, අශ්ව පඞ්ක්තිය මයුර පඞ්ක්තිය සහ රථ පඞ්ක්තියද; නිමාඇත, නිර්මිතකොට ඇතිවන්නාහුය.

291 සත් රුවනින්ම කා ළ
එක් එක් මහල් සුල කා ළ
සත් සිත් විසී කා ළ
සියල්දූ ඇත සිරිනි නිම කා ළ

291 සත්රුවනින්ම, සප්තරත්නයෙන්ම; කළ, කරනලද්දූවූ; සුලකළ, සවලඞ්කෘතවූ; එක් එක් මහල්, ඒ එක එක මාලකයෙක්හි; සත් සිත්, සත්වයන්ගේ චිත්තය; විසී කළ, වශග කළාවූ; සිරිනි, ශ්‍රීයෙන්; නිමකළ, නිමාකරන ලද්දූවූ; සියල්දූ, (උවමනා) සකල ද්‍රව්‍යයෝ; ඇත, ඇතිවන්නාහ.

292 සත් දළැති ඇ ත් ර දූ
පමුක මංගල ඇ ත් ර දූ
සත් දහස් ඇ ත් ර දූ
සපිරිවර ගෙන සිටිත් ඇ ත් ර දූ

292 මංගල ඇත්රදූ, මඞ්ගල හස්තිරාජයා නමින් ප්‍රසිද්ධවූ; සත්දළැති ඇත්රදූ, ෂඩ්දන්ත හස්තිරාජයා; පමුක, ප්‍රමුඛකොට ගෙන; ඇත්රදූ, හස්තිරාජයෝ; සත්දහස්, සප්ත සහස්‍රයක්; සපිරිවර ඇත්රදූ ගෙන, පිරිවර හස්තිරාජයන් එක්කොට ගෙන; සිටිත්, ස්ථිතිය කරන්නාහුය.

293 වලාහක අ ස් ර දූ
පෙරටු කැරනා අ ස් ර දූ
සත්දහස් අ ස් ර දූ
සැරසි සිටි තව සමග අ ස් ර දූ

293 වලාහක අස්රදු, වලාහක අශ්වරාජයා නමින් ප්‍රසිද්ධවූ; අස්රදුනා, අශ්වරාජේන්ද්‍රයා, පෙරටුකැර, පූර්වඩ්ගම කොට; සත්දහස් අස්රදු, සප්ත සහස්‍ර අශ්වරාජකෙනෙක්; නව, අන්‍යවූත්; අස්රදු සමග, අශ්වරාජයන් සමග්‍රව; සැරසී, සජ්ජිතව; ඉදිනි, සවිනිය කරන්නාහුය......

294 තැඹුරන් දද යෙන්
හිර සඳ මඩල සිරි යෙන්
සැරසු නෙක රුව යෙන්
සත් දහස් රිය ඇතිය අග යෙන්

294 තැඹු, ඔසවනලද්දවූ; රන්දදයෙන්, සුවර්ණධ්වජයන් ගෙන් යුක්තවූ; හිරසඳ මඩල සිරියෙන්, චන්ද්‍රසූර්‍ය්‍ය මණ්ඩල ශ්‍රීයෙන්; නෙකරුවයෙන්, අනෙක ලක්‍ෂණයෙන්; සැරසූ, සවලඞකෘතකළාවූ: අගයෙන්, අනඝිවූ; සත්දහස් රිය, සප්තසහස්‍ර පරිමිත රථයෝ; ඇතිය, ඇතිවන්නාහ......

295 මොහු සිහ මර ඉ බුන්
සැදු යසහරුර දිග ඹුන්
මහලෙකෙක දුක් බුන්
රහත් රුස් සත්දහස් තළ ඹුන්

295 මර ඉබුන්, (පච) මාර නමැති හස්තීන්ට; සිහ, සිංහ රාජන්වූ; දිගඹුන්, දිශා නමැති කාන්තාවන්ගේ; උර, වක්‍ෂඃස්ථල යෙහි; යසහර, කීර්ති නමැති මුක්තාහාරය; සැදූ; සජ්ජිත කළාවූ; මොහු, මුන්වහන්සේගේ; දුක් බුන්, දුඃඛ රහිත; මහල් එක එක, ඒ එක් එක් මාලකයෙක්හි; සත්දහස්, සප්ත සහස්‍රයකින් යුත්; තළඹුන් රුස්, නාටකස්ත්‍රී වර්ගයෝ; රහත්, නෘත්‍ය කරන්නාහුය......

296 අජිත එකුමර සඳ
තුටු කර දුටන් නෙත් සඳ
විලසින් සුපුන් සඳ
මෙමලස තුන් පා යෙහි වසන සඳ

296 අජිත එකුමරසඳ, ඒ අජිත කුමාරොත්තමයා; දුවන්, දර්ශනය කළවුන්ගේ; නෙත්සඳ, නෙත්‍ර චිත්තයන්; තුටුකර, ප්‍රීණනය කරමින්; සුපුන් සඳ විලසින්, පූර්ණචන්ද්‍රයා මෙන්; තුන්පායෙහි, (යථොක්ත) ප්‍රාසාදත්‍රයෙහි; වසන සඳ, වැඩවාසය කරන කල්හී—(මතු තුන් කව්හා කුලකයි.)

297 එසක්විති නම්　　ස ක්
අැ දඹදිව රදෙව්　　ස ක්
සුවාසූදහ　　ස ක්
මඟුල්කඩුගත් රදකුමර　　ස ක්

297 සක්රදෙව්, ශක්‍රයාබඳු; එසක් නම්සක්විති අැ, ඒ සංඛනම්චක්‍රවර්තිනරේන්‍ද්‍රයාආදී; දඹදිව, ජම්බුද්වීපයෙහි; මඟුල් කඩුගත්, මඞ්ගලඛඞ්ග ගත්තාවූ; සුවාසූදහසක්, චතුරශීති සහස්‍රයකින්යුත්; රදකුමරසක්, රාජකුමාරපිරිසක්–

298 මහ බෝසත්　　කා රා
සපැමිණ මෙමපළ　　කා රා
ගිම්මුබැගුණ　　කා රා
කරමුසේවය මෙඅපිල　　කා රා

298 මහ බෝසත්කරා, එ මහා බොධිසත්‍වොත්තමයාවෙත; සපැමිණ, සම්ප්‍රාප්තව; මෙම, මේවක්‍ෂ්‍යමාණකාරණය; පළ කරා, ප්‍රකාශකරන්නේය; (එනම්) ලකරා, සවලඞ්කෘතවූ; ගුණකරා, ගුණයන්ට ආකරවූ; හිමි, ස්වාමිපුත්‍රයාණෙනි; මෙඅපි, මේඅසමත්හු; මුබැ, භවත්හු; සේවයකරමු, සේවයකරන්නෙමු–

299 තිදස පුර බ　　ටූ ව ත්
එදින දිනුමොහු කැ　　ටූ ව න්
මරුපස නොවැ　　ටූ ව න්
අැමතිඅටළොස්කෙළකඉ　　ටූ ව න්

299 තිදස පුර, දිව්‍යලොකයෙන්; බටූවත්, අවතීර්ණවූ; එදින, තද්දිනයෙහි; මොහු කැටූවන්, මූන්වහන්සේ එකීභූත වම; දිනු, (කේතුමතියෙහි) ජනිතවූ; මරු, මාරයාගේ; පස, පාසයෙහි; නොවැටූවන්, පතිත නොවූ; ඉටූවත්, ඉෂ්ටාභිවෘද්ධය කාවූ; අැමති, අමාත්‍යයෝ; අටළොස් ෂොළසා; අෂ්ටාදශ කොටි ලයකා–

300 මෙකුමරවර　　ය සේ
වත්කල යොවුන් ව　　ය සේ
රුවින් රන් ලි　　ය සේ
සරණ ගුති කුමරියක් පි　　ය සේ

300 යසේ, කීර්තිමත්වූ; වර, ප්‍රාර්ථනීයවූ; මෙකුමරවර, මේකුමාරොත්තම (තෙමේ–තමා); යොවුන්වයසේ. යෞවන අවස්ථාවට; වත්කල, ප්‍රාප්තවූ කල්හි; රුවින්, රූපලක්‍ෂණය

කාරණ කොටගෙන; රන්ලියසේ, සුවර්ණලතාවක්වැනි; කුමරි යක්, කුමාරිකාවක්; පියසේ, ප්‍රියවූ පරිදි; සරණගති; පරි ණය කොටගන්නේය.....

301 වු ව න් සඳ බි ම් බා
ල ව න් වැනිපල බි ම් බා
සි රි න් රත බි ම් බා
සි ය ල් රුසිරෙන් බිසෝ බි ම් බා

301 වුවන්, වක්ත්‍රයෙන්; සඳබිම්බා, චන්ද්‍රබිම්බය වැනිවූ; ලවන්, අධරයුගලයෙන්; පලබිම්බා වැනි, බිම්බුඵලවැනිවූ; සිරින්, ශ්‍රියාවෙන්; රතබිම්බා, සුවර්ණබිම්බයක් වැනිවූ; සියල් රුසි රෙන්, රූපසෞන්දර්යශ්‍රීසාකල්‍යයෙන්; බිසෝ බිම්බා, බිම්බා දෙවිය (හෙවත් සිද්ධාර්ථ කුමාරඅග්‍රමහෙසිකාවූයශෝධරාදෙවිය) සමානවූ—(මතුකාවහා සම්බන්ධයි.)

302 රුව් ගුණ අ මා යා
සදිවසර අස මා යා
සඳමුව න මා යා
පවර බිසවක් වෙයි ර මා යා

302 සදිවසර, ෂඩ්විධදිව්‍යාප්සරාවන්හා; අසමායා, අසදෘශ වූ; රුව ගුණ, රූපලාවණ්‍යයෙන් සහ ගුණයෙන්; අමායා, අ මෘතයක් වැනිවූ; සඳමුව, චන්ද්‍රමුඛී යන; නාමායා, නාමයෙන් ප්‍රසිද්ධවූ; රම්‍යා, මනොරම්‍යවූ; පවර, ප්‍රශස්තවූ; බිසවක්, මහිෂියක්; වෙයි, වන්නීය.....

303 එබිසව් සිරිලි ය ට
සම කාලොත් කිවි කවි ය ට
දිය බිඳ ගත් නි ය ට
වැන්න සරි කළ කලිඳු නදි ය ට

303 කිවි, කවීන්ද්‍රයන් විසින්; කවියට, කාව්‍ය ප්‍රබන්ධය පි ණිස; එබිසව්, ඒ මහිෂියගේ (රූපශ්‍රිය); සිරිලියට, ශ්‍රීකාන්තා වට; සම කාලොත්, සමාන කාලෝස්; නියට, නඛාභ්‍යන්තර යට; ගත්, ග්‍රහණය කළ; දිය බිඳ, දිය පොද; කලිඳු නදියට, කාලින්දී (යමුනානම්) ගඞ්ගාවට; සරි කළ වැන්න, සදෘශ කළාක් වැනිවේ.....

304 තිළිණෙන් සුරතු ර ට
එබිසො සරි කළ ඇදු ර ට
ගැරහුම් මිස නෙ ර ට
අහෝ වන්නේ යසස් කෙව ර ට

304 එබිසො, ඒ මහිෂිය; තිළිණෙන්, ත්‍යාගය කරණකොට ගෙන; සුර තුරට, කල්පද්‍රුමයට; සරිකළ, සදෘශ කළාවූ; ඇදුරට, ආචාර්‍ය්‍යයන්හට; නෙරට, නොයෙක් රටවැස්සන් ගෙන් (ශියශියදෙස්හි); ගැරහුම් මිස, ගර්හාවන් විනා; කෙව රට, කවරකාලයෙක්හි; යසස් වන්නේ, කීර්ත්තියක්වන්නේද? (නොවන්නේමැයි) අහෝ, ආශ්චර්‍ය්‍යයයි!

305 උන් නැණ ගුණ නි ව ට
කතද සොමිසඳ මොන ව ට
සමකර පෑ ලො ව ට
කිවිඳු නොම හොබනේ සබා ව ට

305 උන්, ඒමහිෂිය; නැණ, ඥානය කරණකොට ගෙන; නිවට කතද, සරස්වතී දෙවියටද; ගුණ, ගුණයකරණ කොට ගෙන; සොමිසඳ, සෞම්‍යචන්ද්‍රයාටද; මොනවට, මනාකොට; සමකර, සමානකොට; ලොවට, ලොකයාහට; පෑ, ප්‍රකාශ කළ; කිවිඳු, කවීන්ද්‍ර තෙමෙ; සබාවට, පණ්ඩිත්ජනසමාජයට; නොම හොබනේ, ශොභමානනොවන්නේමැයි.

306 සොඳ දෙසඳුන් සු ව ඳ
වැහෙසි තුනු සුදු මුදු ව ද
සඳ මුවයෙන් න ව ද
නිකුත්වෙයි සැම පියුම් එසු ව ඳ

306 සුදු, පරිශුඬවූද; මුදුවද, මෘදුලවූද; තුනු, (ඒබිසො වගේ) ශරීරයෙන්; සොඳ, සුන්දරවූ; දෙසඳුන් සුවඳ, චන්දන යෙහි සුගන්ධය; වැහෙසි විහිදෙන්නේය; නවද, අන්‍යවූත්; එපියුම් සැම සුවඳ, ඒසකල පද්ම සුගන්ධය තෙමෙ; සඳමුවයෙන්, චන්ද්‍රොපමවූමුඛයෙන්; නිකුත්වෙයි, නිෂ්ක්‍රාන්තවන්නේය.

307 උන් ගුණ රුවා සා ර
දෙලොස්රියනක් වට සා ර
දුල් රූ රැස් ල සා ර
මඬල බැබලේ ලෙස සිසිර සා ර

307 ගුණ රුව, ගුණයන්ටහා රූපශ්‍රියටත්; ආකාර, උත් පතහිඝථානයක් බඳුවූ; උන්, ඒබිසවගේ; වටකර, හාත්පස්හි; දෙලොස් රියනක්, ද්වාදශරතනයක්හුගේප්‍රමාණ; දුල්, උජ්ජ්ව ලත්වූ; රූ රුස් ලකර මඬල, රූපාලඞකාර රශ්මි මණ්ඩලය; සිසිරකර, චන්‍ද්‍රයා මෙන්; බැබළේ, භ්‍රාජිතවන්නේය.

308 මවෙකොව් අ දරවන්<br>
සව් ගුණ මිණි අ දරවන්<br>
බිසෝ සුන් දරවන්<br>
එසඳමුව සරි යසෝ දරවන්

308 අදරවන්, (සකලසත්‍වයාහට) අදර ඇතිවන්නාවූ; ම වෙකොව්, අසහායමාතෘවක් වැනිවූ; සව්ගුණමිණි, සියලුගුණ නමැති රතනයන්ට; අදරවන්, ආධාරවූ; සුන්දරවන්, ශ්‍රීසෞ න්‍දර්‍ය්‍යයෙන් යුක්තවූ; එසඳමුවබිසෝ, චන්‍ද්‍රමුඛී යන නමින් ප්‍රසිඬවූමහිෂි තොමෝ; යසෝදර, (රාහුලමාතා) යශොධරා දෙවියට; සරිවන්, සදෘශවන්නීය.

309 වර එබිසෝ රුවන්<br>
සරණ ගති මොහු ග රුවන්<br>
:විලස පුරඳු රුවන්<br>
ගත් සුජාදිවසර රුසි රුවන්

309 පුරඳුරුවන්, පුරන්‍දරයාගෙවත්ශක්‍රදෙවෙන්‍ද්‍රයා; රුසි රුවන්, රුචිරවූ; සුජාදිවසර, සුජානම්දිව්‍යපසරාව; ගත්විලස, අභිෂෙකකරගත්ලීලායෙන්; ගරුවන්, ගරුවූ; මොහු, මේ කුමාරොත්තමතෙමෙ; වර, පූජ්‍යවූ; එබිසෝරුවන්, ඒබිසො රතනය; සරණගති, අභිෂෙකකරගත්තේය.

310 කුමරා ලොවෙසා හිමි<br>
සහ අගබිසෝ කළ හිමි<br>
සිරි රුගත් සිරි හිමි<br>
විලස් සව්සිරි විඳි ලෝ හිමි

310 ලොවෙසා හිමි, ලොකයට අසහාය ස්වාමිවූ; කුමරා, ඒකුමාරොත්තමයා; හිමිකළ, අභිෂෙක කරනලද්දවූ; අගබි සෝ සහ, අග්‍රමහිෂියහා සමග්‍රව; සිරි, ශ්‍රීකාන්තා; රුගත්, ග්‍රහණය කළ; සිරිහිමි විලස්, විෂ්ණුසුරෙන්‍ද්‍ර මෙන්; ලෝහිමි, ලොකයට අයැත්; සව්සිරි, සකලෛශ්වර්‍ය්‍යය; විඳි, විඳෑනය කරන්නේය.

311 වසර අටදහ ස ක්
ගිහි සැපත විඳ මෙලෙ ස ක්
වසනසඳ සුර ස ක්
මවා පෙන්වන අතිනි එප ස ක්

311 වසර, අවුරුදු; අටදහසක්, අෂ්ටසහස්‍රයක්; මෙලෙ සක්, මේආකාරයෙන්; ගිහි සැපත, ගෘහස්ථ සෞඛ්‍ය සම්පත්තිය; විඳ, වින්දනය කරමින්; වසනසඳ, වැඩවාසයකරන කල්හි; සුරසක්, දිව්‍යසමූහයා විසින්; මවා, නිර්මිතකොට; එපසක්, ඒප්‍රත්‍යක්ෂවූ; අතිනි, අඞ්ගයෙන්; පෙන්වන, දර්ශනය කරවන්නාවූ—(මතුකව හා කුලකයි.)

312 ජරා ලෙඩ මළ රූ ව
තවුස් විලසද මග රූ ව
සිවු නිමිති පූ රූ ව
දකි පින්සිරිසර අපූ රූ ව

312 ජරා ලෙඩ මළරූව, ජරා ව්‍යාධි මෘත යනත්‍රිවිධස්වරූප යන්ද; මඟරූව, පූජ්‍යවූ; තවුස්විලසද, තපස්විවෙෂයද යන; සිවු පූරූව නිමිති, ඒචතුර්විධපූර්ව නිමිත්තයන්; අපූරූව, ආශ්චර්‍ය්‍ය වූ; පින්සිරිසර, පුණ්‍යශ්‍රීසාර ඇති හෙතෙම; දකි, දර්ශනය කරන්නේය........

313 තුන් විලස් දුනි මි ත
දූක කළකිරි එසු මි ත
තවුස්රූ සුනි මි ත
බලා කර තමහටද එප මි ත

313 දුනිමිත, දුෂ්ටනිමිත්තාකාරවූ; තුන්විලස්, ත්‍රිවිධවෙෂ යන්; එසුමිත, ඒසුමිත්‍රමහාබොධිසත්ව තෙමේ; දූක, දර්ශනය කෙරෙමින්; කළකිරී, සංවේගයට පැමිණ; සුනිමිත, ඉෂ්ටා රම්මණයක්වූ; තවුස්රූ, තාපසවෙෂය; බලා, අවලොකනය, කොට; එ, ඒ නිමිත්තාකාරය; තමහටද, තමන්වහන්සේ හටත්; පමිත කර, (මැනැවැයි) ප්‍රමාණකොටගෙන—(පඤ්චකයකින් කුලකයි.)

314 එ බිසෝ සොදු රූ ම න්
සඳමුව නමැති ග රූ ම න්
වැදු දින උතු රූ ම න්
බඹවඩන නම් නම පුතු රූ ම න්

**314** සොඳුරුවන්, රූපශ්‍රීසෞන්දර්‍ය්‍යයෙන් යුක්තවූ; ගරුවන්, ගරුවූ; සඳමුව නමැති, චන්ද්‍රමුඛී යන නාමයෙන් (ප්‍රසිද්ධ) වූ; එ බිසෝ, ඒ අග්‍රමහිෂිකා තොමෝ; උතුරුවන්, උත්තමවූ; තම බඹවඩන නම් පුතුරුවන්, තමන්වහන්සේගේ බ්‍රහ්මවර්ධන නම්වූ පුත්‍රරත්නය; වැදූ දින, ප්‍රසවකාළ දිනයෙහි—

315 පැවිදි බැව් දු  ල් ලේ
ලබමියි සිතා ලො  ල් ලේ
රන් මතුමහ  ල් ලේ
පලක් බැඳ ඉඳි නොවී මැ  ල් ලේ

**315** දුල්ලේ, උජ්ජ්වලිතවූ; පැවිදි බැව්, ප්‍රව්‍රජිත භාවය; ලබමියි, ලබන්නෙමියි; සිතා, චින්තනයකොට; රන්මතුමහල්ලේ, ඒ සුවර්ණමයවූ ඌර්ධ්වහර්ම්‍යතලයෙහි; පලක්බැඳ, පර්‍ය්‍යඞ්ක බන්ධනය කොට; මැල්ලේ නොවී, මලානික නොව; ලොල්ලේ, ලෞල්‍යයෙන්යුක්තව; ඉඳී, උපවේශනය කරන්නේය.—

316 මෙසේ අප ආ  රි ය
බවත බවතින් හැසි  රි ය
කර දුක්කර කි  රි ය
වැඩඉඳී සත් දිනක් සපි  රි ය

**316** මෙසේ, මෙපරිද්දෙන්; අප, අසමත්හුගේ; ආරිය, ආර්‍ය්‍යෝත්තම තෙමෙ (හෙවත් මෛත්‍රෙය මහා බෝධිසත්ත්ව තෙමෙ); බවත බවතින්, භාවතාවැඩීමෙන්; හැසිරිය, කල්ගෙවමින්; දුක්කර කිරය කර, දුෂ්කරක්‍රියා කොට (චතුරඞ්ගවීර්‍ය්‍ය වඩා); සපිරිය, පරිපූර්ණවූ; සත් දිනක්, සප්තාහයක්; වැඩ ඉඳී, උපවේශනය කරන්නේය.—

317 සුවසූ දහස්  ර ද
සහ එපමණ බිසෝ  ර ද
සංඛ සක්විති  ර ද
පිරිවරා ගෙන අනෙක පුද  ර ද

**317** සුවසූදහස් රද සහ, චතුරශීතිසහස්‍ර පරිමිත නරශ්‍රෙෂ්ඨයන්හා; එපමණ රදබිසෝ, ඒ ප්‍රමාණ රාජමහිෂියන්ද; සංඛ සක්විතිරද, සංඛනම් චක්‍රවර්ත්තිරාජයා; පිරිවරා, පරිවාරය කොට ගෙන; අනෙක පුදරද, නොයෙක් රාජපූජ්‍යයන්; ගෙන, ග්‍රහණය කොරෙමින්—(මතුගාව හා සම්බන්ධයි.)

318 එසත්දින ගරු     ව ට
සත්රුවන් පායෙ හි     ව ට
අරක්ගෙන මොන     ව ට
සිරි විකුමෙන් පියසෙ එ ති     ව ට

318 එසත් දින, ඒ සප්තාහයෙහිම; මොනවට, මනාකොට; ගරුවට, ගෞරවාකාරයෙන්; සත්රුවන්පායෙහි, සප්තරත්න ප්‍රාසාදයෙහි; වට, හාත්පස්හි; අරක්ගෙන, ආරක්ෂාග්‍රහණය කොට; විකුමෙන්, වික්‍රමයෙන්; එ, ප්‍රසිද්ධවූ; තිවටපියසෙ, විෂ්ණු පරිද්දෙන්; සිටී, (ඒචක්‍රවර්තිරජ තෙමේ) සිටිනිය කරන් නේය.....

319 එසේ දසදහ     ස ක්
සක්වළ සුරන්හා.     ස ක්
දිවපුදගෙන ප     ස ක්
පිරි තිළි නුබ රකිත් දිය     ස ක්

319 එසේ, තත්වූ පරිද්දෙන්; දසදහසක් සක්වළ, දශ සහස්‍ර චක්‍රවාටයෙහි; සුරන් හා, දෙවියන් සහ; සක්, ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ; පසක්, ප්‍රත්‍යක්ෂවූ; දිවපුද, දිව්‍යමයපූජාභාණ්ඩයන්; ගෙන, ග්‍රහණයකොට; තිළි, තුෂ්ටවී; නුබ, ආකාශයෙහි; පිරී, පූරිතව; දියසක්, (මහාබොධිසත්ව) ජගත්චක්ෂුනරේන්ද්‍රයන්; රකිත්, සංරක්ෂණය කරන්නාහුය.....

320 කි සත් දින නො     මි න
දුක්කරකිරිය පුර     මි න
කතා නොම කර     මි න
ඉඳී හිමි අන්වත නොබල     මි න

320 කිසත්දින, පූර්වොක්ත සප්තාහයෙහිම; නොමින, බොහෝ සෙයින්; දුක්කරකිරිය, දුෂ්කරක්‍රියා; පුරමින, පරිපූර්ණ කෙරෙමින්; කතා නොම කරමින, සංලාපනොකොට; අන් වත, අන්‍යයන්ගේ වක්ත්‍රය; නොබලමින, නිරීක්ෂණය නො කොට; හිමි, ඒ ස්වාමීන්ද්‍රයාණන්වහන්සේ; ඉඳී, නිෂද්‍යා කරන් නේය.....

321 සැම බුදුහුම සෙ     දි න
බුදුවන කෙලෙස් පසි     දි න
වෙසගපුණුපොයො     දි න
එ අප හිමි වන ලොවට රද     දි න

321 සැම බුදුහුම, සකල සර්වඥවරයන්ම; සෙදින, ශීඝ්‍රව; කෙලෙස් පසිඳින, සකලක්ලෙශයන් ප්‍රවිඝානකරණයෙන් හෙවත් නසමින්; බුදුවන, සර්වඥපදප්‍රාප්ත වන; වෙසග පුණු පොහොදින, වෛශාඛපෞර්ණමීදිනයෙහි; ලොවට, ලොකයට; දිනරද වන, බුඬරාජ වන්නාවූ; එ අපහිමි, අපගේ ඒ ස්වාමීන්ද්‍ර තෙමෙ—(මතුකාව් දෙක හා සම්බන්ධයි.)

322 සසර කර ඇ ක් ම න්
බිඳැර ගොර මර වි ක් ම න්
දෙන්ට සත මෝ ක් ම න්
සිතන කෙණෙහිම මහබිනි ක් ම න්

322 මර, මාරයාගේ; ගොර, ඝොරවූ; වික්මන්, වික්‍රමය; බිඳැර, භග්න කොට පියා; සසර, සංසාරය; ඇක්මන් කර, ආක්‍රමණය කොට හෙවත් ඉක්මවා; මන්, පූජ්‍යවූ; මොක්, නිර්වාණය; සත, සමස්තසත්වයා හට; දෙන්ට, දානය කර විම පිණිස; මහබිනික්මන්, මහාභිනිෂ්ක්‍රමණයට; සිතන කෙණෙහිම, චින්තනය කරන ක්‍ෂණයෙහිම......

323 සත්දෙර සත්ප වු රු
ගෙන තොම තබා එ සා වු රු
රන්පා නුබ වි වු රු
යාය නැඟ බෝමැඩට තොත වු රු

323 සත්පවුරු, සප්තප්‍රාකාරයන්හිද; සත්දෙර, සප්තවාසලයන්හිද; සිටි, ස්ථිතවූ; එ කාවුරු, ඒ කාතර පුද්ගලයක්හු නමුදු; තොම තබා, ප්‍රතික්ෂෙප නොකොටම; ගෙන, ග්‍රහණය කොට ගෙන; රන්පා, රත්නප්‍රාසාදය තෙමෙ; නුබවිවුරු, ආකාශකුහරයට; නැඟ, උල්ලඞ්ඝනය කොට; තොතවුරු, තා වරය නොව; බෝමැඩට, බොධිමණ්ඩලයට; යාය, ප්‍රයාණය කරන්නේය......

324 සිරිමත් රදැති ස ර
රුලක් සිරි ගෙන යන ස ර
පැන නැඟනුබ අ ස ර
යති සැම පිය පැවිදිවනු ස ර

324 පැවිදි සර වනු, සාරවූ ප්‍රව්‍රජිත භාවයට පැමිණීම පිණිස; සැම පිය, ප්‍රියවූ සැම දෙනාම; සර, පියුම් තඩාගය කට; යන, ප්‍රයාණය කරන; සිරිමත්, ශ්‍රීමත්වූ; රදතිසර රුලක්,

හංසරාජ සමූහයක්හුගේ; සිරිගෙන, ශොභාග්‍රහණය කරමින්; නුබඅසර, නභොවාරයට; පැන නැග, උල්ලඞ්ඝනය කොට; යති, ප්‍රයාණය කරන්නාහුය.—

325 සුදම්සබ අ ක් ම න්
කළ පාහි ගත් අ ක් ම න්
වර මහබිනි ක් ම න්
කරන සඳ හිමි නොවීදු ක් ම න්

325 සුදම්සබ අක්මන්! කළ, සුධර්මා නම් දිව්‍යසභාව ආක්‍රමණය කළ; අක් මන් ගත්, නෙත්සිත් ග්‍රහණය කළ; පාහි, රන්පා තුළෙහි; හිමි, ඒ මහාබොධිසත්වස්වාමීන්ද්‍ර යාණන්වහන්සේ; නොවී දුක්මන්, මනොදුඃඛයක් නොමැතිව; වර, උතුම්වූ; මහබිනික්මන් කරනසඳ, මහාභිනිෂ්ක්‍රමණය කරන කල්හි හෙවත් වැඩමකරන කල්හි-(මතුකව් දෙක හා සම්බන්ධයි.)

326 සුර අසුර බඹ සෙ න්
කර තුති පසතුරු ගො සෙ න්
දද සේසත් රැ සෙ න්
ඔසව ඔසවා අනෙක විල සෙ න්

326 සුර අසුර බඹසෙන්, දෛත්‍ය දෙව බ්‍රහ්ම සෛන්‍යයෝ; පසතුරු ගොසෙන්, පචතූර්‍ය්‍යනාදයෙන්; තුතිකර, සතුති කරමින්; අනෙකවිලසෙන්, අනෙකප්‍රකාරයෙන්; දද සේසත් රැසෙන්, ධවජ සෙවතච්ඡත්‍ර සමූහය; ඔසව ඔසවා, උද්ගත කොට ,කොට—

327 දිවුසුවඳ දර මි න
දිව මල් පහන් පුද මි න
මඟුල්වෙස් පා මි න
කරත් බුහුමන් දෙපද වදි මි න

327 දිවසුවඳ, දිව්‍යසුගන්ධයන්; දරමින, ධාරණය කරමින්; දිවමල්පහන්, දිව්‍යමයපුෂ්පයන් සහ ප්‍රදීපයන්ද; පුදමින, පූජනය කොටකොට;මඟුල්වෙස්,මඞ්ගලවෙෂයන්;පාමින, දක්වමින්; දෙපද, (මහාබොධිසත්වයන්ගේ) පාදවන්දය; වදිමින, නමස්කාර කරමින්; බුහුමන්, බහුමාන; කරත්, කරන්නාහුය.—

328 රිවි තරිඳුන් ස ගහ ස
පෑ විලසිනලුකර හ ස
වඩිත් සුර සුව හ ස
වඩා මහබෝසතුට සෙනෙ හ ස

328 රිවිතරිඳුන්, චන්ද්‍රසූර්‍ය්‍යයන්; සගස, සහස්‍රයක්; පෑ විලසින්, නැංගාසේ; අහස, ආකාශය; අලුකර, ආලෝක කොට; මහබෝසතුට, මහාබෝධිසත්වයන්ට; සෙනෙහස වඩා, සෙනහාධ්‍යාශය වර්ධනය කොට; සුර සුවහස, ශතසහස්‍රසඞ්ඛ්‍යාත දෙවියෝ; වඩිත්, ගමන්සලසත් (ගමනාරම්භ කෙරෙත්)—

329 සක් සහත් මෙහෙ සු රු
සඳකුමර වෙනු ගණි සු රු
සිව්වරම් දෙවි සු රු
වඩිත් සමගින් එහිමි ලොවි සු රු

329 සක්, ශක්‍රය; සහත්, මහාබ්‍රහ්මය; මෙහෙසුරු, මහෙශ්වරය; සඳකුමර, සකන්දය; වෙනු, විෂ්ණුය; ගණිසුරු, ගණෙශ්වරය; සිව්වරම් දෙවිසුරු, සතරවරම් දිව්‍යරාජයෝය (යන මේ දිව්‍යසමූහයා); ලොවිසුරු, ලොකෙශ්වරවූ; එහිමිසමගින්, ඒ මෛත්‍රෙය බොධිසත්වස්වාමීන්ද්‍රයාණන්හා සමඟ; වඩිත්, වැඩම කරන්නාහුය—

330 සකල තුරු දෙ වි යෝ
ගිරි කුළෙහි රැඳි දෙ වි යෝ
සදෙව් ලොව දෙ වි යෝ
සමඟ පිරිවර එකි දෙ වි යෝ

330 සකල, සියලුම; තුරු දෙවියෝ, වෘක්ෂාධිගෘහිත දෙවතාවෝද; ගිරිකුළෙහි, පර්‍වතකූටයන්හි; රැඳි, රජීතවූ; දෙවියෝ, දෙවතාවෝද; සදෙව් ලොව, ෂඩ්විධ දිව්‍යලොකයෙහි; දෙවියෝ, දෙවතාවෝද; එකිදෙවියෝ, ඒදෙවියන්ගේ; පිරිවර සමඟ, පරිෂත් සමූහව—(මතුකව් දෙක හා කුලකයි.)

331 පෙර දෙසින් අ ප ම ණ
දකුණතින් තව එ ප ම ණ
වම් පසද නො ප ම ණ
පසුද සුරකිය නොගැකි කො ප ම ණ

331 පෙර දෙසින්, (මහාබොධිසත්වයන්ගේ) පූර්‍වදිශාභාගයෙන්; අපමණ, (දෙවතයන්ගේසඞ්ඛ්‍යාව) ප්‍රමාණාතික්‍රාන්තය, තව, අන්‍යවූත්; දකුණතින්, දක්ෂිණපාර්ශ්වයෙන්ද; එපමණ,

ඒ ප්‍රමාණය හෙවත් ප්‍රමාණාතික්‍රාන්තය; වම්පසද, වාම්පාර්ශ්ව යෙන්ද; නොපමණ, ප්‍රමාණාතික්‍රාන්තය; පසුද, පශ්වාත් භාග යෙහිද; සුර, දෛවතයන්ගේ (සඞ්ඛ්‍යාව); නොපමණ, කශචිත් ප්‍රමාණද්‍යසි; කිය නොහැකි, කථනය කළ නොහැක්කේය—

332 එසුර සහ හිර　　ස ද
අරක් ගෙන අපහිමි　　ස ද
මුළුලෝ මඬල　　ස ද
විලස අලුකර යති එම　　ස ද

332 හිරසඳ සහ, චන්‍ද්‍රසූර්‍ය්‍යයී දෙදෙනා ඇතුළු; එසුර, ඒ පූජෝංකත දිව්‍ය සමූහයෝ; අප, අසමත්හුගේ; හිමිසඳ, ස්වාමීන්ද්‍ර (මහාබොධිසත්ව) යාණන්වහන්සේ; අරක්ගෙන, ආරක්‍ෂාග්‍රහණය කොට; මුළුලෝ, සමස්තලොකය; සඳමඬල විලස, චන්ද්‍ර මඬල ශ්‍රියෙන්; අලුකර, ආලොක කොට; එමසඳ, ඒදිනයෙහි; යති, ප්‍රයාණයකරන්නාහුය—

333 විලසින්ම විදු　　ලි ය
යන තුමා දකා සුර　　ලි ය
ඉඳ නිලඹර ලො　　ලි ය
කරත් ගී රඟ නෙරඟ නොමි　　ලි ය

333 විදුලිය විලසින්ම, විද්‍යුත් ආකාරයෙන්ම; යන, ප්‍රයාණය කරන; තුමා, ඒමෙමනෙත්‍රයබොධිසත්වයන්වහන්සේ; සුරලිය, සුරාඞ්ගනාවෝ; දකා, අවලොකනය කොට; නිලඹර, නිලාම්බරයෙහි, ඉඳ, උපවිෂ්ටවැ; නොමිලිය, ම්ලානිකනොවැ; ලොලිය, ලෞල්‍යයෙන්; නෙරඟ, අනෙකාකාර; ගීරඟ, නෘත්‍ය ගීත; කරත්, කරන්නාහුය—

334 අමර ගඟ ඔ　　ස් සේ
එහිමි දිලි හිමරු　　ස් සේ
චතුලෙස පසැ　　ස් සේ
වඩින සඳ මිහි ඇතිදෙප　　ස් සේ

334 හිමරුස්සේ, චන්ද්‍රයාමෙන්; දිලි, භ්‍රාජිතවූ; එහිමි, ඒ ස්වාමීන්ද්‍ර තෙමේ; සේ, දක්‍ෂවූ; පසැ:ස්වතුලෙස, සම්‍යක්සම්බුඞ්ඞීම පිණිස; අමරගඟඔස්සේ, ආකාශනදියගේ කූලමාර්ගයෙහි; වඩිනසඳ, ප්‍රයාණය කරන කල්හි; දෙපස්සේ, උභයපාර්ශ්වයෙහි; මිහි, ධරණීතලයෙහි;ඇති,විද්‍යමානවූ–(මතුකාව්‍යවයහාසම්බන්ධයි)

335 සියපත් යුරු වූ වන්
තිලුපුල් සදිසි දෙනු වන්
තාලිය වන් ල වන්
දසන් කොඳ අත් සපුකුසුම වන්

335 සියපත් යුරු, සුපිෂපිත පද්ම සදෘශවූ; වූවන්, වක්‍ත්‍ර ඇති; තිලුපුල් සදිසි, නීලොත්පල සදෘශවූ; දෙනුවන්, විනෙත්‍ර ඇති; තාලියවන්, තාංගපල්ලව සදෘශවූ; ලවන්, අධර ඇති; කොඳ, කුන්දකුඩ්මල සදෘශවූ; දසන්, දන්තයන් ඇති; සපුකුසුම වන්, චම්පකපුෂප (මාලාවන්) සදෘශවූ; අත්, හස්තවය ඇති—

336 පුත් තන පල නි මල්
බරණ මුතුහර නිසා මල්
වතලිය ලියසා මල්
බලාතුටු වෙති එහිමි සුවි මල්

336 නිමල්පල, නිර්මලවූ ඵල තමැති; පුන්තන, පීන පයොධර ඇති; නිකමල්, නිර්ගුණ්ඩිපුෂප තමැති; මුතුහර බරණ, මුක්තාහාර ආභරණයෙන් යුක්තවූ; කමල්ලිය, ශ්‍රීකාන්තාවහා සදෘශවූ; වතලිය, වනස්ත්‍රීහු; සුවිමල්, අතිනිර්මලවූ; එහිමි, ඒ ස්වාමීන්ද්‍රයාණන්; බලා, අවලොකනයකොට; තුටුවෙති, සන්තුෂ්ට වන්නාහුය.

337 රළගිරා මොනො රුන්
සහ මියුරුහඬ කිනු රුන්
බලා හිමිකුම රුන්
රහත් ගීනද රහටබම රුන්

337 මියුරුහඬ, මධුරස්වර ඇති; කිනුරුන් සහ, කින්නරාඞ්ගනාවන් හා; ගිරා මොනොරුන් රළ, කිර මයූර පක්ෂි සමූහයෝ; හිමි කුමරුන්, ස්වාමීන්ද්‍ර කුමාරයන්; බලා, නිරීක්ෂණය කරමින්; බමරුන්, භ්‍රමරයන්ගේ; ගීනද රහට, ගීතනාද වෘත්තයට; රහත්, නෘත්‍යකරන්නාහුය.

338 තුරු අග රිකි ල් ලන්
සමගින් පියඹ ගො ල් ලන්
මගසතුට ලො ල් ලන්
කොරෙත් පිසරුවිගණකොවුල් ලන්

338 සමගින්, පියඹගොල්ලන්, ප්‍රියාඞ්ගා ගණයන් හා එක්ව; තුරු අග, වෘක්‍ෂයන්ගේ මස්තකයෙහි; රිකිල්ලන්, ශාඛාග්‍රයෙහි (සඤ්චරිතවූ); ගණ කොවුල්ලන්, (මත්ත) කෝකිලයන් සම්බන්ධවූ සමූහයෝ; මහසතුට, මහාබොධිසත්ත්වයන්ට; ලොල්ලන්, ලෞල්‍යයෙන්; පියරුව්, ප්‍රියරාවය; කෙරෙත්, කරන්නාහුය.

339 නෙපියුම් විලලැ  ගි ය
බමරකැන් ඉන් උලැ  ගි ය
කරත පියරා  ගි ය
සවන කළ හදවේය සම  ගි ය

339 නෙපියුම් විල, අනෙක පදම තඩාගයන්හි; ලැගිය, ලගනවූ; බමරකැන්, භ්‍රමරසමූහයෝ; ඉන්, ඒ තඩාගයන් කෙරෙන්; උලැගිය, උල්ලඞ්ඝිතව; කරත, ක්‍රියමාණවූ; පියරා, ප්‍රියඞ්කරවූ; රාගිය, රාගාන්විත ගීතය; සවන කළ, ශ්‍රවණය කළවුන්ගේ; හද, හෘදය; සමගිය වේය, සාමාග්‍රිවන්නේය.

340 එමඟ වනදිගැ  සි ය
පවන් සලනට හිමි  සි ය
වැලුක්මල් විල  සි ය
සෙමරගෙන සිටි වැන්නසැර  සි ය

340 එමඟ, ඒමාර්ගයට අයත්; වන, අරණ්‍ය නමැති; දිගැසිය, දීර්ඝාක්‍ෂිහොමෝ; වැලුක්මල් විලසිය, ඒකාශපුෂ්ප නමැති; සෙමෙර, චාමරය; ගෙන, ග්‍රහණයකොට; සියහිමි, සවකීය වල්ලභයාහට; පවන්සලනට, පවන්සඳහා චාමරසැලීමපිණිස; සැරසිය සිටි වැන්න, සැරසී සිටින්නාක් වැනිවේ.

341 වනවිල් කල්කා  ම ල්
ගැවසී නත හස සුනි  ම ල්
ඔසවා වත්සා  ම ල්
වැන්න බලනා හිමිහු නැබ  ම ල්

3ı1 වන, ඒඅරණ්‍ය යෙහි; විල්, තඩාග නමැති; කමල්කල්. ශ්‍රීකාන්තාතොමෝ; සුනිමල්, අති නිර්මලවූ; හස, හිසර නමැති; නත, පියයුරන්ගෙන්; ගැවසී, යුක්තව; කමල්, පියුම් නමැති; වත්, වස්ත්‍රය; ඔසවා, උද්ගත කොට; හිමිහු, (සවකීය) ස්වාමිපුරුෂවූ; මල්නැබ, විෂ්ණුහු; බලනා වැන්න, අවලෝකනය කරන්නියක් වැනිවේ.

342 බුදුවන්ට ආ ලය
මහසතුට සුරලෝ ලය
නිලඹර විසා ලය
මලින් සරසනි මලෙන් මා ලය

342 බුදුවන්ට, සර්‍වඥපදප්‍රාප්තවීමට; ආලය, ලොභීවූ; මහ සතුට, මහා ප්‍රබොධිසත්‍වයන්ට; ලෝලය, ලොලය කරන්නාවූ; සුර, දෙවියෝ; විසාලය, මහත්වූ; නිලඹර, නීලාඹරය; මලෙන් මාලය, මාලකයෙන් මාලකය; මලින්, කුසුමයෙන්; සරසනි, අලඞ්කෘත කරන්නාහුය.—

343 එ ව න් සුරසම ගි න්
ගු ව න් තල දුළ වෙම ගි න්
ස ව න් වි නිස ගි න්
නි ව න් දෙන හිමි වඩී මෙර ගි න්

343 එවන්, පූජෝංකතවූ; සුර, දෙවියන්; සමගින්, සමග්‍රව; දුළ, භ්‍රාජිතවූ; ගුවන්තල, ආකාශයෙහි; වෙමගින්, වීථිමාගී යෙන්; නිසගින්, සවභාවයෙන්; සවග්වි, සර්‍වඥව; නිවන්, නිර්‍වාණශ්‍රිය; දෙන, ප්‍රදනය කරන්නාවූ; හිමි, අප සවාමීඥ තෙමේ; මෙරගින්, මෙපරිද්දෙන්; වඩී, වැඩම කරනසේක.—

344 එරන්පා අ ත ර ව
වැඩමකර සිරි ප ත ර ව
සතට සෙත ස ත ර ව
දෙන්ට හිමි සුරමගින් එ ත ර ව

344 සතරව, ශාස්තෘව හෙවත් සම්‍යක් සම්බුඩව; සතට, සත්‍වයාහට; සෙත, (මොක්‍ෂ) ශාන්තිය; දෙන්ට, ප්‍රදනය කිරීම පිණිස; හිමි, ඒ සවාමීඥතෙමේ; එරන්පා අතරව, ඒ රත්න ප්‍රාසාදභ්‍යන්තරයෙහි; සිරි පතරව, පතළාවූ ශ්‍රියෙන්; එතරව, තත්ක්‍ෂණයෙහි; සුරමගින්, ආකාශයෙන්; වැඩමකර, ප්‍රයාණය කොට;—(මතුකව හා සම්බන්ධයි.)

345 මිඳ හස මුවත ඹ ර
සාමල්දෙවි ඇඳි රත ඹ ර
රුඳි සපාසිනෑ ඹ ර
බසී බෝමැඩ දෙසට පෑහැ බ ර

345 රතඹර, සුවර්ණවස්ත්‍රයන්; ඇඳි, ආච්ඡාදිතව; මුවනඹර, පද්මාකාර මුඛයෙන්; මිඳගස, මිඤ මඤ හාස්‍යයෙන් යුක්තවූ; කමල්දෙවි, ශ්‍රීකාන්තාව; රැඳී, රජිතවූ; සපා, ප්‍රාසාදය සහිතව; ආසින්, ආකාශයෙන්; ඇඹර, ආවෘතතව; පැහැබර, ප්‍රභා භරිතවූ; බෝමැඩ දෙසට, බොධිමණ්ඩල දිශාවට; බසී, අවතීර්ණ වන්නේය.—

346 එසඳ සුර ස ක් සේ
බෝසත් රත ගිර ක් සේ
තම අතින් ද ක් සේ
ගෙන මඟුල් කඩු රන්පත ක් සේ

346 රතගිරක්සේ, සුවර්ණ පර්වතරාජයා සදෘශවූ; බෝසත්, බොධි සත්ව තෙමේ; එසඳ, එකාලෙහි; සක්සුරසේ, ශක්‍රදෙවෙන්ද්‍ර ලීලායෙන්; තමඅතින් දක්සේ, ස්වකීයදක්ෂිණ හස්තයෙන්; රන් පතක්සේ, සුවර්ණ පත්‍රයක්වැනි; මඟුල් කඩු, මඞ්ගල ඛඩ්ගය; ගෙන, ග්‍රහණය කොට—(මතුකව ගා සම්බන්ධයි.)

347 ඉඳුනිල් පැහැ වි ල ස
පැරයු සිරිලොල් වර ල ස
කපා හිමි තො ව ල ස
දමයි නුබ රඳනටම සුවි ල ස

347 පැහැවිලස, ප්‍රභාසම්පන්නභාවයෙන්; ඉඳුනිල්, ඉන්ද්‍රනීල මාණික්‍යය; පැරයු, පරාජය කළාවූ; සිරි, ශ්‍රීදෙවින්; ලොල්, ලොලත්‍වය කරන්නාවූ; වරලස, කෙශකලාපය; තොවලස, ශෛඝ්‍රයෙන්; හිමි, ස්වාමීන්ද්‍ර තෙමේ; කපා, ඡෙදනය කොට; සුවිලස, මනාකාරයෙන්; නුබ, ආකාශයෙහි; රඳනටම, නිවෘත්ත වීම පිණිස; දමයි, ප්‍රක්ෂෙප කරන්නේය.—

348 එසේ කළැයි ල් ලේ
මහබඹු වඩාලො ල් ලේ
ඉඳුසැරය දු ල් ලේ
පමින් ගොස් බඹලොවට එ ල් ලේ

348 එසේ, තාදෘශාකාරයෙන්; කළ ඇසිල්ලේ, කෘතක්ෂණයෙහි; මහබඹු, මහාබ්‍රහ්ම තෙමේ; ලොල්ලේ වඩා, ලොලත්‍වය වර්ධනය කරමින්; දුල්ලේ, උජ්වලිතවූ; ඉදු සැරය, සෘඩිමත් වෙගය; පාමින්, පල කොට; එල්ලේ, ඍජුව; බඹලොවට, බ්‍රහ්මලොකයට; ගොස්, ගමනය කරමින්—(මතුකව් දෙක හා කුලකයි.)

349 කප මුල මහබ දු රු
තිසා එ මෙතේමොකැ දු රු
පහළව ඇති සො දු රු
එතෙක් බඹලොව රකින ලොවැදු රු

349 මහබදුරු කප, මේ මහා භද්‍රකල්පය; මුල, ආරම්භයෙහි; එ මෙතේමොකැදුරු, ඒ මෛත්‍රෙය මොක්ෂාචාර්‍ය්‍යයාණන්වහන්සේ හෙවත් බුදුරජාණන්; තිසා, උදෙසා; පහළව, ප්‍රාදුර්භූතව; සොදුරු, සුන්දරවූ; බඹලොව, බ්‍රහ්ම ලොකයෙහි; ඇති, විද්‍යමාන වන්නාවූ; එතෙක්, ඒතාවත් කාලය දුරු හෙවත් මෛත්‍රෙය බුද්ධොත්පාදකාලය වනතුරු; ලොවැදුරු, මහාබ්‍රහ්මයා විසින්; රකින, ආරක්‍ෂා කරන්නාවූ—

350 අටපිරිකර ව ර ය
ගෙන හිස බඹ උදු ර ය
අපමුනි පිදු යු ර ය
සැණෙන් වුන් හිමි පුදයි එව ර ය

350 වරය, උතුම්වූ; අටපිරිකර, අෂ්ටපරිෂ්කාරය; උදුරය, මහත්වූ; බඹහිස, බ්‍රහ්මයාගේශීර්ෂයෙන්; ගෙන, ග්‍රහණය කොට; සැණෙන්, ක්‍ෂණයෙන්; වුන්, අවුදින්; අපමුනි, ගෞතම සර්‍වඥයන්වහන්සේට; පිදුයුරය, පූජිතපරිදි; එවරය, ඒ වේලාවෙහි; හිමි, ස්වාමීන්ද්‍රයාණන්ට; පුදයි, පූජනය කරන්නේය—

351 පිළිගෙන එපිරි කා ර
දරමින් සියගත ල කා ර
මහණවෙස් අත් කා ර
දිලෙයි යසරැස් තෙද සහස් කා ර

351 එපිරිකර, ඒ (අෂ්ට) පරිෂ්කාරය; පිළිගෙන, ප්‍රතිග්‍රහණය කොට; ලකර, අලඞ්කෘතවූ; සියගත, ස්වකීය සිරුරෙහි; දරමින්, ධාරණය කොට ගෙන; මහණ වෙස්, ශ්‍රමණ වෙෂය; අත්කර, හස්තප්‍රාප්ත කොටගැනීමහෙතුකොටගෙන; සහස්කර, සහස්‍රකිරණයා බඳු; යසරැස් තෙද, යශොරාශි තෙජඃකදම්බයෙන්; දිලෙයි, භ්‍රාජමාන වන්නේය—

352 සිව්වේදෙහි නි ස ක්
තෙරපත් බමුණු පිරි ස ක්
සුවාසූදහ ස ක්
පැවිදිවෙත් එවිගසම තොල ස ක්

352 තිසක්, සඞ්කාරහිතව; සිව්වේදෙහි, චතුර්වේදයෙහි; තෙරපත්, පරතීරප්‍රාප්තවූ; බමුණු, ඒ බ්‍රාහ්මණයෝ; සුවාසූ දහසක්, චතුරශීතිසහස්‍ර ප්‍රමාණවූ; බමුණු පිරිසක්, බ්‍රාහ්මණසමූහයක්; එවිගසම, තත්ක්ෂණයෙහිම; නොලසක්, අනලසවූ; පැවිදි වෙයි, ප්‍රව්‍රජිත වන්නේය.

353 මහමායා    තෙනෝ
බුදුවූ දවස් එ    තෙනෝ
පින්කර පැව    තෙනෝ
පැවිදිවත දනඳුනව් මෙ    තෙනෝ

353 මහමායාතෙනෝ, මහාමායාදේවියගේ පුත්‍ර සිද්ධාර්ථ කුමාරෝත්තමයා; බුදුවූ දවස්, සම්බුද්ධපදප්‍රාප්ති කාලයෙහි; එතෙනෝ, ඒ ශාසනයෙහිදී; පින්කර, පුණ්‍යසචය කොට; පැවතෙනෝ, ප්‍රවෘත්තවූවන; මෙතෙනෝ, මේ (මෛත්‍රෙයබුද්ධ) ශාසනයෙහිදී; පැවිදිවන, ප්‍රව්‍රජිතවන්නාවූ; දන, ජනයන් (සාවරහුදකියා); අඳුනව්, සඥානනය කරව්.

354 පුරණ ඉසිද    ත් ත ය
පැවිදිවෙති දෙබෑ ස    ත් ත ය
පිරිසක් රැග    ත් ත ය
එලක්අටසැටදහස් යු    ත් ත ය

354 පුරණ ඉසිදත්තය, පුරාණය සහ ඉසිදත්තය යනනම් ඇති; දෙබෑ, සහෝදරයෝ දෙදෙනෙක්; එලක්අටසැටදහස් යුත්තය, ඒ එක්ලක්ෂඅෂ්ටෂෂ්ටිසහස්‍ර පරිමිතවූ; පිරිසක්, පර්ෂද්; රැගත්තය, පමුණුවා ගෙන; සත්තය, ඒකාන්තයෙන්; පැවිදි වෙති, ප්‍රව්‍රජිත වන්නාහුය.

355 ජිතමිත අජිත    මි ත
පැවිදි වෙති පඬි එදෙ    මි ත
සමගින් ගුණ අ    මි ත
එලක්අටසැටදහස් තම    මි ත

355 ජිතමිත අජිතමිත, ජිතමිත්‍රය සහ අජිතමිත්‍රය යන නම් ඇති; එමිත, ඒ අන්‍යොන්‍ය මිත්‍රවූ; දෙපඬි, පණ්ඩිතයෝ දෙදෙනෙක්; අමිතගුණ, අප්‍රමෙයගුණඇති; තමමිත, ස්වකීය මිත්‍රයන්; එලක්අටසැටදහස්, ඒ එක්ලක්ෂඅෂ්ටෂෂ්ටි සහස්‍රයක්; සමගින්, එක්වම; පැවිදි වෙති, ප්‍රව්‍රජිත වන්නාහුය.

356 සුනන්ද සිටු දූ ව
සිදුහත් සිටුද පසි දූ ව
පැවිදි වෙති සබ දූ ව
එලක්අටසැටදහස් සබ දූ ව

356 සුනන්ද, සුනන්‍දය යන නම් ඇති; සිටුදූව, ශ්‍රෙෂ්ඨි දුහිතෘද; සිදුහත්, සිද්ධාර්ථ යන නම් ඇති; සිටුද, ශ්‍රෙෂ්ඨි තෙමේද; එලක්අටසැටදහස්, ඒ එක්ලක්‍ෂඅෂ්ටෂෂ්ටිසහස්‍රපරිමිත; සබඳුව, මිත්‍රයන්; සබඳුව, සම්බන්ධ කොට ගෙන හෙවත් පමුණුවාගෙන; පසිදුව, ප්‍රසිද්ධවශයෙන්; පැවිදි වෙති, ප්‍රව්‍රජිත වන්නාහුය.

357 මහණ වෙති යස ව ති
සහ විසාකා සුපැ ව ති
ඉතිරි සහ නැණ ව ති
එලක්අටසැටදහස් සිල් ව ති

357 එලක්අටසැටදහස්, ඒඑක්ලක්‍ෂඅෂ්ටෂෂ්ටි සහස්‍රපරිමිත; නැණවති, ඥානවත්තවූ; සිල්වති, ශීලවත්තවූ; ඉතිරිසහ, සත්‍රීන් සමග්‍රව; සුපැවති, මොනවට ප්‍රවෘත්තිතවූ; යසවති සහ විසාකා, යසවති විශාඛා දෙදෙන; මහණ වෙති, ප්‍රව්‍රජිත වන්නාහුය.

358 රජ බමුණු වෙළ දූ න්
කුල කෙළගණන් පසි දූ න්
පැවිදිවෙති ලොමු දූ න්
මල්කඩෙක වෙත් මෙතේහිමි දූ න්

358 කෙළ ගණන්, කොටි සඞ්ඛ්‍යාවෙන්; රජ බමුණු වෙළ දූන්, රාජ බ්‍රාහ්මණ වණිග් ජනය යන; කුල, වංශොත්භූත; පසිදූන්, ප්‍රසිද්ධවූවෝ; එකලොම්දූන් මල්කඩ, ලොකයෙහි අසහාය අවතංශකවූ; මෙතේහිමිදූන් වෙත්, ඒ මෛත්‍රෙය ස්වාමීන්දයාණන් වෙත්හි; පැවිදි වෙති, ප්‍රව්‍රජිත වන්නාහුය.

359 යළි වරණ ම ර සී
මහණ සිරිගත් සැ ර සී
දිනිසුරු දිනු ර සී
දිලී ඔහු එමවරෙහි ව ර සී

359 යළි, ඉක්බිතිව; සැරසී, සජ්ජිතව; මහණ සිරිගත්, ශ්‍රමණවෙශයධාරාගත්; මරවරණ, මාරනමැති හස්තීන්ට; සී, කෙශරීන්‍ද්‍රායමාණවූ; දිනුසුරු, හිරුගු; දිනුරසී, ජයගත් රශ්මි යෙන්;ඔහු, ඒ මෙත්‍රේබෝසතුන්වහන්සේ; වරසී, පූජ්‍යශ්‍රෙෂ්ඨවූ; එම වරෙහි, තත්සමයෙහි; දිලී, භ්‍රාජිතව:—(මෙතැන් පටන් අටකවකින් කුලකයි.)

360 පහරින් ගජහ සු න්
විසුරුණු මැණික් වන් සු න්
වැල්ලෙන් පැහැ ක සු න්
ගඟක් දුක පිරිවැරූ සෙහ සු න්

360 ගජහසුන්, හස්ත්‍යශවයන්ගේ; පහරින්, ප්‍රහාරදනය කිරීම කාරණ කොට ගෙන; සුන්, ඡින්නව; විසුරුණු මැණික් වන්, විශීර්ණවූ මාණික්‍යයන්ගේ වර්ණයෙන්; කසුන් පැහැ, කාංචන පැහයෙන් යුක්තවූ; වැල්ලෙන්, වාලුකා ඇත්තාවූ; සෙහසුන්, සෙවතහංසරාජයන් විසින්; පිරිවැරූ, පරිවෘතවූ; ගඟක්, ගංගාවක්; දුක, (ඒස්වාමීන්ද්‍රයොමෙ) අවලොකනය කොට

361 වැඩසිට තුළ එ ස ඳ
පියුම්පිට නැගූ මිහි ස ඳ
හිවිගුණ සපිරි ස ඳ
එදියනා දියනා ගොඩවූ ස ඳ

361 මිහිසඳ, මහිකාන්තාව විසින්; එසඳ තුල, ඒගඞ්ගාභ්‍යන්තරයෙහි; නැගූ, (තත්ක්‍ෂණයෙහි) උද්ගත කළ; පියුම් පිට, පද්ම මස්තකයෙහි; වැඩසිට, ස්ථිතිය කොට; හිවිගුණ, උච්චවූ ගුණයෙන්; සපිරි, සම්පූර්ණවූ; සඳ, චිත්‍රායක් ඇති; එදියනා, ඒ ජගද්ගුරුයා; දියනා, ජලස්නානය කොට; ගොඩවූ සඳ, ස්ථලභූමියට වන්කල්හි—

362 සඳ සිරි මුව . සි රි
සෙයින් අබිඳන් අ සි රි
සඳමුව බිසො සි රි
පැතූ කප්ලක් පෙරුම් ස සි රි

362 මුවසිරි, මුඛශ්‍රිය; සඳසිරි සෙයින්, චන්ද්‍රශොභාකාර හෙයින්; අසිරි, ආශ්චර්‍ය්‍යවූ; සිරි, ශ්‍රිමත්වූ; සඳමුව අබිඳන් බිසෝ, චන්ද්‍රමුඛීනාමධෙය අග්‍රමහෙසිකා තොමෝ; කප්ලක්, කල්පලක්‍ෂයක්; පැතූ, ප්‍රාර්ථනා කළාවූ; පෙරුම්, පාරමිතා වන්හෙන්; සසිරි, සමෘඬවූ—

363 ගුණ මිණි හද න | ද න
බැබළි මොනවට සුස | ද න
සුරනුමතින් යො | ද න
සකල දිවබද රසින් පසි | ද න

363 ගුණ මිණි, ගුණ නමැති මාණික්‍යයන්ට; හද නදන, හෘදය නමැති නිධානයෙන්; බැබළි, භ්‍රාජිතවූ; මොනවට, මනාකොට; සුසදන, සුසජ්ජිත කරන්නාවූ; සුරඅනුමතින්, (සකල) දෙවියන්ගේ එකඟවීමෙන්; යොදන, යොජිත කරන්නාවූ; සකල දිවබදරසින්, සියලු දිව්‍ය භොජන රසයෙන්; පසිදන, ප්‍රසිද්ධවන්නාවූ—

364 කිරිපිඬු නෙසුව | දි න්
පුදන එබිසෝ ඔක | දි න්
මහසත් තුම සො | දි න්
වළඳමින එමතැනින් අවු | දි න්

364 ඔකදින්, මහත් ප්‍රීතියෙන්; එබිසෝ, ඒ මහිෂිය විසින්; පුදන, පූජනය කරන්නාවූ; නෙසුවදින්, අනෙක සුගන්ධයෙන් යුත්; කිරිපිඬු, ක්ෂීරපායාසය; මහසත්තුම, මහා බොධිසත්ව තෙමෙ; සොදින්, සුන්දරාකාරයෙන්; වළඳ මින, අනුභව කොට; එම තැනින්, ඒ ස්ථානයෙන්; අවු දින්, ආගමනය කොට—

365 ලොබ හැර ගිහි ගෙ | ව ල්
නිවට දෙව්ගත් රැක | ව ල්
වනලැහැබක ද | ව ල්
විහරණය කොට නික්ම එම | ව ල්

365 ගිහිගෙවල්, ගෘහස්ථාශ්‍රමයන්හි; ලොබ හැර, ආලය වර්ජිත කොට; නිවට දෙව්, බ්‍රහ්මාමරයන් විසින්; රැකවල් ගත්, ආරක්ෂා කරගත්; වනලැහබක, අරණ්‍යයක; දවල් විහ රණය කොට, දිවා විහාරය කොට; එමවල්, ඒ අරණ්‍යයෙන්; නික්ම, නිෂ්ක්‍රාන්තවූ—

366 සවස් කල එ | දි නා
නොපැරදි තැනයි හැ | ඳි නා
නා බෝමුල | දි නා
වඩී දුනුමට සවනෙ සො | ඳි නා

366 එදිනා, නත්දිනයෙහි; සවස් කල, සායං කාලයෙහි; නොපැරදි තැනයි, අපරාජිත ස්ථානයයි; හැදිනා, සජ්ජනය කොට; නා බෝමුල, නාගශ්‍රීබොධිද්‍රැමූලයෙහි; දිනා, සම්මාර පරාජය කොට; සව්නෙ, සකලඥෙය මණ්ඩලය; සොදිනා, සුන්‍දරාකාරයෙන්; දැනුමට, අවබොධ කිරිම පිණිස; වඩි, (ඒබොධිද්‍රැමූලයට) වැඩ වදාරනසේක......

367

පිරිකරුණා අද හද න ඳ නා පිටදෙනදියනා මෙනෙබෝදියනා
සිරිපු ර ණා වට රිදි සෙමනා කඳ උසගණනා සිය විසි රි යනා
පිරිව ර ණා අතුපසලෙළෙනා මඳ මඳ පවනා සිය විසි රි යනා
සිරිතර ණා ඒ මුලසිට නා අගසැට බඹිනා පිනවසි න යනා

367 පිරි කරුණා, පරිපූර්ණ කාරුණ්‍යයෙන්; අද, ආර්ද්‍රවූ; හද, හෘදයක් ඇත්තාවූ; නඳනා, මනො නන්‍දනවූ; මෙනෙ දියනා, මෛත්‍රෙය නාථයන්වහන්සේට--නොහොත්: මෙ නෙදියනා, මේ ත්‍රෛලොක්‍යාධිපතීන්වහන්සේට; පිට දෙන, පෘෂ්ඨදානය කිරිම පිණිස (ප්‍රාදුර්භූත වන්නාවූ); නාබෝදිය, ඒ නාගශ්‍රීබොධිවෘක්ෂ රාජයාගේ; සිරි පුරණා, පරිපූර්ණ ශ්‍රියෙන් යුක්තවූ; වට රිදිසෙ මනා කඳ, වෘත්තවූ රජතමය කඳක් සේ මනොඥවූ ස්කන්ධයෙහි; උස ගණනා, ප්‍රාංශුත්වයෙහි සඞ්ඛ්‍යා ප්‍රමාණය; සිය විසිරියනා, විංශතිශතරත්නයක් වේ; පිරිවරණා, (ඒ වෘක්ෂරාජයා) පරිවෘතකොට ඇති; මඳමඳ පවනා, මන්‍ද මන්‍ද මාරුතයෙන්; ලෙළෙනා, ලීලොපෙත වන්නාවූ; අතුපස, පංච මහාශාඛාවෝ; සියවිසිරියනා, (එක් එක් ශාඛා බැගින්) විංශතිශතරත්නයක් (දිගවෙත්); මූලසිටනා, මූලයෙහි පටන්; අග, මස්තකයදක්වා; සැටබඹිනා, (ප්‍රාංශුත්වය) ෂෂ්ටි ව්‍යාමප්‍රමාණ හෙවත් දෙසියසාලිස්රියනකින් යුක්ත වන්නාවූ; සිරිතරණා, ශ්‍රී හරිතවූ; ඒ, ඒ නාගශ්‍රීබොධිද්‍රැමරාජයා; නයනා පිනවසි, නයනප්‍රීණනය කරන්නේය......

368

සු ර වර ණා සිරිගත ලෝනා තිසලැස පුද නාමුනිසැලුම්මනා
ම ර වර ණා පිරිබෝසැව නා පෙරපැළඅතු නා අගිසගර මනා
තිරස ර ණා සැටබඹදිගි නා සොමිදසුණතුනා පුරඑමස මනා
සර කි ර ණා මඩලය ව ට නා ටරහල් රිය නා වනුයේනි මනා

368 සුර වරණා, සුරවරෙණ්‍යවූ හෙවත් දෙවාති දෙවවූ; ලෝනා, (ත්‍රෛ) ලොකනාථවූ; සිරිගත මුනි, මෛත්‍රෙය සර්වඥයන්වහන්සේ විසින්; මනා, මොනවට; තිසලැස සැලුම්, නිශ්චල නෙත්‍ර කාන්තියෙන් (අනිමිසලොචන පූජායෙන්); පුදනා, පූජ

නය කරන්නාවූ; මරවරණා, (පංච) මාරමථනයකරන්නාවූ; පිරිබෝසැවනා, පාරිභොගිකචෛත්‍යවන්නාවූ; රමනා, මනොරම්‍යවූ; නිරසරණා, සත්‍වයන්හට සපිර ප්‍රතිෂ්ඨාකරවූ; පෙරපැළා පූර්ව පශ්චිම යන දිගන්තයෙහි; අතුඅගින් අග. ශාඛාග්‍රයෙන් ශාඛාග්‍රයට හෙවත් පූර්වශාඛාග්‍රයපටන් පශ්චිම ශාඛාග්‍රයට; දිගිනා, දීර්ඝත්වයෙන්; සැට බඹ, ෂෂ්ටිව්‍යාමප්‍රමාණ හෙවත් දෙසිය සාලිස්රියනක්ද; සොම්දකුණතු, උතුරු දක්ෂිණශාඛාවන් අතරත්; එම සමනා, යථොක්ත ප්‍රමාණදවන්නාවූ; සරකිරණා, සාරවූ රශ්මියෙන් බබළන්නාවූ; වටිනා, හාත්පස්හි; අටරහල් රියනා, අටළොසින් ගුණකරනලද හතලිස්රියනක් හෙවත් සත්සියවිසිරියන්වූ; මඩලය, සාඛාමණ්ඩලය ඇති; නා තුර, ඒ නාගශ්‍රී බොධිද්‍රැමය; නිමනාවනුයේ, නිර්මාණය වන්නේය.

369

දූ ල් ස මි දූ ඒ බෝ දුමි දූ සේසතක් බ දූ ඉදුමිණපැ සැදූ
පු ල් ත රි දූ සිරිගත්නොමදූ සක්නියෝල දූ විස්සම්පු සැදූ
කල් නි බ දූ වොරුඳු සුමු දූ කුරුලියහුව් දූ පත්නිල්නි සැදූ
ම ල් පු බු දූ මූලසිට විහි දූ අගනෙක්පසිදූ ඇතඑතුර සදූ

369 සක්, ශක්‍රදෙවෙන්ද්‍රයාගේ; නියෝලදූ, නියොගලද්දාවූ; විස්සම්. විශ්වකර්මදිව්‍යපුත්‍රයාවිසින්; පැස ඇඳූ, සිතියම් කොට; ඉදුමිණ ඉන්ද්‍රනීලමාණික්‍යයෙන්; සුසැදූ, සවලඞ්කෘත කරනලද; සේසතක් බඳූ, සෙවතච්ඡත්‍රයක් වැනි; දූල්, උජ්ජ්වලිතවූ; නිබඳු, නිරන්තරයෙන්; කල්, මනඃකල්‍යවූ; පුල්තරිඳු, පූර්ණචන්ද්‍රයාගේ; නොමඳුසිරි, අමන්දශ්‍රිය; ගත්, ගෘහීතවූ; ඒබෝදුමිඳු සමිඳු, ඒබොධිද්‍රැමෙන්ද්‍රස්වාමින්ද්‍රයාගේ; සුමුදූ, අතිමෘදුලවූ; වොරුඳු, විරාජිතවූ; කුරුලියහු, අංකුර සහ රිකිලි; විදූ, ප්‍රවාලමයය; පත්නිල්, පත්‍ර ඉන්ද්‍රනීලමාණික්‍යමය වන්නාහුය; පසිදූ, ප්‍රකටවූ; එතුර සඳු, ඒවෘක්ෂරාජෙන්ද්‍රයා; මූලසිට, මූලයෙහි පටන්; අගනෙක්, මස්තකය දක්වා; නිසැදූ, නිරන්තරයෙන්; පුබුදුමල්, ප්‍රබුද්ධ කුසුමයෙන්; විහිදූ, විසතීර්ණව; ඇත, ඇති වන්නේය.

370

තිලොවගුරු අප හිමි කුම රු බුදුවනමහ රු එදිනෙහි රුසිරු
එ සි වතුරු සුපිපෙහනිබොරු සක්පමණදූරු මල්රුස දි සිරු
බු දු වගරු වැඩ වසනපු රු අසුදනස්පි රු වසරක් ඇ සිරු
දි නු වමරු එම මර සපු රු සිරිපානයු රුදිලෙනොමැලිසිරු

370 තිලොව ගුරු, ත්‍රෛලෝක්‍යාචාර්‍ය්‍යවූ; අප හිමිකුමරු, අසමත් ස්වාමිකුමාරෝත්තමයා; බුදුවන, සර්‍වඥපදප්‍රාප්ත වන; මහරු, මාහැඟිවූ; එදිනෙහි, තද්දිනයෙහි; රුසිරු, රුචිරවූ; එසිව තුරු, ඒ ශ්‍රේෂ්ඨවූ නාගශ්‍රීබෝධිවෘක්ෂයෙහි; තිබොරු, මිථ්‍යා නොවම; සුපිපෙන, සුපුෂ්පිත වන්නාවූ; සක්පමණදුරු, ගැලසක්සා ප්‍රමාණවූ; දිසිරු, රුචින් බබළන; මල්රුස, පුෂ්ප සමූහය තෙමේ; ගරු, ගරුවූ; බුදුව, සම්‍යක්සම්බුඬව; පිරු, පරිපූර්ණ; අසුදහස් වසරක්, අශීතිසහස්‍ර වර්ෂයක්; ඇසිරු, ආශ්‍රිතව ගෙවත් යුක්තව; වැඩවසන තුරු, (උන්වහන්සේ) ජීවමානව වාසය කරන කාලය තෙක්; එම මර සතුරු, යථෝක්ත සර්වඥතමන්වහන්සේ විසින්; මරු දිනුව, මාර පරාජය කළ; සිරි, ශ්‍රියාව; පාතයුරු; ප්‍රකාශ කරන්නාක් මෙන්; නොමැලි, ම්ලාන නොව; සිරු, සුන්දරව; දිලෙ, භ්‍රාජිත වන්නේය.

371

ලොවපතරා වටඑබෝතු රා බිමදෙගව්පුරා රන්වැලි උ තුරා
අවට සරා වෙයිරන්පවු රා ඉන්පිටඉවු රා ගව් දෙළොසතුරා
තව එවරා ඇතකුසුම්තු රා නමකරඉදු රා බෝරජ මි තුරා
ලොවඇදුරා සිවගොවිදුගුරා මිසඅන්කව රා වත නෙද එ තුරා

371 ලොවපතරා, (ත්‍රෛ) ලෝක ප්‍රසිඬවූ; එබෝතුරා, ඒ බොධි වෘක්ෂරාජයා; වට, හාත්පස්හි; දෙගව් පුරා, පරිපූර්ණ ද්විගව්‍යූති ප්‍රමාණ; බිම, ධරණී තලයෙහි; රන්වැලි, ස්වර්ණවාලුකා; උතුරා, උත්තරීතවද; අවට, එහි හාත්පසින්; සරා සාරශ්‍රියෙන් යුක්තාවූ; රන් පවුරා, ස්වර්ණමය ප්‍රාකාරයක්ද; වෙයි, ඇති වන්නේය; ඉන් පිට ඉවුරා, එයින් බාහ්‍ය භූමිතිරයෙහි; ගව් දෙළොසතුරා, ගව්‍යූති ද්වාදශයක්හුගේ අතරෙහි; බෝ රජ මිතුරා, මේ මිත්‍රවූ බොධිද්‍රැමෙන්ද්‍රයාට; ඉදුරා, සෘජුව; නමකර, නමස්කාර කරමින්; තව, අනෘවුත්; කුසුම් තුරා, පුෂ්ප වෘක්ෂයෝ; එවරා, තත්කාලයෙහිදී; ඇත, ඇති වන්නාහුය; ලොව ඇදුරා, මහාබ්‍රහ්මයාද; සිව, ඊශ්වරයාද; ගොවිදු, මහාවිෂ්ණුද; ගුරා, වෘහස්පතිද; මිස, විනා; අන් කවරා, අන්‍ය වූ කවරෙක් තෙමේ; එතුරා, ඒ නාගශ්‍රීබොධිරාජයා; වත නෙද, වර්ණනාකරන්නේද (නොහැක්මය යන අර්ථයි)

නවමසර්ගය සමාප්තයි.

372 සිරි සඳමි තුරුවා
සෙවුන් ගෙන නිර තුරුවා
මරුභටස තුරුවා
එබෝරජ දිසි ජය උ තුරුවා.

372 සිරිසඳ, ලක්ෂමිය; මිතුරුවා, මිත්‍රව; නිරතුරුවා, අනවරතයෙන්; සෙවුන්ගෙන, සෙවනය කොටගෙන; මරුභට, මාරයාභට; සතුරුවා, ශත්‍රුව; ජය, විජයශ්‍රිය; උතුරුවා, උත්තරීතකරවා; එබෝරජ, ඒනාගශ්‍රිබොධිරාජයා; දිසි, භ්‍රාජමානවන්නේය.

373 මහසතුට ජය බිම
මරුට කිසියස නොලැ බිම
බෝමූලට එල ඹිම
කරන කල හිමි නොවී කැල ඹිම

373 මහසතුට, මහාබොධිසත්ත්වයන්ට; ජය බිම, ජය භූමිවූ; මරුට, වසවර්ත්තිමාරයාට; කිසියස, සවල්පවූද කීර්ත්තියක්; නොලැබිම, අලභ්‍යමානවූ; බෝමූලට, ඒ නාගශ්‍රිබොධිමූල යට; හිමි, ස්වාමි පුත්‍රයා; කැලඹිම නොවී, චංචල භාව යක් නොමැනිව; එලඹිම කරන කල, සම්ප්‍රාප්තවන කල්හි- (මතුකාව හා කුලකයි.)

374 ඊතණ අට මි ටක්
පැතුම් ඇත්තෙක් නෙවි ටක්
හිමිසඳුට සතු ටක්
වඩා දෙසි පා වැඳම් නෙවි ටක්

374 නෙවිටක්, අනෙක වාරයක්; පැතුම් ඇත්තෙක්; ප්‍රාර්ථනා ඇති පුද්ගලයෙක්; ඊතණ, කුශතෘණ; අට මිටක්, අෂ්ට මුෂ්ටියක්; හිමි සඳුට, ස්වාමීන්ද්‍රයාණන්ට; සතුටක් වඩා, සන්තුෂ්ටිය වඩනය කොට; නෙවිටක්ම, තුන් වරක්ම; පාවැඳ, ශ්‍රීපාදවන්දය ප්‍රණාමය කොට; දෙසි, පුදන් නේය.

375 එගිතණ සුල කුණු
ගෙනැ හිමි දෙසත තිල කුණු
වැද බෝමැඩ ද කුණු
දිගින් කර තුන්යලක් පැද කුණු

375 සුලකුණු, මහාපුරුෂලක්‍ෂණයෙන් හෙබි; තිලකුණු, (ජගත්ත්‍රය ගත බ්‍රහ්මාදී පුද්ගලාන්තරයක්හු විසින් නොදක්විය හැකි අනාත්මලක්‍ෂණයෙන් සැදුම් ලත්, නිර්‍වාණමුඛයයි දක්වනලද) ත්‍රිලක්‍ෂණයන්; දෙසන, (ආශයානුශයපරිත්‍රානුරූප කොට) වදාරන්නාවූ; හිමි, ඇන්ලෝහිමියාණන්වහන්සේ; එතිතණ, යථොක්ත කෘශතෘණ (අටමිට); ගෙනැ, ප්‍රතිග්‍රහණය කොට; දකුණු දිගින්, දක්‍ෂිණ දිශාවෙන්; බෝමැඩ, ඒබෝධිමණ්ඩයට; වැද, ප්‍රවිෂ්ටවැ; තුන්යලක්, තෙවරක්; පැදකුණු කර, ප්‍රදක්‍ෂිණා කොට—(මතුකව හා කුලකයි.)

| | |
|---|---|
| 376 එබෝමුල ඉ | ඳු රු |
| දෙසින් ඊතණ සො | ඳු රු |
| දුමු කල වි | ඳු රු |
| අඳුන් පැත නගි දුරුර අ | ඳු රු |

376 සොඳුරු, සුන්දරවූ; ඊතණ, කුශතෘණ; එබෝමුල, ඒ බොධිමූලයෙහි; ඉඳුරු දෙසින්, පූර්‍වදිග්භාගයෙන්; දුමු කල, බහාලූ කල්හි; අඳුරු, අන්ධකාරය; දුරුර, දූරීභූත කෙරෙමින්; විදුරු අසුන්, වජ්‍රාසනය; පැත නගි, උද්ගත වන්නේය.——

| | |
|---|---|
| 377 අට පනස් | රි ය නා |
| උලැගි මුලබෝ | දි ය නා |
| පෙරාසුන | දි ය නා |
| ඉඳී පිටදී වන්ට | දි ය නා |

317 නාබෝදියමුල, ඒ නාගශ්‍රීබොධි මූලයෙහි; උලැගි, උල්ලඞ්ඝිතවූ; අටපනස් රියනා, අෂ්ටපඤ්චාශත් හස්තපරිමිත; අසුන, වජ්‍රාසන (මස්තකයෙහි); පෙර, පූර්‍වදිශාවලොකනයෙන් යුක්තව; දියනා, ඒජගදීශ්වර තෙමෙ; පිටදී, (බොධිස්ට) පෘෂ්ඨ දානයකොට; දියනා වන්ට, ලොකනායක වනු පිණිස හෙවත් බුදුවනු පිණිස; ඉඳී, උපවෙශනය කරනසේක.——

| | |
|---|---|
| 3i8 සොළසා අ | සං ඛා ය |
| කප්ලක් පිරූ නි | සං ඛා ය |
| ගුණදම් අ | සං ඛා ය |
| ගුරුවූ සක්විති රජුට | සං ඛා ය |

378 සොළසාඅසංඛය කප්ලක්, සොළසාසංඛ්‍ය කල්පලක්‍ෂයක්; නිසංඛය, නිශ්ශඞ්කායෙන් හෙවත් සැකනැතිව; පිරූ, පූරණය කරන ලද්දාවූ; අසංඛය, සඞ්ඛ්‍යා රහිතවූ; ගුණ දම්,

ගුණ ධර්මයන්ගෙන් යුක්තවූ; සංඝාය සක්විති රජුට, සංඛ්‍යාභි ධාන චක්‍රවර්තිතරේන්‍ද්‍රයන්ට; ගුරුවූ, ආචාර්යවූ—(මතුකව හා කුලකයි.)

379 අපහිමි සු මං ග ල
දෙතිස්ලකුණැති මං ග ල
විලස මුනි මං ග ල
සිතන සඳ බුදුවන්ට මං ග ල

379 මංගල, කල්‍යාණවූ; දෙතිස්ලකුණැති, ද්වාත්‍රිංශත්වර මහාපුරුෂලක්‍ෂණයෙන් යුක්තවූ; සුමංගල, ශොභන මංගලකාරවූ; අපහිමි, අප මහා බොධිසත්වස්වාමීන්ද්‍රයාණන්වහන්සේ; මංගල මුනිවිලස, මඞ්ගලාභිධෙයමුනීන්ද්‍ර ලීලායෙන්; මංගල, මඞ්ගල කරවූ; බුදුවන්ට, සම්‍යක්සම්බුද්ධවීම පිණිස; සිතන සඳ, චින්තනයකරන කල්හි—

380 වටවූ තුන් යො දු න්
ඉඳු බඳු සිරි කැලුම් දු න්
මහ සේසත් මු දු න්
නහන් වෙතසිට බඹහු සමි දු න්

380 තුන්යොදුන්, යොජනත්‍රයක්; වටවූ, වෘත්තවූ; මහ, විසාලවූ; ඉඳු බඳු, චන්ද්‍රයා සදෘශවූ; කැලුම් සිරි, කාන්තිශ්‍රීය; දුන්, ප්‍රකාශකලාවූ; සේසත්, ශ්වේතච්ඡත්‍රයන්; බඹහුසිට, (දශ දහසක්සක්වළ) බ්‍රහ්මයෝ සපින්ය කොට; සමිඳුන්, ස්වාමීන්ද්‍ර යාණන්ගේ; මුදුන්වෙත, මස්තකයකෙරෙහි; නහන්, ආරෝපනකරන්නාහ—

381 ජයතුරා නම් ඇ ති
සියවිසිරියන් දිග ඇ ති
සක් දෙව් ගිගුම් ඇ ති
පිඹිත් සක්රදහු මහ පින් ඇ ති

381 සියවිසිරියන් දිගඇති, විංශතිශතහස්තප්‍රමාණ දීර්ඝත්වය ඇති; දෙව්ගිගුම් ඇති, මෙඝයකට බඳු ඝොෂණයෙන් යුක්තවූ; ජයතුරා නම් ඇති, විජයුත්තර යන නමින් ප්‍රසිද්ධවූ; සක්, සංඛයන්; මහ පින්ඇති, මහාපුණ්‍ය ඇත්තාවූ; සක්රදහු, (දසදහසක්සක්වළ) ශක්‍රදෙවෙන්ද්‍රයෝතුමූ; පිඹිත්, ධමනය කරන්නාහ—

382 පංසිඃඃ නම් යු ත්
දෙව් තුන්ගව් දිගින් යු ත්
වෙණ තම ඇකෙහි යු ත්
ගෙන කරත් ගායනා රැව් යු ත්

382 පංසිකා නම් යුත් දෙව්, පංචශිඛනම් යුත් ගන්ධර්ව දිව්‍යපුත්‍රයෝ තුමූ; දිගින්, දීර්ඝත්වයෙන්; තුන්ගව් යුත්, ත්‍රිග ව්‍යූති ප්‍රමාණ ඇති; තම ඇකෙහි යුත්, තමන්ගේ අඞ්කයෙහි යොදන ලද; වෙණ, වීණාව; ගෙන, ග්‍රහණය කොට; රැව් යුත්, රාවයෙන් යුක්තවූ; ගායනාකරත්, වීණාවාදනය කරත් නාඟ.......

383 දෙව්ඳුහු සුයා ම ය
තුන්ගව් දිග පමණ ම ය
දිවසෙමර පුදූ ම ය
සලත් පසෙකින් හිමිට අස ම ය

383 සුයාමය දෙව්ඳුහු, සුයාම නම් දිව්‍යරාජයෝ තුමූ; දිග, දිගින්; තුන්ගව් පමණමය, ත්‍රිගව්‍යූති ප්‍රමාණයඇති; පුදූමය, ආශ්චර්‍යවූ; දිව සෙමර, දිව්‍ය චාමරය; ගෙන, ග්‍රහණය කොට; අසමය, අසමවූ; හිමිට, ලොකස්වාමින්වහන්සේට; පසෙකින්, පාර්ශ්වයෙක්හිසිට; සලත්, පවත් සලන්නාඟ.......

384 සන්තුසිත මෙන මැ ති
දෙව්පුත් පතළ විකු මැ ති
හිමිසඳුට පෙරු මැ ති
සලත් මිණිතල්වැට එකැලු මැ ති

384 පතළ, ප්‍රසිද්ධවූ, විකුමැති, වික්‍රමඇති; සන්තුසිත මෙ නමැති, සන්තුසිත යන මේ නාමයෙන් ප්‍රසිද්ධවූ; දෙව්පුත්, දිව්‍යපුත්‍රයෝතුමූ; පෙරුමැති, (සමත්‍රිංශත්) පාරමිතා ඇත්තාවූ; හිමි සඳුට, ස්වාමිඥයාණන්ට; කැලුමැති, කාන්තිමත්; එ මිණි තල් වැට, ප්‍රසිද්ධවූ මාණික්‍ය තාලවෘන්තය; සලත්, චල නය කරන්නාඟ.......

385 එසඳෙහි පිවි තු රු
මලිනි දූල් රොතිති තු රු
නෙක කුසුමන් තු රු
අවට සුපිපෙත් සුවඳ උ තු රු

385 එසදෙහි, තත්කාලයෙහිදී; පිවිතුරු, පවිත්‍රවූ; ඉතුරු, අභිරික්තවූ; රොතිති, රේණුයෙන්; සුවඳ උතුරු, ඉතිරියන සුවඳ ඇත්තාවූ; මලිති, පුෂ්පයෙන්; දුල්, උජ්ජ්වලවූ; නොන, බොහෝවූ; කුසුමන්තුරු, පුෂ්පවෘක්ෂයෝ; අවට, එහිහාත් පස්හි; සුපිපෙත්, සුපුෂ්පිත වන්නාහුය.

386 විදුපිල් වර ල ස
රනමොනොර කිරනොව ල ස
තුරු අගෙහි සිහි ල ස
කුලුණු හිමි දුක රහත් නෙවි ල ස

386 රනමොනොර, ස්වර්ණමයූරයෝද; කිර, කීරපක්ෂිහුද; නොවලස, අනලසවූ; සිහිලස, ශීතලස්පර්ශීඇති; තුරු අගෙහි, වෘක්ෂාග්‍රයෙහි; පිල්වරලස, පිංඡාකලාපයන්; විදු, විස්තීර්ණ කොට ගෙන; කුලුණු, (සකල සත්වයා කෙරෙහි පතළාවූ) කරුණා ඇත්තාවූ; හිමි, මෛත්‍රෙය ස්වාමීන්ද්‍රයන්; දුක, අවලොකනය කොට; නෙවිලස, අනේකාකාර; රහත්, නෘත්‍ය කරන්නාහුය.

387 තද මතකොවු ල් ල න්
දෙන වැද මලාමැ ල් ල න්
සුරගඳඹ ගො ල් ල න්
පසඟතුරු කරනෙව් විපු ල් ල න්

387 මලාමැල්ලන්, කුදු මහත් පුෂ්පයන්හි; වැද, ප්‍රවිෂ්ටව; මත කොවුල්ලන්, මත්ත කොකිලයන් විසින්; දෙනතද, පවත්වන්නාවූ නාදය (කොබඳුද යතහොත්); සුරගඳඹ ගොල්ලන්, දිව්‍යගන්ධර්ව සමූහයා විසින්; විපුල්ලන්, මහත්වූ; පසඟතුරු, පංචාඞ්ගිකතූර්‍ය්‍යනාදය; කරනෙව්, කරන්නක් වැනිය.

388 එවරෙහි ඇත්අ සු න්
ලෙසින් සැරසී සන් සු න්
දෙන ගොස සෙ මිනි සු න්
පිණිස කරනෙව් මරුගෙ මන් සු න්

388 එවරෙහි, තද්දිනයෙහි; ඇත් අසුන්, හස්ත්‍යශ්වයන්; මිනිසුන් සෙ, මනුෂ්‍යයන්මෙන්; සන්සුන් ලෙසින් නිශ්චලාකාරයෙන්; සැරසී, සජ්ජිතව; දෙන, පවත්වන්නාවූ; ගොස, ඝොෂණය (කොබඳුද යතහොත්); මරුගෙ, වසවර්තිමාරයාගේ; මන්, මානය; සුන් පිණිස, සූන්‍ය බැව් නිසා; කරනෙව්, කරන්නාක්මෙනි.

389 එවන විල් සුර ලි ය
මුව තඹරෙලිය ළක ලි ය
දුට හිමිරු පිය ලි ය
නිගා දෙන්නේ නඳුන් සර ලි ය

389 එවන, ඒඅරණ්‍යයෙහි; ළකලිය, මනොඥවූ; තඹර, පියුම් නමැති; මුව එලිය, මුඛාලොකශ්‍රිය ඇති; විල් සුරලිය, තඩාගනමැති දිව්‍යස්ත්‍රි; හිමි, වල්ලභයා නමැති; හිරු, සූර්‍ය්‍යයා විසින්; දුට, අවලොවකනය කළහොත්; පියලිය, ප්‍රියවඩිනය වී; නඳුන්, ශක්‍රයාගේ නන්‍දනොද්‍යානයෙහි; ලියසර, සරසි නමැති දිව්‍යපසරාවට; නිගාදෙන්නේ, නිග්‍රහදානය කරන්නේය.

390 දිගු සොඳුරු ළ ඳු නා
පැලඳ කොඳ හරන ඳු නා
ගා සුවඳ ස ඳු නා
සලනවැනි වැලිගුවල්වි ඳු නා

390 සොඳුරු. සුන්‍දරවූ; දිගු ළඳුනා, දිශා නමැති කාන්තාව; නඳුනා, ප්‍රියංකරවූ; කොඳහර, කුන්‍දකුඩ්මල නමැති මුක්තා හාරය; පැලඳ, පිලන්‍ධනය කොට; සුවඳ සඳුනා, සුගන්‍ධ චන්‍ද නකල්කය; ගා, ආලිප්ත කොට ගෙන; වැලුගු, කාශපුෂ්ප නමැති; වල්විදුනා, වාලව්‍යජනය; සලන වැනි, චලනය කරන්නාක් වැනිවේ.

391 මිහිසඳ පස න් නී
උලැඟි මුනිපුද දෙ න් නී
මරමත සිඳි න් නී
විලස දෙරණත ගුගුරව න් නී

391 මිහිසඳ, මහිකාන්තාතොමෝ; පසන්නි, ප්‍රසන්නව; උලැඟි, (ධරණියෙන්) උල්ලංඝිතව; මුනි, සර්‍වඥයන්වහන්සේට; පුදදෙන්නී, පූජාදානය කරන්නියක් මෙන්ද; මර, මාරයාගේ; මත, මස්තකය; සිඳින්නී විලස, ඡෙදනකරන්නියක් මෙන්ද; දෙරණත, ධරණීතලය; ගුගුරවන්නී, ගර්ජිත කර වන්නීය.

392 සුවහස් බඹ කැ ලු මි
පාතා මෙමුනි සුදි ලු මි
කර දිනකර බැ ලු මි
අවර ගිර පස් වේ වැ හොදි ලු මි

392 සුදිලුම්, මොනවට භ්‍රාජමාන වන්නාවූ; මෙමුනි, මේ මෛත්‍රෙය මුනීන්ද්‍රයාණන්වහන්සේ; පානා, දක්වන්නාවූ; සුව හස් බඹ, බ්‍රහ්මශතසහස්‍රයක්ගේ; කැලුම්, කාන්තිය; දිනකර, හිරුහු; බැලුම් කර, අවලොකනය කොට; නොදිලුම්වැ, භ්‍රාජිත නොවැ; අවරගිර පත්වේ, අස්තඞ්ගත වන්නේය.

393 සුරෝ පරසතු මල්
අසුරෝ පලොල් සුනි මල්
ගිරිතුරු පුල්කා මල්
පුදත් දිවනයි එකාඬුපුල් මල්

393 සුරෝ, දෙවියෝ; පරසතුමල්, පාරිජාත පුෂ්පයෙන්ද; අසුරෝ, දෛත්‍යයෝ; සුනිමල්, අති නිර්මලවූ; පලොල්, පාටලී පුෂ්පයෙන්ද; දිවනයි, දිව්‍යනාගයෝ; එකාඬුපුල්මල්, ඒකාණ්ඩාත් පල පුෂ්පයෙන්ද; ගිරිතුරු, පර්වත හා වෘක්ෂයෝ; උපුල් කමල්, උත්පලයෙන් හා පද්මයෙන්ද; පුදත්, පූජා කරන්නාහුය.

394 බඹ සුරන් සුර ලිය
කරන ගීරඟ ළකලිය
එසඳෙහි දුටු ලොලිය
කවිරු බුදුබව කෙරෙහිනොඇලිය

394 බඹ, බ්‍රහ්මයන්ද; සුරන්, දෙවියන්ද; සුරලිය, දිව්‍යප්සරාවන්ද; කරන, ක්‍රියමාණවූ; ළකලිය, මනොඥවූ; ගීරඟ, නෘත්‍යගීතයන්; එසඳෙහි, එකල්හි; දුටු, දර්ශනය කරනලද්දාවූ; ලොලිය, ලෞල්‍යයෙන් යුක්තවූ; කවුරු, කවර පුද්ගලයෙක්; බුදුබව කෙරෙහි, සර්වඥපදප්‍රාප්තවීමෙහි; නොඇලිය, ආසක්ත නොවන්නේද? (සියල්ලෝ ඇල්ම කරත් යන අර්ථයි.)

395 එම්සඳෙහි අහ සින්
වසිත මල්වැසි කෙලෙ සින්
බුදුමඟුලට තො සින්
ඉසිත සුරලිය කඳුළු විල සින්

395 එම සඳෙහි, ඒ කාලයෙහි; අහසින්, ආකාශයෙන්; වසිත, වර්ෂණය කරන්නාවූ; මල්වැසි, පුෂ්ප වර්ෂණය; කෙලෙසින්, කවරප්‍රකාරද යතහොත්; බුදුමඟුලට, බුද්ධමඞ්ගල්‍යයට; තොසින්, සන්තුෂ්ටවැ; සුරලිය, දිව්‍යප්සරාවන් විසින්; ඉසිත විකීර්ණකරනලබන්නාවූ; කඳුළු විලසින්, අශ්‍රු ධාරා මෙනි.

396 බලා මෙසිය ල් ලා
මරදෙව් වී තැවු ල් ලා
සියලඟ වෙවු ල් ලා
කෑඳව කෑඳවා පිරිස් ගො ල් ලා

396 මෙ, මේ උක්තප්‍රකාර ප්‍රවෘත්තිය; සියල්ලා, සාකල්‍ය යෙන්; මරදෙව්, වසවර්ත්තිමාරදිව්‍යපුත්‍ර තෙමෙ; බලා, අවලෝකනය කෙරෙමින්, තැවුල්ලා වී, හෘද්සන්තාපයට පැමිණ; සියලඟ, සකල ශරීරය; වෙවුල්ලා. කම්පනය කොට; පිරිස් ගොල්ලා, (තම) පක්ෂ සමූහයා; කෑඳව කෑඳවා, ආහ්වානය කෙරෙමින්—(මතුකව හා කුලකයි.)

397 ගිනිබඳු රළුඇ සි න්
උමතුවු අයකු විල සි න්
රුදු ගොර හඬ බ සි න්
කියයි මෙලෙසට කිපී සරෝ සි න්

397 ගිනිබඳු, ඇවිලගත්ගින්නකට බඳු; රළු ඇසින්, බිහිසුනු චක්ෂුසින්යුක්තව; උමතුවු අයකු, උම්මත්තකයකුගේ; විලසින්, විලාසයෙන්; සරෝසින්, රෝෂසහිතවූ; කිපී, කුපිතව; මෙලෙසට, මේ (වක්ෂ්‍යමාණ) ආකාරයෙන්; රුදු, රෞද්‍රවූ; ගොර, ඝොරවූ; හඬ, ශබ්ද ඇති; බසින්, වචනයෙන්; කියයි, කථනය කරන්නේය.—

398 පින් තෙද විකුම් ස ර
අජිත කුමරිඳු පැණ ස ර
නොතකා මමර ස ර
බුදුවනසෙ අදකරයි වැර ස ර

398 පින්, පුණ්‍යශ්‍රීන්ද හෙවත් භාග්‍යයෙන්ද; තෙද, තෙජසින්ද; විකුම්, වික්‍රමයෙන්ද; සර, ස්ථිරභාවයෙන්ද; පැණ, ප්‍රඥායෙන්ද; සර, සාරවූ; අජිතකුමරිඳු, අජිත කුමාරෙන්ද්‍ර තෙමෙ; මමර සර, මාගේ මාර චරිතය; නොතකා, සංලක්ෂණය නොකොට; අද, අද දිනයෙහි; බුදුවනසෙ, බුද්ධත්වය ලැබීමට; වැරසර, වීර්‍ය්‍ය සාරය; කරයි, කරන්නේය.—

399 ඔවුන් බුදුවූ ච ර
මගෙ බලයෙන් පලකා ච ර
උන් පදගෙන මෙ ච ර
ගසමි පරසක්වලෙහි එකා ච ර

399 ඔවුන්, ඒ අජිතකුමාරයන්; බුදුවූ වර, සම්ඥවූ කල්හි; මගෙ, අසමත්හුගේ; බලයෙන්, වික්‍රමයෙන්; පල කාවර, කාවරත්ම් ප්‍රයොජනයක්ද? මෙවර, අද දිනමෙහි; උන් පද ගෙන, උන්වහන්සේගේ පාදවන්දය අල්ලා; පරසක්වළෙහි, පරචක්‍රවාලයෙහි; එකවර, එකක්ෂණයෙන්ම; ගසමි, ක්ෂිප්ත කරන්නෙමි (ලාහෙලාපියන්නෙම්වයැ යූ සේයි.)

400 මයුද සහ වා | දය
සිදු කර නොව පමා | දය
බෝමැඩින් බේ | දය
කරම් වන සා උන් පසා | දය

400 මයුද සහ වාදය, මාගේවාක්ප්‍රහාර සහිත යුඬය; නොව පමාදය, නොපමාව (වහ. වහා); සිදුකර, සිඬ කොට; උන්, ඒ අජිතකුමාරයන්ගේ; පසාදය, චිත්තප්‍රසාදය; වනසා, විනාශ කොට; බෝමැඩින්, බොධිමණ්ඩයෙන්; බේදය කරම්, භෙදකරන් නෙමි (බලාත්කාරයෙන් පහ කරන්නෙමි.)

401 මෙම සැඬ තෙපු. | ල් ලා
කියමින් දෙරණ සො | ල් ලා
ගජගිරි මෙවු | ල් ලා
නැඟෙයි මුළුතෙදියත වෙවු | ල් ලා

401 මෙම, මේ පූර්වොක්තවූ; සැඬ, චණ්ඩවූ; තෙපුල්ලා, වාක්‍යයන්; කියමින්, කථනය කරමින්; දෙරණ, පෘථිවිය; සොල්ලා, චලනය කරමින්; මුළු තෙදියත, සකල ජගත්‍රය; වෙවුල්ලා, කම්පිත කරවමින්; ගිරිමෙවුල්ලා, ගිරිමෙඛලානම්වූ; ගජ, හස්තිරාජයාපිටට; නැඟෙයි, ආරූඪවන්නේය.

402 මවා අත් දහ | සක්
රුගත් දිලිඅවි සහ | සක්
ගොර බිරම් අවි | සක්
දරා වසවත් සමඟ මර | සක්

402 වසවත්, වසවර්ති මාරදිව්‍යපුත්‍ර තෙමේ; දිලිඅවි, ජ්වලිතවූ ආයුධයන්; සහසක්, සහස්‍රයක්; රුගත්, ග්‍රහණය කළාවූ; අත්දහසක්, සහස්‍රහස්තයක්; මවා, නිර්මිත කොට ගෙන; ගොර, ඝොරවූ; බිරම්, භයානකවූ; සක්අවි, චක්‍රායුධය; දරා, ධාරණය කොට; මරසක් සමඟ, මාරපිරිස් හාඑක්වැ— (මතුකව් හා කුලකයි.)

403 ම ර හඬ ගස න් නේ
ම ර යුදය පවස න් නේ
ම ර සක පිඹි න් නේ
මෙසේ මර දෙව් වෙස් පා න් නේ

403 මරහඬ ගසන්නේ, මාර ඝොෂණය කරන්නේය; මරසක, මාර සඞ්ඛය; පිඹින්නේ, ධමනය කරන්නේය; මර යුදය, මාර යුඩයැයි; පවසන්නේ, ප්‍රකාශ කරන්නේය; එමෙසේ, මේවක්‍ෂ්‍යමාණාකාරයෙන්; මරදෙව්, මාරදිව්‍යපුත්‍ර තෙමේ; වෙස්, වෙෂයන්; පාන්නේ, ගෙනහැර දක්වන්නේය.

404 රකුස් වෙස් ගත් තෝ
යකුන්ගේ වෙස් ගත් තෝ
පිසස් වෙස් ගත් තෝ
එකෙකු ගත් වෙසෙකෙක් නො ගත් තෝ

404 රකුස් වෙස් ගත්තෝ, රාක්‍ෂසවෙෂග්‍රහණය කළෝද; යකුන්ගේ වෙස් ගත්තෝ, යක්‍ෂයන්ගේ වෙෂග්‍රහණය කළෝද; පිසස්වෙස් ගත්තෝ, පිසාචවෙෂග්‍රහණය කළෝද; එකෙකු ගත් වෙස්, එකක්හු විසින් ග්‍රහණය කරනලද වෙෂයක්; එකෙක් නොගත්තෝ, අනිකක්හු විසින් නොගත්තෝද වන්නාහ. (අන්‍යොන්‍ය විසදෘශවෙෂයන්මැ ගත්තු යැයු සේසි.)

405 ඇත්කඳලිහිණි වෙ ස්
මහවත් බිලීපුටු වෙ ස්
මුගටි වල්මී වෙ ස්
සිගල් බළු වාතර හුරු වෙ ස්

405 ඇත්කඳලිහිණිවෙස්, එනම්පක්‍ෂිවෙෂයද; මහවත්, උලූක වෙෂයද; බිලීපුටු වෙස්, කාත්‍ය වෙෂයද; මුගටි, නකුල වෙෂයද; වල්මීවෙස්, වනමූෂිකවෙෂයද; සිගල්, ශෘගාල වෙෂයද; බලු, සුනඛ වෙෂයද; වාතර, වඳුරු වෙෂයද; හුරුවෙස්, සූකරවෙෂයද—(මතුකව් අටක් හා කුලකයි.)

406 දිවි වග වෙහෙල් වෙ ස්
සිහ තුරඟ ගජ මියු වෙ ස්
මෙඅැ වියරු වෙ ස්
සියල්ලෝද ඇති බිරම් වෙ ස්

406 දිව්වෙස්, වීපිවෙෂයද; වග, ව්‍යාඝ්‍රවෙෂයද; මෙහෙල්, වෘකාවෙෂයද; සිහ, සිංහවෙෂයද; තුරඟ, අශ්වවෙෂයද; ගජ, හස්තිවෙෂයද; මියුවෙස්, මහිෂ වෙෂයද යන; මෙ ඈ, මේ ආදිවූ; වියරූවෙස්, විකාරවෙෂ සහිත; සියල්ලෝද, සියලු ලොකධාතු වෙහි; ඇති, විද්‍යමානවූ; බිරම් වෙස්, භීෂණවෙෂ ඇති—

407 ඔළ මොළ රළුරෝ සෙන්
දසබිම්බරක් මර සෙන්
ගෙන යුද රුදුලෙ සෙන්
සැරසි සැරසී ඉදන් අහ සෙන්

407 ඔළ මොළ, චණ්ඩප්‍රචණ්ඩවූ; රළු, රෞද්‍රවූ; රොසෙන්, රොෂයෙන් යුක්තවූ; දසබිම්බරක් මරසෙන්, දශබිම්බරකින් යුක්තවූ මාරසෙනාවක්; ගෙන, ග්‍රහණය කොට; රුදුලෙසෙන්, රෞද්‍රාකාරයෙන්; යුද, යුඞයෙන්; සැරසි සැරසී, සැදීසැදී; අහසෙන්, ආකාශයෙහි; ඉදන්, උපවෙශනය කොට—

408 වි කා දත්කට මර
වි කා රෙන් තතු නොස මර
ත කා නොම එකු මර
සැකා නොව වන ලොවට බුන් මර

408 තතු, තත්වාකාරය; නොසමර, සමරණය නොකොට; මර, මාරදිව්‍යපුත්‍ර තෙමෙ; විකාරෙන්, උන්මත්තකත්වයෙන්; දත් කට, දන්තයන් සහ මුඛය; විකා, චර්‍වණය කරමින්; ලොවට, ලොකයට; සැකානොව, ශඞ්කා රහිතව; බුන්මර වන, සම්‍යක් සම් බුඞවන්තාවූ; එකුමර, ඒකුමාරොත්තමයන්; නොම නකා, සංලක්‍ෂණය නොකොට—

409 හද වෙර බැඳ දිලී
අප සමිඳු තුම සු දිලී
යුද ගෙන පැර දිලී
කරන ලෙස තදසැරෙන් වි දිලී

409 බැඳ, බන්ධනය කරන ලද; හද, හෘදයෙහි; වෙර, වෛරයෙන්; දිලී, ජ්වලිතව; සුදිලී; මොන්වටභ්‍රාජිතවූ; අප සමිඳු තුම, අපගේ ස්වාමීශ්‍රෙෂ්ඨතමයා; පැරදිලි කරන ලෙස, පරාජය කරන පරිද්දෙන්; යුදගෙන, යුඞාරම්භ කොට; විදුලී, විද්‍යුත් බඳු; තද සැරෙන්, ඝනබඩ වෙගයෙන්—

410 සක්අවිය ලෙ ල වා
සුරලිය කඳුළු ග ල වා
රුදුරු නෙත් ස ල වා
දෙව් බඹුන් හැම පලව ප ල වා

410 සක් අවිය, චක්‍රායුධය; ලෙලවා, චලිත කරමින්; සුර ලිය, සුරඞ්ගනාවන්ගේ; කඳුළු, බාෂ්ප; ගලවා, වලනය කොට; රුදුරුනෙත්, රෞද්‍ර නෙත්‍රයන්; සලවා, චංචල කරමින්; හැමදෙව්බඹුන්, සකලදිව්‍යබ්‍රහ්මයන්; පලව පලවා, එලවඑලවා—

411 වසා සඳ හිරු රැ ස්
ගනඳුරෙන් ලොව කර රැ ස්
විහිදනට බුදු රැ ස්
නොදෙව් කියමින් එක්ව මර රැ ස්

411 සඳහිරු රැස්, චන්ද්‍රසූර්‍ය්‍යාලොකය; වසා, ඡාදනය කර මින්; ලොව, ලොකය; ගනඳුරෙන්, ඝනාන්ධකාරයෙන්; රැස් කර, රාශිභූත කෙරෙමින්; බුදුරැස්, සවනක්සන බුඬරශ්මීන්; විහිදනට, විසිර්‍ණය කිරීමට; නොදෙව්, අවකාශ නොහරිව්යයි (වලක්වව්); මරරැස් එක්ව, මාරසෛන්‍යයන් හා එකීභූතව; කියමින්, කථනය කරමින්—

412 ගස් ගල් කඩ කා ඩා
පුපුරවා හෙන ය කා ඩා
නරලොව දෙර කා ඩා
අවුත් තම මරසිරිත නෝ කා ඩා

412 ගස්ගල්, වෘක්ෂයන් සහ පර්‍වතයන්; කඩ කඩා, ඛණ්ඩ නය කොට කොට; හෙන යකඩා, අශනිආයස; පුපුරවා, ප්‍රසළු රණය කරමින්; තම මර සිරිත, ස්වකීය මාර චරිත්‍රය; නො කඩා, ඛණ්ඩනය නොකොට; නරලොව, මනුෂ්‍යලොකයෙහි; දෙරකඩා, මාරප්‍රදෙශයෙහි; අවුත්, ආගමනය කොට:—

413 කරදර ,ගොරබ සි න්
විගසින්ම පැන අහ සි න්
හෙනමර හඬ ගො සි න්
නගී සක්වළ ගලට සරෝ සි න්

413 ඝොර, ඝොරවූ; කරදර, කෲරධාරිවූ; බසින්, කෙපුලින් (ශුක්‍රාණුව); විගසින්ම, තත්ක්‍ෂණයෙහිම; අහසින්, ආකාශයෙන්; පැන, ඛම්පනය කෙරෙමින්; ගෙනමර, මාරඅශනි යන; හඬ, ශබ්දයන්ගේ; ගොසින්, ඝොෂණයෙන්; සරොසින්, රොෂයෙන්; සක්වළ ගලට, චක්‍රවාල පර්වතයට; නගි, උල්ලඞ්ඝනය කරන් නේය—

414 මෙලෙස වුත් වස වත්
මාර දෙව් පුත් බල වත්
ඔසවමින් හිස වත්
බලයි දෙස ඇති කුමර පැණ වත්

414 මෙලෙස, මේ පූර්වොක්තාකාරයෙන්; බලවත්, අති මාත්‍රවූ; වසවත්මාරදෙව් පුත්, වසවර්තිමාරදිව්‍යපුත්‍ර තෙමේ; වුත්, ආගමනය කොට; හිසවත්, ශීර්ෂය සහ වක්ත්‍රය; ඔසව මින්, උද්ගතකොට; පැණවත්, ප්‍රඥාන්විත; කුමර, අජිතකුමා රෙන්ද්‍රයාණන්වහන්සේ; ඇතිදෙස, වැඩසිටින්නාවූ දිශාව; බලයි, අවලොකනය කරන්නේය—

415 පළමුවු පෙරුම් දස
දෙවැනි පෙරුමන් උප දස
තෙවැනි පරමත් දස
පිරූ බුදුකුරු දහම් තුන් දස

415 පළමුවු, ප්‍රථමවූ; දසපෙරුම්, දශපාරමිතාවන්ද; දෙ වැනි, ද්විතියවූ; දස උප පෙරුමන්, දශ උප පාරමිතාවන්ද; තෙවැනි, තෘතියවූ; දස පරමත්, දශ පරමාර්ථ පාරමිතාවන්ද යන; තුන්දස බුදුකුරුදහම්, සමත්‍රිංශත් පරමිතාවන්; පිරූ, පරිපූර්ණකළ—(මතු කවත්‍රයක් හා සම්බන්ධයි.)

416 යස විසර වි ලසේ
දෙසන සිව්සස් නො ලසේ
හිමි මුව කම ලසේ
දුක හැගී පින් සුනෙර ග ලසේ

416 යශ විසර, කීර්තිරාශියකින් සමන්විත; විලසේ, විලා සයක් ඇත්තාවූ; සේ, දක්‍ෂවූ; හිමි, ස්වාමීන්ද්‍රයාණන්ගේ; නො ලසේ, ශීඝ්‍රව; සිව්සස්, චතුස්සත්‍යය; දෙසන, දෙශනා කරන් නාවූ; මුව කමල,- මුඛපද්මය; දුක, (වසවත් මරදෙව්) අවලො කනය කොට; සුනෙර ගලසේ, සුමෙරුපර්වතය බඳු (ස්ථිරවූ); පින්, (මහබොධිසත්වයන්ගේ) පුණ්‍යවිභූතිශ්‍රිය; හැගී, අවබොධව.

417 මර දෙස් හද නි　　　වි ද
ගොසින් මුනි තෙද විනි　　වි ද
පැරද කළ සුද　　　වි ද
ළ සෝගින්තෙන් තැවුලි විඳ　වි ඳ

417 මුනි, මෛත්‍රෙයමුනීන්‍ද්‍රයාණන්ගේ; තෙද, තෙජස් රශ්මිය; නිවිද දෙස්, දෙෂත්‍රයෙන් යුක්තවූ; මර, වසවත්ති මාරයාගේ; හද, හෘදය; විනිවිද ගොසින්, විනිවෙධනය කර මින්; ඇවිද, (ඒ මරදෙව් තෙමෙ) ආහිණ්ඩනය කරමින්; කළ, කළාවූ; සුද, යුඩය; පැරද, පරාජයවැ; ළ සෝගින්තෙන්, හෘදයශොකාග්නිය කරණ කොට ගෙන; තැවුලි, සන්තාපය; විඳ විඳ, විඳිනය කොට කොට—

418 හරවා ඇතු　　　ම තා
තම මරසෙනඟ අ　　ම තා
බියව හිමි අ　　　ම තා
දුවයි විලසින් එකෙක් උ　ම තා

418 ඇතුමතා, මත්තගජෙන්ද්‍රයා; හරවා, ආපසු හරවාගනි මින්; අමතා, අමාවක්බඳු; හිමි, ස්වාමීන්ද්‍රයාණන්වහන්සේට; බියව, භීතිප්‍රාප්තව; තම, ස්වකීයවූ; මර සෙනඟ, මාරසෙනා වට; අමතා, ආමන්ත්‍රණය කරමින්; උමතා එකෙක්, උන් මත්තකයෙක්; විලසින්, විලාසයෙන්; දුවයි, ධාවනයකරන් නේය—

419 එ රැ හිමි පින්　　　තෙ ද
ඇති සමතිස් පෙරුම්　　තෙ ද
සමඟ මරදෙව්　　　　තෙ ද
සියලු පස්මර රුපුන් බිඳ　තෙ ද

419 සමතිස් පෙරුම් තෙද, සමත්‍රිංශත් පාරමිතාවන්ගේ පරාක්‍රමයෙන් යුත්; පින්තෙද ඇති, තෙජොපුණ්‍යාන්විත; හිමි, ඒස්වාමීන්ද්‍රයන්වහන්සේ; එරැ, තත්දින රාත්‍රියෙහිදී; තෙද, තෙජසින් යුත්; මරදෙව් සමඟ, වසවත්තිමාරදෙව් සහිතවූ; සියලු පස්මර රුපුන්, සකල පචමාරශත්‍රුන්ගේ; තෙද, වික්‍ර මය; බිඳ, භග්න කොට—(මතුකව ගා කුලකයි)

420 පෙර නිවෙස් පෙර — යම
දිවැස් නැණ ලැබ මැද — යම
සවුනේ දැනැලූ — යම
මෙසේ බුදුවෙති ඉකුත් තුන් — යම

420 පෙරයම, ප්‍රථම යාමයෙහි; පෙරනිවෙස්, (පූර්වකාල යෙහි අනෙක කල්පකොටිශතසහස්‍රයෙහි ස්කන්ධපරිපාටියෙහි ප්‍රවෘත්තවූ) පූර්වේනිවාසානුස්මෘතිඥානයද; මැදයම, මධ්‍යමයාමයෙහි; දිවැස් නැණ, (මතුකාලයෙහි සමස්ත සත්ත්වයාගේ ච්‍යුතිප්‍රතිසන්ධිදෙක්හි ප්‍රවෘත්තිය අවබොධ කරන්නාවූ) දිව්‍ය චක්ෂුරභිඥානයද; ලැබ, ලබ්ධව; අලූයම, ප්‍රත්‍යූෂයෙහි; සව්නේ, සර්වඥතාඥානයද; දැන, ප්‍රතිවෙධකොට; තුන්යමඉකුත්, ත්‍රියාමාතික්‍රාන්තයෙහි (රැය පාන්වන කල්හි); මෙසේ උක්තප්‍රකාර යෙන්; බුදුවෙති, සම්‍යක් සම්බුද්ධරාජ වනසේක—

421 හිමි සඳුගෙ රන් — වන්
බුදුබඳින් මනරම් — වන්
සවන් ගන රැස් — වන්
දුවයි දින දින මෙලෙස සිරි — වන්

421 රන්වන්, ස්වර්ණවර්ණවූ; හිමිසඳුගෙ, ඒ ස්වාමීන්ද්‍රයාණන් ගේ; මනරම්වන්, මනොරම්‍යවූ; බුදුබඳින්, ශ්‍රීබුද්ධශරීරයෙන්; සිරිවන්, ඉතාශොබනාවූ ශ්‍රියාන්විත; සවන් ගන රැස්වන්, ෂඩ්වර්ණ ඝන රශ්මිතෙමෙ; මෙලෙස, මේවක්ෂ්‍යමාණාකාරයෙන්; දිනදින, හැමකල්හි; දුවයි, ධාවනයකෙරේ—

422 කළිඳු ගඟ ද — ලසේ
1 නිලිඳු ඉඳුවර ම — ලසේ
නීල සුනිල් රැස් වි — ලසේ
වර්ණය. දුවයි සක්වළ නැඟිනො — ලසේ

422 කළිඳුගඟ, කාලින්දී (යමුනානම්) නදියගේ; දලසේ, ජලය පරිද්දෙන්ද; නිලිඳු, ඉන්ද්‍රනීලමාණික්‍යයෙහි ගා; ඉඳුවර මලසේ, ඉන්දීවරපුෂ්පාකාරයෙන්ද; සුනිල්රැස් විලසේ, (සුනීලස්නිග්ධකෙශධාත්වාදියෙන් නිකුත්වන) අතිනීල ශොභා රශ්මිතෙමෙ; සක්වළ, චක්‍රවාල පර්‍යන්තයෙන්; නැඟී, උල්ලඞ්ඝනය කොට; නොලසේ, ශීඝ්‍රව; දුවයි, ධාවනය කරන්නේය.

| | | |
|---|---|---|
| 423 | පැන බඳුතුරුස | යු රු |
| 2 | සුනෙර විලිනව ගිය | යු රු |
| **පීත** | මඩල පැන දිව | යු රු |
| **වණ්ණ.** | දුවයි රන්වන් කැලුම් අම | යු රු |

423 උතුරු සයුරු, උත්තරසාගරයාගේ; පැනබඳු, ජලය සමානවූද; සුනෙර, සුමෙරු පර්වතය; විලිනව, දියව; ගියපුරු, ගම්නය කළාක් මෙන්ද; අමයුරු, අමෘතාකාරවූ; රන්වන් කැලුම්, (ශකලශරීරයෙන් නිෂ්ක්‍රාන්තවන්නාවූ) පීතවර්ණරශ්මි තෙමෙ; දිවයුරුමඩල, සූර්‍ය්‍යමණ්ඩලයෙන්; පැන, උල්ලඞ්ඝනය කොට; දුවයි, ධාවනය කරන්නේය.—

| | | |
|---|---|---|
| 424 | එ පබළු සිඳු ත | ර ඟ |
| 3 | පියුම්රා මෙණි මෙන | ර ඟ |
| **ලොහිත** | සුරත් රුස් මන | ර ඟ |
| **වණ්ණ.** | දුවයි නැඟ සුරමඟින් එස | ර ඟ |

424 එ පබළු සිඳුතරඟ, ඒ ප්‍රවාල සමුද්‍ර තරඟාකාරවූද; පියුම්රාමෙණි රඟ මෙන, පද්මරාග මණිප්‍රභාකාරවූද; මන රඟ, මනොරම්‍යවූ; එසරඟ, ඒ යහපත් ශොභායෙන් යුත්; සුරත්රුස්, (පාදපාණිතලයෙන් හා ඔෂ්ඨයෙන් නිකුත්වන) අතිරක්තරශ්මි තෙමෙ; නැඟ, උල්ලංඝනය කොට; සුරමඟින්, ආකාශයෙන්; දුවයි, ධාවනය කරන්නේය.—

| | | |
|---|---|---|
| 425 | කිරි සිඳු පැහැ | ව සා |
| 4 | තෙදිය සිරිසිරි ග | ව සා |
| **අවදාත** | මුනි රඟෙව් ප | ව සා |
| **වණ්ණ.** | දුවයි සුදුබුදුරුස් එ ද | ව සා |

425 කිරිසිඳු, ක්ෂීරසමුද්‍රයාගේ; පැහැ, ප්‍රභාව; වසා, ඡාදනය කොට (මුව කොට); තෙදිය, භුවනත්‍රය; අසිරි, ආශ්චර්‍ය්‍යවූ; සිරි, ශොභාවෙන්; ගවසා, පුරා; මුනිරඟ, සර්‍වඥතනය; පවසාඑව්, ප්‍රකාශ කරමින්මෙන්; සුදු බුදුරුස්, (ඌණ්ණා දන්තනබ පඞ්කතීන් නිකුත්වන) සෙවත බුඩරශ්මිතෙමෙ; එදවසා, තද්දිනයෙහි; දුවයි, ධාවනය කරන්නේය.—

| | | |
|---|---|---|
| 426 | සුර මුනි පුද | ට ව න් |
| 5 | රතැටෙව් කර තල | ට ව න් |
| **මාජ්ඣ** | බුදුරුස් මිද | ට ව න් |
| **වණ්ණ.** | දුවයි මුළුසක්වළ එක | ට ව න් |

426 මුනි පුදට්වන්, සම්බුඩ පූජනය පිණිස; වන්, ප්‍රවිෂ්ටවූ; සුර, (බ්‍රහ්මයන් සහිත) දෙව සමූහයන්; තලට වන්, අග්නි ප්‍රවෙශවූ; රතැවෙව්කර, රත්නිකාසපින්වැනි විලාසයෙන් යුක්ත කොරෙමින්; මඳටවන්, (ශරීරයෙහි තත්තත්ස්ථානයෙන් නිකුත්වන) මාඤ්ජෂ්ඨවර්ණවූ; බුදුරුස්, බුඩරශ්මිතෙමෙ; මුළුසක්විළ, සකල චක්‍රවාලයෙහි; එකටවන්, ඒකාකාරවර්ණයෙන්; දුවයි, ධාවනය කරන්නේය.

427 ලොවතුරුනි සැම වන්
පාතෙව් එක්කොට ලෙ වන්
ගතිතෙමෙතෝ ස වන්
දුවයි පබසර කැලුම් රම වන්

6
ප්‍රභාස්වර
වර්ණ.

427 ලොවතුර, ලොකාභ්‍යන්තරයෙහි; ඇති, විද්‍යමාන වන්නාවූ; සැමවන්, සකල වර්ණයන්; එක්කොට. එකරාශි කොට; ලෙවන්, ලොකෂඩ්යාහට; පාතෙව්, දක්වන්නාක් මෙන්; එමෙතෝ සවන්, ඒමෙතෙත්‍රයසම්භුදයන්වහන්සේගේ; ගතින්, ශරිරයෙන්; රම්වන්, මනොරම්‍යවූ; පබසරකැලුම්, (ශරීරයෙහි තත්තත්ස්ථානයෙන් නිකුත්වන ඒ ප්‍රභාස්වර කාන්තිය; දුවයි, ධාවනය කරන්නේය.

428 වැදී ගොස් බව ගෙහි
කිම්ද නා ලොව එර හෙහි
විහිදී දසදි ගෙහි
දුවයි බුදුරුස් අසිරි සව ගෙහි

428 ගොස්, ගමනයකොට; භවගෙහි, භවාග්‍රයෙහි; වැදී, ප්‍රවිෂ්ටව; එරහෙහි, ඒ ආකාරයෙන්; නාලොව, නාගලොකයෙහි; කිම්ද, නිමග්නාවූ; දස දිගෙහි, දශදිගන්තයෙහි; විහිදී, ව්‍යාප්තවූ; අසිරි, ආශ්චර්යවූ; සවගෙහි, ෂඩ් වර්ගයෙහි; බුදුරුස්, බුඩරශ්මි තෙමෙ; දුවයි, ධාවනය කරන්නේය.

429 දින රෑ නොප මද
විසිපස්යොදුන් හැ මද
පබම්ඩල නො මද
දිලෙ මෛත්‍රේමුනිසඳුගෙ අ මද

429 හැමද, සර්වකාලයෙහි; නොපමද, ප්‍රමාද රහිතව; දින රෑ, දිවාරාත්‍රි දෙක්හි; විසිපස් යොදුන්, පංචවිංශති යොජනයක්; අමද, අමෘතදයිවූ; මෙතෝ මුනිසඳුගෙ, ඒ

මෛත්‍රෙයමුනීන්‍ද්‍රොත්තමයාගේ; පබමඩල, ප්‍රභාමණ්ඩලය; තොමද, අමන්‍දව; දිලෙ, භ්‍රාජමාන වන්නේය.—

430 අසෝකය බඹ දෙ ව්
දෙඅගසව් කෙලෙසුන් දෙ ව්
සඟ පිරිස් සඟ දෙ ව්
පිරිවරති මුනිමෙතේ දෙව් දෙ ව්

430 කොලෙසුන් දෙව්, කෙලශයන් ධොවනය කළාවූ; අසෝකය බඹදෙව්, අශොකය බ්‍රහ්මදෙවය යන; දෙඅගසව්, අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් ඇතුළුවූ; සඟපිරිස් සඟ, සංඝපර්ෂද් සමග්‍රව; දෙව්. දෙව් පිරිසක්; දෙව්දෙව්, දෙවාති දෙවවූ; මෙතේමුනි, මෛත්‍රෙයමුනීන්‍ද්‍රයාණන්වහන්සේ; පිරි වරති, පිරිවරාහැසිරෙන්නාහ.—

431 මහ තෙර කෙනෙක් සි හ
නම් යුත් ගරු උවටු සි හ
අනඳ මෙන් සැහැ සි හ
වේ මෙතේමුනිරදුට නර සි හ

431 සැහැසිහ, (අප) ශාක්‍යසිංහසර්ඥයන්වහන්සේට; අනඳ මෙන්, ආනන්‍දමහාස්ථවිරයන්වහන්සේ මෙන්; සිහ නම් යුත්, සිංහ යන නාමයෙන් ප්‍රසිඬවූ; ගරු, ගරුවූ; උවටු සිහ, අග්‍රඋපස්ථායක; මහතෙර කෙනෙක්, මහාස්ථවිරතුමෙක්; නරසිහ, ඒ නරශ්‍රෙෂ්ඨවූ; මෙතේ මුනිරදුට, මෛත්‍රෙයමුනි රාජොත්තමයාණන්ට; වේ, ඇති වන්නේය.—

432 නම් යුත් නො මා යා
සුමනාය පදු මා යා
අග සැවි ර මා යා
වෙත්ය දෙදෙනෙක් මුනිනු මා යා

432 නොමායා, මායාරහිතවූ නොහොත් අලාමකවූ; සුම නාය පදුමායා, සුමනාය පදුමාය යන; නම් යුත්, නාම යෙන් යුක්තවූ; අගසැවි දෙදෙනෙක්, අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙ නෙක්; රමායා, මනොරම්‍යවූ; මුනිනුමායා, මෛත්‍රෙයමුනි න්‍ද්‍රොත්තමයාණන්වහන්සේට; වෙත්ය, ඇති වන්නාහ.—

433 කුලනට සුතෙර ව න්
සැමරුවන් සිඳුමිණ ව න්
තුරුගණ තරිඳු ව න්
මෙලෙස එබුදුන් රුව සතග ව න්

433 කුලතට, සප්තකුල පර්වතයන්ට; සුමෙරුවන්, සුමෙරු පර්වතය මෙන්ද; සැමරුවන්, සකලරත්නයන්ට; සිතුමිණවන්, චින්තාමාණික්‍යය මෙන්ද; තුරුගණ, තාරකාසමූහයාට; තරිඳු වන්, චන්ද්‍රයා මෙන්ද; සත, සමස්ත සත්වයාහට; අගවන්, ශ්‍රෙෂ්ඨ වන්නාවූ; එබුදුන්රුව, ඒ මෛත්‍රෙය සර්වඥයන්වහන්සේගේ රූපප්‍රමාණය; මෙලෙස, වක්ෂ්‍යමාණාකාරයෙන්වන්නේය—

434

සිරි සර දෙපද පටන්, දස බල, දෙදණට දෙවිසිරියන්
එදෙදණ මඬල පටන්, සුනි මල්, නැබටද දෙවිසිරියන්
සුබ නැබ මඬල පටන්, මත කල්, අකුදු දෙවිසිරියන්
අකුදුතුවෙහි පටන්, උස් නිස්, හිසටවෙ දෙවිසිරියන්

431 දස බල, දශබලධාරිවූ (ඒ මෛත්‍රෙය සර්වඥයන් වහන්සේගේ); සිරිසර දෙපද පටන්, ශ්‍රීපද්මපාදවන්දයෙහි සිට; දෙදණට, දනහිස් යුගලට; දෙවිසිරියන්, වාවිංශත් රත්නයක්ද; එදෙදණමඬල පටන්, ඒ ජානුමඬලමය සිට; සුනිමල්, අතිනිර්මලවූ; සුබ, ශොභනවූ; නැබටද, නාභිමණ්ඩලය වද; දෙවිසිරියන්, වාවිංශත්රත්නයක්ද; නැබ මඬල පටන්, නාභිමණ්ඩලයෙහි සිට; මතකල්, මනඃකල්‍යවූ; අකුදු, අකුධාතුවටද; දෙවිසිරියන්, වාවිංශත් රත්නයක්ද; අකුදුතු වෙහි පටන්, අකුධාතුවෙහි සිට; උස්නිස්, උෂ්ණීෂශිර්ෂලක්ෂණ යෙන් යුක්තවූ; හිසට, ශිරොධාතුවටද; දෙවිසිරියන්, වාවිංශත් රත්නයක්; වේ, ඇති වන්නේය—

435

පුළුලුර දකුණ පටන්, වම් උර, යට පස් විසි රියනා
විදුලි දෙසක සිරි වන්, කන්පට, යුග සත් සත් රියනා
නිමල නිලිඳු දෙනු වන්, එක්එක්, දිසි පස් පස් රියනා
දෙබැම දෙඉඳු සැව් වන්, සිරි ගත, වෙත් පස් පස් රියනා

435 දකුණ උර පටන්, දක්ෂිණ වක්ෂඃස්ථලය සිට; වම් උරයට, වාමභාගවක්ෂඃස්ථලයට; පස්විසිරියනා, පංච විංශත් රත්නයක්; පුළුල, පෘථුල වේ; විදුලි දෙසක, විද්‍යුත්වයක; සිරිවන්, සොභායෙන් යුත්; කන්පට යුග, කර්ණ පට්ටමය; සත්සත් රියනා, සප්ත සප්ත රත්න ප්‍රමාණද; නිමල, නිර්මලවූ; නිලිඳු, ඉන්ද්‍රනීලමාණික්‍යාකාරවූ; දිසි, භ්‍රාජිතවූ; දෙනුවන්, නෙත්‍ර යුග්මය; එක්එක්, එක්එක්හි; පස්

පස් රියනා, පච පච රතන ප්‍රමාණද; දෙඉඳුසැව්වන්, ඉන්ද්‍ර චාප යුගලයක් වැනි; සිරිගත, ශ්‍රීසතවූ; දෙබැම, භ්‍රෑයුග්මය; පස් පස් රියනා, පච පච රතනප්‍රමාණද; වෙත්, වන්නේය—

436

දෙබැම පිතන තයනා, තරතුර, ගණිතින් පස් රියනා
ගහනත සත් රියනා, දෙඅදර. වෙත්පස් පස් රියනා
දිව්ද දස රියනා, වටකර, හිස විසි පස් රියනා
එමුවමඩල දුලනා, සඳපුර, වට විසි පස් රියනා

436 නයනා පිනනා, නෙත්‍ර ප්‍රීණනය කරන්නාවූ; දෙබැම, භ්‍රෑයුග්මය; අතරතුර, අන්තරයෙහි (හෙවත් දෙබැම අතර); ගණිතින්, සඞ්ඛ්‍යා ප්‍රමාණයෙන්; පස් රියනා, පචරතනප්‍රමාණද; ගහනත, නාසිකාව; සත්රියනා, සප්තරතන ප්‍රමාණද; දෙඅදර, අධර යුග්මය; පස් පස් රියනා, පච පච රතන ප්‍රමාණද; දිව්ද, ජිහ්වාධාතුව; දස රියනා. දශරතනප්‍රමාණද; හිස, ශිරොධාතුව; වටකර, හාත්පස්හි; පස් විසිරියනා, පචවිංශතිරතන ප්‍රමාණද; රන්වන්, සුවර්ණවර්ණවූ; සඳපුර, චන්ද්‍රයා මෙන්; දුලනා, බබළන්නාවූ; එමුවමඩල, ඒ ශ්‍රීමුඛමණ්ඩලය; වට, හාත්පස; පස් විසි රියනා, පංචවිංශතිරතන ප්‍රමාණද; වෙත්, වන්නේය—

437

ගෙලද රන බෙර වන්, විසිපස්, රියන් උස්ව වට වන්
දෙඅත් කල්ප සා වන්, හතලිස්, රියන් බැගින්දිගු වන්
දෙඅතුල් මුදුරතු වන්, පස් පස්, රියන් මෙතේබුදු වන්
දෙපද පියුම් දිගු වන්, එතෙලෙස්, රියන ටලොසගුල් වන්

437 මෙතේබුදු ඒ මෛත්‍රෙයසම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයාණන්වහන්සේගේ; රන බෙරවන්, සුවර්ණභෙරියක් බඳුවූ; ගෙලද, ග්‍රීවාධාතුව; පස්විසිරියන්, පචවිංශතිරතනයක්; උස්ව, ප්‍රාංශුත්වය ඇතිව; වට වන්, වෘත්ත වන්නේය; කල්ප සාවන්, කල්පද්‍රැමශාඛාවන් බඳුවූ; දෙඅත්, හස්තමත් දය; හතලිස් රියන් බැගින්, රතන චත්වාරිංශත් චත්වාරිංශත් භාගයෙන්; දිගුවන්, දීර්ඝ වන්නේය; මුදු, මෘදුලවූ; රතුවන්, රක්ත වර්ණවූ; දෙඅතුල්, අතුල් යුගලය; පස්පස් රියන්වන්, රියන් පසක් පසක් ප්‍රමාණ වන්නේය; දෙපද පියුම්, ශ්‍රීපද්ම පාදවන්දය; එතෙලෙස් රියන්ද, ඒ ත්‍රයොදශරතනයක්ද; අට ළොසඟුල්වන්, අෂ්ටාදශඅඞ්ගුලයක් හෙවත් එක්වියත් සාඟුලක්ද වන්නේය—

438

තු න් ත ල ටෙක කි ර ණා, අ ස දි ස, නන් බඹ සුරව ර ණා
පි න් දු ල හිමි ස ර ණා, ව න ස ත, බවදුකු සාරහ ර ණා
ම ං ග ල සක ස ර ණා, අ ට ං සු, රියනුස් බඳ පු ර ණා
බු න් කා ල මර දෙරණා, සුදනෙනි, කරවි පසක්ස ර ණා

438 සුදනෙනි, සජ්ජනයෙනි; තුන්තලට, ජගත්‍රයට; එක කිරණා, අසහාය ආලෝකයක් වන්නාවූ; නන්, නොයෙක්; බඹ, බ්‍රහ්මයන්ටද; සුරවරණා, සුරශ්‍රෙෂ්ඨයන්ටද; අසදිස, අසදෘශවූ; පින්දුල, ශතපුණ්‍යශ්‍රියෙන් බබළන්නාවූ; මංගල සක සරණා, කල්‍යාණවූ චක්‍රලක්ෂණොපෙතවූ ශ්‍රිපාදචන්‍දයක් ඇත්තාවූ; අසූඅටරියන්, අෂ්ටාශිතිහස්ත ප්‍රමාණවූ; උස්, ප්‍රාංශුත්වය ඇති; බඳ පුරණා, පරිපූර්ණ බුඩකායෙන් යුක්තවූ; හිමි, ස්වාමීන්ද්‍ර තෙමෙ; දෙරණා, මේ ධරණීතලයෙහි; මරබුන් කල, සම්‍යක්සම්බුඩවූ කල්හි; සරණා, නිර්වාණය; පසක් කරවි, ප්‍රත්‍යක්ෂ කරවි.

**දශමසර්ගය සමාප්තයි.**

———o:o———

439

දි නි දු න් වර මොහොනබිද න් ලද
එ නි ව න් සැප දුරුර ලමි න් බව
ව දි මි න් ලොව සතට පෙමිණ බුදුවන විවරණ ලබ මි න්

අසෙ කි න් කප්ලක්සොළොසි න් දුන්
ව ර මි න් දගසක් මරබු න් දස
පෙරුම න් පුරමින් ඉස් ඇස් මස් ලේ සුතනඹුද දෙ මි න්

දි න මි න් බිඳ ඔදුර මරු න් මන්
ද නි මි න් සව්නෝද යෙහෙ න් මොක්
දෙනතු න් තල සත මතු බුදුවම මෙතෝමුනිඳු අග මි න්

වෙසෙසින් මෙහි වනානදසි න් සිතු
සු ප ස න් මාවැර සමව න් නැන
ක ළු දු න් මහසත් කල නිමනට සමුදුර ගොඩකර මි න්

439 මොහොතබිදන්, මුහූර්තාභිධෙයවිශ්‍රැත; දිනිඳුන් වර, ජිනෙන්ද්‍රොත්තමයාණන්ගේ ශාසනයෙහිදී; ලද, හස්තප්‍රාප්ත කළ; එතිවන් සැප, ඒ නිර්වාණසෞඛ්‍ය සම්පත්තිය; ලොව සතට, ලොක සත්ත්වයාකෙරෙහි (පතළාවූ); පෙමින, කරුණායෙන්; දුරුරලමින්, දූරිභූත කරමින්; බුදුවන, සම්‍යක් සම්බුදුවන පිණිස; විවරණ, (නියත) ව්‍යාකරණශ්‍රිය; ලබමින්, ප්‍රතිලබ්ධ කරමින්; බව, සංසාරයට; වදිමින්, ප්‍රවිෂ්ටවූ; ඉන්, එයින්; කප්ලක්සොළොස්අසෙකින්, ෂොඩශාසඞ්ඛ්‍යකල්ප ලක්ෂයක්තුළ; ඉස් ඇස් මස් ලේ, ස්වකීය ශීර්ෂ නෙත්‍ර මාංස හා රුධිරද; සුතන් අඹුන්ද, ස්වකීය පුත්‍රයන්හා අඞ්ගනාවන්ද; දෙමින්, දානය කරමින්; දසපෙරුමන් පුරමින්, දශපාරමී ධර්මයන් පරිපූර්ණ කරමින්; (ඒකාලය තුළ) දහසක් මරබුන්, සහස්‍රසඞ්ඛ්‍යාත බුදුවරයන් විසින්; දුන්, දෙනලද; වරමින්, ව්‍යාකරණශ්‍රියෙන්ද යුක්තව; මරුමන්, මාරයාගේ එඩියෙහි; ඔද, ඔජොගුණය; හැර, වර්ජිත කොට; බිඳ, භග්න කොට; දිනමින්, ජයග්‍රහණය කරමින්; සව්නේද, සකලඥෙයමණ්ඩලයද; යෙහෙන්, මොනවට; දනිමින්, ජානනය කරමින්; මතු බුදුවම, අනාගතයෙහි ලොවුතුරා බුදුව; තුන්තල සත, ජගත්ත්‍රයවාසීන්හට; මොක්දෙන, නිර්වාණය ලබාදෙන්නාවූ; මෙතේමුනිඳු, මෛත්‍රෙයමුනීන්ද්‍රයාණන්වහන්සේගේ; අගමින්, අග්‍රවූ බුඬඣත්වය; මෙහි, මෙතැන්හි (හෙවත් මෙතැන් පටන්); වෙසෙසින්, විශෙෂයෙන්; වනන, වර්ණනා කෙරෙමැයි යන; සුපසන්, සුප්‍රසන්නවූ; සිතුඅදහසින්, චිත්තාධ්‍යාශයෙන් යුක්තවූ; මාවැර, අසමත්හුගේ වීර්‍ය්‍යය (කෙබඳුද යතහොත්); කළඳුන්, කළඳකවූ; මහසත්, අප මහාබොධිසත්ත්වයන්වහන්සේ විසින්; සමුදුර, මහාසමුද්‍රය; ගොඩකරමින්, ස්ථලභූමියක් කොට; නිමනට, නිමා කරනු පිණිස; කළ, කළාවූ; නැත, උත්සාහය; සමවන්, සමානවන්නේය.—

440 ලොවගුරු අසුර ගුරු
සක් වෙනු ගණිඳු සුර ගුරු
තෙදියත සකල ගුරු
නැණින් පසුබා මෙතේලොව ගුරු

440 මෙතේලොවගුරු, මෛත්‍රෙයලොකාචාර්‍ය්‍යයන්වහන්සේ; ලොවගුරු, මහාබ්‍රහ්මයා; අසුරගුරු, අසුරාචාර්‍ය්‍යය හෙවත් ශුක්‍රයා; සක්, ශක්‍රයා; වෙනු, විෂ්ණුයා; ගණිඳු, ගණෙශ්වරයා; සුරගුරු, සුරාචාර්‍ය්‍යය හෙවත් වෘහස්පතිය යනාදී; තෙදියත, ජගත්ත්‍රයෙහි (ඇතිවන්නාවූ); සකලගුරු, සියලුමආචාර්‍ය්‍යවරයන්; නැණින්, ඥානයකාරණ කොටගෙන; පසුබා, පශ්චාත්භූත කොට;—(මතුකව හා කුලකයි.)

441 සව්නේ ගෙවී මෙන්
නොනැවතම හැඳිනි මෙන්
නැණිනෙකලු කර මෙන්
වැජඹෙ තෙදියට එකහිරුහු මෙන්

441 සව්නේ, සකලඥෙයමණ්ඩලය; ගෙවීමෙන්, අවසන් කොට; නොනැවතම, අනිවෘත්තව හෙවත් ආවරණ රහිතවම; හැඳිනීමෙන්, විජානනය කිරීමෙන්; නැණින (අනාවරණ) ප්‍රඥ යෙන්; එකලු කරමෙන්, එකාලොක කිරීමෙන්; තෙදියට, ජගත්ත්‍රයට; එකහිරුහු මෙන්, අසහාය සූය්‍යීක්හුසේ; වැජඹෙ, විජෘම්භමාණ වන්නේය.

412 අටපිරිස් මැ ද්දේ
නොබා සිහලෙස ස ද්දේ
දෙසන දම් සු ද්දේ
ලොවෙක වියතෙක මුනිඳුසි ද්දේ

442 අටපිරිස් මැද්දේ, අෂ්ටපර්ෂද් මධ්‍යයෙහි; සිහලෙස, සිංහරාජයකු මෙන්; නොබා, අභීතව; සද්දේ, අෂ්ටාඞ්ග බ්‍රහ්ම ස්වරයෙන්; සුද්දේ, පරිශුද්ධවූ; දම්, ශ්‍රීසද්ධර්මය; දෙසන, දෙශනා කරන්නාවූ; සුසිද්දේ, සුපරිනිෂ්පන්නාවූ; මුනි; ඒ (මෛත්‍රෙය) සර්වඥරාජොත්තමයාණන්වහන්සේ; ලොව, ලොක යෙහි; එක වියතෙක, අසහාය ව්‍යක්ත තැනන්වහන්සේය.

1. අටපිරිස්. අෂ්ටපර්ෂද්.

1 ක්ෂත්‍රිය. 2 බ්‍රාහ්මණ. 3 ගෘහපති. 4 ශ්‍රමණ.
5 චාතුර්මහාරාජිකදෙව. 6 තාවතිංස දෙව. 7 මාර දෙව.
8 බ්‍රහ්ම.

443 තෙදියෙක ගුරු වන්
දෙකොළ නොවූ දම් අග වන්
දෙසනා මග නි වන්
තෙවිදු සිව්වෙසරදින් රම වන්

443 දෙකොළ, උභයාන්තයට; නොවූ, අප්‍රාප්තවූ; අග වන්, අග්‍රවූ; නිවන්, නිර්වාණයට; මඟ, (මධ්‍යමප්‍රතිපදා) මාර්ග සංඛ්‍යාතවූ; දම්, ශ්‍රීසද්ධර්මය; දෙසනා, දෙශනා කරන්නාවූ; තෙදියට, ජගත්ත්‍රයට; එකගුරුවන්, අසහාය ආචාය්‍ර්යවූ (මෛ

තෙත්‍රය මුනීන්ද්‍රයාණන්වහන්සේ); තෙවිදු, ත්‍රිවිද්‍යායෙන් හා; සිව්වෙසරදින්, චතුර්වෛශාරද්‍යඥානයෙන්; රමවන්, මනෝරම්‍ය වනසේක

### 1. දෙකෙළ.

කාමසුඛල්ලිකානුයෝග අත්තකිලමථානුයෝග සඞ්ඛ්‍යාතවූ හෝ ශාශ්වත උච්ඡේද සඞ්ඛ්‍යාතවූ හෝ උභොඅන්තයයි.

1. කාමසුඛල්ලිකානුයෝග:—
   අනර්ථ එළවන කාම සැපයෙහි යෙදීම.

2. අත්තකිලමථානුයෝග:—
   අනර්ථ එළවන ආත්මක්ලාන්තයෙහි යෙදීම.

1. ශාශ්වත:—
   ආත්මය සදාකාලිකය, පෙරලෙනසවභාවක් නොමැත්තේය යන මිථ්‍යා කල්පනාව.

2. උච්ඡේද:—
   ඇති ආත්මය පුනරුත්පත්තියක් නොලැබ සිඳේය යන මිථ්‍යා කල්පනාව

### 2. තෙවිදු.

1 පෙරවිසූ ජාති දන්නා පූර්වේනිවාසානුස්මෘතිඥානය.
2 සත්වයන්ගේ චුති උත්පත්ති දන්නා දිව්‍යචක්ෂුරභිඥානය
3 කාමාදිආශ්‍රවයන් ක්ෂයකරන ආශ්‍රවක්ෂයකරඥානය

### 3. සිව්වෙසරද. චතුර්වෛශාරද්‍යඥානය.

1 තථාගතයන්වහන්සේගේ සම්‍යක්සම්බුද්ධභාවයට විරුද්ධව කරුණු සහිතව ප්‍රතිචෝදනා කරන්ට හැකි කෙනෙක් නැතිබැව් දැකීමය.

2 එසේම තථාගතයන්වහන්සේ කාමාදිආශ්‍රවයන් ක්ෂයකළ බවටද—

3 තථාගතයන්වහන්සේ විසින් නියම කරනලද අන්තරායකර ධර්මයන්ගේ නියමයටද—

4 තථාගතයන්වහන්සේ විසින් නියම කරනලද පිළිපැදීමෙහි පිළිපදින්නාහුගේ අභිමතවූ දුක්නැසීමටද විරුද්ධවකාරණු සහිතව වාදකාරයන් නොමැතිබැව් දක්මය—

**444 පස්ගති දත්නැ ණෙන්**
**සසාදුරණ නුව ණෙන්**
**එබොජග සත්පැ ණෙන්**
**අටග මඟ නව ලොවුතුරු නැණෙන්**

444 පස්ගති, පචගතිය; දත්, ජානනය කළාවූ; නැණෙන්, ඥානයෙන්ද; සසාදුරණ නුවණෙන්, ෂඩ්අසාධාරණ ඥානයෙන්ද; එ, ඒ; බොජඟසත්, සප්තබොධ්‍යඞ්ගයන්; (විජානනය කළ) පැණෙන්, ඥානයෙන්ද; අටහමඟ, අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි (ප්‍රවෘත්ත වූ ඥානයෙන්ද); නවලොවුතුරු නැණෙන්, නවලොකොත්තර ධර්මයන්හි (ප්‍රවෘත්තවූ) ඥානයෙන්දඃ—

(මෙතැන් සිට අටකවකින් කුලක බන්ධනයවේ.)

1. පස්ගති. පචගතිය.

1 නිරය ගති. 2 තිරච්ඡානයොනි ගති. 3 පෙත්තිවිසය ගති. 4 මනුස්ස ගති. 5 දෙව ගති (මෙහි දෙව ගතියට බ්‍රහ්ම ගති යත් ඇතුළත්වේ )

2 සසාදුරණ නුවණ. ෂඩ්අසාධාරණඥානය.

1 සත්‍වයන්ගේ ශ්‍රාද්ධාදිඉන්ද්‍රිය මූකළ නොකළ බැව්දන්නා—
ඉන්ද්‍රියපරොපරියත්තඤාණය.

2 සත්‍වයන්ගේ අදහස් ආදිය දන්නා—ආසයානුසයඤාණය.

3 යමාමහපෙළහර කිරීම දන්නා—යමක පාටිහීරඤාණය.

4 මහත් කරුණාවෙන් සත්‍වයන් දක්නා—
මහාකරුණා සමාපත්තිඤාණය.

5 සියල්ල දන්නා—සබ්බඤ්ඤුතඤාණය.

6 වැසීමක් නැතුව දකිම්වූ—අනාවරණඤාණය.

(මේ ඤාණසය ශ්‍රාවකයන්ට අසමානවපැවති බැවින් අසාධාරණඤාණයි.)

## 3. සත් බොජඟ. සප්ත බොධ්‍යඞ්ගය.

| | |
|---|---|
| 1 සති සම්බොජ්ඣඞ්ගය | (බොධ්‍යඞ්ග සඞ්ඛ්‍යාතවූ) සිහිය. |
| 2 ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය | -එම- ප්‍රඥව. |
| 3 විරිය සම්බොජ්ඣඞ්ගය | -එම- වීය්‍යය. |
| 4 පීති සම්බොජ්ඣඞ්ගය | -එම- ප්‍රීතිය. |
| 5 පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය | -එම-කෙලෙස් සන්සිඳීමෙන් සිත කය සන්සුන්බව. |
| 6 සමාධි සම්බොජ්ඣඞ්ගය | -එම-සිත එකඟව පැවතිබව |
| 7 උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය | -එම-මධ්‍යස්ථ භාවය. |

## 4. අටඟමඟ. අෂ්ටාඞ්ගික මාර්‍ගය.

| | |
|---|---|
| 1 සම්මා දිට්ඨි | මිථ්‍යා දෘෂ්ටියට ප්‍රතිපක්ෂවූ යහපත් දෘෂ්ටිය |
| 2 සම්මා සංකප්ප | මිථ්‍යා කල්පනාවට —එම—කල්පනාව |
| 3 සම්මා වාචා | මිථ්‍යා වචනයට —එම—වචනය |
| 4 සම්මා කම්මන්ත | මිථ්‍යා කර්මාන්තයට —එම--කර්මාන්තය |
| 5 සම්මා ආජීව | මිථ්‍යා ආජීවයට ප්‍රතිපක්ෂවූ යහපත් ආජීවය හෙවත් ජීවිකාව. |
| 6 සම්මා වායාම | මිථ්‍යා ව්‍යායාමයට ප්‍රතිපක්ෂවූ යහපත් ව්‍යායාමය හෙවත් උත්සාහය. |
| 7 සම්මා සති | මිථ්‍යා සමෘතියට ප්‍රතිපක්ෂවූයහපත් සමෘතිය හෙවත් සිහිය. |
| 8 සම්මා සමාධි | මිථ්‍යා සමාධියට ප්‍රතිපක්ෂවූ යහපත් සමාධිය හෙවත් සිත එකඟකිරීමයනඅටයි. |

## 5. නවලොවුතුරා නැණ.

1 සොවාන් මාර්‍ගය. 2. සොවාන් ඵලය. 3. සකෘදගාමි මාර්‍ගය 4 සකෘදගාමි ඵලය 5 අනාගාමි මාර්‍ගය. 6 අනාගාමි ඵලය. 7 අර්හත් මාර්‍ගය. 8 අර්හත් ඵලය. 9 නිර්වාණය—යන නව ලොකොත්තරධර්මයන් දත් ඥනය.

145 එකොලොසක් මෙහෙ ප ල
දත් දසබල නැණස ප ල
දෙලොසැම පස නැ ප ල
දුහග කෙලෙසද මිනූ සුබ ප ල

445 දස බල නැණ, දසබලඥාණ යෙන්ද; සපල, සඵලවූ නොහොත් යුක්ත වන්නාවූ; මෙත්පල එකොළොසක්, මෛත්‍රී ඵල එකාදශකය; දත්, ජානනය කළාවූ; තැපල, චපලවූ නොහොත් අනිත්‍යවූ; දෙළොස, මාදශාඞ්ගයක්වූ; ඇමපස, සකල ප්‍රත්‍යයාකාරයද; සුබපල, ශොභනවූ ඵලඇති (හෙවත් නිර්වාණශ්‍රිය ආදිසියලු සුභඵල ගෙනදෙන්නාවූ); දුහගතෙළ සද, ත්‍රයොදශ ධුතාඞ්ගයන්ද; මිනූ, ප්‍රමාණ කළාවූ:—

1 දසබල නැණ. දශබල ඥාණය.

1 වියහැකිනොවිය හැකිදේ දන්නා—ඨානාඨාන ඥාණය.
2 කර්මවිපාක දන්නා—විපාක ඥාණය
3 සියලු ගතිවලට හා නිවනට පමුණුවන මාර්ගප්‍රතිපදා දන්නා—සබ්බත්ථගාමිනී ඥාණය
4 සත්වයන්ගේ ධාතුවිශෙෂ දන්නා—අනෙකධාතු ඥාණය.
5 සත්වයන් සංසන්දනයවන චරිත දන්නා—අධිමුක්ති ඥාණය.
6 නියුණුවූද මෘදුවූද ඉන්‍ද්‍රිය පිළිවෙළ දන්නා—ඉන්‍ද්‍රිය පරොපරියත්ත ඥාණය.
7 ධ්‍යානාදීන්ගේ කෙලසිලි පිරිසුදුවීම දන්නා—ඣානාදි සංකෙලසදි ඥාණය.
8 පෙරවිසූ ජාතිදන්නා—පුබ්බෙනිවාසානුස්සති ඥාණය.
9 සත්වයන්ගේ චුතිඋත්පත්ති දන්නා—දිබ්බචක්ඛු හෙවත් චුතූපපාත ඥාණය
10 කාමාදීන් ක්‍ෂයකරන—ආසවක්ඛයකරඥාණය.

2 මෙත්පල එකොළොස. මෛත්‍රීඵල එකාදශකය.

1 සුවසේ නිදීම
2 සුවසේ පිබිදීම.
3 නපුරුසිහ නොදැකීම.
4 මිනිස්නට ප්‍රියවීම.
5 අමනුෂ්‍යයන්හට ප්‍රියවීම
6 දෙවියන් විසින් ආරක්‍ෂා කරනු ලැබීම.
7 ශරීරයෙහි ගිනිවිෂ ශස්ත්‍ර නොවැදීම.
8 සිත සමාධිවීම.
9 මුඛ වර්ණප්‍රසාදයඇතිවීම.
10 නුමුළාවූසිහියෙන්කාලක්‍රියා කිරීම.
11 ඉහාත්මභාවයෙහි රහත් ඵලයට නොපැමිණුණොත් ආයුෂ යාගේ ගෙවීමෙන් බ්‍රහ්මලොක යෙහි ඉපදීම.

## 3. ඇමපස. සකල ප්‍රත්‍යයාකාරය.

1 අවිජ්ජාපච්චයා සඞ්ඛාරාː—

අවිද්‍යා ප්‍රත්‍යයෙන් හෙවත් නොවින්ද යුතු කායදුශ්චරිතාදිය විඳින්නාවූ පැමිණිය යුතු කායසුචරිතාදියට නොපැමිණෙන්නාවූ චතුරාර්‍ය්‍ය සත්‍යාදිධර්මයන්ගේ සත්‍යාර්ථාදිය දැනගන්ට නොදෙන්නාවූ විද්‍යාවට ප්‍රතිපක්‍ෂවූ මූලාවශයෙන් පවත්නා අවිද්‍යාවයයි කියනලද නුනුවණ හෙතුකොට ගෙන, පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභිසංස්කාරය ආනෙඤ්ජාභිසංස්කාරය යන ලෞකික කුශලාකුශල චෙතනාවෝ වෙත්.

2 සඞ්ඛාරපච්චයා විඤ්ඤාණංː—

මේ පුණ්‍යාභිසංස්කාරාදීන්ගේ හෙතුවෙන් ප්‍රතිසන්ධිචිත්ත සඞ්ඛ්‍යාත විඥානයවේ.

3 විඤ්ඤාණපච්චයා නාමරූපංː—

ප්‍රතිසන්ධිචිත්තසඞ්ඛ්‍යාතවිඥානයාගේ හෙතුවෙන් නාමරූපයවේ.

4 නාමරූපපච්චයා සළායතනංː—

නාමරූපයන්ගේ හෙතුවෙන් චක්‍ෂුශ්ශ්‍රොත්‍ර ඝ්‍රාණ ජිහ්වා කාය මනස් යන ආධ්‍යාත්මික ෂඩායතනයවේ.

5 සළායතනපච්චයා ඵස්සොː—

ෂඩ්විධආයතනයන්ගේ හෙතුවෙන් චක්‍ෂුඃ ශ්‍රොත්‍රඝ්‍රාණ ජිහ්වාකාය මනඃසඞ්ඛ්‍යාත ෂඩ්වාරිකස්පර්ශයවේ.

6 ඵස්සපච්චයා වෙදනාː—

චක්‍ෂුරාදිෂඩ්වාරිකස්පර්ශයාගේ හෙතුවෙන් සුඛ දුඃඛ උපෙක්‍ෂා වශයෙන්ත්‍රිවිධ වෙදනාවවේ.

7 වෙදනාපච්චයා තණ්හාː—

ත්‍රිවිධවූවෙදනාවන්ගේ හෙතුවෙන් කාමාදිතෘෂ්ණාවවේ.

8 තණ්හාපච්චයා උපාදානංː—

තෘෂ්ණාවගේ හෙතුවෙන් අරමුණු දැඩිකොට ගැනීම් ලක්‍ෂණකොට ඇති කාමාදිඋපාදානයවේ.

9. උපාදානපච්චයා භවොː—

කාමාදිඋපාදානහෙතුවෙන් කර්මභවය උපපත්තිභවයයන දෙවැදෑරුම්භවයවේ.

10 භවපච්චයා ජාති;—

කම්භවයාගේ හෙතුවෙන් ඒ ඒ භවයෙහි ස්කන්ධයන්ගේ පහළවීමයයි කියනලද ජාතියවේ.

11 ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති:—

ජාතිහුගේ හෙතුවෙන් හෙවත් සත්‍වයන්ගේ උත්පත්තිය හෙතුකොට ගෙන ජරාවහා මරණයද ශොකයද වැලපීමද කායිකදුඃඛයද දෞර්මනස්ද දැඩිවූ චිත්තායාසයද යන මොහු ඇතිවෙත්=(නැවත නැවත උපදිත්.)

12 එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොතීති:—

මෙසේ මේ කියනලද්දවූ අමිශ්‍රවූ (සියලු) දුඃඛරාශිහුගේ පහළවීම—ඉපදීමවේ.

## 4. දුහතෙළස. ත්‍රයොදශ ධූතාඞ්ගයෝ

| | |
|---|---|
| 1 පාංශුකූලිකාඞ්ගය | සොහොන් ආදී ඒ ඒ තැනින් අවුලා ගන්නාලද කඩපිළියෙන් කළ සිවුරු ප්‍රයොජන ගැන්ම. |
| 2 තෙචීවරිකාඞ්ගය | තුන්සිවුරුපමණක් දැරීමෙන් ප්‍රයොජන ගැන්ම. |
| 3 පිණ්ඩපාතිකාඞ්ගය | පිඬුසිඟායාමෙන් දිවිපැවැත්ම. |
| 4 සපදානචාරිකාඞ්ගය | අතරතුර කඩ නොකොට ගෙපිළිවෙළින් පිඬුසිඟීම. |
| 5 එකාසනිකාඞ්ගය | එකම ආසනයක හිඳවැළඳීම. |
| 6 පත්තපිණ්ඩිකාඞ්ගය | එකාවපාත්‍රයටලැබුණුදෙයක් පමණක් වැළඳීම. |
| 7 ඛලුපච්ඡාභත්තිකාඞ්ගය | වළඳා අවසන්වූවාට පසු නැවත නැවත කැපකරවා නොවැළඳීම. |
| 8 ආරඤ්ඤිකාඞ්ගය | ගම්න්දුනුපන්සියයක් දුරවන යෙහි විසීම. |
| 9 රුක්ඛමූලිකාඞ්ගය | වෘක්ෂමූලයෙහි විසීම. |
| 10 අබ්භොකාසිකාඞ්ගය | ආවරණයක්නැති අභ්‍යවකාශයෙහි විසීම. |
| 11 සොසානිකාඞ්ගය | සොහොනෙහි විසීම. |
| 12 යථාසන්ථතිකාඞ්ගය | තමාට පැමිණි සෙනස්නෙන් සතුටුවීම |
| 13 නෙසජ්ජිකාඞ්ගය | සයනයෙන් තොරව හිඳීම, සිටීම, ගමන යන තුන්ඉරියව් වෙන්විසීම. |

446 බුදුනැණද තුදු සක්
එසරණ දම් පසලො සක්
සිත්සණරුවා සක්
එසතලොස් නාපන්සිසොළොස සක්

446 තුදුසක් බුදුනැණද, චතුර්දශ බුඩඥනයෙන් හා; පස ලොසක්, පංචදශකයක්වූ; එ සරණ දම්, ඒ චරණධර්මයෙන්ද යුක්තවූ; රුවා, (විඥප්ති ලක්ෂණ ව්‍යතිරික්ත) රූපධර්මයන්ගේ ආයුෂවූ; එසතලොස් සිත්සණ සක්, ඒ සප්තදශ චිත්තක්ෂණ චක්‍රයන්ද; සොලොස, ෂොඩශ විධවූ; නාපන්සි, ආනාපාන සමෘතීන්ද,—

## 1. තුදුසක් බුදුනැණ. චතුර්දශ බුඩඥනය.

"දුක්ඛෙ ඤාණං, දුක්ඛ සමුදයෙ ඤාණං, දුක්ඛ නිරොධෙ ඤාණං, දුක්ඛ නිරොධගාමිනියා පටිපදය ඤාණං, අත්‍ථ පටිසම්භිද ඤාණං, ධම්ම පටිසම්භිද ඤාණං, නිරුත්ති පටිසම්භිද ඤාණං, පටිභාන පටිසම්භිද ඤාණං,—"

1. දුක් මේ මේ යයි කියා දන්නා ඥනය.
2. දුක් ඉපදීමට හෙතු කාරණා මේ මේ යයි දන්නා ඥනය.
3. දුඃඛ නිරොධය මේ යයි දන්නා ඥනය.
4. ඒ දුඃඛ නිරොධයට ප්‍රතිපත්තිමාර්ග මේ යයි දැනගන්නා ඥනය.
5. සියලු අර්ථයන් දැනගන්නා ඥනය.
6. සියලු ධර්මයන් එම
7. සියලු නිරුත්තික්‍රම එම
8. සියලු ප්‍රතිභානයන් , එම

යන ශ්‍රාවකසාධාරණවූ ඥාන අට හා පෙරකී ෂඩ්අසාධාරණ ඥානයෝද තුදුස් බුඩඥානයෝ වෙත්.

## 2. සරණ දම්. චරණධම්මයෝ.

1 උත්තම සිලය.
2 ඉන්ද්‍රිය සංවරය.
3 භොජනයෙහි ප්‍රමාණ දැනීමය
4 නිද්‍රාදුරුකිරීමෙහි යෙදීමය.
5 ශ්‍රද්ධාවය.
6 පවට පිළිකුල් කිරීමය.
7 පවට භයවීමය.
8 බහුශ්‍රැත භාවය.
9 පරාක්‍රමය.
10 සිහිය.
11 ප්‍රඥාවය.
12 ප්‍රථමධ්‍යානය.
13 ද්විතියධ්‍යානය.
14 තෘතියධ්‍යානය.
15 චතුර්ථධ්‍යානය—යනමොහුයි.

## 3. තාපන්සි. ආනාපානසමෘති.

1. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති—
දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති—

දිඝිකොට අශ්වාසකරන්නෝ දීඝීකොට ආශ්වාස කරන් නෙමියි දැන්ම—
දිඝිකොට ප්‍රශ්වාස කරන්නෝ දීඝීකොට ප්‍රශ්වාස කරන් නෙමියි දැන්ම.

2. රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති—
රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති—

ලුහුඬුකොට ආශ්වාස කරන්නෝ ලුහුඬුකොට ආශ්වාස කරන්නෙමියි දැන්ම—
ලුහුඬුකොට ප්‍රශ්වාස කරන්නේ ලුහුඬුකොට ප්‍රශ්වාස කරන්නෙමියි දැන්ම.

3. සබ්බකායපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති—
සබ්බකායපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති—

සියලු ආශ්වාස කායයාගේ උත්පත්තික්‍රමාදිය විශෙෂයෙන් දන්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—
සයලු ප්‍රශ්වාස කායයාගේ උත්පත්තික්‍රමාදිය විශෙෂයෙන් දන්නේ ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

4. පස්සම්භයං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති—
පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති—

ඔළාරිකකායසංස්කාරයන් සංසිඳුවන්නේ ආශ්වාස කරන් නෙමියි හික්මෙන්නේය—

ඔළාරික එම එම ප්‍රශ්වාස එම

5. පීතිපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති—
පීතිපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති—

ප්‍රීතිය විශෙෂයෙන් දන්නේ ආශ්වාස කරන්නෙමියි හික් මෙන්නේය—

ප්‍රීතිය එම එම ප්‍රශ්වාස එම

6. සුඛපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති—
සුඛපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති—

සුඛය විශෙෂයෙන් දන්නේ ආශ්වාස කරන්නෙමියි හික් මෙන්නේය—

සුඛය එම එම ප්‍රශ්වාස එම

7. චිත්තසංඛාරපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති—
චිත්තසංඛාරපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති—

චිත්තසංස්කාරයන් විශෙෂයෙන් දන්නේ ආශ්වාස කරන් නෙමියි හික්මෙන්නේය—

චිත්ත එම එම ප්‍රශ්වාස එම

8. පස්සම්භයං චිත්තසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති—
පස්සම්භයං චිත්තසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති—

චිත්තසංස්කාරයන් සංසිඳුවන්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

චිත්ත එම එම ප්‍රශ්වාස එම

9. චිත්තපටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛති—
චිත්තපටිසංවෙදී පස්සසිස්සාමීති සික්ඛති—

චිත්තය විශෙෂයෙන් දන්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

චිත්තය එම එම ප්‍රශ්වාස එම

10. අභිප්පමොදයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති—
අභිප්පමොදයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති—

චිත්තය විශෙෂයෙන් සතුටු කරවන්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

චිත්තය එම එම ප්‍රශ්වාස එම

11. සමාදහං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති—
සමාදහං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති—

සිතමනාකොට එකඟ කරන්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

සිත එම එම ප්‍රශ්වාස එම

12. විමොචයං චිත්තං අස්සසිස්සාමීති සික්ඛති—
විමොචයං චිත්තං පස්සසිස්සාමීති සික්ඛති—

සිත කෙලෙසුන් කෙරෙන් මුදන්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

සිත එම එම ප්‍රශ්වාස එම

13. අනිච්චානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති—
අනිච්චානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති—

අනිත්‍යය නැවත නැවත දක්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

අනිත්‍යය එම එම ප්‍රශ්වාස එම

14. විරාගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති—
විරාගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති—

විරාගය නැවත නැවත දක්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

විරාගය එම එම ප්‍රශ්වාස එම

15. නිරොධානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති—
නිරොධානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති—

නිරොධය නැවත නැවත දක්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය—

නිරොධය එම එම ප්‍රශ්වාස එම

16. පටිනිස්සග්ගානුපස්සී අස්සසිස්සාමීති සික්ඛති—
පටිනිස්සග්ගානුපස්සී පස්සසිස්සාමීති සික්ඛති—

පටිනිස්සග්ගය (මිදුම්) නැවත නැවත දක්නේ ආශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය-

පටිනිස්සග්ගය නැවත නැවත දක්නේ ප්‍රශ්වාස කරන්නෙමියි හික්මෙන්නේය.

(මේ සොළොස්වාරයෙහි ආශ්වාස ප්‍රශ්වාස සම්බන්ධි සොළොසක් සමෘතිහු ෂොඩශවිධ ආනාපානාසමෘතිහුවෙත්.)

4. රුවා. රූපායුෂ.

විඥප්ති රූප ලක්ෂණරූපයන් හැර අවශෙෂ රූපධර්මයන්ගේ ආයුෂවූ චිත්තක්ෂණයෝ සතොළොස් දෙනමෙහි සප්තදශ චිත්තක්ෂණයෝවෙත්—

447 අටළොස් බුදුද　　　මැ ති
උනුවිසිනැණ සැලකු　　　මැ ති
එවිසිදිටු වස　　　මැ ති
පසසෙ සමතිස් පෙරුම් දනු මැ ති

447 අටළොස් බුදුදම් අෂ්ටාදශ (ආවෙණික) බුඩධර්මයන්ද; ඇති, ඇත්තාවූ; උනුවිසිසැලකුම් නැණ ඇති, එකොනවිංශති ප්‍රත්‍යවෙක්ෂණ ඥානයන් ඇත්තාවූ; එවිසිඇති, ඒ විංශති (වස්තුක) යෙන් යුක්තවූ; වසම් දිටු, විෂමදෘෂ්ටි හා; සමතිස් පෙරුම්, සමත්‍රිංශත්පාරමින්ද; පසසෙ, ප්‍රත්‍යක්ෂාකාරයෙන්; දනුම් ඇති, ජානනයෙන් යුක්තවූ:—

1. අටළොස්බුදුදම්. අෂ්ටාදශබුඩධර්ම.

"අතීතංසෙ බුඩස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතංසෙ අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නංසෙ අප්පටිහතං ඤාණං, සබ්බං කායකම්මං ඤාණපුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තං, සබ්බං වචීකම්මං-පෙ-සබ්බං මනොකම්මං ඤාණ පුබ්බඞ්ගමං ඤාණානුපරිවත්තං, නත්ථි ඡන්දස්ස හානි, නත්ථි ධම්මදෙශනාය හානි, නත්ථි විරියස්ස හානි, නත්ථි සමාධිස්ස හානි, නත්ථි පඤ්ඤාය හානි, නත්ථි විමුත්තියා හානි, නත්ථි දවා, නත්ථි රවා, නත්ථි අප්ඵුතං, නත්ථි

වෙදයිතත්තං, නත්‍ථි අව්‍යාවටමනො, නත්‍ථි අප්පටි සඞ්ඛානුපෙක්ඛා"

1 භාග්‍යවත්බුදුරජාණන්වහන්සේගේ අතීතකොට්ඨාශයෙහි නොපැකුළුණුනුවණය

2 —එම— —එම— අනාගත —එම—

3 —එම— —එම— වර්තමාන —එම—

4 මේධර්මතුනෙන් යුත් භාග්‍යවතුන්වහන්සේගේ සියලුකාය කර්මය නුවණ පෙරටුකොට ඇත්තේය—නුවණ අනුව වටකරන ලද්දේය.

5 සියලු වාක්කර්මයද එසේම වන්නේය.

6 සියලු මනඃකර්මයද එසේම වන්නේය.

7 මේධර්මසයෙන් යුත් භාග්‍යවත්බුදුන්ගේ ධර්මකැමැත්තට ඡන්දයාගේ හානියක් නැත්තේය.

8 ධර්මදෙශනාවගේද හානියක් නැත්තේය.

9 වීය්‍ර්‍යයාගේද හානියක් නැත්තේය.

10 සිත්එකඟකිරීමවූ සමාධියගේද හානියක් නැත්තේය.

11 ප්‍රඥාවගේද හානියක් නැත්තේය.

12 කෙලෙශයන් කෙරෙන් සිතමිදීමනම්වූ විමුක්තියගේද හානියක් නැත්තේය.

13 මේධර්ම දොළසින් යුක්තවූ භාග්‍යවතුන්වහන්සේගේ දව නම්ක්‍රීඩාප්‍රයෝග නැත්තේය.

14 රවනම්වූ බලාත්කාරක්‍රියා නැත්තේය.

15 අප්ඵුතනම්වූ නුවණින් නුදුටුදෙයක් නැත්තේය.

16 වෙදයිතත්තනම්වූ ඉක්මන් ක්‍රියාවක් නැත්තේය.

17 අව්‍යාවටමනනම්වූ නිෂ්ප්‍රයොජන සිත් පැවැත්මක් නැත්තේය.

18 අප්පටිසංඛාන උපෙක්ඛානම්වූ අඥානමධ්‍යස්ථාවක් නැත්තේය.

(යනමොහු අෂ්ටාදශ ආවේණික බුඬධර්මයෝයි.)

2. උනුවිසිසැලකුම්නැණ. එකොනවිංශතිප්‍රත්‍යවේක්‍ෂණඥාන.

"මග්ගං පච්චවෙක්ඛති, ඵලං පච්චවෙක්ඛති, පහීන කිලෙසෙ පච්චවෙක්ඛති, අවසිට්ඨකිලෙසෙ පච්චවෙක්ඛති, නිබ්බානං පච්චවෙක්ඛති" යනාදිවසයෙන්—

1 සෝවාන් පුද්ගලයන් සෝවාන් මඟ බලන බවය.
2 " සුන්කළ කෙලෙසුන් බලන බවය.
3 " සෝවාන් ඵලය බලන බවය.
4 " මතු සුන්වනකෙලෙසුන් බලන බවය
5 " නිවන් අරමුණුකරන බවය.
6 සකෘදගාමි පුද්ගලයන් සකෘදගාමි මඟ බලන බවය.
7 " සුන්කළ කෙලෙසුන් බලන බවය.
8 " සකෘදගාමි ඵලය බලන බවය.
9 " මතු සුන්වනකෙලෙසුන් බලන බවය
10 " නිවන් අරමුණු කරන බවය.
11 අනාගාමි පුද්ගලයන් අනාගාමි මඟ බලන බවය.
12 " සුන්කළ කෙලෙසුන් බලන බවය.
13 " අනාගාමි ඵලය බලන බවය.
14 " මතු සුන්වනකෙලෙසුන් බලන බවය
15 " නිවන් අරමුණු කරන බවය.
16 රහත් පුද්ගලයන් රහත් මඟ බලන බවය.
17 " සුන්කළ කෙලෙසුන් බලන බවය
18 " රහත් ඵලය බලන බවය.
19 " නිවන් අරමුණු කරන බවය.

(රහත් මඟින් මතු සුන්වනකෙලෙසුන් නොමැත්තේය.)

මෙසේසතරඵලයෙහිප්‍රත්‍යවේක්‍ෂණඥානයෝ
එකුන්විස්සෙක්වෙත්.

3. වසම්දිට්ඨි. විෂමදෘෂ්ටි.

"රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං" යනාදින් රූපාදි එකෝකි ස්කන්ධයෙක්හි එකෙකි උච්ඡේද දෘෂ්ටියක් හා සතර සතර ශාශ්වත දෘෂ්ටියක්දැයි පඤ්චස්කන්ධයෙහි විභව දෘෂ්ටිහු පස්දෙනෙක්ද භවදෘෂ්ටිහු පසළොස් දෙනෙක්ද වෙති.

ඒ මෙසේය:—

1 රූපය —ආතම වශයෙන් දක්ම. 1
2 තමා රූපවත්යයි දක්ම. 2
3 තමාකොරෙහි රූපයක් පිහිටියේයයි දක්ම. 3
4 රූපයෙහි තමන් හෝ පිහිටියේයයි දක්ම. 4

1 වෙදනාව—ආතමවශයෙන් දක්ම. 5
2 තමා වෙදනාවත්යයි දක්ම. 6
3 තමාකෙරෙහි වෙදනාවක් පිහිටියේයයි දක්ම. 7
4 වෙදනායෙහි තමන්හෝ පිහිටියේයයි දක්ම. 8

1 සංඥව —ආතමවශයෙන් දක්ම. 9
2 තමාසංඥවත්යයි දක්ම. 10
3 තමාකෙරෙහි සංඥාවක් පිහිටියේයයි දක්ම. 11
4 සංඥායෙහි තමන්හෝ පිහිටියේයයි දක්ම. 12

1සංසකාරයන්- ආතමවශයෙන් දක්ම. 13
2 තමා සංස්කාරවත්යයි දක්ම. 14
3 තමාකෙරෙහි සංස්කාරයන් පිහිටියේයයි දක්ම. 15
4 සංස්කාරයන් කෙරෙහි තමන් හෝ පිහිටියේයයි දක්ම. 16

1 විඥානය --ආතමවශයෙන් දක්ම. 17
2 තමාවිඥානවත්යයි දක්ම. 18
3 තමාකෙරෙහි විඥානය පිහිටියේයයි දක්ම. 19
4 විඥානයෙහි තමන්හෝ පිහිටියේයයි දක්ම. 20

## 4. සමතිස් පෙරුම්. සමත්‍රිංශත් පාරමීන්

“පාරමී, උප පාරමී, පරමත්‍ථ පාරමී” යන ත්‍රිභෙදයෙන් දානාදි පාරමිතාදශය තුන් ගුණවීමෙන් සමත්‍රිංශත් පාරමීහු වෙත්.

ඒ මෙසේවේ:—

1. දාන පාරමිතා—

ඇත් අස් ගෙරිසරක් දාසිදස් අඹු දරු ආදි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වූ හෝ කොත්වත් රන් රිදී ආදි අවිඤ්ඤාණකවූ හෝ සියලු බාහිර වස්තු පිදීම දාන පාරමිතාවය.

2. දානඋපපාරමිතා:—

තමාගේ ශරීරයෙහි මස් ලෙහෙ අත් පා කන් නාසා ආදි වූ ශරීරාවයව දීම දානඋපපාරමිතාවය~

3. දානපරමාත්ථපාරමිතා:—

ශශජාතකයෙහි මෙන් දාන වසයෙන් දිවි පිදීම දාන පරමාත්ථපාරමිතාවය~

4. ශීලපාරමිතා:—

කියනලද ප්‍රකාරවූ සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිර වස්තුව නැසෙන කල්හිද එය ලබාගන්නා පිණිස ශීල භේදයක් නොකොට සිල්රැකීම ශීලපාරමිතාවය~

5. ශීලඋපපාරමිතා:—

එසේම ස්වකීය හස්ත පාදාදි ශරීරාවයවයන්ගේ සිඳුම් බිඳුම් ආදියක් පැමිණි කල්හිදු එය නොසලකා සිල් පිරීම ශීලඋපපාරමිතාවය~

6. ශීලපරමාත්ථපාරමිතා:—

එසේම මහා සංඛපාලජාතකයෙහි මෙන් ජීවිතය නස්නාකල්හිදු ශීලය නොබිඳ රක්‍ෂාකිරීම ශීලපරමාත්ථපාරමිතාවය~

7. නෛෂ්ක්‍රම්‍යපාරමිතා:—

සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිර වස්තූන් අත්හැර මහණදම් පිරීම නෛෂ්ක්‍රම්‍යපාරමිතාවය~

8. නෛෂ්ක්‍රම්‍යඋපපාරමිතා:—

ස්වකීය හස්ත පාදාදි අවයවයන්ගේ සිඳුම් බිඳුම් පැමිණි කල්හිදු එය නොසලකා මහණදම් පිරීම නෛෂ්ක්‍රම්‍ය උපපාරමිතාවය~

9. නෛෂ්ක්‍රම්‍යපරමාත්ථපාරමිතා:—

චූළ සුතසොමජාතකයෙහි මෙන් ජීවිතාන්තරායද නොසලකා මහණ දම් පිරීම නෛෂ්ක්‍රම්‍යපරමාත්ථ පාරමිතාවය~

10. ප්‍රඥාපාරමිතා:—

සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිරවස්තු නස්නා කල් හිදු නුවණින් යුක්තවීම ප්‍රඥාපාරමිතාවය~

11. ප්‍රඥාඋපපාරමිතා:—

ස්වකීය ශරීරාවයවයන්ගේ විනාශයෙහිදු එය නොසලකා නුවණින් යුක්තවීම ප්‍රඥාඋපපාරමිතාවය~

12. ප්‍රඥාපරමාර්ථපාරමිතා:—
සත්තුභස්තජාතකයෙහි මෙන් නුවණින් විමසා අනුන් මහදුකින් මුදලිම ප්‍රඥාපරමාර්ථපාරමිතාවය.

13. වීර්යපාරමිතා:—
සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිරවස්තු විනාශයෙහිදු ගුණධර්ම රැකගැණීමෙහි වීර්ය අත් නොහැරීම වීර්ය පාරමිතාවය.

14. වීර්යඋපපාරමිතා:—
එසේම ස්වකීය ශරීරාවයවයක් නස්නාකල්හි වීර්ය අත්නොහැරීම වීර්යඋපපාරමිතාවය.

15. වීර්යපරමාර්ථපාරමිතා:—
මහාජනකජාතකයෙහි මෙන් ජීවිත විනාශ කාරණයක් පැමිණි කල්හිදු වීර්යඅත්නොහැරීම වීර්යපරමාර්ථපාරමිතාවය.

16. ක්ෂාන්තිපාරමිතා:—
සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිරවස්තු විනාශය ඇතිකල්හිදු නොකිපී ඉවසීම ක්ෂාන්තිපාරමිතාවය.

17. ක්ෂාන්තිඋපපාරමිතා:—
ස්වකීය ශරීරාවයව සිඳින බිඳින කල්හිදු නොකිපී ඉවසීම ක්ෂාන්තිඋපපාරමිතාවය.

18. ක්ෂාන්තිපරමාර්ථපාරමිතා:—
ක්ෂාන්තිවාදජාතකයෙහිමෙන් ජීවිත විනාශයට කාරණවූ මහදුකක් පැමිණි කල්හිදු නොකිපී ඉවසීම ක්ෂාන්තිපරමාර්ථපාරමිතාවය.

19. සත්‍යපාරමිතා:—
සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිර වස්තුවිනාශය ඇති කලහිදු බොරුනොකියා සත්‍යවචනයං රක්ෂා කිරීම සත්‍යපාරමිතාවය.

20. සත්‍යඋපපාරමිතා:—
තමන්ගේ ශරීරාවයවයක් නස්නාකල්හිදු සත්‍යවචනය රක්ෂාකිරීම සත්‍යඋපපාරමිතාවය.

21. සත්‍යපරමාර්ථපාරමිතා;—
මහාසුතසෝමජාතකයෙහි මෙන් තමන් දිවිපුදා සත්‍ය වචනය රක්ෂාකිරීම සත්‍යපරමාර්ථපාරමිතාවය.

22. අධිෂ්ඨානපාරමිතා:—
සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිරවස්තු විනාශයෙහිදු ඉටාගත් ව්‍රත අධිෂ්ඨානය නොහැරීම අධිෂ්ඨානපාරමිතාවය.

23. අධිෂ්ඨානඋපපාරමිතා:—

සවකීය ශරීරාවයව විනාශයෙහිදු අධිෂ්ඨානය නොහැරීම අධිෂ්ඨානඋපපාරමිතාවය.

24. අධිෂ්ඨානපරමාර්ථපාරමිතා:—

මූගපක්ඛජාතකයෙහි මෙන් ජීවිතය පරිත්‍යාගකොටත් අධිෂ්ඨානය රැකගැන්ම නොහොත් ව්‍රතය නොහැරීම අධිෂ්ඨානපරමාර්ථපාරමිතාවය.

25. මෛත්‍රීපාරමිතා:—

සවිඥාණක අවිඥාණක බාහිරවස්තු විනාශයෙහිදු මෛත්‍රීසිත් නොහැරීම මෛත්‍රීපාරමිතාවය.

26. මෛත්‍රීඋපපාරමිතා:—

සවකීය ශරීරාවයව විනාශයෙහිදු මෛත්‍රීසිත නොහැරීම මෛත්‍රීඋපපාරමිතාවය.

27 මෛත්‍රීපරමාර්ථපාරමිතා:—

එකරාජජාතකයෙහි මෙන් ජීවිතාපෙක්ෂාවද හැර මෛත්‍රියෙන් යුක්තවීම මෛත්‍රීපරමාර්ථපාරමිතාවය.

28. උපෙක්ෂාපාරමිතා:—

සවිඥාණක අවිඥාණක බාහිරවස්තු විනාශයෙහිදු උපෙක්ෂාව නොහැරීම උපෙක්ෂාපාරමිතාවය.

29. උපෙක්ෂාඋපපාරමිතා:—

සවකීය ශරීරාවයව විනාශයෙහිදු උපෙක්ෂාව නොහැරීම උපෙක්ෂාඋපපාරමිතාවය.

30. උපෙක්ෂාපරමාර්ථපාරමිතා:—

ලොමහංසජාතකයෙහි මෙන් ජීවිතාශාවද හැර උපෙක්ෂායෙන් යුක්තවීම උපෙක්ෂාපරමාර්ථපාරමිතාවය.

මෙසේ සමතිස් පෙරුම් ප්‍රභෙදක්‍රමය දතයුතුයි.

(ජාතකට්ඨකථාදියෙහි පාරමී, උපපාරමී, පරමත්ථපාරමී විභාගය මීටවෙනස්වද පෙනේ.)

448 සතලිස් කමට ගන්
පතාසුදස වැය නොප හන්
වැඩි පනසක් ප හන්
කුසල් සිව්සැටකලාසඳ හන්

448 සතලිස් කමටහන්, සමචත්වාරිංශත් කර්මස්ථානයන්ද; නොපහන්, ප්‍රසන්න නොවූ නොහොත් අස්ථිරවූ; පනස්, පඤ්චාශත්සඞ්ඛ්‍යාතවූ; උදයවැය, උදයව්‍යයආකාරයන්ද; පහන්, ප්‍රසන්නවූ; වැඩිපනසක්, පරඃපඤ්චාශත්විධවූ; කුසල්, (චිත්ත චෛතසික) කුශලධර්මයන්ද; සඳහන්, සැලකුම් ඇති; සිව්සැට, චතුෂ්ෂෂ්ටිවිධවූ; කලා, කලාශිල්පයන්ද—

1. සතලිස් කමටහන්. සමචත්වාරිංශත් කර්මස්ථානයන්.

| | |
|---|---|
| පඨවිකසිණාදි දස කසිණය | 10 |
| උද්ධුමාතකාදි දස අසුභය | 10 |
| බුද්ධානුස්සතිආදි දස අනුස්සතිය | 10 |
| මෛත්‍රිආදි සතර බ්‍රහ්මවිහරණය(හෙවත්) අප්පමඤ්ඤා සතරය | 4 |
| ආකාසානඤ්චායතනාදි සතරඅරූප භාවනාය | 4 |
| ආහාරයෙහි පටිකූල සඤ්ඤාවය | 1 |
| චතුධාතුවවත්ථානය | 1 |
| | 40 |

(1) දස කසිණය.

| | | |
|---|---|---|
| 1 පඨවි කසිණය. | අරුණවන්මැටියෙන්සෑදූ කසිණමණ්ඩලය නිමිත්ත ග්‍රහණය කොට කරන භාවනාව | |
| 2 ආපො කසිණය. | ජලය ,, ,, ,, | |
| 3 තෙජො කසිණය. | ගින්න ,, ,, ,, | |
| 4 වායො කසිණය. | වාතය ,, ,, ,, | |
| 5 නීල කසිණය. | නීලවර්ණය ,, ,, ,, | |
| 6 පීත කසිණය. | රන්වන් පැහැය ,, ,, ,, | |
| 7 ලොහිත කසිණය. | රක්තවර්ණය ,, ,, ,, | |
| 8 ඕදාත කසිණය. | සුදු පැහැය ,, ,, ,, | |
| 9 අකාස කසිණය. | ආකාසය ,, ,, ,, | |
| 10 ආලොක කසිණය. | ආලොකය ,, ,, ,, | |

## (2) දසඅසුභය.

| | | |
|---|---|---|
| 1 උද්ධුමාතක | අසුභය. | ඉදිමීගිය මළසිරුර අයහපත් බව. |
| 2 විනීලක | අසුභය. | නීලවර්ණවූ මළසිරුර අයහපත් බව |
| 3 විපුබ්බක | අසුභය. | සැරව වැගිරෙන මළසිරුර අයහපත් බව |
| 4 විච්ඡිද්දක | අසුභය. | සිදුරුවූ මළසිරුර ,, ,, |
| 5 වික්ඛායිතක | අසුභය. | සතුන් විසින් කෑ මළසිරුර ,, ,, |
| 6 වික්ඛිත්තක | අසුභය. | ඒඒතැනින්වෙන්වූමළසිරුර ,, ,, |
| 7 හතවික්ඛිත්තක | අසුභය. | අවියෙන් ඇන විසුරුවන ලද මළසිරුර ,, ,, |
| 8 ලෝහිතක | අසුභය. | ලේවැගිරෙන මළසිරුර ,, ,, |
| 9 පුලවක | අසුභය. | පණුවන් ගැවසුණු මළසිරුර ,, ,, |
| 10 අට්ඨික | අසුභය. | එකඇටයක් හෝ ඇටරුසක් හෝ ,, ,, |

## (3) දස අනුස්සතිය.

| | |
|---|---|
| 1 බුද්ධානුස්සතිය. | බුදුගුණ අරමුණුකොට පවත්නා සිහිය. |
| 2 ධම්මානුස්සතිය | ධර්මයෙහි ගුණ අරමුණුකොටපවත්නා සිහිය. |
| 3 සඞ්ඝානුස්සතිය. | සංඝරත්නයෙහි ගුණ අරමුණුකොට පවත්නා සිහිය. |
| 4 සීලානුස්සතිය. | සීලයෙහි ගුණ අරමුණුකොට පවත්නා සිහිය. |
| 5 චාගානුස්සතිය | ත්‍යාගය අරමුණු කොට පවත්නා සිහිය |
| 6 දෙවතානුස්සතිය. | දෙවියන් සාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදිපඤ්චධර්මයන් සිහිකිරීම. |
| 7 මරණානුස්සතිය. | මරණය අරමුණු කොට පවත්නා සිහිය. |
| 8 කායගතා සතිය. | ශරීරය පිළිකුල් බව අරමුණු කොට පවත්නා සිහිය. |
| 9 ආනාපාන සතිය. | ආශ්වාස ප්‍රශ්වාස අනිත්‍යාදි වසයෙන් සිහිකිරීම. |
| 10 උපසමානුස්සතිය. | සියලු කෙලෙස් සන්සිඳුවන නිවන් අරමුණුකොට පවත්නා සිහිය. |

(අනුස්සතියනු නැවත නැවත සිහිකිරීමයි.)

## (4) සතර බ්‍රහ්මවිහරණාදිය.

1 මෛත්‍රිය-සියලු සත්වයෝ නිදුක් නිරෝගී සුවපත්වෙත්වා කියා හිතීමය.
2 කරුණාවය-දුක්පත් සත්වයෝ එයින්මුදනු කැමතිවීමය.
3 මුදිතාවය-සුවපත් සත්වයන්දැකසතුටුවීමය.

4 උපෙක්ෂාවය–සියලු සතුන් කෙරෙහි මැදහත්ව සිටීමය.
5 ආහාරයෙහිප්‍රතිකකූලසංඥාවය { බලුඔරුවෙහිදූමූආහාරමෙන් අහරෙහි පිළිකුල් අදහසයි.
6 චතුධාතුවවත්ථානය–පඨවිආදි සිව්ධාතු අනිත්‍යාදිවසයෙන් විනිශ්චයයි.
7 ආකාසානඤ්චායතනය-කිසුණු ඉගුළු අහසළුල්බගෙනපැවතිසිත
8 විඤ්ඤාණඤ්චායතනය-කිසුණු ඉගුළු අහස්හි පැවතිවිඤ්ඤාණය
9 ආකිඤ්චඤ්ඤායතනය–කිසුණු ඉගුළු අහස්හිකිසිවක් නැතිබව්
10 නෙවසඤ්ඤානාසඤ්ඤායතනය–කිසුණු ඉගුළු අහස්හි පැවති විඥානය ඇති නැති බව.

## 2. උදයවැයනැණ. උදයව්‍යයඥානාකාරය.

"අවිජ්ජාසමුදයා රූපසමුදයො" යනාදින් රූපස්කන්ධයෙහි උදයඥාන පසෙක. "අවිජ්ජානිරොධා රූපනිරොධො" යනාදින් ව්‍යයඥාන පසෙකැයි රූපස්කන්ධයෙහි දසයෙකි. මෙසේ සෙසුස්කන්ධසතරෙහිද ඇතිවනබැවින් උදයව්‍යය ඥාන පනස්වැදෑරුම්වේ.

ඒ මෙසේය:—

(රූපස්කන්ධය)

1 අවිද්‍යා ඉපදීමෙන් රූපහටගැන්මවෙයි.
2 තෘෂ්ණා ඉපදීමෙන් ,, ,,
3 කර්ම හටගැන්මෙන් ,, ,,
4 ආහාර හටගැන්මෙන් ,, ,,
(මෙසේ ප්‍රත්‍යයදැකීම්වසයෙන් සතර ආකාරයකින්ද)
5 ඉපදීමේ ලක්ෂණදැකීම්වශයෙන් එක්පරිද්දෙකින්දැයි, යන පස්ආකාරයකින් රූපස්කන්ධයාගේහටගැන්ම දකී—
1 අවිද්‍යානිරොධයෙන් රූපනිරොධයවෙයි.
2 තෘෂ්ණා ,, ,, ,,
3 කර්ම ,, ,, ,,
4 ආහාර ,, ,, ,,
(මෙසේප්‍රත්‍යය දැකීම් වසයෙන් සතරආකාරයකින්ද)
5 පෙරලීමේ ලක්ෂණදැකීම්වසයෙන් එක්ආකාරයකින්දැයි, යන රූපස්කන්ධයාගේ නිරුඬවීම දකී—

මෙසේ රූපස්කන්ධය කෙරෙහි
උදයව්‍යය දැකීම් දසපරිදිවේ ..................10

(වෙදනාස්කන්ධය)

1 අවිද්‍යාව ඉපදීමෙන් වෙදනාව වෙයි.
2 තෘෂ්ණා ඉපදීමෙන් ,, ,,
3 කර්ම භව ගැන්මෙන් ,, ,,
4 ස්පර්ශය භව ගැන්මෙන් ,, ,,

(මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතර ආකාරයකින්ද)

5 ඉපදීමේ ලක්ෂණ දැකීම් වසයෙන් එක්පරිද්දෙකින්දැයි, යන පස්ආකාරයකින් වෙදනාස්කන්ධයාගේ භවගැන්ම දකී—

1 අවිද්‍යා නිරොධයෙන් වෙදනා නිරොධයවෙයි.
2 තෘෂ්ණා ,, ,, ,,
3 කර්ම ,, ,, ,,
4 ස්පර්ශ ,, ,, ,,

(මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතරආකාරයකින්ද)

5 පෙරලීමේ ලක්ෂණ වසයෙන් එක්ආකාරයකින්දැයි, යන වෙදනාස්කන්ධයාගේ නිරුඬවීම දකී—

මෙසේ වෙදනාස්කන්ධය කෙරෙහි
උදයව්‍යය දැකීම් දස පරිදිවේ ...............10

(සංඥාස්කන්ධය)

1 අවිද්‍යාව ඉපදීමෙන් සංඥාව වෙයි.
2 තෘෂ්ණාඉපදීමෙන් ,, ,,
3 කර්ම භවගැන්මෙන් ,, ,,
4 ස්පර්ශය භවගැන්මෙන් ,, ,,

(මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතර ආකාරයකින්ද)

5 ඉපදීමේ ලක්ෂණ දැකීම් වසයෙන් එක්පරිද්දෙකින්දැයි පස් ආකාරයකින් සංඥාස්කන්ධයාගේ භවගැන්ම දකී—

1 අවිද්‍යා නිරොධයෙන් සංඥා නිරොධය වෙයි.
2 තෘෂ්ණා ,, ,, ,,
3 කර්ම ,, ,, ,,
4 ස්පර්ශ ,, ,,

(මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතර ආකාරයකින්ද)

5 පෙරලීමේ ලක්ෂණ දැකීම් වසයෙන් එක් ආකාරයකින්ද සංඥාස්කන්ධයාගේ නිරුඬවීම දකී—

මෙසේ සංඥාස්කන්ධයකෙරෙහි
උදයව්‍යය දැකීම දස පරිදිවේ.....................10

(සංස්කාරස්කන්ධය)

1 අවිද්‍යා ඉපදීමෙන් සංස්කාර හටගැන්ම වෙයි.
2 තෘෂ්ණා ඉපදීමෙන් " " "
3 කර්ම හටගැන්මෙන් " " "
4 ස්පර්ශ හටගැන්මෙන් " " "

(මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතර ආකාරයකින්ද)

5 ඉපදීමේ ලක්ෂණ දැකීම්වසයෙන් එක් පරිද්දෙකින්දැයි පස් ආකාරයකින් සංස්කාරස්කන්ධයාගේ හටගැන්ම දකී—

1 අවිද්‍යා නිරොධයෙන් සංස්කාර නිරොධයවෙයි
2 තෘෂ්ණා " " "
3 කර්ම " " "
4 ස්පර්ශ " " "

(මෙසේ ප්‍රත්‍යයදැකීම් වසයෙන් සතරආකාරයකින්ද)

5 පෙරලීමේ ලක්ෂණ දැකීම් වසයෙන් එක්ආකාරයකින්දැයි සංස්කාරස්කන්ධයාගේ නිරුද්ධවීම දකී—

මෙසේ සංස්කාරස්කන්ධය කෙරෙහි
උදයව්‍යය දැකීම් දසපරිදිවේ ......... .... 10

(විඥානස්කන්ධය)

1 අවිද්‍යා ඉපදීමෙන් විඥානය වෙයි.
2 තෘෂ්ණා ඉපදීමෙන් " "
3 කර්ම හටගැන්මෙන් " "
4 නාමරූප හටගැන්මෙන් " "

(මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතරආකාරයකින්ද)

5 ඉපදීමෙ ලක්ෂණ දැකීම් වසයෙන් එක්පරිද්දෙකින්දැයි යන පස්ආකාරයකින් විඥානස්කන්ධයාගේ හටගැන්ම දකී—

1 අවිද්‍යා නිරොධයෙන් විඥානනිරොධය වෙයි.
2 තෘෂ්ණා " " "
3 කර්ම " " "
4 නාමරූප " " "

මෙසේ ප්‍රත්‍යය දැකීම් වසයෙන් සතරආකාරයකින්ද)

5 පෙරලීමේ ලක්ෂණ දැකීම් වසයෙන් එක්ආකාරයකින්ද විඥානස්කන්ධයාගේ නිරුද්ධය වෙයි.

මෙසේ විඥානස්කන්ධය කෙරෙහි
උදයව්‍යය දැකීම් දස පරිදිවේ ..............10

| | | |
|---|---|---|
| යථොක්තාකාර | රූපස්කන්ධය කෙරෙහි | —10 |
| | වේදනාස්කන්ධය කෙරෙහි | —10 |
| | සංඥස්කන්ධය කෙරෙහි | —10 |
| | සංස්කාරස්කන්ධය කෙරෙහි | —10 |
| | විඥනස්කන්ධය කෙරෙහි | —10 |
| | උදයව්‍යය දැකීම පනස්පරිද්දේ | 50 |

### 3. පනසටවැනිකුසල්. පරඃපචාශත්විධවූ කුශලධර්මයෝ.

"කතමෙ ධම්මා කුසලා? යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤණසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති වෙදනා හොති සඤ්ඤා හොති චෙතනා හොති චිත්තං හොති විතක්කො හොති විචාරො හොති පීති හොති සුඛං හොති චිත්තස්සෙකග්ගතා හොති සද්ධින්ද්‍රියං හොති විරියින්ද්‍රියං හොති සතින්ද්‍රියං හොති සමාධින්ද්‍රියං හොති පඤ්ඤින්ද්‍රියං හොති මනින්ද්‍රියං හොති සොමනස්සින්ද්‍රියං හොති ජීවිතින්ද්‍රියං හොති සම්මාදිට්ඨි හොති සම්මාසංකප්පො හොති සම්මාවායාමො හොති සම්මාසති හොති සම්මාසමාධි හොති සද්ධාබලං හොති විරියබලං හොති සතිබලං හොති සමාධිබලං හොති පඤ්ඤාබලං හොති හිරිබලං හොති ඔත්තප්පබලං හොති අලොභො හොති අදොසො හොති අමොහො හොති අනභිජ්ඣා හොති අව්‍යාපාදො හොති සම්මාදිට්ඨි හොති හිරි හොති ඔත්තප්පං හොති කායපස්සද්ධි හොති චිත්තපස්සද්ධි හොති කායලහුතා හොති චිත්තලහුතා හොති කායමුදුතා හොති චිත්තමුදුතා හොති කායකම්මඤ්ඤතා හොති චිත්තකම්මඤ්ඤතා හොති කායපාගුඤ්ඤතා හොති චිත්තපාගුඤ්ඤතා හොති කායුජ්ජුකතා හොති චිත්තුජ්ජුකතා හොති සති හොති සම්පජඤ්ඤං හොති සමථො හොති විපස්සනා හොති පග්ගාහො හොති අවික්ඛෙපො හොති යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඉමෙ ධම්මා කුසලා"

(මෙහි 'යෙවාපනක' ධර්මයන් හැර ගණින් ගතයුතු සපණීාදිවූ පූර්වොක්ත කුශලධර්මයෝ පනස්දෙන පරඃපචාශත්කුශලධර්මයෝයයි කියනු ලැබෙත්)

## 4. සිව්සැට කලා. චතුෂ්ෂෂ්ටි කලාවන්.

චතුෂ්ෂෂ්ටි කලාවෝ නම් ඉතිහාසාගමාදී බාහිර විද්‍යා සැට සතරකි.

හෙද—

"ඉතිහාසාගමාද්‍යාශ්ච කාව්‍යාලඞ්කාරනාටකම්
ගායකත්වං කවිත්වඤ්ච කාමශාස්ත්‍රංද්‍යුරෝදරම්"
යනාදින් සුප්‍රසිද්ධයි.

449 නුවණ සත්සැ ත් තෑ
නෑණද අසූනව සි ත් තෑ
සසනු සමද ත් තෑ
සුවිසිකෙළලක් සමාප ත් තෑ

449 සත්සැත්තෑ නුවණ, සප්ත සප්තතිවිධඥානයන්ද; අසූනවසිත්, එකොනනවති චිත්තයන්ද; සයනුසම, ෂණ්ණවති පාෂාණ්ඩසඞ්ඛ්‍යාත පරසමයයන්ද; සුවිසිකෙළ ලක්, චතුර්විංශති කොටි ලක්ෂ පරමිතවූ; සමාපත්තෑ, සමාපත්තීන්ද; දත්, ජානනය කළාවූ; නෑණ, ඥානයද—

### 1 සත්සැත්තෑ නුවණ. සප්ත සප්තතිවිධඥානයන්.

"1 ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, 2 අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, 3 අතීතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, 4 අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, 5 අනාගතම්පි අද්ධානං ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං, 6 අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, 7 යම්පිදං ධම්මට්ඨිති ඤාණං, තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති ඤාණං, 8 භවපච්චයා ජාතීති ඤාණං 9 අසති භවෙ නත්ථි ජාතීති ඤාණං, —පෙ—71 අවිජ්ජාපච්චයා සංඛාරාති ඤාණං, 72 අසති අවිජ්ජාය නත්ථි සංඛාරාති ඤාණං, 73 අතීතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සංඛාරාති ඤාණං, 74 අසති අවිජ්ජාය නත්ථි සංඛාරාති ඤාණං, 75 අනාගතම්පි අද්ධානං අවිජ්ජාපච්චයා සංඛාරාති ඤාණං, 76 අසති අවිජ්ජාය නත්ථි සංඛාරාති ඤාණං, 77 යම්පිදං ධම්මට්ඨිතිඤාණං තම්පි ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති ඤාණං"

1 ජාතිය ඇතිහෙයින් ජරාමරණ වෙයි දැන්මය.
2 ජාතිය නැති කල්හි ජරාමරණ නොවෙයි දැන්මය.
මෙසේ ජාතියකෙරෙන් නුවණ දෙකයි..........2
3 මේක්‍රමයෙන් අතීතකාලයෙහිද ජාතියකෙරෙන් නුවණ දෙකයි......2
4 අනාගතකාලයෙහිද ජාතියකෙරෙන් නුවණ දෙකයි........2
5 එහි යම් යම් ධර්මයන්ගේ පිහිටීම දන්නා නුවණක්වේද, එය ක්‍ෂයවනසුලුය විනාශවන සුලුය යනාදින් දන්නා නුවණ එකකි... ... ... ... ... ... ... ... ... ......1

7

(මෙසේ අවිද්‍යාව ආදිකොට ඇති ද්වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාද යෙහි ජරාමරණාඞ්ගය හැර සෙසු එකොළොස්අඞ්ගයන් කෙරෙහි එකෙක අඞ්ගයෙක්හි සතක් සතක් බැගින් සත් සැත්තෑවක් ඥානයෝ වෙති.)

## 2. අසූ නවසිත්. එකොන නවති චිත්තයන්

| | | |
|---|---|---|
| 1 කාමාවචර සිත් | පනස්හතරයි | —54 |
| 2 රූපාවචර සිත් | පසළොසයි | —15 |
| 3 අරූපාවචර සිත් | දොළසයි | —12 |
| 4 ලොකොත්තර සිත් | අටයි | — 8 |
| | | 89 |

1 කාමාවචරසිත් 54.

| | |
|---|---|
| (1) කුසල් සිත් ... ... ... | 8 |
| (2) අකුසල් සිත් ... ... | 12 |
| (3) සහෙතුක කුසල විපාකසිත්... | 8 |
| (4) අහෙතුක කුසල විපාකසිත්... | 8 |
| (5) අකුසල විපාකසිත් ... ... | 7 |
| (6) සහෙතුක ක්‍රියාසිත් ... ... | 8 |
| (7) අහෙතුක ක්‍රියාසිත් ... ... | 3 |
| | 54 |

(1) කුසල් සිත් 8.

1 සොම්නස්සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුසල්සිත.
2 එසේම සසංස්කාරික කුසල්සිත.
3 සොම්නස්සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික කුසල්සිත.
4 එසේම සසංස්කාරික කුසල්සිත.

5 උපේක්‍ෂාසහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුසල්සිත.
6 එසේම සසංස්කාරික කුසල්සිත.
7 උපේක්‍ෂාසහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික කුසල්සිත.
8 එසේම සසංස්කාරික කුසල්සිත.

(2) අකුසල් සිත් 12.

1 සොම්නස්සහගත දෘෂ්ටිගතසම්ප්‍රයුක්ත අසංස්කාරික අකුසල්සිත.
2 එසේම සසංස්කාරික අකුසල්සිත.
3 සොම්නස්සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංස්කාරික අකුසල්සිත.
4 එසේම සසංස්කාරික අකුසල්සිත.
5 උපේක්‍ෂාසහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංස්කාරික අකුසල්සිත.
6 එසේම සසංස්කාරික අකුසල්සිත.
7 උපේක්‍ෂාසහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංස්කාරික අකුසල්සිත.
8 එසේම සසංස්කාරික අකුසල්සිත.
9 දෞම්නස්සහගත ප්‍රතිඝසම්ප්‍රයුක්ත අසංස්කාරික අකුසල්සිත.
10 එසේම සසංස්කාරික අකුසල්සිත.
11 උපේක්‍ෂාසහගත විචිකිත්සාසම්ප්‍රයුක්ත අකුසල්සිත.
12 උපේක්‍ෂාසහගත ඖද්ධත්‍යසම්ප්‍රයුක්ත අකුසල්සිත.

(3) සහේතුක කුසල විපාකසිත් 8.

1 සොම්නස්සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සහේතුක කුසලවිපාකසිත
2 එසේම සසංස්කාරික කුශලවිපාකසිත.
3 සොම්නස්සහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික කුශලවිපාකසිත.
4 එසේම සසංස්කාරික කුශලවිපාකසිත.
5 උපේක්‍ෂාසහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුශලවිපාකසිත.
6 එසේම සසංස්කාරික කුශලවිපාකසිත.
7 උපේක්‍ෂාසහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික කුශලවිපාකසිත.
8 එසේම සසංස්කාරික කුශලවිපාකසිත.

(4) අහෙතුක කුසල විපාකසිත් 8.

1 උපෙක්‍ෂාසහගත චක්‍ෂුර්විඥනය.
2 එසේම ශ්‍රොත්‍රවිඥානය.
3 ඝ්‍රාණවිඥානය.
4 ජිහ්වාවිඥානය.
5 සුඛසහගත කායවිඥනය.
6 උපෙක්‍ෂාසහගත සම්ප්‍රතෞෂණසිත.
7 සොම්නස්සහගත සන්තීරණසිත.
8 උපෙක්‍ෂාසහගත සන්තීරණසිත.

(5) අකුසල විපාකසිත් 7.

1 උපෙක්‍ෂාසහගත චක්‍ෂුර්විඥානය.
2 එසේම ශ්‍රොත්‍රවිඥානය.
3 ඝ්‍රාණවිඥානය.
4 ජිහ්වාවිඥානය.
5 දුඃඛසහගතවූ කායවිඥානය.
6 උපෙක්‍ෂාසහගතවූ සම්ප්‍රතෞෂණසිත.
7 උපෙක්‍ෂාසහගත සන්තිරණසිත.

(6) සහෙතුක ක්‍රියාසිත් 8.

1 සොම්නස්සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික ක්‍රියාසිත.
2 එසේම සසංස්කාරික ක්‍රියාසිත.
3 සොම්නස්සහගත ඥනවිප්‍රයුක්ත අසංස්කාරික ක්‍රියාසිත.
4 එසේම සසංස්කාරික ක්‍රියාසිත.
5 උපෙක්‍ෂාසහගත ඥනසම්ප්‍රයුක්ත අසංස්කාරික ක්‍රියාසිත.
6 එසේම සසංස්කාරික ක්‍රියාසිත.
7 උපෙක්‍ෂාසහගත ඥානවිප්‍රයුක්ත අසංස්කාරික ක්‍රියාසිත
8 එසේම සසංස්කාරික ක්‍රියාසිත.

(7) අහෙතුක ක්‍රියාසිත් 3.

1 උපෙක්‍ෂාසහගත පඤ්චද්වාරාවර්ජනසිත.
2 එසේම මනොද්වාරාවර්ජනසිත.
3 සොම්නස්සහගත හසිතුප්පාදසිත.

2 රූපාවචරසිත් 15. (කුසල්. 5. විපාක. 5. ක්‍රියා. 5)

(1) ප්‍රථමධ්‍යාන කුසලසිත.
(2) ද්විතීයධ්‍යාන කුසලසිත.

(3) තෘතියධ්‍යාන කුසලසිත.
(4) චතුර්ථධ්‍යාන කුසලසිත.
(5) පඤ්චමධ්‍යාන කුසලසිත.
(6) ප්‍රථමධ්‍යාන විපාකසිත.
(7) ද්විතියධ්‍යාන විපාකසිත.
(8) තෘතියධ්‍යාන විපාකසිත.
(9) චතුර්ථධ්‍යාන විපාකසිත.
(10) පඤ්චමධ්‍යාන විපාකසිත.
(11) ප්‍රථමධ්‍යාන ක්‍රියාසිත.
(12) ද්විතියධ්‍යාන ක්‍රියාසිත.
(13) තෘතියධ්‍යාන ක්‍රියාසිත
(14) චතුර්ථධ්‍යාන ක්‍රියාසිත.
(15) පඤ්චමධ්‍යාන ක්‍රියාසිත.

3 අරූපාවචර සිත් 12. (කුසල්. 4. විපාක. 4 ක්‍රියා. 4)

(1) ආකාසානඤ්චායතන කුසල්සිත.
(2) විඤ්ඤාණඤ්චායතන කුසල්සිත.
(3) ආකිඤ්චඤ්ඤායතන කුසල්සිත.
(4) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල්සිත.
(5) ආකාසානඤ්චායතන විපාකසිත.
(6) විඤ්ඤාණඤ්චායතන විපාකසිත.
(7) ආකිඤ්චඤ්ඤායතන විපාකසිත.
(8) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාකසිත.
(9) ආකාසානඤ්චායතන ක්‍රියාසිත.
(10) විඤ්ඤාණඤ්චායතන ක්‍රියාසිත.
(11) ආකිඤ්චඤ්ඤායතන ක්‍රියාසිත.
(12) නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ක්‍රියාසිත.

4 ලොකොත්තරසිත් 8. (කුසල්. 4. විපාක. 4)

(1) සොවාන්මාර්ගසිත.
(2) සකෘදාගාමිමාර්ගසිත.
(3) අනාගාමිමාර්ගසිත.
(4) අර්හත්මාර්ගසිත.
(5) සොවාන්ඵලසිත.
(6) සකෘදාගාමිඵලසිත.
(7) අනාගාමිඵලසිත.
(8) අර්හත්ඵලසිත.

| | | |
|---|---|---|
| මෙහි අකුසල්සිත් | ... | ...12 |
| කුසල්සිත් | ... | ...21 |
| විපාකසිත් | ... | ...36 |
| ක්‍රියාසිත් | ... | ...20 |
| | | 89 |

මේචිත්තවිභාගයෙහි ආ—

සොම්නස යනු-මානසික සුඛවෙදනාවයි.

ඥානසම්ප්‍රයුක්ත යනු-යථාස්වභාව ප්‍රතිවෙධඥානයෙන්යුක්ත (හෙවත් ඇතිසැටිය දැනගන්නා නුවණ හා එක්වයොදන).

අසංස්කාරික යනු-තමාගේ හෝ අනුන්ගේ වශයෙන්පැවති පූර්වප්‍රයෝග රහිතබවයි.

සසංස්කාරික යනු-එබඳු පූර්වප්‍රයොග සහිතබවයි.

ඥානවිප්‍රයුක්ත යනු-යථාස්වභාවප්‍රතිවෙධඥානයෙන් තොරවූ.

උපෙක්ෂා යනු-මධ්‍යස්ථවෙදනාවයි.

දෞම්නසයනු-මානසික දුඃඛවෙදනාවයි

දෘෂ්ටිගත යනු-මිථ්‍යාදෘෂ්ටියයි.

ප්‍රතිඝ යනු-ද්වේෂයයි

විචිකිත්සා යනු-බුදුහු ඇත්තාහ හෝ නැත්තාහ හෝ යනාදින් බුඩාදිඅටතන්හි උපදනා සංශයලක්ෂණ වූ කාංක්ෂාවයි.

ඖද්ධත්‍යය යනු-අරමුණෙහිනොසන්සුන්බවයි.

සම්ප්‍රත්‍යෙෂන යනු-රූපාදිඅරමුණුපිළිගැනීමයි.

සන්තීරණ යනු-රූපාදිඅරමුණුතීරණයකිරිමයි.

හසිතුප්පාද යනු-රහතුන්ට සිනා උපදවනබවයි.

### 3. සයනු සමය. අනූසයක් ආගම්

පරසමයෙන් ගතයුතුවූ කුටිසක, බහුදක, හංස, පරමහංස මොරව සෙතව පාසුපතාදිවූ ධ්‍යානසුඞිකයන් අවසන්කොට ඇති සන්‍යාසිමත සූතිස (34) ද, බ්‍රහ්මජාලාගත දෙසැටක් (62) දෘෂ්ටිවාදයෝද එක්වූවාහු සයනූ සමයයෝ වෙත්.

### 4. සූවිසිකෙළලක්සමාපත්. චතුර්විංශතිකොටිලක්ෂ පරිමිත සමාපත්තීන්.

භාග්‍යවතුන්වහන්සේ දවසක් පාසා සවස උදය කරුණා සම වත් දෙලොස්කෙළලක්ෂයකටද, ඵලසමවත් දෙලොස්කෙළලක්ෂයකටද සමවදනාසේක. මේ දෙසමවත් වාරගණනායෙන් සූවිසි කෙළලක්ෂයෙකැයි කියනුලැබේ.

450 ලොව පිරියත නැ　　ණි ය
සත දහස් දක් සෙගු　　ණි ය
සුනිසිකැකි නුව　　ණි ය
සමතපටන්අනකැනයග　　ණි ය

450 ලොව, (සකල) ලොකයෙහි; අපිරියත, අපර්‍යන්තවූ; සත, සත්ත්වයාගේ; අදහස්, (ආශය අනුශය චරිත අධිමුක්තිභව්‍යභව්‍ය පරොවරතාසඞ්ඛ්‍යාත) අධ්‍යාශය; සෙගුණය, ජේ‍යගුණයෙන්; දත්, අවබොධවූ; නැණය, ඥානයද; අනනැනයසමතපටන්, අනන්තනය සමන්තප්‍රස්ථානයෙහිවූ; සුත්සිත, අතිතීක්ෂණවූ; නුවණය ගණය, ඥානසමූහයද; ඇති, ඇත්තාවූ—

1. අනනැනයසමතපටන් නුවණය. අනන්තනය සමන්ත ප්‍රස්ථානයෙහිවූ ඥනය.

අනුලොමපට්ඨාන සයෙක, පච්චනියපට්ඨාන සයෙක, අනුලොම පච්චනියපට්ඨාන සයෙක, පච්චනියානුලොමපට්ඨාන සයෙකැයි සමන්තප්‍රස්ථානනම්ලද ක්ෂුද්‍රකප්‍රස්ථානයන් සූවිසිදෙනෙකුන්ගේ සමවධානයෙන් වදරනලද ප්‍රස්ථානමහාප්‍රකරණයෙහි විජෘම්භණයට අවකාශලද්දවූ ප්‍රත්‍යයවිභඞ්ගවාරයෙහි උද්දිෂ්ට "හෙතු පච්චයො—පෙ—අවිගතපච්චයො" යන සූවිසි ප්‍රත්‍යයභෙදයෙන් කුශලාදි ධර්මවිෂයෙහි සුනිසිතව පැවැති නුවණ "සමන්ත පට්ඨාන" ඥනයවේ.

451 දසපැරුම් තෙස රද
පස්තිළිණ සිව්සඟ රද
සිව්දිටනින් වො රද
පිනින් වැජඹෙ මෙතෝමුනි රද

451 දසපැරුම්, දශපාරමිධර්මයෙන්ද; තෙසරද, ත්‍රිවිධචර්‍යා යෙන්ද; පස්තිළිණ, පංචමහාපරිත්‍යාගයෙන්ද; සිව්සඟර, චතුස්සඞ්ග්‍රහ වස්තුයෙන් හා; සිව්අදිටනින්, චතුරධිෂ්ඨානයෙන්ද යන; පිනින් වොරද, බබළන්නාවූ පුණ්‍යශ්‍රීයෙන් හෙවත් මූර්තිමත්වූ කුසලයෙන්; මෙතෝමුනිරද, මෛත්‍රෙයසර්වඥයන් වහන්සේ; වැජඹෙ, විජෘම්භමාණ වනසේක.

1. දසපැරුම්. දශපාරමිතා.

"දානං සීලංච නෙක්ඛම්මං
පඤ්ඤා විරියෙන පඤ්චමං
ඛන්තිසච්චමධිට්ඨානං
මෙත්තුපෙක්ඛාතිමෙ දස"

1. දානපාරමිතා. 2. ශීලපාරමිතා. 3. නෛෂ්ක්‍රම්‍යපාරමිතා. 4. ප්‍රඥපාරමිතා. 5. වීර්‍යපාරමිතා. 6. ක්ෂාන්තිපාරමිතා. 7. සත්‍ය පාරමිතා. 8. අධිෂ්ඨානපාරමිතා. 9. මෛත්‍රීපාරමිතා. 10. උපෙක්ෂා පාරමිතා යනමොහුයි.

2. තෙසර. ත්‍රිවිධචය්‍යාය.

| | |
|---|---|
| 1. ලොකාර්‍ථචය්‍යා | ලොවට හිතවැඩෙහි යෙදීමය. |
| 2. ඥාත්‍යාර්‍ථචය්‍යා | ඤාතීන්ට හිතවැඩෙහි යෙදීමය. |
| 3. බුඞචය්‍යා | ප්‍රඥයෙන් යුත් හැසිරීමය. |

3. පස්මහතිළිත. පචමහාපරිත්‍යාගයෝ.

1. ශ්‍රෙෂ්ඨ ධනපරිත්‍යාගය. 2. පුත්‍ර පරිත්‍යාගය. 3. භාය්‍යා පරිත්‍යාගය. 4. රාජ්‍ය පරිත්‍යාගය. 5. ශරීරාවයව පරිත්‍යාගය.

4. සිවුසහර. චතුස්සඞ්ග්‍රහ වස්තූන්.

1. දානය. 2. ප්‍රියවචනය. 3. අර්‍ථ චය්‍යාය. 4. සමානාත්මතාය.

5. සිවුඅදිටන්. චතුරධිෂ්ඨානයෝ.

චතුරඞග සමන්විත වීය්‍යඅධිෂ්ඨානයයි.

"චත්තාරි විරියඞ්ගානි
තචස්ස ච නහාරුනො
අවසුස්සතමඞ්සස
මංසලොහිතසුස්සනං"

යනමෙයි.

452 සිව් මුහුදු ව තු රු
වැඩියෙන් කුසල් උ තු රු
තෙදියටෙක මි තු රු
මඟුල් ලකුණෙන් සැදි විසි තු රු

452 සිව් මුහුදු, චතුස්සමුද්‍රයාගේ; වතුරු, ජලයටත්; වැඩියෙන්, අධිකව; කුසල් උතුරු, ඉතිරිපවත්නා පින්ඇති; තෙදියට, භුවනත්‍රයට; එකමිතුරු, අසහාය මිත්‍රවූ; විසිතුරු, විචිත්‍රවූ; මඟුල්ලකුණෙන්, මඞ්ගල ලක්‍ෂණයෙන්; සැදි, සජ්ජිතවූ–

(මෙතැන් පටන් නවකවක් හා කුලකයි)

453 ගුණ මිණි සමු දු රා
බඹ සුර නරසුරු දු රා
පස්මරු හළ දු රා
සතන් බව දුකට වෙද ඇ දු රා

453 ගුණමිණි, ගුණ නමැති මාණික්‍යයන්ට; සමුදුරා, සාගරය වැනිවූ; බඹසුර නර අසුර, බ්‍රහමාමර නර අසුර යන සමස්ත සත්ත්වයාහට; ඇදුරා, ආචාර්‍ය්‍යවූ; පස්මරු, පඤ්චමාරයන්; දුරාහල, පහ කළාවූ; සතන්, සත්ත්වයන්ගේ; බවදුකට, (ජාති ජරාමරණාදි) සංසාර දුක්ඛයට; වෙද ඇදුරා, වෛද්‍යාචාර්‍ය්‍යයකු වැනි—

454 තිතඳුරු දිති න් ද
විනෙදන කොඳ තරි න් ද
තිරගුණ ගිරි න් ද
තිලෝගුරු එ මෛත්‍රීමුනි න් ද

454 තිතඳුරු, තිමිර නමැති අන්ධකාරයට; දිනින්ද, සූර්‍ය්‍යයා බඳුවූ; විනෙදන, වෛනෙය ජන නමැති; කොඳ, කුඳ කුඩ්මලයන්ට; තරින්ද, චන්ද්‍රයා බඳුවූ; තිරගුණ, ස්ථිරගුණය කරණ කොට ගෙන; ගිරින්ද, මෙරු පර්‍වත රාජයා බඳුවූ; තිලෝගුරු, ත්‍රෛලොක්‍යාචාර්‍ය්‍යවූ; එ මෛත් මුනින්ද, ඒ මෛත්‍රෙයමුනීන්ද්‍රයාණන්වහන්සේ—

455 සිව් සැපත දු ල බා
ලබාදී සත පො ල ඹා
කුදිටු සිඳු ක ල ඹා
සසුන්බුදු පලකරම සු ල බා

455 දුලබා, දුර්ලභවූ; සිව් සැපත, (සත්පුරුෂ සෙවනය, සද්ධර්‍මශ්‍රවණය යොනිසොමනස්කාරය, ධර්‍මානුධර්‍මප්‍රතිපත්තිය යන) චතුර්විධ සම්පත්තිය; ලබාදී, ප්‍රතිලබ්ධ කරදී; සත, සත්ත්වයන්; පොලඹා, ප්‍රලොභය කොට; කුදිටු සිඳු, මිථ්‍යා දෘෂ්ටි නමැති සමුද්‍රය; කලඹා, ක්‍ෂොභ කරවා; බුදුසසුන්, බුද්ධශාසන යෙහි; පල, ප්‍රයෝජනය; සුලබා කරම, සුඛ ලභ්‍ය කොටම—

456 කෙලෙස් ගිම් න ස් වා
දහම් අමවැසි ව ස් වා
සතන් සිතු තු ස් වා
සියල් සිරි සුබ සෙත සල ස් වා

456 අමදහම්, අමෘත ධර්‍මය නමැති; වැසි, වර්‍ෂය; වස්වා, වර්‍ෂණය කරවා; කෙලෙස් ගිම්, ක්ලෙශ නමැති ඝර්‍මය; නස්වා, නිර්‍වාපණය කරවා; සතන් සිතු, සත්ත්වයාගේ චිත්ත සන්තාන

යන්; තුස්වා, සතුටු කරවා; සියල් සිරි, සකල ශ්‍රී ඇති; සුබ සෙත, ශොභනවූ ශාන්තිය; සලස්වා, සකස්කරවා—

457 පිවිස සත ස සරණ
විඳිනා දුකට ස සරණ
බුදු දම් සඟ සරණ
දෙමින් හරවා දෙර පුර සරණ

457 සසරණ, සංසාර නමැති අණීණවයට; පිවිස, ප්‍රවිෂ්ට වැ; සතවිඳිනා, සත්‍වයන් විසින් වින්දනය කරනුලබන; දුකට, දුඃඛයට; සසරණ, උතුම් ප්‍රතිෂ්ඨාධාරවූ; බුදු දම් සඟ සරණ, බුඬ ධම්ම සංඝ යන ශරණත්‍රය; දෙමින්, දානය කරමින් හෙ වත් ශරණත්‍රයෙහි පිහිටුවමින්; සරණ පුර, නිර්‍වාණපුරයාගේ; දෙර, වාරය; හරවා, විවෘත කරවා—

458 තුන් ලොවට එක සක්
අවුරුදු අසූදහ සක්
වැඩහිඳම සඟ සක්
සමඟ පතුරා දහම් අණ සක්

458 තුන් ලොවට, භුවනත්‍රයට; එකසක්, අස හාය චක්‍ෂුසක් මෙන්; සඟසක්, ශ්‍රාවක සමූහයා; සමඟ, සමග්‍රව; අසූ දහසක් අවුරුදු, අශීත්‍යධික සහස්‍ර සංවත්සරයක්; වැඩහිඳම, (මෛමත්‍රෙයසර්‍වඥයන්වහන්සේ) ජීවමානව වැඩවාසය කර මින්ම; දහම් අණසක්, ධර්ම ආඥාචක්‍රය; පතුරා, ප්‍රසාරිත කරමින්—

459 වෙනෙහි නෙදියත සත්
මහ කුලුණුසිතිනා සත්
බෙලෙන් සිව්සස් සත්
සතර මඟ කර සුලබ තොල සත්

459 තෙදියත සත් වෙනෙහි, භුවනත්‍රය වාසී සත්‍වයන් කෙරෙහි; සත්, ශාන්තවූ; මහ කුලුණු සිතිනා, මහාකාරුණා චිත්තාන්විතව; සත්, ප්‍රශස්තවූ; සිව්සස් (දුඃඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධසත්‍යය, මාර්ග සත්‍යය, යන) චතුඃ සත්‍ය ධර්ම යන්ගේ; බෙලෙන්, බලයෙන්; සතර මඟ (ශ්‍රොත ආපත්ති, ශකෘදගාමි, අනාගාමි අර්හද් යන) චතුර්විධ මාර්ගය; තොලසත්, ඉදුරාම, සුලබකර, සුලභ්‍ය කොට—

460 සැ ම සැපට අග වත
සැ ම බුදුරුවන් පිත වත
සැ ම දුක්ගිනි නි වත
නිවන ලැබදෙත් බව ඉවත් වත

460 සැම දුක්ගිනි, සියලු දුඃඛ නමැති වහ්නිය; නිවත, නිර්ව්‍යාපණය කරන්නාවූ; සැම සැපට, සකල සම්පත්තියට; අග වත, ශ්‍රේෂ්ඨවන්නාවූ; සැම බුදුරුවන්, සකල සර්‍වඥවරයන්; පිතවත, ප්‍රීණනයකරන්නාවූ (නොහොත් තිවිසැනසී වදුරන් නාවූ); බව, සංසාරය; ඉවත්වත, පහවන්නාවූ; නිවන, නිර්‍වාණ සම්පත්තිය; ලැබදෙත්, ප්‍රදනය කරනසේක.

461 කුලුණෙ න් නැණ නෙ තා ය මුනි මෙ තා ය
මෙලෙසි න් සත වෙ තා ය කර මෙ තා ය
දෙ ස මි න් සස් ස තා ය සත ප තා ය
ස ල ස න් නේ සෙ තා ය නිති හි තා ය

461 කුලුණෙන් නැණ නෙතාය, කරුණාවෙන් යුක්තවූ ඥාන චක්ෂුසක්වූ; මුනි මෙතාය, මෛත්‍රෙයසම්‍යක්සම්බුද්ධ සර්‍වඥ රාජෝත්තමයාණන්වහන්සේ;මෙලෙසින්,පූර්‍වොක්තාකාරයෙන්; කර මෙතාය, මෛත්‍රී කොට; සත පතාය, සත් පථයට (ආර්‍ය්‍යමාර්ගයට) අයැත්; සතාය, යහපත්වූ; සස්, චතුඃසත්‍යය; දෙසමින්, දේශනා කරමින්; නිති හිතාය, නිරන්තර හිතාධ්‍යාශ යෙන්; සත වෙතාය, සමස්ත සත්වයා කෙරෙහි; සෙතාය, ශාන්තිය; සලසන්නේ, සම්පාදනය කරන සේක.

එකාදශම සගීය සමාප්තයි,

———o:o———

462 එසමෙහි පෙර පැ තු ම
ඇති සංඛ සක්විනි තු ම
තමරන් පා උ තු ම
කරම සඟනිවසක් සුපැව තු ම

462 එසමෙහි, තත්සමයෙහි; පෙර පැතුම ඇති, පූර්‍ව ප්‍රාර්‍ථනා ඇත්තාවූ; සංඛ සක්විතිතුම; සංඛාභිධාන චක්‍රවර්ත්ති නරෙන්ද්‍ර තෙමෙ; උතුම, උත්තමවූ; සුපැවතුම, සුශුද්ධ ප්‍රවෘත්ති ඇති; තම රන්පා, තමන්ගේ සුවර්‍ණප්‍රාසාදය; සඟනිවසක් කරම, සංඝාවාසයක් කොටම—(මතු කවත්‍රයක් හා කුලකයි)

463 සක්විතිරජ සැ පත්
සමඟ එනිවස සුව පත්
මුනිඳුට ලොවග පත්
පුදා තව ඇති සකල සම් පත්

463 සක්විතිරජ සැපත්, චක්‍රවර්තිරාජ සම්පත්තියක්; සමඟ, සමග්‍රව; සුව පත්, සුඛප්‍රාප්තවූ; එනිවස, ඒ නිවාසයත්; තව ඇති, අවශෙෂව ඇත්තාවූ; සකල සම්පත්, සියලු සම්පත්ති යක්; ලොවගපත්, ලොකාග්‍රවූ; මුනිඳුට, මෛත්‍රෙයසර්‍වඥයන් වහන්සේට; පුදා, පූජා කොට—

464 පෙර දිඹුල් දඹු ගෙන
තනා නිවසක් සුර හෙන
වස්වසවා අ ගෙන
කුසල් කළ එම ළඳුන්සම හෙන

464 පෙර, අතීත භවාන්තරයෙක්හි; දිඹුල් දඹුගෙන, උදුම්බරකාෂ්ඨයන් රැගෙන, සුරහෙන, මනොඥකාරයෙන්; නිවසක්, ආවාසයක්; තනා, නිර්‍මාණය කොට; අගෙන, අගනා ලෙස; වස්වසවා, (ප්‍රත්‍යෙකබුද්ධයන්වහන්සේලා) වස් එළ ඹවා; කුසල්කළ, කෘතපුණ්‍යයෙන් යුක්තවූ; එම්ළඳුන් සම ගෙන, (චක්‍රවර්තිරජහුට මේවාරයෙහිත් අගමෙහෙසිවූ) ඒ කාන්තාවන් සමඟව.—

465 කෙළ දහසක් මැ තින්
සහ බුදුසසුන සුබැ තින්
මහණව පෙම් සි තින්
දකිසි අමමහනිවන් යහ තින්

465 කෙළ දහසක් මැතින් සහ, කොටිසහස්‍රයක් අමාත්‍ය යන් සමඟ; සුබැතින්, මහා භක්තියෙන්; පෙම් සිතින්, චිත්තප්‍රෙමයෙන්; බුදුසසුන, එම බුඩ ශාසනයෙහි; මහණව, පැවි දිව; යහතින්, යෙහෙන්; අමමහනිවන් දකිසි, අමෘතමහා නිර්‍වාණය දශීනයකරන්නේය.—

466 එ මෙත්‍යේබුදු රැවන්
දකිනු බැරි පව් කා රැවන්
දූත උන් කව් රැවන්
සුදන නොකරව් පවසනු රැවන්

466 සුදන, සැජ්ජනයෙනි! එ, ඒ උක්තප්‍රකාරවූ; මෛතේ බුදුරුවන්, මෛත්‍රෙයබුඞරත්නය; පව්කරුවන්, පාපීන් විසින්; දකිනු බැරි, දර්ශනය කිරීම නොහැකිය; උන් කවුරුවන්, ඒ සඛයන් කෙබන්දන්දැයි; දැන, ජානනය කොට; සතුරුවන්, ශත්‍රුවූ; පව්, පාපකර්මයන්; නොකරව්, නොමකරව්!

467 දෙමව්පිය ග රුවන්
පවර රහතන් මැ රුවන්
දුනු ලේ බුදු රුවන්
සඟ තවත් සඟබේද කෙ රුවන්

467 ගරුවන්, ගෞරව කට යුතු; දෙමව්පිය, මාතෘ පිතෘන් දෙදෙනාද; පවර, පූජ්‍යවූ; රහතන්, ක්ෂීණාශ්‍රවයන්ද; මැරුවන්, මාරණය කළවුන්ද; බුදුරුවන්, බුඞරත්නය පිළිබඳ (ශරීරයෙන්); ලේ, ලොහිතය; දුනු, ජනිත කළවුන්ද (ලොහිතොත්පාද පාපකර්මය කළවුන්දැයි යු සේයි); සඟ, සමග්‍රව; තවත්, අන්‍යවූත්; සඟබේද කෙරුවන්, සංඝභෙද කළවුන්ද යන—(මතුකව හා සම්බන්ධයි.)

468 මෙම රුදු ඇනැති රිය
පව්කළ සත්හු අපි රිය
මෛතේමුනි අා රිය
නොම දකින බැව් දනිව් සපු රිය

468 මෙම රුදු, මේ උක්තප්‍රකාර රෞද්‍රවූ; ඇනැතිරිය පව්, ආනන්තරිය පාපකර්මයන්; කළ, කළාවූ; අපිරිය, අප්‍රිය ජනකවූ; සත්හු, සඛයන්; ආරිය, ශ්‍රෙෂ්ඨවූ; මෛතේමුනි, මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ; නොම දකින බැව්, දර්ශනය නොකරන බව, සපුරිය, පරිපූර්ණාකාරයෙන්; දනිව්, ජානනය කරව්!

469 දාගැප්ද බෝ තුරු
පිළිම බණපොත් පිව් තුරු
නැසුවෝද අම් තුරු
මෛතේමුනි නොමදකිත් ලොවුතු රු

469 පිවිතුරු, පවිත්‍රවූ; දාගැප්ද, ධාතුගර්භචෛත්‍යයන්ද; බෝතුරු, බොධිවෘක්ෂයන්ද; පිළිම, ප්‍රතිමාවන්ද; බණපොත්, ධර්මපුස්තකයන්ද; අම්තුරු, සතුරුව; නැසුවෝද, විනාශකළාවූ

සත්‍වයෝද; ලොවුතුරු, ලොකොත්තරවූගුණඇති; මෙතේමුනි, මෛත්‍රෙයසර්‍වඥයන්වහන්සේ; නොම දකිත්, දර්‍ශනය නොක රන්නාහුමය.

470 බුදුදම් සඟන වත්
ලොව සුසිල්වත් අය වත්
අනදර කළහ වත්
දකිනු බැරි මුනිමෙතේ නෙත වත්

470 බුදු දම් සඟනටත්, බුඬ ධර්‍ම සංඝ යන ත්‍රිවිධ රත් නයටද; ලොව, ලොකයෙහි;සුසිල්වත් අයටත්, මනාශිලසංරක්‍ෂ ණයෙන් යුක්‍තවූවන්ටත්; අනදර කළහටත්, අනාදරකළාවූ සත්‍ව යන්ගේ; නෙතටත්, නෙත්‍රයටත්; මෙතේමුනි, මෛත්‍රෙය සර්‍වඥයන්වහන්සේ; දකිනු බැරි, දර්‍ශනය කිරීම බැරිවන්නේය.

471 දන පිනට දෙ න දේ
සතු බුදු දම් සඟ න දේ
කෑ හට සිදුව න දේ
නොදක්මය බුදුරදු මන න දේ

471 දන, දෙය ධර්‍මය පිණිසද; පිනට, තදන්‍යපුණ්‍යකර්‍ම යක් පිණිසද; දෙනදේ, පරිත්‍යාග කරන වස්‍තුවද; බුදු දම් සඟන සතුදේ,බුදුන් දහම් සංඝ සන්‍තක වස්තූන්ද; කෑ හට,පැහැ රගෙන අනුභව කළාවූ සත්‍වයන්ට; සිදුවන දේ, සිඬවන්නාවූ විපා කය නම්; මනනදේ, මනොනන්‍දනවූ; බුදුරදු, මෛත්‍රෙයසර්‍වඥ රාජොත්‍තමයා; නොදක්මය, දර්‍ශනය නොකිරීමමය.

472 නියත මිසදිටු ගත්
කම්පල රඟ නොපිළි ගත්
දෙලොවක් නැතිව ගත්
කියන සත නොමදකිත් එසු ගත්

472 නියත මිසදිටුගත්, නියත මිථ්‍යාදෘෂ්ටි ගෙන; කම් පලරඟ, කෘතකර්‍මයාගේ විපාකය ගෙනදෙනාකාරය; නොපිළි ගත්, ප්‍රතිග්‍රහණය නොකළාවූ; දෙලොවක් නැතිවගත්, උභය ලොකයක් අවිද්‍යමානයයි; කියන, කථනය කරන්නාවූ; සත; සත්‍වයෝ; එසුගත්, ඒ මෛත්‍රෙයසුගතෙන්‍ද්‍රයාණන්වහන්සේ; නොම දකිත්, දර්‍ශනය නොකරන්නාහුමය.

473 හිරු සඳ ආදි වන
දෙවියන්ට දෙස් දෙඬ වන
කම් නොදත් රුදු වන
සතට එමුනිඳු දකිනු බැරි වන

473 හිරු සඳ ආදි වන. චන්‍ද්‍රසූර්‍ය්‍යාදි වශයෙන් විද්‍යමානවූ; දෙවියන්ට, දිව්‍යසමූහයාට; දෙස් දෙඩවන, වරද කියන්නාවූ; කම් නොදත්, කර්‍මයාගේ විපාකය නොඅඳුනන්නාවූ; රුදුවන, රෞද්‍රවූ; සතට, සත්‍වයාහට; එමුනිඳු, ඒ මුනීන්‍ද්‍රයාණන්වහන්සේ; දකිනු බැරිවන, දර්‍ශනය කිරීම නොහැකිවන්නේමය.

474 තිරිසන් පේත කා ය
පිටිසක්වළද නර කා ය
අසුර පස් බඹ කා ය
උපන නො දකිති මෙතේබුදු කා ය

474 තිරිසන් පේතකාය, තිරශ්චීන ප්‍රෙත ශරීරයන්ගෙන් යුක්තවද; නරකය, නිරයන්හිද; පිටිසක්වළද, බාහ්‍ය චක්‍රවාලයන්හිද; අසුර, අසුරයොනියෙහිද; පස් බඹකාය, (ආකාසානංචායතනය, විඤ්ඤානංචායතනය, ආකිංචඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, අසඤ්ඤසත්‍වය යන) පඤ්චවිධ බ්‍රහ්මතලයන්හිද; උපන, උපන්නාවූ සත්‍වයෝ; මෙතේබුදුකාය, ඒ මෛත්‍රෙයසර්‍වඥරාජොත්තමයාණන්ගේ ශ්‍රීශරීරය; නො දකිති, දර්‍ශනය නොකරන්නාහුමය.

475 මේ ආදී න ව ත්
කරන පව්සත බල ව ත්
එමුනිරජ සිරි ව ත්
නොම දකින බැව් දනිව් පැණ ව ත්

475 පැණවත්, ප්‍රාඥයෙනි! මේ ආදී, මේඋක්තප්‍රකාරවූ සහ; නවත්, අන්‍යවූත්; බලවත් පව්, මහත් පාපකර්‍මයන්; කරනා, කරන්නාවූ; සත, සත්‍වයන්; එමුනිරජ, ඒ මෛත්‍රෙයසර්‍වඥරාජොත්තමයාණන්වහන්සේගේ; සිරිවත්, ශ්‍රීමත්වූ වක්ත්‍රය; නොමදකින බැව්, දර්‍ශනය නොකරන බව; දනිව්; ජානනය කරව්.

476 සි ව ං කර දහ මෙ න්
රු ව න් මෙතෙමුනි දකු මෙ න්
නුව න් පල ලැබු මෙ න්
නි ව න් යනසත කියමි මන මෙ න්

476 දහමෙන්, ශ්‍රීසඞ්ඝ යෙන්; සිවංකර, නිර්වාණ සම්පත්තිය ඇතිකරන්නාවූ; මෙතේවුනිරුවන්, මෛත්‍රෙයබුඬරත්නය; දකුමෙන්, දර්ශනය කරමින්; නුවන් පල, නෙත්‍රප්‍රතිලාභ ඵලය; ලැබුමෙන්, ප්‍රතිලාභයකිරිමෙන්; තිවන් යන සත, නිර්වාණයටප්‍රාප්තවන්නාවූ සත්වයන් (කවරහුදුයි); මනමෙන්, සිත්වූපරිද්දෙන්; කියමි, කථනය කරන්නෙමි.

477

| | | |
|---|---|---|
| ස ර ණ | තිසරණ රැගෙන බැතියෙන් නිමල මුනිදම් විල | සි නා |
| හෙරණ | දම් දසසිල්ද අටසිල් පසහසිල් යති ගුණ | සි නා |
| පු ර ණ | බඹසරවසද රැක්කෝ නොකර පස්පව් කෙලෙ | සි නා |
| ස ර ණ | සර බඹ අමර මතදෙන එමුනි දකිති සතො | සි නා |

477 තිසරණ සරණ රැගෙන, රත්නත්‍රය ප්‍රතිඥා කොට ගෙන; බැතියෙන්, භක්තිප්‍රෙමයෙන්; නිමල, නිර්මලවූ; මුනි දම් විලසිනා, බුඬධර්මයවූ පරිද්දෙන්; කෙලෙසිනා, කවරා කාරයකින් නොහොත් මොන යම් කරුණක් නිසාවත්; පස් පව්, ප්‍රාණඝාතාදි පචවිධ පාපකර්මයන්; නොකර, නොම කරමින්; පසහසිල්, නිත්‍ය පචශිලයද; අටසිල්, අෂ්ටාංගශිල යද; දසසිල්ද, දශශිලයද; හෙරණදම්, සාමණෙරධර්මයන්හා; යති ගුණසිනා, භික්ෂුගුණඅදහසින්; පුරණ, පරිපූර්ණවූ; බඹසරවසද, බ්‍ර හම ච ය්‍යා ව ද; රැ ක් කෝ, රක්ෂාකළ සත්වයෝ; බඹ අමර, බ්‍රහමාමරයන්ගේ; මත, මස්තකයට; සරණ, ශ්‍රීපාදන මැති; සර, පද්මය; දෙන, දානයකරන්නාවූ; එමුනි, ඒමෛත්‍රෙය සර්ඥයන්වහන්සේ; සතොසිනා, සන්තුෂ්ටියෙන්; දකිති, දර්ශනයකරන්නාහුය.

478

| | | |
|---|---|---|
| ස යු රු යුරු මහගැඹුරු පින්ඇති දහම් පොත්පත් ලිය | | මි නා |
| ප තු රු වා ලොව සාරන සෙත සත එදම්පදරුත් වන | | මි නා |
| තිබොරු එකකුර බැගින් සක්විතිරජසැපත් නිති ලබ | | මි නා |
| සො ඳු රු එමෙතේ තිලෝගුරුමුනි දකිත් බැතිපෙම් වඩ | | මි නා |

478 සයුරු යුරු, සාගරයපරිද්දෙන්; මහ ගැඹුරු, අති ගම්භිරවූ; පින් ඇති, පුණ්‍ය ඵල ඇති; දහම් පොත් පත්, ධර්මපුස්තක පත්‍ර; ලියමිනා, ලෙඛනය කරමින්; එදම් පද රුත්, ඒ ධර්මය පිළිබඳවූ පදාර්ථයන්; වනමිනා, වර්ණනා කර

මින්; ලොව, ලොකයෙහි; පතුරුවා, ව්‍යාප්තකරවා; කරන සෙනසන, ක්‍රියමාණවූ ශාන්තිය ඇති සත්වයෝ; එකතුර බැගින්, (එසේ ලෙඛ්‍ය කළ නොහොත් කැරවූ) එක්එක් අක්ෂරයක් හුගේ සඞ්ඛ්‍යාවෙන්; තිබොරු, අසත්‍ය නොවම; තිති, තිර තුරුවම; සක්විතිරජසැපත්, චක්‍රවර්තිරාජ්‍යශ්‍රියත්; ලබමිනා, ප්‍රතිලාභයකොට; බැතිපෙම්, භක්තිප්‍රේමය; වඩමිනා, වර්ධනය කරමින්; සොඳුරු, ප්‍රශස්තවූ; එ මෙතේතිලෝගුරුමුනි, ඒත්‍රෛලොක්‍යාචාර්‍ය්‍යමෛත්‍රෙයමුනීන්ද්‍රයන්; දකිත්, දර්ශනය කරන්නාහුය.

## 479

| | |
|---|---|
| එ බ දු දන සහ සාටින අටපිරිකරද ආවාසද න | දු න් |
| ප සි දු බුදුපාමොක්දනද කෙත් වැසිකිළිද මහසඟන | දු න් |
| ස බ ඳු බුදුපෙතිපිළිම කැරවුද එසිව්සස් දෙසු වදනි | දු න් |
| මෙබඳු අටමහකුසල් කළ සත දකිති සම්මාසම්බු | දු න් |

479 එබඳු දන සඟ, යථොක්ත දානමයපුණ්‍යකර්මය හෙවත් ධර්මදානය සහිත; සාටින, සොළින්සිවුරුද; අටපිරිකරද, අෂ්ටපරිෂ්කාරද; නදුන්, ප්‍රියංකරවූ; ආවාසද, සංඝාවාසස්ථානයන්ද; පසිදු, ප්‍රසිඬවූ; බුදුපාමොක්දනද, බුඬප්‍රමුඛ මහසඟනට දන්දීමද; කෙත්, ක්ෂෙත්‍රද; වැසිකිළිද, වච්චකුටීන්ද; මහසඟන, මහාසංඝයාට; දුන්, පූජාකරන ලද්දාවූද; එසිව්සස්, ඒ චතුස්සත්‍යය; දෙසු, දෙශනාකළාවූ; වදනිදුන්, වාගීශ්වරවූ; සබඳු, සාලක්ෂණමිත්‍රවූ; බුදුපෙතිපිළිම, බුඬප්‍රතිමාවන්; කැරවුද, කරන කරවනලද්ද යන; මෙබඳු, මේඋක්තප්‍රකාරවූ; අටමහකුසල්, මහාසිඅෂ්ටමහ කුශලක්‍රියා; කළසත, සිඬකළාවූ සත්වයෝ; සම්මාසම්බුදුන්, සම්‍යක් සම්බුඬ මෛත්‍රෙයසර්වඥයන්වහන්සේ; දකිති, දර්ශනය කරන්නාහුය.

## 480

| | |
|---|---|
| එ ව න අටමහකුසල් සම පල බෝදි දාගැප් පිහිටු | ම ත් |
| සොඳින ලාබත් අවදිබත් සහ පොහොබතුත් තව පිදී | ම ත් |
| සොබන පැන්සැල් ළිං පොකුණු අම්බලම් ඒදඬුතැනී | ම ත් |
| ක ර න පින් සත දකිත් එ මෙතේබුදුරදුන් තෙද අසිරි | ම ත් |

480 එවන, පූජෝක්තවූ; අටමහ කුසල්, අෂ්ටවිධ මහා පුණ්‍යක්‍රියාවන්ගේ; පලසම, සමාන විපාක ඇත්තාවූ; බෝදි දාගැප්, බොධිවෘක්ෂයන් හා ධාතුගර්භචෛත්‍යයන්; පිහිටුමත්, ප්‍රතිෂ්ඨිත කිරීමද; තව, අන්‍යවූත්; ලාබත්, සලාක භක්තය; අවදිබත් සහ, අවධිභක්තය හා; පොහොබතුත්, පෞෂධදින යෙහි දියයුතු භක්තය; සොඳින, සුන්දරාකාරයෙන්; පිදීමත්, පූජනයකිරීමද; සොබන, ශොභනවූ; ලිං, ජලකූපද; පැන් සැල්, පැන්හල්ද; පොකුණු, පුෂ්කරණීද; අම්බලම්, විශ්‍රාම ශාලාද; ඒදඬු, සෙතුන්ද; තැනිමත්, සජ්ජිත කිරීමද යන; පින් කරන, පුණ්‍යයන් කරන්නාවූ; සත, ඒසත්වයෝ; තෙද, තෙජ සින්යුත්; අසිරිමත්, ආශ්චර්‍ය්‍යමත්වූ; ඒ මෙත්බුදුරදුන්, ඒ මෛත්‍රෙයසර්වඥරාජොත්තමයාණන්වහන්සේ; දකිත්, දර්ශනය කරන්නාහුය.

481

ත නා  දම්හල් අසුන් පනවා වියන් ඇතිරිලි අතුර  මි න්
ම නා  මල් තෙල් පහන් අලුකර දහම් දතුවන් සැඳව  මි න්
පි නා  එතුමන් දෙපා සෝදා වඩා ආසන හිඳුව  මි න්
ස නා  යෙන්හද දහම් දෙසවුවො දකිති සුගතිඳු බැති පෙ මි න්

481 දම්හල් තනා, ධර්මශාලාවන් සාදවා; අසුන් පනවා, ධර්මාසනයන් ප්‍රඥප්ත කොට; වියන් ඇතිරිලි, විතානසහ ආස්තරණයන්; අතුරමින්, ආස්තරණය කොට; මනා, මනොඥවූ; මල්, මාල්‍යයෙන් හා; තෙල් පහන්, තෛලප්‍රදීපයෙන්; අලු කර, ආලොක කොට; දහම් දතුවන්, ධර්මඥයන් (ධර්මකථික යන්වහන්සේලා); සැඳවමින්, වැඩම කරවා; පිනා, ප්‍රීණිතවැ; එතුමන්, ඒ උත්තමයන්වහන්සේලාගේ; දෙපා සෝදා, පාදද්වය ධොවනය කොට; ආසන, ආසනයන්හි; වඩා හිඳුවමින්, උපවෙශනය කරවා; හද, සිත්හි; සනායෙන්, ස්නෙහයෙන්; බැතිපෙමින්; භක්තිප්‍රෙමයෙන්; දහම්දෙසවුවො, ධර්මදෙශනා කරවූ සත්වයෝ; සුගතිඳු, ඒ මෛත්‍රෙයසුගතෙන්ද්‍රයාණන්වහන්සේ; දකිති, දර්ශනය කරන්නාහුය.

482

උ තු ම්  මුනිබණ දෙසන කල සැදී පැහැදී ලැදී බැදී තො සේ යා
ව ඩ ම්  නී බැති සාදුනද පිළිවදන් දී නොවල  සේ යා
ද හ ම්  බෙරහඬ සවන කළ සත පිඳම එහි අමර  සේ යා
බි ර ම්  බවහැර නිවන් දෙන මුනිමෙතෝ දකි සියුලෙ  සේ යා

482 උතුම්, උත්තමවූ; මුනිබණ, බුඩ වචනය; දෙසන කල, දේශනා කරන කල්හි; තොසේයා, චිත්තසන්තුෂ්ටියෙහි; ලැදි, සිත් සොම්නසාට; බැඳි, බඤ්ඤිතව; පැහැදී, ප්‍රසන්නව; සැදී, සජ්ජිතව; බැති, භක්තිය; වඩමිනි, වර්ධනය කරමින්; එහි, ඒ ධර්මයෙහි; අම රසේයා, අමෘත රසය; විඳම, වින්දනය කොටම; නොවලසේයා, අනලසව; පිළි වදන්, ප්‍රතිවචන හා; සාදුනද දී, සාධුකාර පවත් වමින්; දහම් බෙරහඬ, ඒ ධර්මනමැති භෙරිනාදය; සවනකළ සත, ශ්‍රවණයකළ සත්වයා; බවකිරම්, සංසාරභිනිය; හැර, දුරු කොට; නිවන් දෙන, නිර්වාණ දය කාවූ; මෛත්‍රේමුනි, මෛත්‍රෙයමුනීන්ද්‍රතාමයාණන්වහන්සේ; සිතුලෙසේයා, චිත්තානුකූලව; දකි, දර්ශනය කරන්නේය ~~~~

483

පගන් තෙල්මල් බොජුන් කෙත් වත් පිළිද පුදදී ලද ලෙසේ
බුදුන් දම් සඟ මවු න් පිය ගුරු වැඳුම්ගරුකරනිසි ලෙසේ
සුරන් සිල්වත් ගිල න් සතඇ සැලකුවන් තවසරු ලෙසේ
පවන් මහ ඇති රුව න් සක්මන් එමුනිදකිතැකිතිර ලෙසේ

483 ලද ලෙසේ, තමන් ලද්දාවූ පරිදි; පහන්, ප්‍රදීපද; තෙල්, තෛලයන්ද; මල්, මාල්‍යයද; බොජුන්, භොජනද; කෙත්, ක්ෂෙත්‍රයන් හා; වත්, වාස යොග්‍ය භූමි සඞ්ඛ්‍යාත වස්තූන්ද; පිළිද, වස්ත්‍රපිළිද යනාදි; පුද, පූජාවස්තූන්; දී, දානය කොරෙමින්; බුදුන් දම් සඟ, බුඩ ධර්ම සංඝ යන රත්නත්‍රයට හා; මවුන් පිය ගුරු, මාතෘ පිතෘ ගුරුවරාදීන්ටත්; නිසි ලෙසේ, යොග්‍යාකාර; වැඳුම් ගරුකර, වන්දනමානන ගෞරව කොටද; තව, අන්‍යවූත්; සුරන්, දෙවියන්ටද; සිල්වත්, සිල්වතුන්ටද; ගිලන්ඇ සත, රොගයෙන්පීඩිතවූවන් ආදි සත්වයන්ට; සරුලෙසේ, සාරවත් ලෙස; සැලකුවන්, සත්කාර කළාවූ සත්වයන්ට; පවන්මහ, ගුවනහි; රුවන්සක්මන්ඇති, (යමක මහා ප්‍රාතිහාර්‍ය්‍ය පිණිස) රත්නචඞ්ක්‍රමයක් ඇත්තාවූ; එමුනි, ඒමෛත්‍රෙයසර්වඥයන්වහන්සේ; තිරලෙසේ, ස්ථිරාකාරයෙන්; දකිත්නැකි, දර්ශනයකිරීමපුළුවන්වෙති ~~~~

484

මෙස් ල මිනිසත් සපල කොට තිනි පසහසිල්වත් රැකති සි න්
ස කා ල සම්බුදුමෛත්‍රේසිරිගන දකිතෙමැයි යන අදහ සි න්
නි ම ල පිරිසුදු සිතින් එකපහනක් මලක් පිදුවෝතො සි න්
ස කා ල මංගලලකුණු දුල් ඒ ලොවිදු දකිතීතොවල සි න්

484 නිසින්, යොග්‍යාකාරයෙන් (හෙවත්මනාකොට); නිති පසඟසිල්වත්, නිත්‍යපංචශීලයවත්; රැක, රක්‍ෂාකරමින්; මෙකල, අධුනාකාලයෙහි (ලද්දාවූ); මිනිසත්, මනුෂ්‍යාත්ම භාවය; සපල කොට,ප්‍රයොජනවත් කොට; සකල,කල්‍යාණසහිතවූ; සම්බුදුමෙතේසිරිගත,සම්‍යක්සම්බුද්ධමෛත්‍රෙයසර්‍වඥරාජොත්තමයාණන් වහන්සේ; දකිනෙමැයි යන අදහසින්, දර්‍ශනය කරන්නෙමුයි යන අධ්‍යාශයෙන්; නිමල, නිර්‍මලවූ; පිරිසුදු සිතින්, පරිශුද්ධ චිත්තයෙන්; තොසින්, සන්තුෂ්ටව; එකපහනක් මලක්, එකම ප්‍රදීපයක් හෝ මලක් නමුදු; පිදුවෝ, පූජාකළාහු; සකලමංගල ලකුණු දුල්, සියලුමඞ්ගලලක්‍ෂණයෙන් උජ්ජ්වලවූ; ඒලොවිදු, ඒමෛත්‍රෙයසර්‍වඥරාජොත්තමයාණන්වහන්සේ; නොවලසින්, අනලස්ව; දකිති, දර්‍ශනය කරති.

485

සවන් පෙරකල් සිරින් අසිරි යමාමහපෙළහරින් නඳ නට
ගුවන් මිණිඅයුරුව න් තිත්ගණරුදුරුදප්බිඳහරිනසෙදි නට
පුරන් දර අයැදුමෙ න් වැඩහිඳ සුදම්සබ දම් දෙසනසුර නට
ලෙවන් සිතුමිණිරුව න් මෙත්මුනි නුවන් දුටො යති
යෙහෙන් නිව නට

485 පෙරකල් සවන් සිරින්, තමන්වහන්සේට අතීතයෙහිවූ සර්‍වඥවරයන් මෙන්; අසිරි, ආශ්චර්‍ය්‍යමත්වූ; නඳන, ආනන්දකරවූ; යමාමහපෙළහරින්, යමකමහාප්‍රාතිහාර්‍ය්‍යයෙන්; ගුවන් මිණිඅයුරුවන්, සූර්‍ය්‍යයා අන්ධකාරවිධ්වංසනයකරන්නාක්මෙන්; තිත්ගණ, තීර්ථකසමූහයාගේ; රුදුරු දප්,රෞද්‍රවූදර්පය; සෙදිනට, සිඳුයෙන්; බිඳහරින, භග්නකොටහරින්නාවූ; පුරන්දර, ශක්‍රයාගේ; අ යැ දු මෙ න්, ආ රා ධ නා යෙ න්; සුදම්සබ, සුධර්මානම් දෙවසභාවෙහි; වැඩහිඳ, උපවේශනයකරමින්; සුරනට, දෙවසමූහයාට; දම් දෙසන, ධර්මදෙශනාකරන්නාවූ; ලෙවන්, තුන්ලොකවාසීන්ට; සිතුමිණිරුවන්, චින්තාමාණික්‍යයක් බඳුවූ; මෙත්මුනි, මෛත්‍රෙයසර්‍වඥයන්වහන්සේ; නුවන් දුටො, නෙත්‍රාපාථකළෝ; යෙහෙන්, සුවසේ; නිවනට, නිර්‍වාණපුරප්‍රවරයට; යති, ප්‍රවිෂ්ටවන්නාහුය.

ද්වාදශම සර්ගය සමාප්තයි.

——○§○——

486

නි ති ඳු  දියබඳ කමල් සිවුමා කඳකුමර තමදිව  සරා
ග ණි ඳු  සඳු දූඹිමුණ්ඩ දම්රජ යෙහෙන් සැරදෙත් සිරි  සරා
ප සි ඳු  ලෙද බුදුසසුන් රැකදෙත් මෙදෙව් තම තෙද බල  සරා
සු මු ඳු  සෙත්පුර සැපත් වෙත්වා සියලු සත් නිත් පින්  සරා

486 නතිඳු, නාථෙන්ද්‍රය; දියබඳ, විෂ්ණුය; කමල්, ශ්‍රීකාන්තාය; සිව, ඊශ්වරය; උමා, උමාදෙවිය; කඳකුමර, ස්කන්දකුමාරය; තමදිවසරා, (ඒදෙවිඳුහුගේ) ස්වකියදිව්‍යප්සරාය හෙවත් වල්ලිමාතාය; ගණිඳු, ගණේශ්වරය; සඳු, තරිඳුය; දූඹිමුණ්ඩ, දෙවතාබණ්ඩාරය; දම්රජ, යමරාජය යන දෙවියෝ; සිරිසරා, සාරශ්‍රියෙන් යුක්තව; යෙහෙන්, සුවසේ; සැර දෙත්, චිරකාලයක් ජීවත්වෙත්වා හෙවත් දීර්ඝායුඃශ්‍රී විඳිනයකෙරෙත්වා! (තවද) මෙදෙව්, මේ දෙවසමූහයෝ; තම තෙද බලසරා, ස්වකියතෙජොබලාන්විත පරාක්‍රමයෙන්; පසිදු ලෙද, ප්‍රසිඬලෙස; බුදුසසුන්, බුඬශාසනය; රැකදෙත්, රක්ෂා කොරෙත්වා! සියලු සත්, සකල සත්වයෝ; නිත්, නිරන්තරයෙන්; පින්සරා, පින්කම්හි හැසිර; සුමුදු, ඉතාමෘදුවූ; සෙත්පුර, ශාන්තිපුරයට හෙවත්නිර්වාණපුරයට; සැපත් වෙත්වා, සම්ප්‍රාප්තවෙත්වා!

---

487 සේ ස ඳ  තුසිසුරපුරවර වැඩහු  න් න
තේතෙද  නතිඳු මතු බුදුවන සිරිපු  න් න
මා  හ ඳ  බැතින් කලමෙම පින්සුපසන් න
සේ ස  ඳ  හිමිසඳුනි අනුමෝදන් ව  න් න

488

සහම්  පත් මගබඹුන් ඇතුළුව සකල බඹකැලසොළොස්බඹලොව
සුද ම්  සබපති පුරන්දර අන් සුරන් සහ සුරලිය සදෙව්  ලොව
වර ම්  දෙව් සිව් දහම්රද මගෙ දෙමව්පිය පුත් වැඹිය පර  ලොව
උතුම්  මෙපින් මෙත්සිහින්ගෙන ලබව්නිවනත් සැමසැපතලොව

489

ගොවිඳු  සිරිසඳු ඉසුරු උමඟන ගණිඳු කඳ තම දිව  සරා
දෙ වි ඳු  ජයතුඟු සුමන විබිසන අය්යනා සුර ගම්  සරා
ත රි ඳු  රිවි ගුරු රහඟ කිවි බුද පතඟ සැනි බඹ මිහි  සරා
ප සි ඳු  දෙවිඳුනි මෙපින් ගෙන මෙත්මුනි දකිත්වා සිත්  සරා

490

මි තු රැ සොභොවුරැ ඇදුරැ නැසහ වසනසත්සුර අසුරනා ලොව
ස යු රැ විල්නදි මෙර හිමද ගල් තුරන් නුබ බිම සුරන් සැම ලොව
නි ස රැ දුක්සත නරක ගිනි වැසි රකුස් යක් බූ පිසස් ඇති ලොව
සි තු රැ වනවැනිමෙපින්ගෙනමෙත්මුනිදකිත්වාසියලුසත්ලොව

---

491 තොස්කර අ ම නි ව න් දෙන සත තුන්ත ල ය
උ ස් මෙ ර යුරැ රැ ව න් මෙත්සිරිගන දූ ල ය
වි ස් ත ර ලියු මෙ පි න් බලයෙන් හැමක ල ය
ස ස් ති ර ම ට සි රි න් වේ ජයමංග ල ය

492 ස ස ර ව ස න තුරැ දුක් මෙමට නොව මි න
නි ත ර කා ල ණ මිතු සිතු විලස ලබ මි න
ප ත ර නැණි න සැරියුත් හිමි සම වෙ මි න
ස ති ර මෙති න බඹමෙන මහද දිලෙ මි න

493 හැ ම ව ර තිදොර අකුසල් රුස නොකෙරෙ ම් වා
නි ර තු ර බුදුදහම් හද තුළ දරනෙ ම් වා
ගොරනි ර නොවැද සුර නර සුව විඳිනෙ ම් වා
සැ ම සු ර තුටින් දෙන සෙත සපදන් වෙ ම් වා

494 ස ස ර ගිම්නිවා අම දම්වැසි ව ස් වා
කොස ර යුරැ කුදිටු වරණෙඹි බිඳන ස් වා
ප ත ර සිරි තිවන් දෙන පින්කෙත ඉ ස් වා
ප ව ර මෙතේමුනි දැක දෙඇසින් තො ස් වා

495 සු ග ත එමුනි වැඳ මගෙපින් දුල්ව මි වා
නි ය ත බුදුබවට විවරණ ලබනෙ ම් වා
ස ත ත සුසිල් රුකා පස්මරැ බිඳල ම් වා
දි ය ත මමත් සම්මා සම්බුදු වෙ ම් වා

---

496 ස ත ර එඑ මගද සකු පරතෙර ද ත් තේ
නි ත ර සුපිරිසුදු සිල් ගුණ දම් යු ත් තේ
ප ව ර බුදුසසුනඹර සොම් සිරි ග ත් තේ
වෙහෙර වැසි වාද්දුවෙ දළදුව ක් තේ

497 වැ ලි ක ඩ දහම්දේසම්දුගෙ පසිදු ව ත
දි ය වැ ඩ නිති තියැලි බැතණු වන සොබ න
ලැ බ ඉ ඩ එහිම්පා වැඳ සිප්සත ඉගෙ න
සි ය සැ ඩ දෙස නසන මුනිබණද දූතගෙ න

498 සි රි ලක කොළඹ කොටහේනේ වැසි විත න
පි රි සුදු ගොවිකුලෙන් පැවතෙන සැදූ පු ත
සි රි මත් උතුම් ඉංග්‍රිසිරජ අණ යට ත
දූ රි මහ විනිසසල ලිපිකරුදුර සම ත

499 ද න් න නෙසත ඒ. ඩි. ලෝරැන්ස් සු ද න
පු න් න මෙමතේමුනිගුණ වැනුමෙන් න ද න
දු න් න මිණෙව් කව්බැඳ සත හද නි ද න
ස න් න සහිතකර ලෙද පෙර පඬි ව ද න

500 ස ක වසිනෙක්දහස්අටසියතෙසාලි ස
තැ ක තින් සා තුලා සඳු දිනිදූ අජරැ ස
ස ක සිහ දිනූ පොහොවෙසගෙහි කිවි දව ස
රු ක සිල් අටඟ නිමකාළෙ මෙම පොත සතො ස

---

**මෙමහේබුදුගුණාලංකාර**

සහ

**මනොරමාව්‍යාඛ්‍යානය සමාප්තයි.**

සි ඕ ර සතු.



